330 වන කාණ්ඩය - 03 වන කලාපය
தொகுதி 330 - இல. 03
Volume 330 - No. 03

2026 ඔක්තෝබර් 08 වන බ්‍රහස්පතින්දා
2026 ஒக்ரோபர் 08, வியாழக்கிழமை
Thursday, 08th October, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 399]

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව:අතිරේක සාමාජිකයන් [තීරුව 399]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 400]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 402-451]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

නිදහස් වෙළෙඳ ගිවිසුම් පුළුල් කිරීම තුළින් වෙළෙඳ පොළ ප්‍රවේශය සුරක්ෂිත කර ගැනීමේ උපායමාර්ග [තීරුව 452]

**සංචාරක කර්මාන්තයේ කාර්ය සාධනය සහ සංවර්ධනය:**

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 454]

**එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ වාර්තාවේ අඩංගු කරුණු සම්බන්ධව රජයේ ස්ථාවරය:**

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 461]

**සූර්ය බලශක්ති උත්පාදනය සඳහා "නෙට් ප්ලස්"ක්‍රමවේදය හඳුන්වා දීම:**

බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 470]

**ශ්‍රී ලංකාවට ලබා දුන් IMF විස්තීර්ණ ණය පහසුකමෙහි ආර්ථික, සමාජයීය සහ මූල්‍ය ප්‍රතිඵල:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 479]

**දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි [තීරු 491-592]

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 592-596]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 597-618]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**

பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 399]

சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள் [ப: 399]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 400]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 402-451]

**தனி அறிவித்தல் மூல வினா:**

சுதந்திர வர்த்தக ஒப்பந்தங்களின் விரிவாக்கத்தினூடாக சந்தை அணுகலைப் பாதுகாக்கும் உத்தி [ப: 452]

**சுற்றுலாக் கைத்தொழிலின் அபிவிருத்தியும் செயலாற்றுகையும்:**

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று [ப: 454]

**ஐ.நா. மனித உரிமைகள் உயர்ஸ்தானிகரின் அறிக்கையிலுள்ள விடயங்கள் மீதான அரசாங்கத்தின் நிலைப்பாடு:**

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று [ப: 461]

**சூரிய மின்சக்தி உற்பத்தி சம்பந்தமாக 'நெட் பிளஸ்' முறைமை அறிமுகம்:**

வலுசக்தி அமைச்சரினது கூற்று [ப: 470]

**IMF இலங்கைக்கு வழங்கிய நீட்டிக்கப்பட்ட கடன் வசதியால் ஏற்படும் பொருளாதார, சமூக மற்றும் நிதிசார் விளைவுகள்:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 479]

**ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 491-592]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 592-596]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 597- 618]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Protection of the State from Terrorism Bill: Petition to the Supreme Court [Col. 399]

Legislative Standing Committee: Additional Members [Col. 399]

AUDITOR-GENERAL'S REPORT [Col. 400]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 402-451]

QUESTION BY PRIVATE NOTICE:

Strategy of Securing Market Access through Expansion of Free Trade Agreements [Col. 452]

PERFORMANCE AND DEVELOPMENT OF TOURISM INDUSTRY:

Statement by Minister of Foreign Affairs, Foreign Employment and Tourism [Col. 454]

GOVERNMENT'S STANCE ON MATTERS IN REPORT OF UN HIGH COMMISSIONER FOR HUMAN RIGHTS:

Statement by Minister of Foreign Affairs, Foreign Employment and Tourism [Col. 461]

INTRODUCTION OF NET PLUS BASIS FOR SOLAR POWER GENERATION:

Statement by Minister of Energy [Col. 470]

ECONOMIC, SOCIAL AND FISCAL OUTCOME OF IMF EXTENDED FUND FACILITY TO SRI LANKA:

Statement by Deputy Minister of Finance and Planning [Col. 479]

ANTI-CORRUPTION (AMENDMENT) BILL:

Read a Second, and the Third time, and passed as amended [Col. 491- 592]

ADJOURNMENT QUESTIONS [Cols. 592-596]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols.597- 618]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ඔක්තෝබර් 08වන බ්‍රහස්පතින්දා***
*2026 ஒக்ரோபர் 08, வியாழக்கிழமை*
*Thursday, 08th October, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m., MR. DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### PROTECTION OF THE STATE FROM TERRORISM BILL: PETITION TO THE SUPREME COURT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform Parliament that Hon. Speaker has received a copy of another petition filed at the Supreme Court in terms of the Article 121(1) of the Constitution in respect of the Bill titled “Protection of the State from Terrorism” on 07th October, 2026 in addition to the receipt of the petition mentioned in the Announcement dated 07th October, 2026.

## II

### ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්
### சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்
### LEGISLATIVE STANDING COMMITTEE: ADDITIONAL MEMBERS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

In terms of Standing Order No. 113(2) of Parliament, the Hon. Speaker has nominated the following Co-opted Members to serve in the Legislative Standing Committee for the consideration of the “Tredzo Development Foundation (Incorporation)” Bill :

The Hon. Harshana Rajakaruna

The Hon. Rohana Bandara

The Hon. (Dr.) Najith Indika

The Hon. (Prof.) Sena Nanayakkara

The Hon. Amila Prasad

The Hon. Danushka Ranganath

The Hon. Darmapriya Wijesinghe

The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney at Law

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

On behalf of the Hon. Speaker, I present the First Installment - Parts IV and V , Fourth Installment - Part III and Fifth Installment - Parts III and IV of the Report of the Auditor-General for the Financial Year 2025, in terms of Article 154(6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

Hon. Deputy Speaker, I move,

"That the Report be printed".

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## II

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

On behalf of the Hon. Speaker, I present the Special Audit Report on the Electric Vehicle Usage, Post-Usage Management and Environmental Impact Assessment in Sri Lanka in the Eighth Installment of the Report of the Auditor-General, in terms of Article 154(6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I move,

"That the Report be printed".

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

Order made by the Minister of Finance, Planning and Economic Development under Section 10A of the Customs Ordinance (Chapter 235), as amended by the Act, No. 83 of 1988 and published in Gazette Extraordinary No. 2501/88 of 14th August 2026. - [The Hon. (Dr.) Harini Amarasuriya]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Hon. Deputy Speaker, I present the Annual Performance Report of the Office of the Leader of the Opposition of Parliament for the year 2025.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Gnanamuththu Srineshan - *[Not in the Chamber.]*

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාඇල, කපුවත්ත, දුම්රියපොළ පාර, අංක 45/9/කේ යන ලිපිනයෙහි පදිංචි එච්.එම්.එස්. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහනුවර, උනුවින්න, කන්දංදිය යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්. ජයතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No. 1 - 787/2025 - (1), the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana - *[Not in the Chamber.]*

Question No.2 - 911/2025 - (1), the Hon. Mujibur Rahuman - *[Not in the Chamber.]*

Question No.3 - 1040/2025 - (1), the Hon. (Mrs.) Rohini Kumari Wijerathna - *[Not in the Chamber.]*

### උතුරු පළාතේ පාරිසරික, ඓතිහාසික සහ සංස්කෘතික ආකර්ෂණ ස්ථාන: ප්‍රවර්ධනය
### வட மாகாணத்திலுள்ள சூழலியல், வரலாற்று மற்றும் கலாசார ரீதியான கவர்ச்சிமிக்க இடங்கள்: மேம்படுத்தல்
### ECOLOGICAL, HISTORICAL AND CULTURAL ATTRACTIONS OF NORTHERN PROVINCE: PROMOTION

1078/2025

**4.** ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு ரஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනයේ සහ උතුරු පළාතේ අනෙකුත් දිස්ත්‍රික්කවල ඇති පාරිසරික, ඓතිහාසික සහ

සංස්කෘතික ආකර්ෂණයන් හඳුනාගෙන ඒවා ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන පියවර කවරේද;

(ii) දේශීය සංස්කෘතිය, ප්‍රජාවන් සහ පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගනිමින් මෙම ප්‍රදේශය සංචාරක උපාය මාර්ගයට ඒකාබද්ධ කිරීම සඳහා කලාපීය වශයෙන් විශේෂිත සැලසුම් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) දේශීය පාරිසරික සංචාරක ස්ථාන වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) නවාතැන් සහ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය, අදාළ පාර්ශ්වකරුවන් සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කර තිබේද;

(iii) දේශීය ප්‍රජාවන්, විශේෂයෙන්ම තරුණ තරුණියන් සහ කාන්තාවන් පුහුණු කිරීම සහ සේවයේ යෙදවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) උතුරු පළාතේ ගැටුම්වලින් බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික ආරක්ෂණ විධිවිධාන ඇතුළත් පුළුල් පරිසර සංචාරක ප්‍රතිපත්තියක් පිළිබඳව සලකා බලනු ලබන්නේද;

(v) යාපනය ගෝලීය සහ දේශීය වශයෙන් ප්‍රචලිත කිරීම සඳහා සහ පරිසරයට සහ දේශීය ජීවනෝපායයන්ට සංචාරක ව්‍යාපාරයේ දිගු කාලීන බලපෑම් නිරීක්ෂණය කිරීම සඳහා වන යාන්ත්‍රණයන් කවරේද?

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாணம் மற்றும் வட மாகாணத்தின் ஏனைய மாவட்டங்களிலுள்ள சூழலியல், வரலாற்று மற்றும் கலாசார ரீதியான கவர்ச்சி மிக்க இடங்களை இனங்கண்டு ஊக்குவிப்பதற் காக மேற்கொள்ளப்பட்டு வருகின்ற நடவடிக்கைகள் பற்றியும்;

(ii) உள்ளூர் கலாசாரம், சனசமூகங்கள் மற்றும் சூழற்றொகுதிகள் ஆகியவற்றைப் பாதுகாக்கும் அதேநேரம், இந்தப் பிரதேசங்களை சுற்றுலா மூலோபாயத் திட்டத்துடன் ஒன்றிணைப் பதற்கான பிராந்தியம் சார்ந்த குறிப்பான திட்டங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) உள்ளூர் சூழலியல் சுற்றுலாத் தலங்களுக்கான அணுகலை மேம்படுத்துவதற்காக மேற் கொள்ளப்பட்டு வருகின்ற நடவடிக்கைகள் பற்றியும்;

(ii) தங்குமிட வசதிகள் மற்றும் பொது வசதிகளை மேம்படுத்துவதற்கு அமைச்சு பங்கீடுபாட்டாளர் களுடன் கூட்டுச்சேர்ந்துள்ளதா என்பதையும்;

(iii) குறிப்பாக உள்ளூர் சனசமூகங்களிலுள்ள இளைஞர்கள் மற்றும் பெண்களுக்குப் பயிற்சி யளித்து அவர்களைத் தொழிலில் அமர்த்து வதற்காக மேற்கொள்ளப்பட்டு வருகின்ற நடவடிக்கைகள் பற்றியும்;

(iv) மோதலினால் பாதிக்கப்பட்ட வட மாகாணத்தின் மாவட்டங்களில், சுற்றாடல் பாதுகாப்புடன் கூடிய ஒரு பூரணமான சூழலியல் சுற்றுலாக் கொள்கை தொடர்பாக பரிசீலிக்கப்பட்டு வருகின்றதா என்பதையும்;

(v) யாழ்ப்பாணத்தை உலகளாவிய மற்றும் உள்நாட்டு ரீதியில் பிரபல்யப்படுத்தி ஊக்குவிப் பதற்கும், சுற்றாடல் மற்றும் உள்ளூர் வாழ்வா தாரங்கள் ஆகியவற்றின் மீதான சுற்றுலாத் துறையின் நீண்டகாலத் தாக்கத்தைக் கண்காணிப்பதற்குமாகக் காணப்படுகின்ற பொறிமுறைகள் பற்றியும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the steps being taken to identify and promote ecological, historical and cultural attractions in Jaffna and the other districts of the Northern Province; and

(ii) whether region-specific plans exist to integrate this area into the tourism strategy while safeguarding local culture, communities and ecosystems?

(b) Will he also inform this House -

(i) the measures being taken to improve access to local eco-tourism sites;

(ii) whether the Ministry has partnered with stakeholders to upgrade accommodations and amenities;

(iii) the measures being taken to train and employ local communities, particularly youth and women;

(iv) whether a comprehensive ecotourism policy with environmental safeguards is being considered for post-conflict districts of the Northern Province; and

(v) the mechanisms for marketing Jaffna globally and domestically, and for monitoring tourism's long-term impacts on the environment and local livelihoods?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)

(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

Hon. Deputy Speaker, on behalf of the Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism, I answer the Question.

(a) (i) The Ministry has commenced planning Sri Lanka's "Global Destination Communication Campaign" by obtaining

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

consultancy services under a World Bank-supported project. Under this initiative, plans are underway to develop and strengthen "Brand Sri Lanka", implement provincial-level tourism branding for the nine provinces and carry out destination-specific branding for unique tourism products.

These distinctive tourism products include agro-tourism, coastal and marine tourism, sports tourism, culinary tourism, adventure tourism, meditation and spiritual tourism, wellness and Ayurveda tourism, nature and biodiversity tourism, wildlife tourism and culture and heritage tourism. This Global Destination Communication Campaign is intended to be implemented as a five-year global promotion campaign under the Sri Lanka Tourism Promotion Bureau.

(ii) Yes.

The Northern Province Tourism Development Plan considers the tourism potential, infrastructure requirements, development opportunities and the safeguarding of the ecosystem within each district. Furthermore, emphasis is placed on protecting local culture and ecosystems as well as ensuring the participation of local communities and protecting their aspirations. Therefore, this plan provides the strategic guidance necessary to prioritize and implement tourism development projects across the Northern Province.

The Sri Lanka Tourism Development Authority has selected the Kokkilai-Puliyamunai Village in the Northern Province as a "Vibrant Sustainable Tourism Village." This initiative will provide support for community-based organizations, small-scale infrastructure development, livelihood and skill-building programmes, local heritage, tourism products and authentic tourism experiences.

(b) (i) The Ministry incurred an expenditure of Rs. 424 million on 46 projects in 2025 and has allocated Rs. 930 million for 2026 for the development of the tourism sector, including the improvement of access to local ecotourism sites. Accordingly, the details regarding the development projects aimed at improving access to ecotourism sites in the Northern Province implemented in 2025 and scheduled for implementation in 2026 through District Secretariats and local government institutions are submitted in the Annex below.

ඇමුණුම - I

දේශීය පාරිසරික සංචාරක ස්ථාන වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා 2025 – 2026 අයවැය ප්‍රතිපාදන මත යාපනය දිස්ත්‍රික්කයේ සහ උතුරු පළාතේ සංචාරක ක්ෂේත්‍රයට අදාලව ප්‍රතිපාදන නිදහස් කර ඇත.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | නිදහස් කරන ලද ප්‍රතිපාදනය (රු.) |
|---|---|---|
| 2025 | | |
| 01 | කොක්කිලායි, පුලියමුනායි කලපුවේ නානකාමර පහසුකම් සහිත රැඳී සිටීමේ ස්ථානයක් ඉදිකිරීම | 9,903,128.85 |
| 2026 | | |
| 01 | වන්නෙරිකුලම් පරිශ්‍රයට පිවිසෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 9,385,151.89 |
| 02 | වන්නෙරිකුලම්හි ඇවිදින මංතීරු, නාන ස්ථාන ඉදිකිරීම සහ පස් පිරවීමේ කටයුතු | 2,639,539.79 |
| 03 | කැසුරිනා (Casuarina) වෙරළේ අභ්‍යන්තර මංතීරුවක් ඉදිකිරීම | 8,786,745.24 |
| 04 | නිලාවරෙයිහි (Nilavarai) සෞඛ්‍යාරක්ෂිත පහසුකම්, විවේක ස්ථාන, ඇවිදින මංතීරු, වාණිජ කුටි සංවර්ධනය කිරීම සහ භූමි අලංකරණ කටයුතු | 24,907,908.59 |
| 05 | චැටි (Chatty) වෙරළ තීරයේ යටිතල පහසුකම් නැංවීම (පිවිසුම් මාර්ගය ඇතුළුව) | 14,563,412.42 |
| 06 | කයිට්ස් (Kayts) ජැටියෙහි ගල් ඇල්ලූ වෙරළ තීරයක් සකස් කිරීම, භූමි අලංකරණය සහ පැළ සිටුවීමේ කටයුතු (පිවිසුම් මාර්ගය ඇතුළුව) | 1,038,360.71 |

(ii) The Sri Lanka Tourism Development Authority facilitates tourism investors by providing information and guidance on legal and regulatory requirements and by coordinating with relevant State agencies. Furthermore, the Authority collaborates with industry stakeholders and State agencies to raise awareness among tourism service providers regarding the standards and quality requirements necessary for establishing, registering and operating tourism enterprises while also offering them technical guidance and support.

Furthermore, under the Clean Sri Lanka Programme, the Presidential Secretariat has held meetings with relevant tourism sector entities and State agencies for upgrading accommodation and amenities, and ten "Tourism Facility Centres" have been identified so far.

Accordingly, the Sri Lanka Tourism Development Authority has agreed to establish five such centres and a letter has been sent to the Vavuniya District Secretary seeking a suitable location in the Vavuniya District representing the Northern Province.

(iii) The nine hotel schools established by the Sri Lanka Institute of Tourism and Hotel Management covering all nine provinces channel over 6,000 trained young men and women into the hospitality and tourism sectors annually. Accordingly, the Northern Province Hotel School, which is located in the Jaffna District, channels more than 100 trained young men and women into the hospitality sector each year.

Furthermore, the Sri Lanka Institute of Tourism and Hotel Management has been conducting a three-month "Hotel Multitasker Course" from the year 2025 for

the children of unemployed Samurdhi beneficiary families across the Island under the scheme of "*Sathkaraye Shramasena*" in collaboration with the Department of Samurdhi and private hotel schools.

Under this initiative, 102 youths from the Jaffna District and 100 from the Kilinochchi District were trained and employed in 2025, and the programme is continuing into 2026. In addition, discussions are underway with the District Secretariat of the Mullaitivu District to conduct this course in the Mullaitivu District as well. The course will commence once the necessary arrangements have been finalized.

(iv) The National Tourism Policy incorporates measures for environmental protection and sustainable tourism development, particularly under its second main policy theme. Accordingly, measures have been proposed to minimize environmental damage in ecologically sensitive areas, including the assessment of their carrying capacity and the introduction of appropriate environmental control mechanisms.

Furthermore, the policy includes provisions for adhering to sustainable standards when developing new tourism infrastructure; these measures encompass the promotion of renewable energy use, effective waste and wastewater management and the minimization or elimination of single-use plastics.

(v) As stated in the Answer to (a)(i), plans are currently being formulated by obtaining consultancy services with the assistance of the World Bank for the five-year Global Destination Communication Campaign implemented by the Sri Lanka Tourism Promotion Bureau - SLTPB. The primary objective of this initiative is to develop and strengthen the "Brand Sri Lanka" and to establish regional branding for the nine provinces. In this process, the aim is to implement destination-specific branding for specialized tourism products, including those related to agriculture, coastal and marine sports, cuisine, adventure, meditation, wellness, nature, wildlife as well as culture and heritage.

In addition to this, arrangements have been made to host special cultural and culinary festivals to promote the unique culture, traditions, arts, cuisine and historical heritage of the Northern Province and Jaffna.

Furthermore, efforts are being made to successfully showcase the tourism attractions of the Northern Province, including Jaffna, to the global tourism market through national and international public relations and digital promotion programmes which benefit all districts of the Island as well as through the engagement of media, tourism influencers, and content creators.

(c) Not relevant.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Rajeevan Jeyachandramoorthy, you can ask your first Supplementary Question.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

Hon. Deputy Speaker, my first Supplementary Question is, while developing historically and culturally significant sites in the Northern Province as tourist destinations, it is equally important to ensure adequate basic health and sanitary facilities for both local and foreign visitors. In particular, concerns have been raised by the public regarding lack of adequate, clean and properly maintained toilet facilities at several tourist sites.

Therefore, will the Ministry implement a dedicated programme to provide modern, clean and accessible toilet and sanitary facilities at major tourist destinations in the Northern Province? If so, could the Deputy Minister specify the financial allocations and timeframe for providing such facilities at the identified tourist destinations?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

Sir, yes, we admit that the sanitary facilities are inadequate and are not up to the standard at some of the tourist sites. Therefore, through our Ministry as well as through other Ministries and programmes like Clean Sri Lanka, we are investing to improve such facilities. Specifically, the Hon. President has assured that from next year onwards, all these funding allocations will be directly linked to the tourism subcommittees of the District Coordinating Committees.

So, from next year onwards, the district subcommittees on tourism could directly identify places where such facilities are necessary and invest on those projects with funding from the annual Budget.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Rajeevan, you may ask the second Supplementary Question.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

Sir, my second Supplementary Question is, as our country expects a significant increase in the tourist arrivals in the coming years, what specific arrangements

[ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා]

has the Ministry made to ensure that a substantial share of those tourists would visit the five districts in the Northern Province?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

Sir, actually, the North and the East have been the key focus for tourism development projects specifically funded by the ADB and the World Bank, and the World Bank has agreed to fund US Dollars 100 million for tourism development in the northern region. There is a development project approved by the BoI right now, a cruise service from Colombo to the North. Very soon, it will be started. We hope that there would be a significant tourist traffic from the South to the North once the cruise service is started. Also, the British High Commission has agreed to implement several projects in the Mannar District. Then, the Delft Island has been identified to be developed as a carbon-neutral tourist destination and some funding agencies have agreed to fund that. So, there are a number of development projects in the pipeline as well as the Global Destination Communication Campaign. We hope that, in the coming years, a significant tourist traffic from the South would lead towards the North.

## කඩොලාන වනාන්තර: පුත්තලම දිස්ත්‍රික්කය
### கண்டல் நிலக்காடுகள்: புத்தளம் மாவட்டம்
### MANGROVE FORESTS: PUTTALAM DISTRICT

1338/2025

**5. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි කඩොලාන වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(ii) එම කඩොලාන වනාන්තරවල නම් කවරේද;

(iii) එම කඩොලාන වනාන්තර අතරින් මේ වනවිට රක්ෂිත බවට පත් කර ඇති වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(iv) එම වනාන්තරවල නම් කවරේද;

(v) විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශ වීමේ තර්ජනයට ලක්ව ඇති කඩොලාන වනාන්තර සංඛ්‍යාව කොපමණද;

(vi) එලෙස තර්ජනයට ලක්ව ඇති කඩොලාන වනාන්තරවල නම් කවරේද;

(vii) කඩොලාන පරිසර පද්ධතිය අනාගත පරම්පරාව උදෙසා ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தில் அமைந்துள்ள கண்டல் நிலக்காடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி கண்டல் நிலக்காடுகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி கண்டல் நிலக்காடுகளுள் இதுவரையில் ஒதுக்கக் காடுகளாகப் பிரகடனப்படுத்தப் பட்டுள்ள காடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி காடுகளின் பெயர்கள் யாவை என்பதையும்;

(v) பல்வேறு செயற்பாடுகளின் காரணமாக அழிந்துபோகும் அச்சுறுத்தலுக்கு உள்ளாகி யுள்ள கண்டல் நிலக்காடுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) அவ்வாறு அச்சுறுத்தலுக்கு உள்ளாகியுள்ள கண்டல் நிலக்காடுகளின் பெயர்கள் யாவை என்பதையும்;

(vii) கண்டல் நிலச் சூழற்றொகுதியை எதிர்காலச் சந்ததியினருக்காகப் பாதுகாப்பதற்கு மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House the -

(i) number of mangrove forests located in the Puttalam District;

(ii) names of the said mangrove forests;

(iii) number of such mangrove forests which have been declared as forest reserves;

(iv) names of the said forest reserves;

(v) number of mangrove forests that are endangered due to various activities;

(vi) names of such endangered mangrove forests; and

(vii) measures that will be taken to protect the mangrove ecosystem for future generations?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 65කි.

| අනු අංකය | අධවිය | කඩොලාන වනාන්තර සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පුත්තලම | 38 |
| 2 | හලාවත | 26 |
| 3 | ආනවිලුන්දාව | 01 |
| | එකතුව | 65 |

(ii) කඩොලාන වනාන්තරවල නම් පහත දැක්වේ.

| අනු අංකය | අධවිය | කඩොලාන වනාන්තරයේ නම |
|---|---|---|
| 1 | පුත්තලම | ආනවිලුන්දාව |
| 2 | පුත්තලම | සේරක්කුලිය කඩොලාන වනාන්තරය |
| 3 | පුත්තලම | කරතිවු කඩොලාන වනාන්තරය |
| 4 | පුත්තලම | තිරික්කපල්ලම කඩොලාන වනාන්තරය |
| 5 | පුත්තලම | පුබුදූගම කඩොලාන වනාන්තරය |
| 6 | පුත්තලම | ඔඩයාපිටිය කඩොලාන වනාන්තරය |
| 7 | පුත්තලම | සේගුවන්තීවු කඩොලාන වනාන්තරය |
| 8 | පුත්තලම | අම්බන්වෙලි කඩොලාන වනාන්තරය |
| 9 | පුත්තලම | තිල්අඩිය කඩොලාන වනාන්තරය |
| 10 | පුත්තලම | කට්ටකඩුව කඩොලාන වනාන්තරය |
| 11 | පුත්තලම | මදුරන්කුලිය කඩොලාන වනාන්තරය |
| 12 | පුත්තලම | මුන්දලම කඩොලාන වනාන්තරය |
| 13 | පුත්තලම | කඩයාමට්ටමේ කඩොලාන වනාන්තරය |
| 14 | පුත්තලම | උඩප්පුව වනාන්තරය |
| 15 | පුත්තලම | පාරුතොටුපල වත්ත සංරක්ෂිතය |
| 16 | පුත්තලම | කුරින්තංපිටිය සංරක්ෂිතය |
| 17 | පුත්තලම | උස්ලන්තිවු සංරක්ෂිතය |
| 18 | පුත්තලම | තිගලි සංරක්ෂිතය |
| 19 | පුත්තලම | සේතපොළ සංරක්ෂිතය |
| 20 | පුත්තලම | දළුව 1 රක්ෂිතය |
| 21 | පුත්තලම | නවක්කඩුව රක්ෂිතය |
| 22 | පුත්තලම | තිල්ලකැලේ රක්ෂිතය |
| 23 | පුත්තලම | කන්දකුලිය රක්ෂිතය |
| 24 | පුත්තලම | කරඹ රක්ෂිතය |
| 25 | පුත්තලම | කුඩාව රක්ෂිතය |
| 26 | පුත්තලම | මඩ්ඩලකුඩාව රක්ෂිතය |
| 27 | පුත්තලම | මුදලපාලිය රක්ෂිතය |
| 28 | පුත්තලම | සම්මට්ටියාඩිය රක්ෂිතය |
| 29 | පුත්තලම | තිල්අඩිය රක්ෂිතය |
| 30 | පුත්තලම | කරඹ රජයේ කැළය |
| 31 | පුත්තලම | හෙට්ටි කණුඩල්පාය රජයේ කැළය |
| 32 | පුත්තලම | ඊත්තාලේ රජයේ කැළය |
| 33 | පුත්තලම | ඊත්තාලේ 1 රජයේ කැළය |
| 34 | පුත්තලම | උස්සන්තිවු රජයේ කැළය |
| 35 | පුත්තලම | උස්සන්තිවු 1 රජයේ කැළය |
| 36 | පුත්තලම | අනවාසල් රජයේ කැළය |
| 37 | පුත්තලම | පාරුවාඩිය රජයේ කැළය |
| 38 | පුත්තලම | කුරින්ණංපිටිය උතුර රජයේ කැළය |
| 39 | පුත්තලම | පාලකුඩාව රජයේ කැළය |
| 40 | හලාවත | පම්බල රක්ෂිතය (කඩොලාන) |
| 41 | හලාවත | ඉරණවිල සංරක්ෂිතය (කඩොලාන) |
| 42 | හලාවත | මට්ටකොටුව සංරක්ෂිතය (කඩොලාන) |
| 43 | හලාවත | නෙරිය (කඩොලාන) |
| 44 | හලාවත | ඔල්ලුකුඩා (කඩොලාන) |
| 45 | හලාවත | පොල්ඇළ දූපත සංරක්ෂිතය (කඩොලාන) |
| 46 | හලාවත | තක්කාලකුඩිය සංරක්ෂිතය (කඩොලාන) |
| 47 | හලාවත | දූපත් දෙක සංරක්ෂිතය ( කඩොලාන) |
| 48 | හලාවත | කුරුළු දූපත සංරක්ෂිතය (කඩලොන) |
| 49 | හලාවත | තලාප සංරක්ෂිතය |
| 50 | හලාවත | කිරල දූපත සංරක්ෂිතය ( කඩොලාන) |
| 51 | හලාවත | අඹකදවිල රක්ෂිතය (කඩොලාන) |
| 52 | හලාවත | කරුක්කපනේ (කඩොලාන) රක්ෂිතය |
| 53 | හලාවත | මුතුපංතිය (කඩොලාන) රක්ෂිතය |
| 54 | හලාවත | නගුල්එළිය (කඩොලාන) රක්ෂිතය |
| 55 | හලාවත | මුරවල කඩොලාන රක්ෂිත වනාන්තරය |
| 56 | හලාවත | මැරවල 01 කඩොලාන රක්ෂිතය වනාන්තරය |
| 57 | හලාවත | මැරවල 02 කඩොලාන රක්ෂිතය වනාන්තරය |
| 58 | හලාවත | මැරවල 03 කඩොලාන රක්ෂිතය වනාන්තරය |
| 59 | හලාවත | වවුල්කැලේ කඩොලාන රක්ෂිතය වනාන්තරය |
| 60 | හලාවත | කුසල කඩොලාන රක්ෂිතය වනාන්තරය |
| 61 | හලාවත | කරුක්කපනේ බී කඩොලාන රක්ෂිතය වනාන්තරය |
| 62 | හලාවත | කුම්බුට්කුලියාව 1 |
| 63 | හලාවත | කුම්බුට්කුලියාව 2 |
| 64 | හලාවත | කුම්බුට්කුලියාව 3 |
| 65 | හලාවත | පම්බල සංරක්ෂිතය (කඩොලාන) |

(iii) 43කි.

| අනු අංකය | අධවිය | රක්ෂිත වනාන්තර බවට පත් කර ඇති කඩොලාන වනාන්තර සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පුත්තලම | 20 |
| 02 | හලාවත | 23 |
| | එකතුව | 43 |

(iv) කඩොලාන වනාන්තර අතරින් මේ වනවිට රක්ෂිත බවට පත් කර ඇති වනාන්තරවල නම් පහත දැක්වේ.

| අනු අංකය | අධවිය | රක්ෂිත වනාන්තර බවට පත් කර ඇති කඩොලාන වනාන්තරවල නම |
|---|---|---|
| 1 | පුත්තලම | ආනවිලුන්දාව |
| 2 | පුත්තලම | කට්ටකඩුව මංගළිය රක්ෂිතය |
| 3 | පුත්තලම | මදුරන්කුලිය කඩොලාන රක්ෂිතය |
| 4 | පුත්තලම | මුන්දලම කඩොලාන රක්ෂිතය |
| 5 | පුත්තලම | කඩයාමට්ටේ කඩොලාන රක්ෂිතය |
| 6 | පුත්තලම | පාරුතොටුපොල වත්ත සංරක්ෂිතය |
| 7 | පුත්තලම | කුරිඤ්ඤාඤ්පිටිය සංරක්ෂිතය |
| 8 | පුත්තලම | උස්ලන්තිව් සංරක්ෂිතය |
| 9 | පුත්තලම | තිගලි සංරක්ෂිතය |
| 10 | පුත්තලම | සේතපොල රක්ෂිතය |
| 11 | පුත්තලම | දළුව 1 රක්ෂිතය |
| 12 | පුත්තලම | නවක්කඩුව රක්ෂිතය |
| 13 | පුත්තලම | තිල්ලකැලේ රක්ෂිතය |
| 14 | පුත්තලම | කන්දකුලිය රක්ෂිතය |
| 15 | පුත්තලම | කරඹේ රක්ෂිතය |
| 16 | පුත්තලම | කුඩාව රක්ෂිතය |
| 17 | පුත්තලම | මණ්ඩල්කුඩාව රක්ෂිතය |
| 18 | පුත්තලම | මුදලපාලිය රක්ෂිතය |
| 19 | පුත්තලම | සම්මටට්වාඩිය රක්ෂිතය |
| 20 | පුත්තලම | තිල්ලඅඩිය රක්ෂිතය |
| 21 | හලාවත | පම්බල රක්ෂිතය (කඩොලාන) |
| 22 | හලාවත | පම්බල සංරක්ෂිතය (කඩොලාන) |
| 23 | හලාවත | ඉරණවිල සංරක්ෂිතය (කඩොලාන) |
| 24 | හලාවත | මට්ටකොටුව සංරක්ෂිතය (කඩොලාන) |
| 25 | හලාවත | නෙරිය (කඩොලාන) |
| 26 | හලාවත | ඔල්ලුකුඩා (කඩොලාන) |
| 27 | හලාවත | පොල් ඇළ දූපත සංරක්ෂිතය (කඩොලාන) |
| 28 | හලාවත | තත්කාලකුඩිය සංරක්ෂිතය (කඩොලාන) |
| 29 | හලාවත | දූපත් දෙක සංරක්ෂිතය (කඩොලාන) |
| 30 | හලාවත | කුරුළු දූපත සංරක්ෂිතය (කඩොලාන) |
| 31 | හලාවත | කිරල දූපත සංරක්ෂිතය (කඩොලාන) |
| 32 | හලාවත | තලාව රක්ෂිතය (කඩොලාන) |
| 33 | හලාවත | අඹකදවිල රක්ෂිතය (කඩොලාන) |
| 34 | හලාවත | කරුක්කපනේ (කඩොලාන) රක්ෂිත |
| 35 | හලාවත | මුතුපංතිය (කඩොලාන) රක්ෂිත |
| 36 | හලාවත | නගුල්එළිය (කඩොලාන)රක්ෂිත |
| 37 | හලාවත | මැරවල කඩොලාන රක්ෂිත වනාන්තරය |
| 38 | හලාවත | මැරවල 01 කඩොලාන රක්ෂිත වනාන්තරය |
| 39 | හලාවත | මැරවල 02 කඩොලාන රක්ෂිත වනාන්තරය |
| 40 | හලාවත | මැරවල 03 කඩොලාන රක්ෂිත වනාන්තරය |
| 41 | හලාවත | වවුල්කැලේ කඩොලාන රක්ෂිත වනාන්තරය |
| 42 | හලාවත | කුසල කඩොලාන රක්ෂිත වනාන්තරය |
| 43 | හලාවත | කරුකපනේ බී කඩොලාන රක්ෂිත වනාන්තරය |

(v) 17කි.

| අනු අංකය | අධවිය | විනාශ වීමේ තර්ජනයට පත්ව ඇති කඩොලාන වනාන්තර සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පුත්තලම | 03 |
| 02 | හලාවත | 14 |
| | එකතුව | 17 |

(vi)

| අනු අංකය | අධවිය | විනාශ වීමේ තර්ජනයට පත් වී ඇති කඩොලාන වනාන්තරවල නම |
|---|---|---|
| 1 | පුත්තලම | සේගුවන්තිව් සංරක්ෂිත වනාන්තරය |
| 2 | පුත්තලම | අම්බලන්වෙලි සංරක්ෂිත වනාන්තරය |
| 3 | හලාවත | පම්බල රක්ෂිතය (කඩොලාන) |
| 4 | හලාවත | පම්බල සංරක්ෂිතය (කඩොලාන) |
| 5 | හලාවත | ඉරණවිල සංරක්ෂිතය (කඩොලාන) |
| 6 | හලාවත | මට්ටකොටුව සංරක්ෂිතය (කඩොලාන) |

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා ]

| | | |
|---|---|---|
| 7 | හලාවත | නෙරිය (කඩොලාන) |
| 8 | හලාවත | තලාව රක්ෂිතය (කඩොලාන) |
| 9 | හලාවත | අඹකඳවිල රක්ෂිතය (කඩොලාන) |
| 10 | හලාවත | කරුක්කපනේ (කඩොලාන) රක්ෂිත |
| 11 | හලාවත | මුතුපංතිය (කඩොලාන) රක්ෂිත |
| 12 | හලාවත | නගුල්එළිය (කඩොලාන) රක්ෂිත |
| 13 | හලාවත | කරුකපනේ බී කඩොලාන රක්ෂිත වනාන්තරය |
| 14 | හලාවත | කුම්බුටුකුලියාව 1 |
| 15 | හලාවත | කුම්බුටුකුලියාව 2 |
| 16 | හලාවත | කුම්බුටුකුලියාව 3 |

(vii) ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් ගනු ලබනවා. ප්‍රධාන වශයෙන්ම මේ කඩොලාන පරිසර පද්ධති රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කරනවා. 2024 වසර වනකොට අපේ රටේ කඩොලාන වනාන්තර රක්ෂිත 121ක් ප්‍රකාශයට පත් කරලා තිබුණා. ජාතික ජන බලවේගය රජය පත් වුණාට පසුව 2025 - 2026 වසරවලදී මෙම රක්ෂිතවලට තවත් කඩොලාන වනාන්තර රක්ෂිත 20ක් එකතු වුණා. ඒ අනුව දැනට කඩොලාන රක්ෂිත 141ක් අපේ රටේ රක්ෂිත හැටියට ප්‍රකාශයට පත් කර තිබෙනවා. මේ තුළ හෙක්ටෙයාර 20,664.51ක් තිබෙනවා. මේ රජය බලයට පත් වුණාට පසුව පමණක් අපි මේ වසර දෙක තුළ හෙක්ටෙයාර 460.51ක රක්ෂිත ප්‍රමාණයක් කඩොලාන රක්ෂිත හැටියට ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඊට අමතරව මේ කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා රක්ෂිත විනාශ කරන්නන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම වාගේම හායනයට පත්ව ඇති කඩොලාන වනාන්තර රක්ෂිත ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහාත් විශේෂ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. මේ වැඩසටහන් රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය යන දෙඅංශයම එකතු වෙලා සිදු කරනවා.

මේ වනවිට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින්, හායනයට පත් වී ඇති කඩොලාන භූමි ප්‍රමාණය හඳුනාගෙන ඇති අතර ඒ අනුව පුත්තලම දිස්ත්‍රික්කයේ පුබුදුගම හෙක්ටෙයාර 12ට වැඩියෙන් හායනයට පත් වී ඇති භූමියක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින්ද, ආනවිලුන්දාව ආශ්‍රිත කඩොලාන පරිසර පද්ධතිය හායනයට ලක් වී ඇති ප්‍රදේශයක කඩොලාන ප්‍රතිෂ්ඨාපන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පෞද්ගලික ආයතනද සහභාගිත්වයෙන් සිදු කෙරෙනවා. 2020 වසරේදී හෙක්ටෙයාර 217.6ක්, 2021 වසරේදී හෙක්ටෙයාර 111.1ක් සහ 2022 වසරේදී හෙක්ටෙයාර 100ක් වශයෙන් දැනටමත් විනාශ වෙලා තිබෙන කඩොලාන පරිසර පද්ධතිය ප්‍රතිෂ්ඨාපනය කර තිබෙනවා.

ඊට අමතරව ශ්‍රී ලංකාවේ කඩොලාන සංරක්ෂණය සහ තිරසර භාවිතය සඳහා වන ජාතික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම හඳුන්වා දීලා තිබෙනවා. ඒක ක්‍රියාත්මක කරනවා. ඊට අමතරව ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රක්ෂිත සහ කඩොලාන පරිසර පද්ධතිවල තිබෙන වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කරමින් ඒවා ආරක්ෂා කරගැනීම සඳහා ජනතා සහාය ලබා ගනිමින් කටයුතු කරනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Hector Appuhamy, you may ask your first Supplementary Question.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, කඩොලාන කියන්නේ ඇත්තටම මේ රටේ පරිසරය ආරක්ෂා කරන්න තිබෙන ඉතාම වැදගත් ශාකයක්. මේ රටේ ජීවත් වන ජනතාවට විතරක් නොවෙයි, බොහෝ වෙලාවට ජීවීන්ටත් මේ කඩොලාන පරිසර පද්ධතිය තුළින් ඉතා වැදගත් සේවයක් ලැබෙනවා. ඔබතුමා කිව්වා, විනාශ කරපු කඩොලාන නැවත ආරක්ෂා කරන්න - සංරක්ෂණය කරන්න - අවශ්‍ය වැඩ පිළිවෙළ ගැන. ඒ වාගේම එක එක අවුරුදුවල ඒවා විනාශ වෙච්ච විධියත්, ඒවා සංරක්ෂණය කරන්න තෝරා ගත් විධියත්, කඩොලාන හැටියට හඳුනා ගත් ප්‍රදේශ සහ වනාන්තර හැටියට නම් කරපු ප්‍රදේශ පිළිබඳවත් සංඛ්‍යාලේඛන ඔබතුමා ලබා දුන්නා. ඒ වෙනුවෙන් ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

පුත්තලම දිස්ත්‍රික්කයේ මාදම්පේ, ගලහිටියාව ප්‍රදේශයේ ඉස්සන් වගා කිරීම සඳහා කඩොලාන සම්පූර්ණයෙන්ම විනාශ කරමින් තිබෙනවා කියන එක මේ වෙලාව වනවිට පරිසර අමාත්‍යවරයා හැටියට ඔබතුමා දන්නවාද? ඊළඟට, පුත්තලම දිස්ත්‍රික්කයේ, කාක්කපල්ලිය ප්‍රදේශයේ - හලාවත කාක්කපල්ලියේ - හෝටලයක් ඉදිකිරීම සඳහා කඩොලාන විනාශ කරමින් සිටිනවා. මම අහනවා ඔබතුමාගෙන්, කඩොලාන විනාශ කරන මේ ස්ථාන කඩොලාන පද්ධතියක් හැටියට හඳුනාගෙන තිබෙනවාද, මේවා ඊට පෙර විනාශ කර තිබෙනවා නම් ඒවා ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් හදලා තිබෙනවාද, එහෙම නැත්නම් වනාන්තරයක් හැටියට හඳුන්වා දී තිබෙනවාද, නැත්නම් තෙත් බිමක් ලෙස හඳුන්වා දී තිබෙනවාද කියලා. මේ සිද්ධි දෙක සම්බන්ධයෙන් මේ වෙනකොට ආණ්ඩුව, විශේෂයෙන්ම අමාත්‍යාංශය හැටියට ඔබතුමන්ලා අරගෙන තිබෙන පියවර මොනවාද කියන එකත් දැනගන්න කැමැතියි. කරුණාකර එම කාරණා මේ සභාවට ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු නිශ්චිත සිද්ධි දෙක සම්බන්ධයෙන් මම සොයා බලා කටයුතු කරන්නම්. ගරු මන්ත්‍රීතුමාට මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. අපේ රටේ කිසියම් වන විනාශයක් සිදු වෙනවා නම්, අන්න ඒ වන විනාශය සිදු වූ වහාම, එය සිදුවන මොහොතේදීම දැනුවත් කිරීම සඳහා පරිසර අමාත්‍යාංශයත්, ආරක්ෂක අමාත්‍යාංශයත් සම්බන්ධ කරමින් "වන සුරැකුම" කියලා ඒකකයක් හඳුන්වා දී තිබෙනවා. අපි ඒ සඳහා

හදිසි දුරකථන අංකයක් ලබා දී තිබෙනවා, "1995" ලෙස. කිසියම් වන විනාශයක් සිදු වෙනවා නම්, ඒ මොහොතේදීම හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට පුළුවන් වහාම ඒ ගැන දැනුවත් කරලා ඒ වන විනාශය නැවැත්වීම සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම සිදු කරන්න. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කරුණු දැක්වීමෙන් පසුව එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, could you wait for his complete answer?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
තව අතුරු ප්‍රශ්නයක් අහන්න ඔබතුමාට අවස්ථාව තිබෙනවා. ඒ අවස්ථාවේදී ඔබතුමාට කරුණු දක්වන්න පුළුවන්. මගේ පිළිතුරට බාධා නොකර සිටියා නම් හොඳයි. අපි මේක දේශපාලන භාවිතයක් කරගන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* මේවා දේශපාලන වුවමනාවන්ට පාවිච්චි කරන්නේ නැතිව, කෙනෙකුට සැබෑ ලෙසම මේ පරිසර පද්ධතීන් ආරක්ෂා කරගන්න වුවමනාව තිබෙනවා නම්, අන්න ඒ සඳහා අවස්ථාව සකස් කර තිබෙනවා.

මේ නිශ්චිත කාරණා දෙක සම්බන්ධයෙන් මම නිශ්චිතව සොයා බලා දැනුවත් කරන්නම්. *[බාධා කිරීමක්]* නමුත් කිසියම් වුවමනාවක් තිබෙනවා නම් කෙනෙකුට, කෙනෙක් පරිසරයට ආදරය කරනවා නම්, විශේෂයෙන්ම කඩොලාන පරිසර පද්ධතියට ආදරය කරනවා නම්, ඒ පරිසර විනාශය සිදුවන මොහොතේදීම "1995" දුරකථන අංකයට දැනුම් දුන්නොත්, ත්‍රිවිධ හමුදාව, පොලිස් විශේෂ කාර්ය බලකාය, ඒ වාගේම වන සංරක්ෂණ හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු මැදිහත්වෙලා ඒවා නවත්වන්න කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Hector Appuhamy, you may ask your second Supplementary Question, please.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අසාධාරණයක් නම් කරන්න එපා. මේ අහන්න යන්නේ මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය නොවෙයි. මොකද, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට ඇමතිතුමා පිළිතුරු දුන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you may ask your second Supplementary Question along with that.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මෙතුමා නිකම් ස්වාමීන් වහන්සේ නමක් බණක් කියන විදියට බණක් තමයි කිව්වේ. ඒක වැඩක් නැහැ අපට. මම ඇහුවේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිශ්චිත-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leader of the House.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව, මන්ත්‍රීවරයාට ප්‍රශ්න අහන්නත් පුළුවන්; ඇමතිවරයාට උත්තර දෙන්නත් පුළුවන්. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඇමතිවරයාගේ උත්තරය භාර ගන්නත් පුළුවන්; භාර නොගන්නත් පුළුවන්. ගරු ඇමතිවරයෙක් සූදානම් වෙලා ඇවිල්ලා උත්තරය දෙනකොට ඒක අහගෙන ඉන්න නිහතමානීකමක් නැත්නම්, ඒක ඔබතුමාගේ ප්‍රශ්නයක්. අපි කාටවත් විශේෂ බලයක් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ මේ ප්‍රශ්නය දෙවැනි අතුරු ප්‍රශ්නය ලෙස සලකන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Hector Appuhamy, you may ask your second Supplementary Question.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
හොඳයි, කමක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අපි ජනතාවගේ ප්‍රශ්න ටික අහන්නේ. ඒවා අහන්න එපාය කියනවා නම්, ඒ අහද්දී ප්‍රශ්නයට උත්තර නොදී වෙන එකක් කියලා, "අපි කියන එක අහගෙන ඉන්න, වෙන මොනවත් අහන්න එපා" කියලා කියනවා නම්, අපි අහන්නේ නැතුව ඉන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඒක නම් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ තත්ත්වය, අපි ඒකට එකඟ වෙන්නම්. මොකද, ඔබතුමන්ලාගේ 159දෙනෙක් ඉන්න නිසා ඔබතුමන්ලාට ඒක කරන්න පුළුවන්. කමක් නැහැ. හැබැයි, ජනතාවගේ ප්‍රශ්න එහෙම යට කරන්න බැරි බව හොඳට මතක තියා ගන්න. ඒක පළමුවෙනි කාරණාව. මොකද, ජනතාවගේ ප්‍රශ්න අපි අහන්නේ.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

මේක දැනට සිදු වෙන එකක්, ගරු ඇමතිතුමනි. දැනටත් කඩොලාන විනාශ කරනවා. ඒකටයි උත්තරයක් ඉල්ලුවේ. හැබැයි, ඇමතිතුමා ඒකට නොවෙයි උත්තර දුන්නේ. එහෙම නැතිව, ඇමතිතුමාට මගේ ගෞරවයක් නැතිව නොවෙයි. ඇමතිතුමාට මගේ ගෞරවය තිබෙනවා, මේ සභාවට ගෞරවය තිබෙනවා, සියලුදෙනාටම ගෞරවය තිබෙනවා. හැබැයි, මම මේ අහන්නේ ඔබතුමන්ලා අහන්න ඕනෑ ප්‍රශ්නයක්. කමක් නැහැ. උත්තරය නැහැ. පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවට කියන්නේ මේකයි. මේ ස්ථාන දෙකෙහි කඩොලාන විනාශ කරනවා. මේ ස්ථාන දෙකෙහි කඩොලාන විනාශ කරන්නේ ඔබතුමන්ලාගේ අය. හරි, උත්තරයක් නැහැ. ඒක අපි පිළිගන්නම්. ඔබතුමන්ලාගේ අය බලෙන් කඩොලාන විනාශ කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සීදූව ප්‍රදේශයේ සිමෙන්ති කර්මාන්තශාලාවක් හදනවා. ඒ කර්මාන්තශාලාව හදන එකට පරිසර බලපත්‍ර වේලාසන දීලා තිබෙනවා. හැබැයි, ඒක සිමෙන්ති හදන තැනක් මිසක් ඇසුරුම් කරන තැනක් නොවෙයි. ඒ නිසා එතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

ඊළඟට, අම්පාරේ ගුවන් හමුදා කඳවුරට අයිති ඉඩමක් තිබෙනවා. ඒක ඇත්තටම අලින්ගේ වාසස්ථානයක්. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් තිබෙනවා, ආණ්ඩුවට අයිති හෝ අයිති නැති යම් තැනක වනජීවීන් රැඳෙනවා නම්, ඒ ස්ථානය වනජීවීන් ආරක්ෂා කරන ස්ථානයක් හැටියට පත් කරනවා කියලා. හැබැයි, එතැන වී මෝලක් හදනවා. ඒකටත් කැලේ කපලා අවශ්‍ය වැඩ කටයුතු ටික කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එල් නිනෝ තත්ත්වයත් එක්ක ලෝකයේ රටවල් ගණනාවකට බරපතළ ප්‍රශ්න තිබෙනවා. නේපාලය සහ ශ්‍රී ලංකාවේ තත්ත්වය සම්බන්ධව තමයි ලෝකයේ හැම තැනකදී හැම සංවිධානයක් එක්කම සාකච්ඡා කරද්දී කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්නයට යොමු වෙන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මම පොදුවේ අහන්නේ මේකයි. මේ රටේ පරිසරය ආරක්ෂා කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ රාශියක් ගන්න තිබෙනවා. විශේෂයෙන්ම අපේ රක්ෂිත වනාන්තරත් එක්ක කඩොලාන වාගේ ශාක ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් විධිමත්ව සකස් කරන්න ඕනෑ.

ඔහොම වචනවලින් කියන්න පුළුවන් වුණාට, ඒක විධිමත්ව කරලා නැහැ. මේ රටේ පරිසරයට අපි අපේ අම්මා තාත්තාට වාගේ, දෙවියන්ට වාගේ සලකන්න ඕනෑ. ඒක ආරක්ෂා කරන්න අවශ්‍ය විධිමත් වැඩ සැලැස්මක් හදලා ඉදිරි කාලය තුළ මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද කියලා මම විශේෂයෙන් අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මොකක් හරි කල්පනාවේ හරි සාමාන්‍ය පියවි සිහියේ හරි අඩුවක් තිබෙනවා කියලා තමයි මට හිතෙන්නේ, මේ වාගේ ප්‍රශ්න අහන කොට. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එහෙම අපහාස කරන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member. - *[Interruption.]*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
පසුගිය වසර දෙක තුළ පරිසර අමාත්‍යාංශය විධියට අපි සැලකිය යුතු පමණින් පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගණනක් අරගෙන තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, I request you to not to make personal insinuations. - *[Interruption.]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member? - *[Interruption.]*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
විශේෂයෙන් අපේ රට තුළ රක්ෂිත 113ක් අපි ප්‍රකාශයට පත් කළා, පසුගිය වසර දෙක තුළ විතරක්. [බාධා කිරීම්] ඒ වාගේම හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමන්ලා ආණ්ඩු කරපු කාලයේ- [බාධා කිරීම්]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will allow one of you to speak. - *[Interruption.]* Yes, Hon. Dayasiri Jayasekara?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම පැහැදිලිව අපේ Standing Ordersවල තිබෙනවා, කිසිම කෙනෙකුට අයුතු ආරෝපිත චෝදනාවක් කරන්න බැහැ කියලා, ඒ, එක. දෙවනුව, 'මොළය හොඳ නැහැ, පිස්සෙක්' වාගේ අදහසක් නේ, ඒ කථාවේ තිබෙන්නේ. සාමාන්‍යයෙන් පිස්සෝ තමයි තවත් කෙනෙකුට පිස්සෝ කියන්නේ. ඒ නිසා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ කථාව කිව්වාම ඒක තවදුරටත්-*[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I have taken note of that, Hon. Dayasiri Jayasekara. - *[Interruption.]*

Hon. Minister, would you please refrain from making such statements? No insults against any Hon. Member of Parliament, please.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට අවමන් කළේ, ගැරහුවේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. මම හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට ඒ අදාළ ගරුත්වය දීලා තමයි පැහැදිලි කිරීම කළේ. මම කිව්වේ, 'පියවි සිහියේ අඩුවක් තිබෙනවා' කියලා. ඒ නිසා හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, ඔබට අවමන් කරපු, ඔබට ගරහපු අන්න ඒ මන්ත්‍රීවරයාට විරුද්ධව කරුණාකර දැන් action එකක් ගන්න කියලා. දැන් action එකක් ගන්න! අපි එහෙම මන්ත්‍රීවරුන්ට ගරහන අය නොවෙයි. ජාතික ජන බලවේගය කියන්නේ සෑම කෙනෙකුටම අදාළ ගරුත්වය දීලා කටයුතු කරන සංවිධානයක්. ඒ නිසා කරුණාකර මේ වෙලාවේ ඔබට ගරහපු මන්ත්‍රීවරයාට එරෙහිව දැන් කටයුතු කරන්න. වරප්‍රසාද ප්‍රශ්නයක් ගෙනෙන්න. වරප්‍රසාද ප්‍රශ්නයක් ගෙනෙන්න, එතුමාට විරුද්ධව.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, please take your seats. - *[Interruption.]*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මගේ නම කිව්වා. මට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තත්ත්පර 30ක කාලයක් දෙන්නම්, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සිංහල ලේ තිබෙන ශ්‍රී ලංකාවේ හොඳ කෙනෙක්. හොඳ ජාතකයක් තිබෙන කෙනෙක්. මතක තියා ගන්න, මට හොඳට කල්පනාව තිබෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, තමුන්නාන්සේ කිව්වේ කල්පනාව නැහැ කියලායි. හැබැයි, තමුන්නාන්සේට උත්තර දෙන්න බැරුව ගියා කල්පනාව හරියට තියාගෙන. මම කල්පනාවෙන් තමයි ප්‍රශ්න ටික ඇහුවේ. මම ඇහුවේ අපේ දිස්ත්‍රික්කයේ අපට ඡන්දය දුන්නු, අපව මෙතැනට ගෙනැල්ලා වාඩි කරපු අය වෙනුවෙන්. ඒක හොඳට මතක තියා ගන්න. අපි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, we are moving on to the next Question. Question No. 06, the Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law.

## රාජ්‍ය විශ්වවිද්‍යාල: නේවාසිකාගාර පහසුකම්
### அரச பல்கலைக்கழகங்கள்: தங்குமிட வசதிகள்
STATE UNIVERSITIES: HOSTEL FACILITIES

1380/2025

**6. ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට ක්‍රියාත්මක රජයේ විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

(iii) විශ්වවිද්‍යාලවල මේ වන විට ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් විශ්වවිද්‍යාලය මඟින් නේවාසික පහසුකම් සපයා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව, සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) නේවාසික පහසුකම් පිළිබඳ උග්‍ර හිඟයක් පවතින විශ්වවිද්‍යාල කවරේද;

[ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය ]

(vi) නේවාසික පහසුකම් පිළිබඳ ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தற்பொழுது இயங்கி வருகின்ற அரச பல்கலைக் கழகங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி பல்கலைக்கழகங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) பல்கலைக்கழகங்களில் தற்பொழுது கற்றல் நடவடிக்கையில் ஈடுபட்டுள்ள மாணவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு பல்கலைக்கழகத்திலும் தங்குமிட வசதிகள் வழங்கப்பட்டுள்ள மாணவர் களின் எண்ணிக்கை, மொத்த மாணவர்களின் எண்ணிக்கையில் சதவீதமாக வெவ்வேறாக யாது என்பதையும்;

(v) தங்குமிட வசதிகள் தொடர்பில் அதிக பற்றாக்குறை நிலவுகின்ற பல்கலைக்கழகங்கள் யாவை என்பதையும்;

(vi) தங்குமிட வசதிகள் தொடர்பான பிரச்சினையைத் தீர்ப்பதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of State universities currently in operation;

(ii) names of those universities;

(iii) number of students currently studying in the universities, separately;

(iv) number of students provided with hostel facilities by each university, separately as a percentage of the total student population;

(v) universities that face a severe shortage of hostel facilities; and

(vi) measures that will be taken to resolve the issue regarding hostel facilities?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් මූලාසනය විධියට Standing Orders අනුව කටයුතු කරන්න බැඳිලා සිටිනවා. ඔබතුමා අතුරු ප්‍රශ්න ඇසීමට තිබෙන අවස්ථාව අනවශ්‍ය ආකාරයට භාවිත කරන්න ඉඩ දීමත් මේ අනවශ්‍ය තත්ත්වය ඇති වීමට හේතුවක් ලෙස බලපෑවා කියන එකයි මගේ අදහස. නිශ්චිත කාල සීමාවක් ඇතුළතදී එක් ප්‍රශ්නයයි අහන්න පුළුවන්. එහෙම නොවුණොත්, විශාල වශයෙන් හැම පැත්තටම විසිරෙනවා ඔය ප්‍රශ්න. ඒ නිසා speeches කරන්න දෙන්නේ නැතිව කරුණාකර අපේ අයිතිවාසිකම් රැකෙන විධියට මේ ගරු සභාව පාලනය කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Prime Minister is to answer the Question raised by the Hon. (Mrs.) Chamindranee Kiriella. - *[Interruption.]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

Sir, I rise to a point of Order. ගරු නියෝජ්‍ය කථානායකතුමා, කථා කරන්න අවස්ථාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Prime Minister, you can answer that Question. - *[Interruption.]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Member has already asked the Question. The Hon. Prime Minister will answer that. Please give ear to the Hon. Prime Minister.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please listen to her. We will come to you later, Hon. Leader of the Opposition. - *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please listen to the Answer. I have already called for the Answer.- *[Interruption.]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Point of Order එකක් නැඟුවාම අවස්ථාව දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Is it with regard to this Question? That matter was settled earlier. - *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order..-.*[Interruption]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.-*[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, I will allow you to raise your points of Order after the Hon. Prime Minister's Answer to that Question.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya )
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මේ වන විට ක්‍රියාත්මක රජයේ විශ්වවිද්‍යාල සංඛ්‍යාව 22කි.

(ii)
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල ඇමුණුම 1 මඟින් දක්වා ඇත.

  මීට අමතරව, පනත් මඟින් ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල 5ක් ඇත. ඒවා පහත සඳහන් පරිදි වේ.
- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
- ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

(iii)

| විශ්වවිද්‍යාලය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල | ඇමුණුම 2 මඟින් දක්වා ඇත. |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 465 |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 551 (දේශීය - 475, විදේශීය - 76) |
| ලංකා සාගර විශ්වවිද්‍යාලය | 1,516 |
| වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | 4,348 |
| ජෙනරල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 8,218 |

(iv)

| විශ්වවිද්‍යාලය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | නේවාසික පහසුකම් සපයා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව | නේවාසික පහසුකම් සපයා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව, සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල | ඇමුණුම 3 මඟින් දක්වා ඇත. | | |
| ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | සියලුම සිසුන් සඳහා නේවාසික පහසුකම් සපයා ඇත. | | |
| ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 551 | 442 | 80% (දේශීය - 79%, විදේශීය - 87%) |
| ලංකා සාගර විශ්වවිද්‍යාලය | 1,516 | 196 | 12.92% |
| වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | 4,348 | 332 | 7.6% (කාන්තාවන් සඳහා පමණි.) |
| ජෙනරල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 8,218 | 406 | 4.94% |

ඇමුණුම් 1, 2 සහ 3 **සභාගත*** කරමි. .

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

(v)
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි සිටින සිසුන් 150,815ක් අතුරින් සිසුන් 63,318දෙනෙකු සඳහා දැනට නේවාසිකාගාර පහසුකම් ලබා දීමේ හැකියාව පවතී. එය සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 42ක් වේ. ඒ අනුව, සියලු විශ්වවිද්‍යාල සඳහා නේවාසිකාගාර පහසුකම් වැඩිදියුණු කළ යුතු වේ.
- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන නේවාසික පහසුකම් ඉල්ලුම් කර ඇති සියලු සිසුන් සඳහා නේවාසික පහසුකම් ලබා දී තිබේ.
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන නේවාසික පහසුකම් ඉල්ලුම් කර ඇති සියලු සිසුන් සඳහාත් නේවාසික පහසුකම් ලබා දී තිබේ.
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයෙහි උග්‍ර නේවාසිකාගාර හිඟයක් පවතී.
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ද නේවාසික පහසුකම්වල උග්‍ර හිඟයක් පවතී.

මා කලින් ද සඳහන් කළ පරිදි, පිරිමි ශිෂ්‍යයන්හට නේවාසික පහසුකම් නොමැත.

(vi) <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි දැනට නව නේවාසිකාගාර 55ක් ඉදි කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, එමඟින් වැඩිපුර සිසුන් 16,000ක් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ. ඒ සඳහා 2026 වර්ෂයේ නව නේවාසිකාගාර ඉදි කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 1,500ක මුදලක් වෙන් කර ඇත. ඒ අතර, 2026 අය වැය ප්‍රතිපාදන යටතේ විශ්වවිද්‍යාල නේවාසිකාගාර ප්‍රතිසංස්කරණ උදෙසා රුපියල් මිලියන 853ක මුදලක් ද වෙන් කර ඇත.

තවද, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල සිසුන් සඳහා සමස්ත නේවාසිකාගාර ප්‍රතිපත්තියක් - මෙතෙක් එවැනි කිසිදු ප්‍රතිපත්තියක් තිබිලා නැහැ - UGC එක විසින් සකස් කරමින් පවතී.

දැනටත් ශිෂ්‍යයන් පෞද්ගලික නේවාසිකාගාරවල ඉන්නවා. පෞද්ගලික නේවාසිකාගාර සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ද එයට ඇතුළත් කරනවා.

මෙම ප්‍රතිපත්තියේ අරමුණ වන්නේ, සියලු ශිෂ්‍යයන්ට සාධාරණ, විනිවිදභාවයෙන් යුතු, ආරක්ෂිත, දැරිය හැකි, ප්‍රවේශ විය හැකි සහ සියලුදෙනා ඇතුළත් වන - inclusive - නේවාසිකාගාර පහසුකම් සැපයීමත්, ඒ සඳහා policy එකක් සකස් කිරීමත් ය.

<u>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය</u>

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අලුත් පරිශ්‍රයකට ගෙන යන්න අපි මේ වනකොට සැලසුම් කර තිබෙනවා. එම සංවර්ධන කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. එම අලුත් පරිශ්‍රය තුළ සිසුන් 1,600කට පමණ නේවාසිකාගාර පහසුකම් සැපයීමට අපි සැලසුම් කර තිබෙනවා.

<u>වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය</u>

විශ්වවිද්‍යාලය සතු භූමියෙන් පර්චස් 80ක පමණ ප්‍රමාණයක් උපයෝගී කර ගනිමින්, පිරිමි සිසුන් 600දෙනෙකු සඳහා නේවාසිකාගාර පහසුකම්, නවීන ඉගැන්වීම් වැඩහල් සහ ආසන 300කින් සමන්විත ආපණ ශාලාවක් ඇතුළත් ඒකාබද්ධ බහුමහල් සංකීර්ණයක් 2027 සිට 2029 දක්වා දේශීය අරමුදල් යටතේ ඉදි කිරීමට යෝජිත ය. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Mrs.) Chamindranee Kiriella, please pose your first Supplementary Question.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අගමැතිතුමියනි, ඔබතුමියගේ උත්තරයේත් සඳහන් වුණු ආකාරයට අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ ඉන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ප්‍රශ්න රාශියක් තිබෙනවා. අපි ඊයේ දැක්කා, අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය ඇතුළු ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශාල සංඛ්‍යාවක් පාරට බැහැලා තිබෙනවා, ඒගොල්ලන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්න කියලා. ඒවායින් කිහිපයක් තමයි ආචාර්යවරුන්ගේ හිඟය, සුබසාධන ගැටලු. ප්‍රධානතම කාරණයක් තමයි, නේවාසිකාගාර ප්‍රශ්නය. ගරු අගමැතිතුමියගේ පිළිතුරට අනුව සමහර විශ්වවිද්‍යාලවල සියයට 7කට තමයි නේවාසිකාගාර පහසුකම් ලබා දීලා තිබෙන්නේ. මේ ආණ්ඩුව බලයට පත් වෙන්නට කලින් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6කට ආසන්න ප්‍රමාණයක් මේ ක්ෂේත්‍රය සඳහා යොදවනවා කිව්වා. විශේෂයෙන්ම ඔබතුමිය ඒ පිළිබඳව විශාල හඬක් නැඟුවා.

ගරු අගමැතිතුමියනි, පේරාදෙණිය විශ්වවිද්‍යාලය ගත්තොත්, මෙවර අය වැයෙන් රුපියල් බිලියන 4ක ප්‍රතිපාදන ඉල්ලා තිබෙනවා. නමුත්, අද වනකොට රුපියල් බිලියන 2.3ක් පමණයි සම්මත වෙලා තිබෙන්නේ, මේ නේවාසිකාගාර ප්‍රශ්නය විසඳන්නට. තව රුපියල් බිලියන 1.7ක් ඉල්ලා තිබෙනවා. මොකද විශේෂයෙන්ම පේරාදෙණිය විශ්වවිද්‍යාලය නේවාසික විශ්වවිද්‍යාලයක් - residential university - වශයෙන් තමයි ස්ථාපිත කරනු ලැබුවේ. එම නිසා මම ඔබතුමියගෙන් ඉල්ලා සිටින්නේ, විශේෂයෙන්ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාර ප්‍රශ්නය විසඳීම සඳහා ඒ ඉල්ලා තිබෙන ප්‍රතිපාදන වැඩි කරලා, ඒ වාගේම අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ තිබෙන නේවාසිකාගාර ප්‍රශ්නය විසඳීම සඳහාත් ප්‍රතිපාදන යොමු කරන්න කියලායි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විස්තර කළේ ඒ ප්‍රශ්න විසඳන්න ගත්ත ක්‍රියාමාර්ගයි. අවුරුදු ගණනාවක් තිස්සේ - පසුගිය අවුරුදු 10ක්, 15ක් තිස්සේ - එකම නේවාසිකාගාරයක්වත් ආරම්භ

කරලා නැහැ. 2015 වසරේ සිට රජය ප්‍රතිපත්තියක් හැටියට තීරණයක් අරගෙන තිබෙනවා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට නේවාසිකාගාර තනන්නේ නැහැ කියලා. ඒක වෙනස් කළේ අපේ ආණ්ඩුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නේවාසිකාගාර තනන්නේ නැහැ කියන ඒ තීරණය ගන්නේ ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණයක් කරලායි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මම ප්‍රශ්නයට උත්තර දුන්නාට පස්සේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ගන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rauff Hakeem, please give ear to the Hon. Prime Minister.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණයකින් විතර වැඩි කරලා තිබෙනවා. එසේ වැඩි කර තිබියදී තමයි ආචාර්යවරුන්ගේ සංඛ්‍යාවත් වැඩි නොකර, නේවාසිකාගාර පහසුකම්ද සපයන්නේ නැතිව කටයුතු කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුව තමයි ඒක වෙනස් කරන්නේ. මම කියපු විධියට අපි නේවාසිකාගාර 55ක් - පේරාදෙණියත් ඇතුළුව අලුත් නේවාසිකාගාර 55ක් - සඳහා අනුමැතිය ලබාගෙන තිබෙනවා. මුල් අවුරුද්දේ අපේ අවධානය දෙන්නේ peripheral universitiesවලට.

මොකද, මේවායේ තමයි බරපතළ ප්‍රශ්නය තිබෙන්නේ. ඒවායේ පුද්ගලික නවාතැන් පහසුකම් ලබා ගන්නත් අතිශය දුෂ්කරයි. මොකද, ඒ ගම්වල, ඒ ප්‍රදේශවල එහෙම නිවාස නැහැ. ඒ ශිෂ්‍යයන්ට accommodation ලබා ගන්න හරිම අමාරුයි. ඒ නිසා අපි peripheral universitiesවලට මුලින් ප්‍රමුඛතාව දීලා established universitiesවලටත් ඇතුළුව තමයි මේ සැලසුම හදාගෙන යන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තිබෙන ඒවා renovate කරන්නත් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ විධියට, එම විශ්වවිද්‍යාලවලට ඒ මුදල් වෙන් කරමින් තමයි අපි යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමිය තවත් කාරණාවක් කිව්වා, සියයට 6ක ප්‍රමාණය පිළිබඳව. අපේ ප්‍රතිපත්තිය තිබෙන්නේ ක්‍රමිකව අපි ඒක වැඩි කරනවා කියන එක. ඒ පොරොන්දුවත් අපි ඉෂ්ට කරමිනුයි ඉන්නේ. මෙතෙක් කල් අධ්‍යාපනයට වෙන් කරපු ඉහළම මුදල 2025දීත්, 2026දීත් වෙන් වෙනවා. මට විශ්වාසයි, 2027දීත් ඒ හා සමානව වෙන් වෙනවා කියලා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Rauff Hakeem?

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමිය අසත්‍ය ප්‍රකාශයක් කළා. මමත් වරක් උසස් අධ්‍යාපන අමාත්‍යවරයෙක් හැටියට හිටියා. අපේ කාලය තුළදී - 2015 සිට 2020 දක්වා - අපි නේවාසිකාගාර විශාල ගණනක් හැම විශ්වවිද්‍යාලයකම, -

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාටත් අයිතියක් තිබෙනවා, ඒ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්න. පසුගිය අවුරුදු ගණන තුළ ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණයකින් වැඩි වෙලා තිබෙනවා. එතකොට ඒ හා සමානව 2015 ඉඳන් නේවාසිකාගාර අවශ්‍ය විධියට හදලා තිබුණා නම්, අද මේ ප්‍රශ්නය මේ විධියට උග්‍ර වෙලා තියෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Chamindranee Kiriella, you may pose your Second Supplementary Question.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම ආචාර්යවරුන්ගේ හිඟයකුත් අද වෙනකොට මේ විශ්වවිද්‍යාලවල තිබෙනවා. ගරු අගමැතිතුමියනි, විශේෂයෙන්ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ දෙමළ භාෂාවෙන් උගන්වන ආචාර්යවරුන් සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. ඒ නිසා දෙමළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශාල අසාධාරණයක් සිදු වෙනවා, මට ලැබුණු තොරතුරු අනුව. දෙමළ භාෂාවෙන් උගන්වන ආචාර්යවරුන්ට ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ අයදුම්පත් ඉදිරිපත් කරනකොට දෙමළ බසින් මුද්‍රණය කිරීම නොකිරීමට බලපෑම් ඇති වෙලා තිබෙනවා. ඉතින්, මම දන්නේ නැහැ, ඔබතුමිය මේ සම්බන්ධයෙන් දැනුවත්ද කියලා. මේ පිළිබඳව සොයා බලා ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඒ නිශ්චිත කාරණය ගැන මම තව විස්තර ලබා ගන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, අපි මේ වෙනකොට ආචාර්යවරුන් 2,000ක පමණ ප්‍රමාණයක් බඳවා ගැනීමට අනුමැතිය ලබා දීලායි තිබෙන්නේ. අවාසනාවකට, සමහර විශ්වවිද්‍යාල අනුමැතිය දීලා තිබෙන බඳවා ගැනීම්වලිනුත් සියයට 50ක්වත් තවම බඳවා ගෙන නැහැ, මේ අවුරුදු දෙක ඇතුළත. පේරාදෙණිය විශ්වවිද්‍යාලය ද ඇතුළත්ව.*[බාධා කිරීමක්]* ඔව්, සියලු මාධ්‍යවලින්. ඒ වාගේම මම මාසයකට විතර කලිනුත් උපකුලපතිතුමන්ලා හමුවෙලා කිව්වේ, අනුමත වෙච්ච ප්‍රමාණය බඳවා ගන්න, ඒ බඳවා ගැනීමත් එක්ක අඩුම තරමින් සියයට 75ක් අනුමැතිය ලැබිලා තිබෙන තනතුරු බඳවා ගත්තොත්, අපි ඊළඟ පුරප්පාඩුවලටත් අනුමැතිය දෙන්නම් කියලා. සියයට 75ට වැඩියෙන් බඳවා ගෙන තිබෙන විශ්වවිද්‍යාලවල නව පත්වීම්වලටත් අපි අනුමැතිය ලබා දෙමිනුයි ඉන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Ramanathan Archchuna, what brings you to your feet?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I would like to bring your attention to Standing Order No. 92 (2). ඒක මම සම්පූර්ණයෙන්ම කියවන්න කැමැති නැහැ. ඒකේ තිබෙනවා, Division එකක් නැත්නම් point of Order එකක් ගන්න පුළුවන් කියලා. Let me record this in Hansard.

ඒ වාගේම, Standing Order No. 91 (b)හි මෙසේ සඳහන් වෙනවා:

"No Member shall be interrupted, unless on a point of order ...."

එතැන point of Order කියලා කියන්නේ, when any Hon. Member is speaking, we can interrupt and ask for a point of Order. සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය ඔතැන පුටුවේ වාඩි වෙලා ඉඳන් එදා කියනවා, කාටවත් points of Order දෙන්න බැහැ, කථා කරන එක්කෙනා කැමැති නැත්නම් එහෙම දෙන්න බැහැ කියලා. කරුණාකරලා උගන්වලා ඔතැන පුටුවේ වාඩි කරවන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Your point has been noted, Hon. Member.

## තොරතුරු තාක්ෂණ දූරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටුවීම: අරමුණු සහ ප්‍රතිලාභ
## தகவல் தொழில்நுட்ப தொலைக் கல்வி நிலையங்கள்: நோக்கம் மற்றும் பயன்கள்
## ESTABLISHMENT OF TECHNOLOGY DISTANCE LEARNING HUBS: OBJECTIVES AND BENEFITS

1530/2025

**7. ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කලාප මට්ටමින් තොරතුරු තාක්ෂණ දූරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන - ITDLH - පිහිටුවීමේ අරමුණු සහ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

(ii) උතුරු සහ නැගෙනහිර පළාත්වල ඇතැම් අධ්‍යාපන කලාපවල එම මධ්‍යස්ථාන මෙතෙක් ස්ථාපිත කර නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, මෙතෙක් එම මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති කලාප කවරේද;

(iv) එම කලාපවල මධ්‍යස්ථාන ස්ථාපිත නොකිරීමට හේතු කවරේද;

(v) මෙතෙක් මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති සියලුම අධ්‍යාපන කලාපවල ඒවා ස්ථාපිත කිරීම සඳහා කාල වකවානු සහිත සැලැස්මක් සකස් කර තිබේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

(vi) තාක්ෂණය පදනම් කරගත් දූරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති කලාපවල සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் கல்வி வலய மட்டத்தில் தகவல் தொழில்நுட்ப தொலைக் கல்வி நிலையங்கள் - ITDLH- தாபிக்கப்பட்டதன் நோக்கம் மற்றும் எதிர்பார்க்கப்படும் பயன்கள் யாவை என்பதையும்;

(ii) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களின் சில வலயங்களில் மேற்படி நிலையங்கள் இதுவரை யில் தாபிக்கப்படவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி நிலையங்கள் இதுவரையில் தாபிக்கப்படாதுள்ள வலயங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி வலயங்களில் இந்நிலையங்கள் தாபிக்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) இதுவரையில் நிலையங்கள் தாபிக்கப்படாதுள்ள சகல கல்வி வலயங்களிலும் அவற்றைத் தாபிப் பதற்கான காலப்பகுதி உள்ளடங்கிய திட்டம் தயாரிக்கப்பட்டு இருப்பின், அதனை நடைமுறைப்படுத்தும் திகதி யாது என்பதையும்;

(vi) தொழில்நுட்பத்தை அடிப்படையாகக் கொண்ட தொலைக் கல்வி நிலையங்கள் தாபிக்கப் படாதுள்ள வலயங்களில் சமத்துவத்தை உறுதிப்படுத்துவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the objectives and the expected benefits of establishing Information Technology Distance Learning Hubs - ITDLHs - at the education-zone level in Sri Lanka;

(ii) whether she is aware that such Learning Hubs have not been established in certain education zones in the Northern and the Eastern Provinces so far;

(iii) if so, the zones in which such Learning Hubs have not been established so far;

(iv) the reasons for not establishing such Learning Hubs in the said zones;

(v) if a time-bound plan has been prepared for the establishment of such Learning Hubs in all education zones in which such Learning Hubs have not been established so far, the date on which the said plan will be implemented; and

(vi) the steps that will be taken to ensure equality among the zones where Technology-based Distance Learning Hubs have not been established?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දිවයින පුරා තොරතුරු තාක්ෂණ හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථාන - ITDLHs - 109ක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව යටතේ ක්‍රියාත්මක වන අතර, කොට්ඨාස මට්ටමින් නොව අධ්‍යාපන කලාප මට්ටමින් ඒවා ස්ථාපිත කර ඇත.

වර්තමානයේ ITDLH ලෙස හැඳින්වෙන මෙම මධ්‍යස්ථාන එවකට පරිගණක සම්පත් මධ්‍යස්ථාන - CRC - නමින් ස්ථාපිත කර ඇති අතර, එම මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණු පහත පරිදි වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැවත වතාවක් කියනවා නම්, ITDLH කියලා දැන් හඳුන්වන්නේ, ඉස්සර CRC කියලා හැඳින්වුණු මධ්‍යස්ථානයමයි. නම වෙනස් කරපු එකයි මෙතැන වෙලා තිබෙන්නේ. ඒවා ආරම්භ කිරීමේ අරමුණු ලෙස තිබෙන්නේත් CRC පිහිටුවීමට තිබෙන අරමුණුමයි. ඒ අරමුණු මෙසේයි.

- අ.පො.ස. (සා/පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) විභාගවලින් පසු සිසුන්ට පරිගණක හා තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම.
- පරිගණක සහ මූලික යෙදවුම් මෘදුකාංග භාවිතය පිළිබඳව සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීම.
- ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා පරිගණක භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- පාසල් අතර පවතින ICT සම්පත් උපරිම හා කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සහ බෙදාහදා ගැනීම.
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වැඩිදුර අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව සහ රැකියා අවස්ථා සඳහා අවශ්‍ය මූලික පදනම සකස් කිරීම.
- වේගයෙන් වෙනස් වන තාක්ෂණික පරිසරයට අනුවර්තනය වීමට අවශ්‍ය දැනුම හා කුසලතා සිසුන් තුළ වර්ධනය කිරීම.

වර්තමානයේ මෙම මධ්‍යස්ථාන මඟින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

- පාසල් සිසුන්, අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල අපේක්ෂිත සිසුන් සඳහා කෙටි කාලීන තොරතුරු තාක්ෂණ පාඨමාලා පැවැත්වීම.
- පාසල් හැර ගිය සිසුන් රැකියා වෙළෙඳ පොළට යොමු කිරීම අරමුණු කරගත් පාඨමාලා පැවැත්වීම. (උදා: NVQ පාඨමාලා)
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ ගුරු පුහුණු කටයුතු සඳහා පහසුකම් සැපයීම.
- විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, වෙනත් රජයේ සේවකයින් මෙන්ම ප්‍රජාව සඳහා ද තොරතුරු තාක්ෂණ කුසලතා සංවර්ධනය කිරීම අරමුණු කරගනිමින් විවිධ වැඩසටහන් පැවැත්වීම.
- මාර්ගගතව විභාග පැවැත්වීම සඳහා පහසුකම් සැපයීම.
- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මාර්ගගතව අයදුම් කිරීමට පහසුකම් සැපයීම.

(ii) ඔව්.

(iii) උතුරු සහ නැඟෙනහිර පළාත්වලට අයත් පහත සඳහන් කලාපවල ITDLH මධ්‍යස්ථාන දැනට (2026) ස්ථාපිත කර නොමැත.

| අනු අංක | පළාත | ITDLH මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති කලාප | විස්තර |
|---|---|---|---|
| 1 | උතුර | කිලිනොච්චි උතුර | මෑත කාලීනව ආරම්භ කරන ලද කලාපයකි. |
| 2 | | මන්නාරම | |
| 3 | | මුලතිව් | |
| 4 | නැඟෙනහිර | දෙහිඅත්තකණ්ඩිය | පෙර ස්ථාපිත මධ්‍යස්ථාන පැවැති අතර පසුව යම් යම් හේතු මත එම මධ්‍යස්ථාන වසා දමා ඇත. |
| 5 | | මහඔය | |
| 6 | | කන්තලේ | |
| 7 | | මඩකලපුව බස්නාහිර | |

(ඉහත සඳහන් උතුරු සහ නැඟෙනහිර පළාත්වල ITDLH මධ්‍යස්ථාන 7 ඇතුළුව දිවයින පුරා ITDLH මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති කලාප 12ක් ඇත. ඉතිරි කලාප 5 පහත පරිදි වේ)

- දකුණු පළාත - අම්බලන්ගොඩ, උඩුගම
- වයඹ පළාත - මහව
- මධ්‍යම පළාත - ගම්පොල
- ඌව පළාත - තණමල්විල

මේ විධියට රටේ වෙනත් පළාත්වල තිබෙන සමහර කලාපවලත් ITDLH මධ්‍යස්ථාන නැහැ.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

(iv) ඉහත සඳහන් කලාප කිහිපයක මීට පෙර පරිගණක සම්පත් මධ්‍යස්ථාන - CRC - ස්ථාපිත කර තිබී ඇති අතර (වර්තමානයේ ITDLH මධ්‍යස්ථාන ලෙස හැඳින්වෙන මෙම මධ්‍යස්ථාන එවකට පරිගණක සම්පත් මධ්‍යස්ථාන ලෙස හඳුන්වා ඇත.) ඒ අධ්‍යාපන කලාපවල මෙම මධ්‍යස්ථානවලට අනුයුක්තව සේවය කළ ඇතැම් ගුරුවරුන්ගේ විශ්‍රාම යාමත් සමඟ ඊට නව ගුරුවරුන් ඒ සඳහා අනුයුක්ත නොවීමත්, මෙම මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය පරිගණක හා උපකරණ ප්‍රමාණවත්ව නොලැබීමත්, අධ්‍යයන කටයුතු පවත්වා ගැනීමට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් පාඨමාලා සඳහා අයදුම් නොකිරීමත් යන හේතු මත මෙම මධ්‍යස්ථාන පසුකාලීනව වැසී ගොස් ඇත. සමහර කලාපවල මෙම මධ්‍යස්ථාන ස්ථාපිත කර නොමැති බව වාර්තා වේ.

(v) මෙම කලාපවල නව මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට ව්‍යාපෘති යෝජනා සකස් කර 2024, 2025, සහ 2026 වර්ෂවල දී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ ද එම වසරවල නව ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් නොකිරීම මත ඒවා අනුමත නොවීය. එබැවින්, නැවත වතාවක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් ඉන්නවා.

(vi) ITDLH මධ්‍යස්ථාන නොමැති කලාපවල ඉදිරියේදී ITDLH මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ නැවත වතාවක් සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකිරීමට සැලසුම් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

நன்றி! கௌரவ பிரதமர் அவர்களே, அரசாங்கத்தால் தீவளாவிய வகையில் நடைமுறைப்படுத்தப்படும் செயற்றிட்டங்களில் சில கல்வி வலயங்களும் சில மாவட்டங்களும் விடுபட்டிருப்பது என்பது, குறிப்பாக முல்லைத்தீவு மாவட்டம் பல அளவீடுகளிலும் 'இல்லை' என்ற வகுதிக்குள் உள்ளடக்கப்பட்டிருப்பது துரதிருஷ்டவசமானது. வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள ஆறு கல்வி வலயங்களில் முல்லைத்தீவு, மன்னார் கல்வி வலயங்களில் இவ்வாறான கணினி வள நிலையங்கள் இல்லை என்று அறிகின்றோம். அதை நீங்களும் ஏற்றுக்கொண்டு இருக்கிறீர்கள். முல்லைத்தீவு கல்வி வலயத்தில் 74.84% கணினிகள் செயலிழந்த நிலையில் உள்ளன. 82.76% பல்லூடக எறிவைகள் செயலிழந்த நிலையில் உள்ளன. இது வட மாகாணத்திலுள்ள 13 கல்வி வலயங்களிலும் மிகவும் பின்னடைவான புள்ளிவிபரமாக உள்ளது. இப்படி அதிகப்படியான கணினிச் சாதனங்கள் செயலிழந்ததால், கணினிமயப்பட்ட கற்பித்தலை எவ்வாறு பாடசாலைகளில் வினைத்திறனாகக் கொண்டுசெல்ல இயலும்? ஒரு வலயத்தில் அமையப்பெறும் கணினி வள நிலையம், இவ்வாறான கணினி வளங்களின் தொடர் பராமரிப்புக்கு வலுச்சேர்ப்பதோடு, அவ்வலய ஆளணியின் தகவல் தொழில்நுட்ப அறிவூட்டலுக்கும் காத்திரமான பங்களிப்பை வழங்கும். எனவே, தயவுசெய்து இவ்வாறு பின்தங்கியுள்ள முல்லைத்தீவு மற்றும் மன்னார் கல்வி வலயங்களுக்கு இதுவரை கிடைக்காதுள்ள தகவல் தொழில் நுட்ப வள நிலையத்தை 2027ஆம் ஆண்டில் நிறுவ வகைசெய்ய இயலுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මතු කරන ප්‍රශ්නයේ සාධාරණත්වයක් තිබෙනවා. ඇත්තටම උතුරු නැඟෙනහිරට සුවිශේෂි වනවා වාගේම, රටේ පළාත් ගණනාවකට අවශ්‍ය පරිදි පරිගණක පහසුකම් ලැබිලා නැහැ. අපි 2026දී මේ පිළිබඳව audit එකක් කළාම අපට තොරතුරු ලැබුණා, 2014න් පසුව අලුත් උපකරණ ලබා දීලා නැහැ කියලා. 2014 සිට පරණ ඒවා තමයි මේ බොහෝ ස්ථානවල තිබෙන්නේ. එතුමා කියන කථාව ඇත්ත. ඒ නිසා අපි අවුරුදු 5ක ව්‍යාපෘතියක් සැලසුම් කරලා මෙවර අය වැයට ඉදිරිපත් කරලා තිබෙනවා. අලුත්වැඩියා කිරීම් සඳහා අපි කොහොමටත් වාර්ෂිකව මුදල් දෙනවා. නමුත් මේවා බොහොමයක් තිබෙන්නේ අලුත්වැඩියා කරන්න බැරි තත්ත්වයක. එම ස්ථාන සඳහා අලුත් උපකරණ ලබා දීම අපි ආරම්භ කරන්නේ ද්විතීයික පාසල්වලින්. ඒ ද්විතීයික පාසල්වලට මෙම පහසුකම් ලබා දෙන්නත්, ඒ කලාපවල මෙම මධ්‍යස්ථාන දියුණු කිරීමටත් අවුරුදු 5ක ව්‍යාපෘතියක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

நன்றி, கௌரவ பிரதமர் அவர்களே! எனது இரண்டாவது மேலதிகக் கேள்வி, தற்பொழுது இயங்கிக்கொண்டு இருக்கும் அவ்வாறான கணினி வள நிலையங்களிலுள்ள இலத்திரனியல் சாதனப் பழுது மற்றும் இலத்திரனியல் சாதனத் தேவை தொடர்பானது. குறிப்பாக, வவுனியா - மரக்காரம்பளையில் இயங்கிவரும் வட மாகாண தகவல் தொழில்நுட்ப மற்றும் தொலைக்கல்வி நிலையத்தில்கூட -பிக்ரெக், வவுனியா- 37.5 சதவீதமான கணினிகளே இயங்குநிலையில் உள்ளன. வட மாகாணத்தில் முன்னெடுக்கப்படும் பெரும்பாலான விதிவிட செயலமர்வுகள் குறித்த வள நிலையத்திலேயே மேற் கொள்ளப்பட்டு வருகின்றன. எனவே, குறித்த வள நிலையம் உட்பட கல்வி வலயங்களின் தகவல் தொழில்நுட்ப அறிவூட்டும் மையமாகச் செயற்படும் இவ்வாறான வள நிலையங்களின் தொடர்ச்சியான உயிரோட்டமான பாவனைக் குப் போதுமான அளவு திருத்த நிதியையும் காலத்துக்கேற்ப புதிய கணினிச் சாதனங்களையும் வழங்குவது தொடர்பில் அரசு கவனம் செலுத்த வேண்டுமென தயவுடன் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ඒ ඉල්ලීම අපි භාර ගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි වාර්ෂිකව මුදල් වෙන් කරලායි තිබෙන්නේ, සෑම දිස්ත්‍රික්කයකටම, සෑම කලාපයකටම අලුත්වැඩියා කටයුතු සඳහා. නමුත් මම පෙර කියූ පරිදි සමහර ඒවා දැන් අලුත්වැඩියා කරන්න බැරි තත්ත්වයක තිබෙන්නේ. ඒ ස්ථාන සඳහා අපට අලුතින් උපකරණ ලබාගන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ සඳහා තමයි අපි මේ නව ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබෙන්නේ. ඒකට අනුමැතිය ලැබුණාම මේ centresවලත්, ද්විතීයික පාසල්වලත් සියයට 50ක විතර අවශ්‍යතාව 2027 වසර තුළ සම්පූර්ණ කරන්න අපි බලාපොරොත්තු වනවා. නමුත් මේක අවුරුදු 5ක ව්‍යාපෘතියක්. 2027දී තමයි අපි අඩුම තරමේ සියයට 50කටවත් පහසුකම් ලබා දෙන්න සැලසුම් කරලා තිබෙන්නේ.

## අධ්‍යාපන සභාව පිහිටුවීම: විස්තර
## கல்விச் சபையை நிறுவுதல்: விபரம்
## ESTABLISHMENT OF EDUCATION COUNCIL: DETAILS

1835/2026

**8. ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්තමාන රජයේ ප්‍රතිපත්තිය අනුව ‘අධ්‍යාපන සභාව’ පිහිටුවීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ සංවිධාන ව්‍යුහය කවරේද;

(iii) ගුරු-විදුහල්පති වැටුප් විෂමතා විසඳීම සඳහා වන ‘සුබෝධිනී වාර්තාව’ ක්‍රියාත්මක කිරීමේදී නව ආයතනයක අවශ්‍යතාව ඇති වන්නේ කවර ආකාරයකින්ද;

(iv) මෙම ආයතනය පිහිටුවා අවසන් කිරීමට නිශ්චිත කාල රාමුවක් තිබේද;

(v) එම ආයතනය මඟින් ගුරුවරුන්ගේ වෘත්තීය තත්ත්වය ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தற்போதைய அரசாங்கத்தின் கொள்கைக்கு அமைய 'கல்விச் சபையை' நிறுவுவதற்கு திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், இதன் நிறுவனக் கட்டமைப்பு யாது என்பதையும்;

(iii) ஆசிரியர்-அதிபர் சம்பள முரண்பாடுகளைத் தீர்ப்பதற்கான 'சுபோதினி அறிக்கையை' நடைமுறைப்படுத்துகையில், புதிய நிறுவன மொன்றின் தேவைப்பாடு எந்தவகையில் எழுகிறது என்பதையும்;

(iv) இந்த நிறுவனத்தை தாபித்து நிறைவு செய்வதற் கான குறிப்பிட்டதொரு காலவரையறை உள்ளதா என்பதையும்;

(v) மேற்படி நிறுவனத்தினூடாக ஆசிரியர்களின் தொழில்சார் நிலைமையை மேம்படுத்துவதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether there is a plan to establish an Education Council in accordance with the policy of the present Government;

(ii) if so, the organizational structure of that institution;

(iii) as to how the establishment of a new institution becomes necessary in implementing the Subodhini Report, which aims to resolve salary anomalies prevailing in the Teacher-Principal Services;

(iv) whether a specific timeframe has been set to complete the process of establishing the said institution; and

(v) the measures that will be taken by the said institution to enhance the professional standards of teachers?

(b) If not, why?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, what is your point of Order?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

In answering Question No. 6, the Hon. Prime Minister mentioned that no hostel facilities were developed during 2015 to 2018. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

That is not a point of Order, Hon. Ravi Karunanayake.

Hon. Prime Minister, you may answer the Question raised by the Hon. Chanaka Madugoda.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I will provide the data, if necessary. My point was that the number of students increased significantly during that period, but the number of hostels did not keep pace. - *[Interruption.]* - And, there was a decision taken not to build new hostels; There was a decision taken not to build new hostels between 2015 and 2024. That led to a severe hostel crisis in the university system. So, that is the crisis we are currently dealing with, with 55 new projects. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Prime Minister, you may answer the Question raised by the Hon. Chanaka Madugoda.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Can you switch on the mike?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Could we get on to Question No. 8 by Hon. Chanaka Madugoda. The Hon. Prime Minister, please.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් අයටත් අවස්ථාව දෙන්න වෙයි, ඔය විධියට ගියොත්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The Chair is very infectious; Sir, you are normally very generous but, as soon as the Hon. Leader of the House -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, we have a long agenda. We have three more Questions, three Ministerial Statements and a very important Debate lined up for today. - *[Interruption.]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
The Deputy Speaker is being questioned by the Leader of the House.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Prime Minister, you can answer Question No. 08.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Deputy Speaker, if the Members so wish, we can have a debate on the question of hostel facilities at a later date.

The Hon. Member who asked me Question No. 8 is on his feet. So, now, I have to respond to him. Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please do, Hon. Prime Minister.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයෙත් මම මේ ප්‍රශ්නයට දීර්ඝ වශයෙන් පිළිතුරු ලබා දුන්නා. නමුත් මම හිතන විධියට ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා ඊට කලින් තමයි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා මම නැවත ඒ කරුණු ඉදිරිපත් කරන්නම්. ඒ අනුව එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) මේ සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් අදාළ පනත් කෙටුම්පත් සකස් කර මීට අදාළ පනත අනුමත වූ පසු මෙම ආයතනයට අදාළ සංවිධාන ව්‍යුහය පිළිබඳව තොරතුරු ලබා දිය හැක.

(iii) දැනට ස්ථාපිත කර ඇති ජාතික වැටුප් කොමිෂන් සභාව මඟින් වැටුප් විෂමතාවට අදාළ කටයුතු කරනු ඇත.

(iv) නිශ්චිත කාල රාමුවක් නොමැත. නමුත් වසරක කාලයක් තුළදී පිහිටුවීමට අපේක්ෂා කරනු ලැබේ.

නිශ්චිත කාල රාමුවක් කියන්න බැරි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක නීති සම්පාදනය පිළිබඳ කාර්යයක් නිසායි. නමුත් අපි අවුරුද්දක් ඇතුළත මේක කරන්න තමයි සැලසුම් කරලා තිබෙන්නේ.

(v) මේ සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් අදාළ පනත් කෙටුම්පත් සකස් කර පනත අනුමත වූ පසු මෙම ආයතනය මඟින් ගුරුවරුන්ගේ වෘත්තීය තත්ත්වය ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු ලබා දිය හැකි අතර, දැනට යෝජිත ක්‍රියාමාර්ග පහත පරිදි ඉදිරිපත් කරමි.

01. වෘත්තීය සංවර්ධනය, අධ්‍යාපන වෘත්තිකයන් ලියාපදිංචි කිරීම, වැඩසටහන් සහ ආයතනවල තත්ත්ව සහතික කිරීම හා ප්‍රතීතනය සහ වැටුප් සම්බන්ධ කාරණා සඳහා ආයතනික රාමුවක් ස්ථාපිත කිරීම.

02. පෙර පාසල්, ප්‍රාථමික සහ ද්විතීයික මට්ටම්වල සිට සෑම මට්ටමකදීම අධ්‍යාපන වෘත්තිකයන්ගේ වෘත්තීය සංවර්ධනය සහ ලියාපදිංචිය නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම.

03. පූර්ව නිශ්චිත නිර්ණායක සහ ගුණාත්මක මිනුම් මත පදනම්ව අධ්‍යාපන වෘත්තිකයන් ලියාපදිංචි කිරීම.

04. වෘත්තීය සංවර්ධන වැඩසටහන් සහ වෘත්තීයභාවය වැඩිදියුණු කිරීම.

05. ද්විභාෂා අධ්‍යාපන අවස්ථා සෑම දෙනාටම ලබා දීම සඳහා උසස් තත්ත්වයේ ද්විභාෂා අධ්‍යාපනඥයින් බිහි කිරීම.

06. ජාත්‍යන්තරව පිළිගත් හා ගෞරවනීය අධ්‍යාපන වෘත්තිකයන් නිර්මාණය කිරීම.

07. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.

08. අධ්‍යාපන වෘත්තිකයන් පොදු ජාතික අරමුණු සහ ඉලක්ක කරා යොමු කිරීම.

09. අධ්‍යාපන වෘත්තිකයන්ගේ සුභසාධනය වැඩිදියුණු කිරීම.

10. අධ්‍යාපන වෘත්තිකයන් අතර සමගිය සහ සහයෝගීතාව වර්ධනය කිරීම හා සියලු පුරවැසියන්ට සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමේ අයිතිය සහතික කිරීම.

11. බඳවා ගැනීම් සහ උසස්වීම් හා වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා සුදුසුකම් ප්‍රමිතිකරණය කිරීම.

12. අධ්‍යාපන වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ගැටලු විසඳීම සඳහා අධ්‍යාපන වෘත්තිකයන් සහ රජය අතර මැදිහත්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය කාලයේ ප්‍රවෘත්තියක් පළ වුණා, යෝජිත අධ්‍යාපන සභාව පිහිටුවීමෙන් පසුව ගුරු මහත්ම මහත්මීන්ට ඉගැන්වීම සඳහා බලපත්‍රයක්, එහෙම නැත්නම් ගුරු බලපත්‍රයක් ලබා ගන්න වෙනවාය කියලා. ගරු අගමැතිතුමියනි, ගුරු සේවයට එකතු වෙන්න පුළුවන් ක්‍රම තුන හතරක් තිබෙන බව අපි දන්නවා. උපාධිධාරීන්ට ගුරු විභාගය ලියලා ගුරු සේවයට ඇතුළු වෙන්න පුළුවන්. ඒ වාගේම අධ්‍යාපනවේදී උපාධිය සමත් කණ්ඩායමට ගුරුවරුන් විධියට එන්නත් පුළුවන්. විද්‍යාපීඨ හරහාත් ගුරු මහත්ම මහත්මීන් විධියට එන්නත් පුළුවන්. ඒ වාගේම HND වැනි ඩිප්ලෝමා මඟිනුත් යම් යම් අවස්ථාවලදී බඳවා ගැනීම් කරලා තිබෙනවා.

හැබැයි, ගරු අගමැතිතුමියනි, මම ඉහත කියපු ඒ කිසිදු නිර්ණායකයකට අයත් නොවන අපේ රටේ පෞද්ගලික පාසල්වල උගන්වන ගුරුවරු වාගේම උපකාරක පන්ති පවත්වන ගුරුවරු විශාල පිරිසකුත් ඉන්න බව අපි දන්නවා. ලංකාවේ දැනට ගුරු සේවයට එකතු වෙන්න පුළුවන් මේ අදාළ කණ්ඩායම්වලට අමතරව මම දෙවැනියට කිව්ව කණ්ඩායම වන උපකාරක පන්ති පවත්වන ගුරුවරු වාගේම පෞද්ගලික පාසල්වල උගන්වන ගුරු මහත්ම මහත්මීන්ට ගුරු සේවයට එකතු වීම සඳහා යම් බලපත්‍රයක් ලබා දෙන්න පුළුවන් ක්‍රමවේදයක් මේ අධ්‍යාපන සභාව පිහිටුවීමෙන් පසුව ඇති වෙනවාද, එහෙම නැත්නම් ඒකට යම් ක්‍රමවේදයක් ඔබතුමිය සකස් කරලා තිබෙනවාද කියන කාරණය මම අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන සභාව පිහිටුවීමේ අරමුණ වන්නේ ගුරු වෘත්තිය තුළ තිබෙන වෘත්තිකභාවය රැක ගැනීම සඳහා වෘත්තිකයන්ගෙන් සමන්විත වන සභාවක් පිහිටුවීමයි. එතකොට, ඒ සභාව විසින් තමයි තීරණය කරන්නේ ගුරුවරයෙක් ලෙස practise කිරීමට තිබිය යුතු නිර්ණායක සහ qualifications මොනවාද කියලා. ඒ ප්‍රතිපත්තිය අනුව තමයි සභාව පිහිටුවූවාට පස්සේ ක්‍රියාත්මක වෙන්නේ. මේ වනවිට යෝජනා වෙලා තිබෙන අධ්‍යාපන සභාවේ නීති රීති තුළ ගුරුවරයෙක් හැටියට ඕනෑම ක්ෂේත්‍රයක ක්‍රියාත්මක වීමට නම්, ඒ registration එකයි, licence එකයි ලබා ගත යුතුයි. එතැන වෙන් කරලා නැහැ, "මේ ආයතනයට පමණක්" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක තමයි යෝජිත ප්‍රතිපත්තිය. අපි මේ වනකොට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ඒක යොමු කරලා තිබෙන්නේ පවතින නීතියත්, ව්‍යවස්ථාවත් එක්ක ගැටෙන්නේ නැති වන විධියට මේක ස්ථාපිත කිරීම සඳහා නීතිය සකස් කළ යුතු නිසායි. ඒ නීතිය සකස් කළාම තමයි මෙතුමා අහන ඒ නිශ්චිත ප්‍රශ්නයට අපිට උත්තරයක් සපයන්න වෙන්නේ. ප්‍රතිපත්තියක් හැටියට යෝජනා වෙලා තිබෙන්නේ සියලුම ගුරුවරුන්ට මේ licensing ක්‍රමය ක්‍රියාත්මක විය යුතුයි කියායි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගුරු මහත්ම මහත්මීන්ගේ වැටුප් විෂමතා ඉවත් කරන්න සුබෝධිනී කමිටුව පත් කරලා, එහි වාර්තාව අනුව එම විෂමතා විසඳන්න අපේ ආණ්ඩුව කාලයේ තුනෙන් එකක වැටුප් වැඩිවීමක් ලබා දුන්නා. ගුරු-විදුහල්පති වැටුප් විෂමතා විසඳීම සඳහා ලබා දුන් ඒ සුබෝධිනී වාර්තාව අනුව ගුරු මහත්ම මහත්මීන්ට තවත් තුනෙන් දෙකක වැටුප් වැඩිවීමක් ලැබෙන්න නියමිතයි. මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි, ඒ තුනෙන් දෙකක වැටුප ගුරු මහත්ම මහත්මීන්ට ලබා දෙන්න අධ්‍යාපන සභාව පිහිටුවනතුරු ඉන්න වෙනවාද කියලා. මොකද, මේ ආණ්ඩුව බලයට පත් වෙලා මේ වනකොට වසර දෙකක් ගත වෙලා හමාරයි. ඒ වසර දෙකක කාලය තුළ ගුරු මහත්ම මහත්මීන්ගේ ඒ තුනෙන් දෙකක වැටුප් විෂමතාව ගෙවීම පිළිබඳ කිසිදු කථා බහක් හෝ ඒ පිළිබඳව කිසිදු මතයක් ප්‍රකාශ වුණේ නැහැ. ඒ නිසා ගරු අගමැතිතුමියනි, මම දැන ගන්න කැමැතියි, ඒ ගුරු මහත්ම මහත්මීන්ට ලබා දිය යුතු තුනෙන් දෙකක ඉතුරු කොටස ලබා ගැනීමට අධ්‍යාපන සභාව පිහිටුවන තෙක් බලා ඉන්න ඕනෑද, එහෙම නැත්නම් ඊට පෙර ඔබතුමියලා එය ලබා දෙන්න බලාපොරොත්තු වෙනවාද කියන කාරණය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙනකොටත් 2025 වසරේදී රාජ්‍ය සේවයට ලබා දී තිබෙන වැටුප් වර්ධකයත් සමඟ සුබෝධිනී වාර්තාවට එහා ගිය වර්ධකයක් අපි ලබා දීලා තිබෙනවා. ඒක ලබා දීලා තිබෙන්නේ ගුරු වෘත්තියට විතරක් නොවෙයි. අධ්‍යාපන සේවය තුළ අපට තව සේවාවන් හතරක් තිබෙනවා. ගුරු සේවයත් ඇතුළත්ව ඒ හතරටම පඩි වැඩි වෙලා තිබෙනවා. ගුරු වෘත්තියේ, අධ්‍යාපන වෘත්තියේ ඇති වෙලා තිබෙන වැටුප් විෂමතා විසඳන්නත්, පොදුවේ රාජ්‍ය සේවය තුළ තිබෙන විෂමතා විසඳන්නත් වැටුප් කොමිසමක් පත් කර තිබෙනවා. මීට කලින් විටින් විට කණ්ඩායම් විතරක් target වෙලා ලබා දී තිබුණු වැටුප් වර්ධක නිසා ඇති වෙලා තිබෙන වැටුප් විෂමතාව විසඳන්න අපි ඒ ප්‍රශ්න වැටුප් කොමිසමට යොමු කර තිබෙනවා. නමුත් ගුරුවරුන්ගේ වැටුප් 2025 වසරේ වැඩි වුණු වැටුප් වර්ධකයත් සමඟ දැන් වැඩි වෙලා තිබෙනවා. 2027 වසරේ තුන්වැනි වැටුප් වර්ධකයත් ලැබෙන්න නියමිතයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 9 - 1951/2026 - (1), the Hon. Lal Premanath. - *[Not in the Chamber.]*

## සේනානායක සමුද්‍රය: ප්‍රතිසංස්කරණය
சேனாநாயக்க சமுத்திரம்: புனரமைப்பு
SENANAYAKE SAMUDRAYA: RENOVATION

2280/2026

**10.ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ගල්ඔය ව්‍යාපාරය යටතේ ඇති සේනානායක සමුද්‍රයේ වර්තමානයේ රඳවාගෙන ඇති ජල ප්‍රමාණය අක්කර අඩිවලින් කොපමණද;

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

(ii) 1992 වර්ෂයේ සිට සේනානායක සමුද්‍රයේ ප්‍රධාන බැම්ම, සොරොව් කුළුණ, සොරොව් බැරලය, ජලය නිකුත් කිරීමේ පද්ධතිය සහ පිටවාන් පද්ධතිය සම්බන්ධ ඉරි තැලීම් ඇතුළු තාක්ෂණික ගැටලු හඳුනාගෙන ඇති අතර, එම තත්ත්වය මේ වනවිට තීව්‍රවී ඇති බැවින් ජලාශයේ තිරසරභාවය සහ දිගු කාලීන ආරක්ෂාව සම්බන්ධයෙන් අවදානම් තත්ත්වයක් මතුවී ඇති බව දන්නේද;

(iii) කෘෂි පවුල් 170,000කට පමණ වාරි පහසුකම් සලසමින් දිස්ත්‍රික්කයේ කෘෂි ආර්ථිකයේ ප්‍රධාන මූලාශ්‍රයක් බවට පත්ව ඇති මෙම ජලාශ පද්ධතියේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පුළුල් අධ්‍යයනයක් සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தின் கல்ஓயா கருத் திட்டத்தின் கீழுள்ள சேனாநாயக்க சமுத்திரத்தில் தற்போது தேக்கி வைக்கப்பட்டுள்ள நீரின் அளவு எத்தனை ஏக்கர் அடிகள் என்பதையும்;

(ii) 1992ஆம் ஆண்டிலிருந்து சேனாநாயக்க சமுத்திரத்தின் பிரதான அணைக்கட்டு, மதகுக் கோபுரம், மதகு உருளை, நீர் வெளியேற்றும் கட்டமைப்பு மற்றும் வான்பாயும் கட்டமைப்பில் ஏற்பட்டுள்ள வெடிப்புகள் உள்ளிட்ட தொழில் நுட்பப் பிரச்சினைகள் அடையாளம் காணப் பட்டுள்ளதுடன், மேற்படி நிலைமை தற்போது தீவிரமடைந்துள்ளதால் நீர்த்தேக்கத்தின் உறுதித் தன்மை மற்றும் நீண்டகாலப் பாதுகாப்பு தொடர்பில் ஆபத்தான நிலைமை உருவாகி யுள்ளதை அவர் அறிவாரா என்பதையும்;

(iii) சுமார் 170,000 விவசாயக் குடும்பங்களுக்கு நீர்ப்பாசன வசதிகளை வழங்கி, மாவட்டத்தின் விவசாயப் பொருளாதாரத்தின் பிரதான மூலமாக விளங்கும் இந்நீர்த்தேக்கக் கட்டமைப்பின் பாதுகாப்பை உறுதிப்படுத்துவதற்காக விரிவான ஆய்வொன்றையும் புனரமைப்புப் பணிகளையும் மேற்கொள்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the current volume of water impounded in the Senanayake Samudraya under the Gal Oya Scheme in Ampara District, in acre-feet;

(ii) whether he is aware that since 1992, technical issues including cracking have been identified in the main dam, sluice tower, sluice barrel, water release system, and spillway system of the Senanayake Samudraya, and that as this situation has now intensified, a risk has arisen regarding the sustainability and long-term safety of the reservoir; and

(iii) whether actions will be taken to conduct a comprehensive study and carry out renovation work to ensure the safety of this reservoir system, which serves as a major source of the district's agricultural economy by providing irrigation facilities to approximately 170,000 farming families?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සේනානායක සමුද්‍රයේ 2026.10.17 දිනට ජල ධාරිතාව අක්කර අඩි 133,860ක් වන අතර පසුගිය යල කන්නය සඳහා ජල ධාරිතාව සියයට 55ක සීමාවේ පවත්වා ගනිමින් අක්කර 114,357ක වගා කටයුතු සඳහා ද ජලය නිකුත් කර ඇත.

(ii) කාලීනව ඇතිව ඇති තාක්ෂණික ගැටලු හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

(iii) මේ වනවිටත් සොරොව්වේ තිරසරභාවය පවත්වා ගැනීම සඳහා පුනරුත්ථාපන යෝජනා අන්තර්ජාතිකව ලබා ගැනීම සඳහා උපදේශන සමාගම්වලින් යෝජනා කැඳවීමට කටයුතු කරමින් පවතින අතර ඉන්පසු වඩා ප්‍රශස්ත සහ ආර්ථිකමය වශයෙන් ඵලදායී යෝජනා හඳුනාගෙන පුනරුත්ථාපනය කිරීමට කටයුතු කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් කිරීමට ජලාශයේ සොරොව් කුලුන සහ උමං මාර්ගය ප්‍රතිසංස්කරණය හෝ නැවත ඉදිකිරීම සඳහා අධ්‍යයනයෙහි නිර්දේශ අනුව සිදු කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා දී ඇත. පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වනවිටත් ආරම්භ කර ඇත.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. M.S. Uthumalebbe, you may ask your first Supplementary Question.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, சேனாநாயக்க சமுத்திரத்தின் நீர்த்தேக்கக் கொள்ளளவு 770,000 ஏக்கர் அடி ஆகும். பிரதான அணையிலிருந்து சற்றுத் தொலைவில் 1,020

அடி நீளமுடைய 'கொங்கிறீட்' வெள்ளப்பாதை அமைக்கப் பட்டுள்ளது. இதில் 770 அடி நீளமும் 60 அடி உயரமும் கொண்ட வெள்ளப்பாதை அமைப்பும் 6 கதவுகளும் உள்ளன. மேலும், 13 அடி விட்டம் கொண்ட மதகுகள் வழியாக நீர் வெளியேற்றப்பட்டு விநியோகிக்கப்படுகின்றது. முன்னதாக, வெள்ளப்பாதைக் கட்டமைப்பில் ஏற்பட்டிருந்த விரிசல்களைச் சரிசெய்வதற்காக இரசாயனப் பரிசோதனைகள் முறைகள் மட்டுமே பரிசோதிக்கப்பட்டன. தற்போது நீர்ப்பாசனத் திணைக்களம் முக்கியமாக விரிசல்களின் அளவை அளவிட்டு அவற்றைக் கண்காணித்து வருவதாக அறிய முடிகிறது. எவ்வாறாயினும், வெள்ளப்பாதையின் காலம் மற்றும் அதன் கட்டமைப்பின் முக்கியத்துவத்தைக் கருத்திற்கொள்ளும்போது, விரிசல்களின் அகலத்தை மட்டும் அளவிடுவது, கட்டமைப்பின் உண்மையான நிலை மற்றும் அதன் மீதமுள்ள கட்டமைப்பு தாங்குதிறனை மதிப்பிடுவதற்குப் போதுமானதாக இல்லை. விரிசல்களின் ஆழம், பரவல், உட்புறத்தில் அவை தொடர்ந்து விரிவடைந்துள்ள நிலை மற்றும் அவற்றுக்கான அடிப்படைக் காரணங்களைக் கண்டறிய நவீன ஆய்வு மற்றும் மதிப்பீட்டுத் தொழில் நுட்பங்கள் பயன்படுத்தப்பட வேண்டும். இந்த நிலையில், அதிகாரிகள் விரிவான கட்டமைப்பு மதிப்பீட்டை மேற்கொண்டு, தொழில்நுட்ப ரீதியாகச் சாத்தியமான இடங் களில் பொருத்தமான மறுசீரமைப்பு மற்றும் புனரமைப்பு நடவடிக்கைகளை மேற்கொண்டு, நவீன தொழில் நுட்பங்களைப் பயன்படுத்தி, தற்போதுள்ள வெள்ளப் பாதையைப் பாதுகாப்பாக மறுசீரமைக்க முடியுமா? அதன் பயன்பாட்டு ஆயுளை மேலும் நீடிக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙයයි. සේනානායක සමුද්‍රයේ මේ වන විට ඇති වී තිබෙන ගැටලුව තාක්ෂණික මට්ටමින් විසඳිය යුතු ගැටලුවක්. මෙය මීට අවුරුදු 20ක, 30ක පමණ කාලයක සිට පැවතගෙන එන ගැටලුවක්. විශේෂයෙන්ම, එම සොරොව් කුලුනේ ඇති වී තිබෙන ඉරිතැලීම් පිළිබඳව අවුරුදු 20ක පමණ කාලයක සිට වාර්තා වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඉංජිනේරුවන් විවිධ පරීක්ෂණ කරලා, සොයාගැනීම් කරලා යම් තාවකාලික විසඳුම් ලබා දී තිබෙනවා.

මේ වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය මඟින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබෙනවා. ඒ වාගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇතුළු විවිධ ආයතන මඟින්ද මේ පිළිබඳව විවිධ පරීක්ෂණ සිදු කර තොරතුරු ඉදිරිපත් කර තිබෙනවා. නමුත්, මෙහි තිබෙන සංකීර්ණ තත්ත්වය නිසාම මෙම සොරොව් කුලුන සම්පූර්ණයෙන්ම ඉවත් කරනවාද, එසේ නොමැති නම් එම ස්ථානයේදීම එය ප්‍රතිසංස්කරණය කරනවාද, නැතහොත් වෙනත් තැනක ස්ථානගත කරනවාද යන්න පිළිබඳව තාක්ෂණික ආයතනවලට තවමත් නිශ්චිත නිගමනයකට එන්න නොහැකි වෙලා තිබෙනවා. එම නිසා කැබිනට් මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් අනුමැතිය ලබා දී තිබෙනවා, මෙම ඉදිකිරීම සිදු කළ යුතු ආකාරය පිළිබඳව feasibility study එකක් කරලා වාර්තාවක් ලබා දෙන්න කියලා. එම වාර්තාව ලැබුණු සැණින් අදාළ වැඩකටයුතු ආරම්භ කිරීමට අපි සූදානම්ව සිටිනවා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කියනවා වාගේම මෙය අම්පාර දිස්ත්‍රික්කයට පමණක් නොව, රටේ ආර්ථිකයටද විශාල බලපෑමක් ඇති කරන කෘෂිකාර්මික ප්‍රදේශයක්. අපගේ ගණනය කිරීම්වලට අනුව, එක් කන්නයකදී මෙම ප්‍රදේශයේ කුඹුරු වගාව හරහා රුපියල් බිලියන 43ක පමණ මූල්‍යමය දායකත්වයක් රටේ ආර්ථිකයට සැපයෙනවා. මේ සියල්ල සලකා බලමින් තමයි අපට මේ පිළිසකර කිරීම් හා ඉදිකිරීම් කටයුතු කිරීමට සිදු වන්නේ. එම නිසා ඒ පිළිබඳව විද්‍යාත්මක තොරතුරු අධ්‍යයනයකින් පසුව කඩිනමින් අදාළ වැඩකටයුතු ආරම්භ කිරීමට කැබිනට් මණ්ඩලයේත්, ජනාධිපතිතුමාගේත්, අමාත්‍යාංශයේත් අවධානය යොමු වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. M.S. Uthumalebbe, you may ask your second Supplementary Question.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சேனாநாயக்க சமுத்திரத்தின் அணைக்கட்டில் ஏற்பட்டிருக்கின்ற பாதிப்புத் தொடர்பான விபரங்களை நான் இந்தச் சபையில் ***சமர்ப்பிக்கின்றேன்.**

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

விரிசல்களின் அளவை மட்டும் அளவிடுவதற்குப் பதிலாக கட்டமைப்பில் எவ்வளவு செயற்பாட்டு ஆயுட்காலம் மீதம் உள்ளது என்பதையும், இதன் ஆயுட்காலத்தை நடைமுறையில் இன்னும் எத்தனை ஆண்டுகளுக்கு நீடிக்க முடியும் என்பதையும் நாம் அறிந்திருக்க வேண்டும். அடுத்த மழை காலத்தில் அதிக நீர் வரத்து ஏற்பட்டால், அம்பாறை மாவட்டத்தின் அம்பாறை, இறக்காமம், சம்மாந்துறை, அக்கரைப்பற்று, ஆலையடிவேம்பு, அட்டாளைச்சேனை, நிந்தவூர், காரைதீவு, சாய்ந்தமருது, கல்முனை மற்றும் நாவிதன்வெளி ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளில் அமைந்துள்ள பல்லாயிரக்கணக்கான விவசாயக் காணி களுக்குச் சேதம் ஏற்படுவதோடு, பல்லாயிரக்கணக்கான மக்கள் வெள்ளத்தால் பாதிக்கப்படும் நிலைமையும் ஏற்படும். எனவே, மழை காலத்தில் இந்தக் கட்டமைப்பின் பாதுகாப்பை உறுதி செய்வதற்கான நடவடிக்கை மற்றும் பாதுகாப்புத் திட்டம் நடைமுறைப்படுத்தப்பட உள்ளதா என்பதைத் தெரிவிக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය පළමුවැනි අතුරු ප්‍රශ්නයට සමානයි.

අවුරුදු 75කට වඩා පැරණි සේනානායක සමුද්‍රය හරහා යල මහ කන්න දෙකේම අක්කර 120,000ක් පමණ වගා කරනවා. ඒ වාගේම, එම ජලාශය ආශ්‍රිතව සිදු කරන ධීවර කර්මාන්තය සහ බහුකාර්ය ව්‍යාපෘති මෙන්ම, එම ප්‍රදේශයේ ජීවත් වන ජනතාව සම්බන්ධයෙන් ද අප විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඔබතුමා සඳහන් කළ ආකාරයට, ගංවතුර තත්ත්වයක් ඇති වන අවස්ථාවලදී, අධික ලෙස වර්ෂාව පතිත වෙද්දී එම ප්‍රදේශයේ ජනතාව වාගේම වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, ආණ්ඩුවත් විශේෂ අවධානයක් යොමු කරමින් ඉන්නේ. පසුගිය "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව ඇති වූ තත්ත්වය තුළදීත්, සේනානායක සමුද්‍රය සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ අමාත්‍යාංශය විශේෂ අවධානයක් යොමු කර තිබුණා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අරවින්ද සෙනරත් මහතා]

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කරන කාරණය නිවැරදියි. ඒ නිසාම අපි ආණ්ඩුවක් විදියට මේ අවුරුදු දෙක ඇතුළත, විශේෂයෙන්ම 2025 වසරේ මැද භාගයේ සිට මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මූලික අවධානය යොමු කරලා සාකච්ඡා වට ගණනාවක් පවත්වා තිබෙනවා. දැනට මෙම ප්‍රතිසංස්කරණ කටයුතු ස්ථිර වශයෙන්ම කඩිනමින් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු අපි සූදානම් කර තිබෙනවා. Feasibility study එක සිදු කරලා, ඒ අවශ්‍ය තාක්ෂණික කටයුතු අවසන් කළ වහාම එම ව්‍යාපෘතිය ආරම්භ කරන්න අපි කටයුතු කරමින් සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Second round.

## මීගමුව ඩිපෝව: විස්තර
நீர்கொழும்பு டிப்போ: விபரம்
NEGOMBO DEPOT: DETAILS

787/2025

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය:

(අ) (i) මීගමුව ඩිපෝව සතුව මේ වනවිට ධාවනයට සුදුසු මට්ටමේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම ඩිපෝව මඟින් දෛනිකව ධාවනය කරනු ලබන බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු කවරේද;

(iv) එම ඩිපෝව 2015 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව ලැබූ ලාභ/අලාභ කවරේද;

(v) මීගමුව නගරයේ සිට දුරගමන් සේවා ආරම්භ කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நீர்கொழும்பு டிப்போவில் தற்பொழுது போக்குவரத்தில் ஈடுபடுத்தக்கூடிய நிலை யிலுள்ள பஸ் வண்டிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) தற்பொழுது மேற்படி டிப்போவால் அன்றாடம் போக்குவரத்தில் ஈடுபடுத்தப்படுகின்ற பஸ் வண்டிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி டிப்போவில் நிலவும் ஊழியர் வெற்றிடங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி டிப்போ 2015ஆம் ஆண்டிலிருந்து இதுவரை வருடாந்தம் ஈட்டிய இலாபம்/ அடைந்த நட்டம் யாது என்பதையும்;

(v) நீர்கொழும்பு நகரிலிருந்து தொலைதூரப் போக்கு =வரத்துச் சேவையை ஆரம்பிப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House the -

(i) number of roadworthy buses currently owned by the Negombo Depot;

(ii) number of buses that are operated daily by the said depot at present;

(iii) vacancies existing in the cadre of the said depot;

(iv) annual profits/losses recorded by the said depot from year 2015 up to now; and

(v) measures that will be taken to commence long-distance bus services from Negombo City?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මීගමුව ඩිපෝවේ දැනට පවතින ධාවනයට සුදුසු බස් රථ සංඛ්‍යාව 38කි.

(ii) බස් රථ 32කි.

(iii) කාර්යාල සේවකයන්ගේ පුරප්පාඩු - 18

රියදුරු පුරප්පාඩු - 18

කොන්දොස්තර පුරප්පාඩු - 20

| තනතුර | පුරප්පාඩු |
|---|---|
| සහකාර කළමනාකාර (ධාවන) | 01 |
| ඩිපෝ පරීක්ෂක | 13 |
| වැඩ මූලික | 03 |
| සම්පාදක නිලධාරි | 01 |
| රියදුරු | 18 |
| කොන්දොස්තර | 20 |
| එකතුව | 56 |

(iv)

| වර්ෂය | ලාභ/අලාභ |
|---|---|
| 2015 | (53,111,841) |
| 2016 | (23,402,601) |
| 2017 | (4,814,367) |
| 2018 | (8,782,396) |
| 2019 | (26,373,296) |
| 2020 | (47,379,535) |
| 2021 | (56,891,635) |
| 2022 | (60,139,008) |
| 2023 | (33,544,200) |
| 2024 | (41,188,026) |
| 2025 | (39,467,189) |
| 2026 | අවසන් ගිණුම් සකසා නොමැත. |

(v) මීගමුව නගරයේ සිට දුරගමන් සේවා බස් රථ 20ක් පමණ ධාවනය කරන අතර අමතර සේවා ආරම්භ කිරීමට මගීන්ගෙන් ඉල්ලීම් ලැබී නොමැත. මගී ඉල්ලීම් ලැබුණහොත් එම ඉල්ලීම් පිළිබඳව සමීක්ෂණයක් සිදු කර ඉදිරියේදී නව බස් රථ මිලදී ගැනීමට ද රියදුරු, කොන්දොස්තර බඳවා ගැනීම්වලින් අනතුරුව නව සේවා ආරම්භ කිරීමට ද හැකියාව ඇත.

(ආ) අදාළ නොවේ.

## මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන ලියාපදිංචිය: අක්‍රමිකතා
## மோட்டார் வாகனப் போக்குவரத்துத் திணைக்களத்தில் வாகனப் பதிவு: முறைகேடுகள்
## VEHICLE REGISTRATION AT DEPARTMENT OF MOTOR TRAFFIC: IRREGULARITIES

911/2025

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා(ගරු මුජිබුර් රහුමාන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு முஜிபுர் ரஹுமான் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Mujibur Rahuman)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, රේගු පරිගණක පද්ධතිය සමඟ සම්බන්ධ වීමට ප්‍රථම අනීතික වාහන ලියාපදිංචි කිරීම සම්බන්ධව විගණකාධිපතිවරයා ඉදිරිපත් කළ කරුණු කවරේද;

(ii) ඒ අනුව, එම අක්‍රමිකතාවලට දායක වී ඇති නිලධාරීන්ගේ නම් සහ තනතුරු නාම කවරේද;

(iii) එම සිදුවීම තුළින් රජයට අහිමිවී ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම සිදුවීම සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மோட்டார் வாகனப் போக்குவரத்துத் திணைக் களமானது சுங்கக் கணினி முறைமையுடன் இணைக்கப்படுவதற்கு முன்னர் சட்டவிரோத மாக வாகனங்களைப் பதிவு செய்தல் தொடர்பாக கணக்காய்வாளர் தலைமையதிபதி சமர்ப்பித்துள்ள விடயங்கள் யாவை;

(ii) அதற்கமைய, மேற்குறித்த முறைகேடுகளுடன் தொடர்புபட்ட உத்தியோகத்தர்களின் பெயர் களும் பதவிப் பெயர்களும் யாவை;

(iii) மேற்குறிப்பிட்ட சம்பவத்தால் அரசாங்கம் இழந்துள்ள பணத் தொகை எவ்வளவு;

(iv) மேற்குறிப்பிட்ட சம்பவம் தொடர்பாக அமைச்சு மட்டத்தில் எடுக்கப்பட்டுள்ள சட்டரீதியான நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the facts presented by the Auditor-General regarding the illegal registration of vehicles prior to the Department of Motor Traffic connecting with the Customs computer system;

(ii) accordingly, the names and designations of the officers who have been involved in those irregularities;

(iii) the amount of money that the Government has lost due to this incident; and

(iv) of the legal measures taken at the Ministry level regarding this incident?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) විගණන නිරීක්ෂණ ලෙස හඳුනාගෙන තිබූ 2019.10.23 දින පැවති කාරක සභාවේදී ලබා දී තිබූ නිර්දේශයන්ට අදාළ වූ කරුණු 25 (ඇමුණුම - 01** ලෙස ඉදිරිපත් කර ඇත.)

(ii) අදාළ ආයතනය මඟින් විධිමත් විමර්ශනයක් සිදුකර අවසන් වනතුරු අක්‍රමිකතාවලට දායක වී තිබූ නිලධාරීන්ගේ නම, තනතුරු නාම සම්බන්ධ නිවැරදි තොරතුරු ප්‍රකාශ කළ නොහැක.

(iii) අදාළ ආයතනය මඟින් විධිමත් විමර්ශනයක් සිදු කර අවසන් වනතුරු රජයට අහිමිව තිබූ මුදල් ප්‍රමාණය සම්බන්ධ නිවැරදි තොරතුරු ප්‍රකාශ කළ නොහැක.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
^* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

(iv) • විශ්‍රාමික මහාධිකරණ විනිශ්චයකාරතුමෙකුගේ ප්‍රධානත්වයෙන් විමර්ශන කමිටුවක් පත් කර විමර්ශන වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී. (ඇමුණුම - 02**)

• 2025.03.10 සහ 2025.03.21 යන දෙදින කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ පිළිබඳව 2025.07.26 දිනැති පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාවේ (පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 243) අඩංගු නිර්දේශ සම්බන්ධයෙන් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ විරෝධතාවක් ප්‍රකාශ නොවූයෙන් එම වාර්තාවේ අන්තර්ගත දූෂණ හා අක්‍රමිකතාවන් හා සම්බන්ධිත අපරාධමය වැරදි සම්බන්ධයෙන් රටේ පවතින නීතියට අනුව අධිකරණ ක්‍රියාදාමයන් හරහා දඬුවම් පැමිණවීම සිදු කළ යුතු බැවින් එකී වාර්තාව පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයන් මඟින් නීතිපතිට යොමු කර නීතිය බලාත්මක කරන ආයතන හරහා දූෂිත නිලධාරින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කළ යුතු බවට කාරක සභාව විසින් ඒකමතිකව සිය එකඟතාව පළ කරන ලදී. (ඇමුණුම - 03**)

• 2025.02.12 දින පොලිස්පති වෙත ද විමර්ශන කමිටු වාර්තාවේ ඇතුළත් කරුණු 25ට අදාළව විමර්ශනයක් සිදු කර ඒ සම්බන්ධයෙන් ඉදිරි නීතිමය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටින ලදී. (ඇමුණුම - 04)**

(ආ) අදාළ නොවේ.

## සේවක අර්ථසාධක අරමුදල: ගෙවිය යුතු දායක මුදල් හිඟය
## ஊழியர் சேமலாப நிதியம்: நிலுவைப் பங்களிப்புத் தொகை
## EMPLOYEES' PROVIDENT FUND : ARREARS OF CONTRIBUTIONS

1040/2025

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමට හිඟව ඇති පෞද්ගලික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) එම ගෙවීමට ඇති හිඟ මුදල් ප්‍රමාණය ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

** පුස්තකාලයේ තබා ඇත.
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
^* Placed in the Library.

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊழியர் சேமலாப நிதியத்துக்கு நிலுவைப் பங்களிப்புத் தொகையைச் செலுத்த வேண்டியுள்ள தனியார் நிறுவனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு நிறுவனத்தினாலும் செலுத்த வேண்டியுள்ள நிலுவைத் தொகையின் அளவு நிறுவன ரீதியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மேற்படி நிலுவைத் தொகையை அறவிட்டுக் கொள்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Will he inform this House the -

(i) number of private institutions which have arrears of contributions to the Employees' Provident Fund;

(ii) names of such institutions;

(iii) amount of arrears of contributions payable by each of those institutions, separately; and

(iv) measures that will be taken to recover the said arrears of contributions?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීමට හිඟව ඇති පෞද්ගලික ආයතන සංඛ්‍යාව 2026.09.30 දිනට 20,726කි.

(ii) සංයුක්ත තැටියේ මෘදු පිටපතක්* ලෙස දක්වා ඇත.

(iii) 2026.09.30 දිනට සේවක අර්ථසාධක අරමුදලට ආයතන මඟින් ගෙවිය යුතුව තිබෙන දායකත්ව මුදල රුපියල් 34,362,727,926.79 (බිලියන 34.36)ක් වේ. එම හිඟ මුදල් ආයතන අනුව වෙන් වෙන් වශයෙන් සංයුක්ත තැටියේ මෘදු පිටපතක්** ලෙස දක්වා ඇත..

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* Placed in the Library.

(iv) කම්කරු දෙපාර්තමේන්තුව යටතේ දිවයින පුරා විහිදුණු දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40ක් සහ උප කම්කරු කාර්යාල 11ක් මඟින් හිඟ සේවක අර්ථසාධක අරමුදල් අයකර ගැනීම සම්බන්ධව කටයුතු කරනු ලබයි. ඒ එක් එක් කාර්යාලයන්ට අනුයුක්ත කර ඇති කම්කරු නිලධාරීන් විසින් තම බල ප්‍රදේශයට අදාළ ආයතනවල කාලීන පරීක්ෂණ හා ලැබෙන පැමිණිලි අනුව පැමිණිලි පරීක්ෂණ සිදු කරනු ලබයි.

ඒ අනුව සේවක අර්ථසාධක අරමුදල වෙත දායක මුදල් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවන් අනාවරණය කරගත් පසු ගෙවිය යුතු හිඟ දායක මුදල් හා අධිභාර මුදල් ගෙවන ලෙස අදාළ සේවා යෝජකයන් වෙත පළමු නිවේදනය යොමු කරනු ලබයි. එලෙස පළමු නිවේදනය ලැබීමෙන් පසුව යම් සේවා යෝජක පිරිසක් විසින් හිඟ මුදල් ගෙවීම සිදු කරන අතර, එසේ නොගෙවනු ලබන සේවා යෝජකයින් වෙත අවසන් නිවේදන නිකුත් කරනු ලැබේ. එම නිවේදන අනුවද යම් සේවා යෝජක පිරිසක් විසින් හිඟ මුදල් ගෙවීම සිදු කරන අතර නොගෙවනු ලබන සේවා යෝජකයන් සඳහා එම බල ප්‍රදේශයට අයත් මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

මෙලෙස හිඟ දායක මුදල් අයකිරීම සම්බන්ධයෙන් දිවයින පුරා කලාප මට්ටමෙන් පිහිටුවා ඇති නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාල 11ක් මඟින් සහ ප්‍රධාන කාර්යාලයේ සේවක අර්ථසාධක අරමුදල් අංශය විසින් අධීක්ෂණය කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 09 - 1951/2026 - (1), the Hon. Lal Premanath.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question under Standing Order No. 27(2) of Parliament. Hon. Ravi Karunanayake, the Floor is yours.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### නිදහස් වෙළෙඳ ගිවිසුම් පුළුල් කිරීම තුළින් වෙළෙඳ පොළ ප්‍රවේශය සුරක්ෂිත කර ගැනීමේ උපායමාර්ගය
### சுதந்திர வர்த்தக ஒப்பந்தங்களின் விரிவாக்கத்தினூடாக சந்தை அணுகலைப் பாதுகாக்கும் உத்தி
### STRATEGY OF SECURING MARKET ACCESS THROUGH EXPANSION OF FREE TRADE AGREEMENTS

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, I wish to ask the following Questions under Standing Order No. 27(2) from the Hon. Minister of Trade, Commerce, Food Security and Co-operative Development.

Given the structural shift in global trade away from traditional multilateral systems like the WTO and GATT towards aggressive bilateralism, our nation must pivot swiftly to secure vital market access. As a matter of fact, even both the IMF Report and the World Bank Report state the same. In light of regional competitors like India rapidly expanding their Free Trade Agreement network and countries like the Philippines actively securing pacts with the major western economies, we must be smart and ahead of the game. We must aggressively utilize our technical knowledge, domestic capabilities and strategic geographical location to capture the world market.

Therefore, how serious and keen is the Ministry in pursuing comprehensive Free Trade Agreements, how many are currently contemplated and what is your definitive road map to execute this vision?
Will the Hon. Minister also state:

1. whether the Government has adopted a comprehensive national strategy to expand Sri Lanka's network of Free Trade Agreements and Preferential Trade Agreements and if so, the countries currently under consideration and the implementation of the road map?

2. the present status, timelines and negotiating strategy for comprehensive Free Trade Agreements or Advanced Trade Agreements with the United States, the United Kingdom, the European Union and Canada?

3. the measures being taken to strengthen the Economic and Technology Cooperation Agreements - ETCA/ECA - with India, improve

[ගරු රවී කරුණානායක මහතා]

the effectiveness of SAFTA and maximize opportunities arising from India's expanding global trade relationships?

4. following the implementation of the Thailand Free Trade Agreement and the Singapore Free Trade Agreement, the status and timelines for bilateral Free Trade Agreements with China, Japan, Korea, Malaysia and Indonesia?

5. the present status of Sri Lanka's application to join the Regional Comprehensive Economic Partnership, including the progress made following the submission of accession questionnaire and diplomatic efforts to secure membership?

6. whether negotiations or feasibility studies are underway to establish Free Trade Agreements or Comprehensive Economic Partnerships with the major Middle Eastern economies, including Saudi Arabia, Qatar, the United Arab Emirates and Oman and with the key African economies such as South Africa?

7. the Government's assessment of strengthening economic engagement with BRICS, including the progress towards New Development Bank membership and opportunities for trade and investment cooperation?

8. whether the Government create a dedicated national trade negotiation team with an independent multidisciplinary trade negotiation task force comprising public and private sector experts to safeguard national interests and accelerate market access?

Sir, that should include people engaged in trade because they know what exactly is required for negotiations.

Thank you.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා කල් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, Ministerial Statements in reply to Questions under Standing Order No. 27(2) raised by the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam on 22nd of July, 2026 and 09th of September, 2026, the Hon. Vijitha Herath, Minister of Foreign Affairs, Foreign Employment and Tourism

## සංචාරක කර්මාන්තයේ කාර්ය සාධනය සහ සංවර්ධනය: විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## சுற்றுலாக் கைத்தொழிலின் அபிவிருத்தியும் செயலாற்றுகையும்: வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று
## PERFORMANCE AND DEVELOPMENT OF TOURISM INDUSTRY: STATEMENT BY MINISTER OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026.07.22 දින ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(1) පිළිතුර විස්තරාත්මකව පහත වගුවෙහි දැක්වේ.

| වර්ෂය | සංචාරක පැමිණීම | සාමාන්‍ය රැඳී සිටින කාලය | සාමාන්‍ය දෛනික වියදම | සංචාරක ඉපැයීම් ඇමෙරිකානු ඩොලර් මිලියන |
|---|---|---|---|---|
| 2018 | 2,333,796 | 10.8 | 173.8 | 4,380.60 |
| 2019 | 1,913,702 | 10.4 | 181.2 | 3,606.9 |
| 2020 | 507,704 | 8.5 | 158.1 | 682.5 |
| 2021 | 194,495 | 15.1 | 172.6 | 506.9 |
| 2022 | 719,978 | 9 | 164.4 | 1,136.30 |
| 2023 | 1,487,303 | 8.4 | 164.4 | 2,067.90 |
| 2024 | 2,053,465 | 8.42 | 181.15 | 3,168.60 |
| 2025 | 2,362,521 | 8.29 | 148.26 | 3,219 |
| 2026 (අගෝස්තු) දක්වා | 1,535,122 | අගෝස්තු දක්වා මුළු සංචාරක ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 2.06ක් වන අතර, සාමාන්‍ය රැඳී සිටීමේ කාලය දින 8 සිට 9 දක්වා වේ. දිනකට වියදම වෙළෙඳ පොළ අනුව ගණනය කරනු ලබන අතර, මෙය ඇමෙරිකානු ඩොලර් 130.86 සිට ඇමෙරිකානු ඩොලර් 195.23 දක්වා වෙනස් වේ. | | |

සංචාරක පැමිණීම් සහ රැඳී සිටින කාලය ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් සත්‍ය දත්ත මත පදනම් වේ. සංචාරකයන්ගේ දෛනික වියදම් පිළිබඳ තොරතුරු 2024/2025 වර්ෂයේදී අභ්‍යන්තරගත සංචාරකයන් පිළිබඳව සිදු කරන ලද සමීක්ෂණයේ දත්ත මත පදනම් වේ.

නවාතැන් ගැනීමේ සාමාන්‍ය කාලය සහ දෛනික වියදම්වල සාමාන්‍ය ආදිය වෙළෙඳ පොළ (රටවල්) සහ තවත් සාධක කිහිපයක් මත රඳා පවතී. එය දින 8 සිට 15 දක්වා විචලනය වේ. (8.29 - 15.1) වැඩිම කාලයක් රැඳී සිටින රටවල් වන්නේ නෙදර්ලන්තය, නෝර්වේ, ස්විට්සර්ලන්තය, බෙල්ජියම සහ ඩෙන්මාර්කයයි.

සංචාරකයකුගේ දිනක වියදම ඇමෙරිකානු ඩොලර් 130.86 (ලෙබනනය) සිට 195.23 (එක්සත් අරාබි එමීර් රාජ්‍යය) දක්වා විචලනය වේ. දිනකට වැඩිම වියදමක් දරන වෙළෙඳ පොළවල් අතර (පැකේජ නොවන) එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජෝර්දානය, තුර්කිය, මාලදිවයින සහ ඊජිප්තුව ඇතුළත් වේ.

(2)
- 2018දී - උතුරු පළාතට සංවර්ධන ව්‍යාපෘති 6ක් සඳහා මිලියන 39.4යි; නැඟෙනහිර පළාතට සංවර්ධන ව්‍යාපෘති 3ක් සඳහා රුපියල් මිලියන 16.29යි.
- 2019දී - උතුරු පළාතට සංවර්ධන ව්‍යාපෘති 3ක් සඳහා මිලියන 2.48යි; නැඟෙනහිර පළාතට සංවර්ධන ව්‍යාපෘති 3ක් සඳහා රුපියල් මිලියන 12.33යි.
- 2020දී - උතුරු පළාතට සංවර්ධන ව්‍යාපෘති 1ක් සඳහා රුපියල් මිලියන 1.29යි. නැඟෙනහිර පළාතට සංවර්ධන ව්‍යාපෘති 1ක් සඳහා රුපියල් මිලියන 7.76යි.
- 2021දී - නැඟෙනහිර පළාතට ව්‍යාපෘති 2ක් සඳහා රුපියල් මිලියන 10.00යි.

  2022දී වෙන් කරලා නැහැ.
- 2023දී - නැඟෙනහිර පළාතේ සංවර්ධන ව්‍යාපෘති 3ක් සඳහා රුපියල් මිලියන 19යි.
- 2025දී - උතුරු පළාතේ ව්‍යාපෘති 5ක් සඳහා රුපියල් මිලියන 47.66යි. නැඟෙනහිර පළාතේ සංවර්ධන ව්‍යාපෘති 9ක් සඳහා රුපියල් මිලියන 81.46යි.
- 2026දී උතුරු පළාතට රුපියල් මිලියන 209ක් වෙන් කරනවා. එය, සංචාරක අමාත්‍යාංශය උතුරු පළාතට ඉතිහාසයේ වෙන් කළ වැඩිම මුදල් ප්‍රමාණයයි . නැඟෙනහිර පළාතට රුපියල් මිලියන 166.84ක් වෙන් කරනවා. ඒ කියන්නේ, උතුරු පළාතට රුපියල් මිලියන 209කුත්, නැඟෙනහිර පළාතට රුපියල් මිලියන 166.84කුත් වෙන් කරනවා. වැඩිම ප්‍රමාණයක් අපි මේ අවුරුද්දේ වෙන් කරලා තිබෙනවා, උතුරු සහ නැඟෙනහිර පළාත්වල සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා.

2018 සිට 2026 දක්වා සෑම වර්ෂයක් සඳහාම, උතුරු හා නැඟෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක අනුව සංචාරක සංවර්ධනය සඳහා වැය කරන ලද වියදම් පිළිබඳව තොරතුරු ඇමුණුම I මඟින් ඉදිරිපත් කර තිබෙනවා.

අමාත්‍යාංශ ප්‍රතිපාදනවලට අමතරව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය උතුරු පළාතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 3ක් සඳහා රුපියල් මිලියන 50ක් සහ නැඟෙනහිර පළාතේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 2ක් සඳහා රුපියල් මිලියන 150ක් ආයෝජනය කර ඇත. සවිස්තරාත්මක තොරතුරු ඇමුණුම II මඟින් ඉදිරිපත් කර ඇත.

2018 සිට 2026 දක්වා වූ සෑම වසරකම උතුරු හා නැඟෙනහිර පළාත්වල පුරාවිද්‍යාත්මක ස්ථාන සඳහා අමාත්‍යාංශය විසින් දරන ලද වියදම් පිළිබඳ තොරතුරු ඇමුණුම III මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම් I, II සහ III **සභාගත*** කරනවා.

(3) ලියාපදිංචි කරන ලද ආයතන 2018 - 2026 (ජූනි දක්වා)

වගුව 3.1

| වර්ෂය | නව ලියාපදිංචි කිරීම් | මුළු ලියාපදිංචි කිරීම් |
|---|---|---|
| 2018 | 332 | 3,675 |
| 2019 | 607 | 4,282 |
| 2020 | 1,391 | 5,349 |
| 2021 | 842 | 5,632 |
| 2022 | 847 | 6,033 |
| 2023 | 1,781 | 7,434 |
| 2024 | 1,251 | 7,510 |
| 2025 | 814 | 8,111 |
| 2026 (ජූනි) දක්වා | 377 | 8,488 |

සියලුම ලියාපදිංචි සංචාරක සේවා ආයතන, සංචාරක සංවර්ධන බද්ද පාලනය කරන අදාළ නීතිමය රාමුවට සහ රෙගුලාසිවලට අනුකූලව, ඔවුන්ගේ විගණනය කරන ලද අවසාන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වන පරිදි, ආයතනයේ වාර්ෂික පිරිවැටුමෙන් සියයට 1 හෝ සියයට 0.5 ලෙස ගණනය කරන ලද අදාළ සංචාරක සංවර්ධන බද්ද (TDL) ගෙවිය යුතු වේ.

ඒ වාගේම, 2018 සිට 2026 දක්වා ඒ ලැබුණු ආදායම් මා ඉදිරිපත් කරන පිළිතුරේ 3.2 වගුවෙන් සම්පූර්ණ විස්තරාත්මකව ඉදිරිපත් වෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මඩකලපුව ගැන විතරක් කියන්න පුළුවන්ද, ගරු ඇමතිතුමා?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මේ තිබෙන්නේ රටේම එකතු වෙච්ච සංචාරක සංවර්ධන බද්ද. ඔබතුමාගේ ප්‍රශ්නයේ තිබෙන්නේ ඒ විධියට.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට, -

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙන වෙනම අහලා නැහැ. ඔබතුමා අහලා තිබෙන්නේ පොදුවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විජිත හේරත් මහතා]

2018 සිට 2026 මැයි දක්වා සංචාරක සංවර්ධන බද්ද අය කිරීම:

වගුව 3.2

| වර්ෂය | සංචාරක සංවර්ධන බද්ද රුපියල් මිලියනවලින් |
|---|---|
| 2018 | 1,482.08 |
| 2019 | 924.24 |
| 2020 | 540.93 |
| 2021 | 818.25 |
| 2022 | 1,440.01 |
| 2023 | 1,473.82 |
| 2024 | 2,582.08 |
| 2025 | 2,583.65 |
| 2026 මැයි | 1,786.95 |
| **එකතුව** | **13,632.01** |

(4) කාමර ධාරිතාව - දිවයින පුරා ලියා පදිංචි සංචාරක ආයතනවල මුළු කාමර ධාරිතාව කාමර 59,578යි.

එක් එක් ආයතනය විසින් ගෙවනු ලබන මුදල ඔවුන්ගේ විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇති පිරිවැටුම මත රඳා පවතී. 2018 සිට 2026 මැයි 30 දක්වා අය කරන ලද මුළු සංචාරක සංවර්ධන බදු මුදල රුපියල් මිලියන 13,632.01කි. ඉහත 3.2 වගුවෙහි ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරය තිබෙනවා.

සියලුම ලියා පදිංචි සංචාරක සේවා ආයතන මා කලිනුත් කිව්වා වාගේ ආයතනයේ වාර්ෂික පිරිවැටුමෙන් සියයට 1 හෝ සියයට 0.5 ලෙස ගණනය කරන ලද අදාළ සංචාරක සංවර්ධන බද්ද - TDL - ගෙවන්න ඕනෑ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ - SLTDA - ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රියාවලියේ දී හිඟ බදු ගෙවීම් අදාළ වන්නේ නම් අය කරගනු ලැබේ.

ඇත්තටම ගත්තොත්, ඔබතුමා අසා තිබෙනවා 2018 සිට 2026 දක්වා එක් එක් හෝටල්, ඒවායේ කාමර ධාරිතාව, ඒවායේ පිරිවැටුම, අදාළ බදු අනුපාතය, ගෙවිය යුතු මුදල්, හිඟ මුදල් පිළිබඳව. සංචාරක සංවර්ධන අධිකාරිය සතුව 2018 සිට මේ දක්වා සියලුම තොරතුරු එක තැනක නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. අපි දැන් මෑත කාලීන ඒවා සකස් කරමින් යනවා. හෝටල් ප්‍රමාණය සහ කාමර ප්‍රමාණය වාගේ තොරතුරු තිබෙනවා. නමුත්, සමහර තොරතුරු එක තැනක එකතු කරලා නැහැ, පසුගිය කාලයට අදාළව. ඔබතුමාට අත්‍යවශ්‍ය වෙන්නේ නැඟෙනහිර පළාතේ තිබෙන හෝටල්වල එක් එක් හෝටලයේ පිරිවැටුම, ගෙවා තිබෙන බදු මුදල්, නොගෙවා තිබෙන මුදල් පිළිබඳ විස්තර. මෑත කාලීනව - 2025, 2026 කාලයේ - සමහර දත්ත ලබා දෙන්න පුළුවන්. පිරිවැටුම පිළිබඳව, එක් එක් ආයතනය ලබන ආදායම පිළිබඳ තොරතුරු ලබා දෙන්න බැහැ. එසේ ලබා නොදීමට අපි බැඳිලා ඉන්නවා. මොකද, ඒවා ඒ ආයතනය සතු - ඒ අයගේ - මූල්‍ය වාර්තා. ඒවා වෙනත් අයට ලබා දීම නීත්‍යානුකූලව කරන්න බැහැ. RTI කොමිසමෙන් ඉල්ලුවත් ලබා ගන්න බැහැ. මොකද, ඒක ඒ අයගේ ආදායම් වියදම් වාර්තාව. නමුත් ඒ හෝටල්වල කාමර සහ අනෙකුත් දේවල් පිළිබඳව තොරතුරු ලබා දෙන්න පුළුවන්. ඒ වාගේම විදේශීය සේවකයන් කොච්චර ප්‍රමාණයක් වැඩ කරනවාද කියලා පොදුවේ අපට එහෙම දත්ත නැහැ. එහෙම දත්ත එක් රැස් කිරීමක් සිද්ධ වන්නේ නැහැ. නමුත් ආගමන විගමන වාර්තා අනුව 2026 ජුනි වන විට සංචාරක ආයතන විසින් සේවයේ යොදවා ඇති වලංගු නේවාසික වීසා බලපත්‍රලාභින් 1,020ක් ඉන්නවා. එතකොට Immigration and Emigration Department එකෙන් ලබා ගත්තු දත්තත් එක්ක අපට කියන්න පුළුවන්, නේවාසික වීසා අරගෙන 1,020ක් දැනට රැකියාවල නියුක්ත වෙනවා කියලා. ශ්‍රී ලාංකික සේවකයන්ගේ ප්‍රමාණය පසුගිය 2018 වසරේ ඉඳලා මේ දක්වා, වසරින් වසර එක තැනක සඳහන් වෙන්නේ නැහැ.

(5) ඔව්.

සංචාරක කලාප අලුතින් පිහිටුවීම කියන කාරණය ගත්තොත්, මේ කියන තත්ත්වයන් වෙනස් කරලා සංචාරක කලාප අලුතින් පිහිටුවන්න සැලසුම් කරලා, දැන් කටයුතු පටන්ගෙන තිබෙනවා.

නව සංචාරක කලාප පිහිටුවීමට හෝ හෝටල් සංවර්ධනය සඳහා රජයේ ඉඩම් වෙන් කිරීම ඇතුළුව, ප්‍රධාන සංචාරක සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීමට පෙර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, එක්සත් ජාතීන්ගේ සංචාරක සංවිධානය සමඟ සහයෝගයෙන් සංචාරක කර්මාන්තය දේශීය ප්‍රජාවන්ට මැනිය හැකි සහ සාධාරණ ප්‍රතිලාභ ලබා දෙන බව සහතික කිරීම සඳහා පුළුල් ප්‍රතිපත්ති රාමුවක් සංවර්ධනය කරමින් සිටී.

මෙම ප්‍රතිපත්ති රාමුව ප්‍රධාන ක්ෂේත්‍ර හතක්, එනම් දේශීය රැකියා, දේශීය ප්‍රසම්පාදනය, ප්‍රජා ප්‍රතිලාභ, ව්‍යාපෘති මට්ටමේ වගකීම්, අධීක්ෂණය සහ අනුකූලතාව, දිස්ත්‍රික් මට්ටමේ හෙළිදරව් කිරීම සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය යනාදිය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. තවද, සියලු තොරතුරු හුවමාරු කිරීමේ අරමුණෙන් යුතුව ජාතික මට්ටමෙන්, පළාත් මට්ටමෙන් සහ දිස්ත්‍රික් මට්ටමෙන් පවා ප්‍රකාශයට පත් කෙරේ.

මෙහි අරමුණ වන්නේ සංචාරක සංවර්ධනය මැනීම, සංචාරක පැමිණීම්, කාමර ධාරිතාව සහ ආයෝජන වටිනාකම මත පමණක් සීමා නොකර සංචාරක සංවර්ධනය ඉදිරියට ගෙන යාමයි. නව සංචාරක ප්‍රධාන සැලැස්ම යටතේ දේශීය රැකියා, දේශීය සැපයුම්දාම හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කිරීම, පාරිසරික හා සංස්කෘතික වත්කම් ආරක්ෂා කිරීම, දේශීය ප්‍රජාවන්ට සැබෑ ප්‍රතිලාභ ලබා දීම සහ තිරසර සංචාරක සංවර්ධනය ඉදිරියට ගෙන යාම සඳහා සංචාරක කර්මාන්තයේ දායකත්වය වැනි කරුණු මත පදනම්ව සංචාරක සංවර්ධනය තක්සේරු කරනු ලැබේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Rasamanickam, you may have your clarification briefly.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த விடயம் சம்பந்தமாகப் பல சந்தேகங்களும் கேள்விகளும் இருக்கின்றன. சிறியதொரு விடயத்தைச் சொல்லி எனது சந்தேகம் தொடர்பில் வினவலாமென நினைக்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, கடந்த காலத்தில் வடக்கு, கிழக்கு மாகாணங்களில் இருக்கின்ற நட்சத்திர விடுதிகளுக்குச் சுற்றுலாப்பயணிகள் தங்குவதற்கு வந்தால், அவர்களை 'வணக்கம்' என்று தமிழ் மொழியில் சொல்லி வரவேற்பதுதான் கலாசாரமாக இருந்தது. கடந்த ஒருசில மாதங்களுக்கு முன்னர், அந்தக் கலாசாரத்தை மாற்றியமைத்து, "ආයුබෝවන්" என்று மட்டும் சொல்லி வரவேற்கச் சொல்கிறார்கள். இதுவொரு பெரிய விடயம் அல்ல. ஆனால், அந்தப் பிரதேசங்களில் இருக்கின்ற கலாசாரம் தொடர்ச்சியாகப் பேணப்பட வேண்டும் என்பதுதான் எங்களுடைய நோக்கமாகும்.

மட்டக்களப்பு மாவட்டத்தின் வாழைச்சேனையில் இருக்கின்ற சாதாரண ஒரு குடிமகனுக்கு - மாஹிர் என்ற நபர் - அந்தப் பிரதேசத்தில் Sri Lanka Tourism Development Authorityஆல் வழங்கக்கூடிய அனுமதிகூட மறுக்கப்பட்டுக் கொண்டு இருக்கின்றது. அதாவது, ஒரு boatஐ இயக்குவதற்குக் கூட அனுமதி மறுக்கப்பட்டுக்கொண்டு இருக்கின்றது. ஏனென்றால், அந்தப் பிரதேசத்தில் பெரியளவு முதலீட்டாளர்களுக்குத்தான் வசதி, வாய்ப்புகள் வழங்கப் படுகின்றன. நான் இது பற்றி கேள்வியிலும் சொல்லியிருக்கிறேன்.

ගරු ඇමතිතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්න නිසා මගේ ප්‍රශ්නය මම සෘජුවම එතුමාගේ අවධානයටත් ගෙන එනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට - Sri Lanka Tourism Development Authority - හෝ එවැනි මොකක්හරි ආයතනයකට සියයට එකක percentage එකක් Sri Lanka Tourism Development Authority එකේ register වුණු hotels ගෙවනවා නම්, සියයට එකක් ප්‍රාදේශීය සභාවටත් ගෙවන්න ඕනෑ කියලා ප්‍රාදේශීය සභා පනතේ තිබෙනවා. මූල්‍ය බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. නමුත් ගරු ඇමතිතුමා කියනවා, සංචාරක හෝටල්වලින් එකතු කර ගන්නා බදු ප්‍රමාණය පිළිබඳ තොරතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බැහැ කියලා; එහෙම ඉදිරිපත් නොකරන්න බැඳිලා ඉන්නවා කියලා. එතකොට ඒ මුදල් ප්‍රමාණය අපට තක්සේරු කර ගන්න බැහැ, ප්‍රාදේශීය සභා මට්ටමේදී. මොකද, ඒ අය ප්‍රාදේශීය සභාවට රුපියලක්වත් ගෙවන්නේ නැහැ. ගරු අමාත්‍යතුමනි, අප මේ කියන්නේ සාමාන්‍යයෙන් පොඩි බිස්නස් කරන මනුස්සයින් බදුවලින් මිරිකන්න කියලා නොවෙයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, බැසිල් රාජපක්ෂ මහත්මයා අමාත්‍යවරයකුව සිටි කාලයේ - 2010දී - සංචාරක හෝටල්වලට අක්කර 2, අක්කර 4 පමණ වන සේ පාසිකුඩාවල තිබෙන රජයේ ඉඩම් කෑලි කඩලා දීලා තිබෙන බව. අද ඒ ආයතන පවත්වාගෙන යන්නේ බ්‍රවුන්ස් ආයතනය, එයිට්කන් ස්පෙන්ස් ආයතනය, හේලීස් ආයතනය වාගේම දේශපාලනඥයන්ගේ හිතවතුන්ගේ companies. එතකොට ඒ companies සියයට එකක් ගෙවන්න බැහැ කියනවා. *[බාධා කිරීමක්]* මම ඉක්මනින් අවසන් කරන්නම්. මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා, Sri Lanka Tourism Development Authority එක පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හමුවට ගෙන එන්න කියලා. බදු ගෙවන්නේ නැතිව ඉන්නේ කොහොමද? දැන් ප්‍රාදේශීය සභාවල ආදායම අඩු වෙලා තිබෙනවා; ඒ වාගේම, ප්‍රාදේශීය සභාවල වියදම් වැඩි වෙලා තිබෙනවා. මොකද, IMF එක පිට දාලා ප්‍රාදේශීය සභාවලට සියයට 20ක්, 40ක් පඩි ගෙවන්න කියනවා. මේ යන විධියට ප්‍රාදේශීය සභාව කුණු ගන්න ආයතනයක් බවටම තමයි පත් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා මඩකලපුවට ආපු වෙලාවේ යෝජනාවක් ඉදිරිපත් කළා, නැගෙනහිර වෙරළ තීරයේ තිබෙන තවත් ඉඩම් පිළිබඳව. මුහුදුබඩ ප්‍රදේශයේ තිබෙන ඉඩම්වලින් විශාල ප්‍රමාණයක් රජයේ ඉඩම්. ඒ ඉඩම් හඳුනාගෙන, ඒ ඉඩම් ටික දීලා අපි අලුතින් tourism zones කිහිපයක හෝටල් ටිකක් හැදුවොත්, අපට ආයෝජකයෙකු ගෙනෙන්න පුළුවන්. ගරු අමාත්‍යතුමනි, මගේ පැහැදිලි කිරීම මේකයි. පාර්ලිමේන්තුවට ගන්න පුළුවන් වෙන්න ඕනෑ ඒ හෝටල්වලින් කරන එම ගෙවීම් පිළිබඳ තොරතුරු. අපි ඒක public document එකක් කරන්න ඕනෑ නැහැ. හැබැයි ඒකට මොනවා හරි ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. මොකද, පෞද්ගලික හෝටල්කාරයෝ ඒ මුදල් රටට දෙන්න ඕනෑ. ප්‍රාදේශීය සභාවෙන් බදු අය කර ගත්තත්, ඒවා රජයේ සල්ලි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you made your clarification.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ආයුබෝවන්" කියන වචනය වාගේම "வணக்கம்" කියලාත් කියනවා නම් හොඳයි. මමත් ඒක අනුමත කරනවා. එහෙම කියන්නේ නැත්නම්, ඒ ස්ථානවල එයත් කියන්න කියලා අපි දැනුම් දෙමු. "සුබ උදෑසනක් වේවා" - "காலை வணக்கம்", "සුබ සැන්දෑවක් වේවා" - "மாலை வணக்கம்" කියලාත් අපි කියමු. ඒක වඩාත් හොඳයි; මමත් ඒකට කැමැතියි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා, බදු පිළිබඳව. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් සංචාරක හෝටල්වලින් සංචාරක පනතට අනුව එක් එක් හෝටලයේ පිරිවැටුම මත සියයට 1ක් TDL එක අය කරනු ලබනවා. ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් මා ඉදිරිපත් කළා. ලැබුණු මුදල මෙච්චරයි කියලා කිව්වා, ඒකේ හංගන්න දෙයක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, එක් එක් හෝටලය ලබා ගන්නා ආදායම ඔබතුමාට ඉදිරිපත් කරන්න බැහැ. ඒක ඒගොල්ලන්ගේ පෞද්ගලික දෙයක්. ඒක SLTDA එකට දෙනවා, ඒක එහි තිබෙනවා. හැබැයි, ඒක ප්‍රසිද්ධ කරන්න බැහැ. මොකද, ඒක ඒගොල්ලන්ගේ පෞද්ගලික මූල්‍ය වාර්තාවක්. ඒකයි මම කිව්වේ. අනෙක් ඒවා ඉදිරිපත් කරලා තිබෙනවා.

දෙවෙනි කාරණාව තමයි, පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත අනුව සියයට 1ට අඩු ප්‍රමාණයක බද්දක් පළාත් පාලන ආයතනවලටත් අය කර ගැනීමේ නෛතික බලයක් තිබීම. ඒක එක් එක් නගර සභාව, ප්‍රාදේශීය සභාව මඟින් කළ යුතු දෙයක්. හෝටල් පැත්තෙන් ඒ පිළිබඳව තද විරෝධයක් තිබෙනවා, මේ විධියට බදු වර්ග දෙකක් ගෙවන්න බැහැ, ඔවුන්ට අසාධාරණයක් වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසාම බොහෝ හෝටල් හිමියන් මේ වනකොට උසාවි ගිහින් නඩු කිහිපයක් දාලා තිබෙනවා. ඒ සමහර නඩු ඇසෙමින් තිබෙනවා, තීන්දු ලැබුණු නඩු කිහිපයකුත් තිබෙනවා. ඒ පිළිබඳ ගැටලුව විසඳා ගන්න වෙන්නේ ඒ පනත් දෙක සංශෝධනය කිරීමෙන් පමණයි. දැන් අපි සංචාරක

[ගරු විජිත හේරත් මහතා]

සංවර්ධන පනත වෙනස් කරන්න පටන් අරගෙන තිබෙනවා, ඒ කටයුත්ත දැන් සිද්ධ වෙමින් තිබෙනවා.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදනයක් තිබෙනවා, සංචාරක හෝටල්වලින් සියයට 1ක් හෝ ඊට අඩුවෙන් බද්දක් ලබා ගත හැකියි කියලා. ඒක ලබා ගැනීම එක් එක් ප්‍රාදේශීය සභාවේ, නගර සභාවේ වගකීමක් වනවා. ඒක තමයි ඔබතුමාගේ ප්‍රශ්නයට මට දෙන්න පුළුවන් පිළිතුර.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The second Ministerial Statement is also to be made by the Hon. Vijitha Herath, Minister of Foreign Affairs, Foreign Employment and Tourism.

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ වාර්තාවේ අඩංගු කරුණු සම්බන්ධව රජයේ ස්ථාවරය: විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## ஐ.நா. மனித உரிமைகள் உயர்ஸ்தானிகரின் அறிக்கையிலுள்ள விடயங்கள் மீதான அரசாங்கத்தின் நிலைப்பாடு: வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று

## GOVERNMENT'S STANCE ON MATTERS IN REPORT OF UN HIGH COMMISSIONER FOR HUMAN RIGHTS: STATEMENT BY MINISTER OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ වාර්තාව සම්බන්ධව ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් 2026.09.09 දින ස්ථාවර නියෝග 27(2) යටතේ යොමු කරන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) වසර ගණනාවකට පෙර සිදු වූ සිදුවීම්වලට අදාළ නඩු සම්බන්ධයෙන් සාක්ෂිමය, විමර්ශනමය හා කාර්ය පටිපාටිමය වශයෙන් සැලකිය යුතු අභියෝග පවතින බව පිළිගැනීම වැදගත්ය. සාක්ෂිකරුවන් මිය යාම හෝ අතුරුදහන්වීම, සාක්ෂි අහිමිවීම හෝ ඒවායේ තත්ත්වය පිරිහීම, කාලය ගතවීම සහ විමර්ශන නිලධාරින් හා ආයතනික ව්‍යුහයන්හි වෙනස්කම් එම අභියෝගවලට ඇතුළත් වේ.

ඒ අතරම, වගවීම තහවුරු කිරීමට සහ ගැටුමෙන් පැන නැඟුණු ගැටලු විසඳීමට රජය විසින් ඵලදායී පියවර ගෙන ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ හානිපූරණය සඳහා වන කාර්යාලය වැනි ආයතනවල කටයුතු මෙන්ම, ක්‍රියාත්මක වෙමින් පවතින අධිකරණ සහ ආයතනික ක්‍රියාවලි හරහා ලබා ඇති අර්ථවත් ප්‍රගතිය ඊට ඇතුළත් වේ.

නීතිවිරෝධී ක්‍රියා පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම සහ ඊට සම්බන්ධ ඕනෑම පුද්ගලයෙකුගේ සමාජ තත්ත්වය, තනතුර හෝ පසුබිම නොසලකා සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීමට ද රජය කැප වී සිටී. වැදගත් සහ ඉහළ අවධානයට ලක් වූ සිද්ධි ගණනාවක් සම්බන්ධයෙන් විමර්ශන නැවත ආරම්භ කිරීම සහ ඉදිරියට ගෙන යාම ඇතුළුව පසුගිය වසර දෙක තුළ සිදු වූ වර්ධනයන් මඟින්, මෙම කැපවීම ප්‍රායෝගික ක්‍රියාමාර්ග බවට පරිවර්තනය වෙමින් පවතින බව පෙන්නුම් කෙරේ.

ස්වාධීන ජාතික යන්ත්‍රණ හරහා මෙන්ම, නිසි ක්‍රියා පටිපාටි, නීතියේ ආධිපත්‍යය සහ අදාළ නීතිමය රාමුවට අනුකූලව මෙම කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාමට රජය කටයුතු කරනු ඇත.

(ආ) බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනතේ 23 වන වගන්තිය, නීතිමය කාල සීමාවන් සීමා කිරීම් ඇතුළු අනෙකුත් ලිඛිත නීතිවලට වඩා ප්‍රමුඛත්වය ගන්නා බව රජයේ ස්ථාවරය වන අතර, 2025 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාව පිළිබඳව පැවති මූලික සමාලෝචනයේදී බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම් පිළිබඳ කමිටුව - CED - වෙත මෙම ස්ථාවරය දැනුම් දෙන ලදී.

බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම් පිළිබඳ කමිටු සමාලෝචනය පැවති අවස්ථාවේදී, එම පනත සම්මත කිරීමෙන් පසු, නඩු පැවරීමක් සඳහා එය මෙතෙක් භාවිත කර නොමැති බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දෙන ලදී.

මේ පනත ගෙනෙන්නේ මෑත කාලයේ; 2018න් පස්සේ. අතීතයට බලපාන ලෙස මෙම පනත ක්‍රියාත්මක කළ හැකි ද යන්න පිළිබඳ අධිකරණමය අර්ථ දැක්වීමක් තවම ලැබී නැහැ. මේ කාලය ගත්තොත්, අතුරුදහන්වීම් නැහැ. ඉතින් අපි සන්තෝෂ වනවා, 2024න් පස්සේ ඒ අතුරුදහන්වීම් නැහැ, එම නිසා මේ පනත යටතේ නඩු පැවරීමක් සම්බන්ධව කරුණු පැන නඟින්නේ නැහැ.

(ඇ) සහජීවනය පිළිබඳ දේශීය යන්ත්‍රණ වන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය - OMP, හානිපූරණය සඳහා වන කාර්යාලය - OR - සහ ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය - ONUR - ශක්තිමත් කරන ලද මානව සහ මූල්‍ය සම්පත් යොදා ගනිමින් තම අදාළ කාර්යභාරයන් අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් සිටී.

අතුරුදහන් වූවන් සම්බන්ධ පැමිණිලි පිළිබඳ විමර්ශන කඩිනම් කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත රුපියල් මිලියන 375ක් වෙන් කර ඇති අතර, ඉදිරි වසර දෙක තුළ අතිරේක සිද්ධි 10,000ක් පමණ විසඳීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම, ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සම්බන්ධ වීම තුළින් අධිකරණ වෛද්‍ය පරීක්ෂාවන් ශක්තිමත් කිරීමටත්, ප්‍රාදේශීය කාර්යාල සහ මාර්ගගත පහසුකම් හරහා සිය සේවා වෙත ප්‍රවේශ වීමේ හැකියාව වැඩිදියුණු කිරීමටත් එම ආයතනය කටයුතු කරමින් සිටී.

හානිපූරණය සඳහා වන කාර්යාලය මූල්‍ය ආධාර පමණක් නොව, ජීවනෝපාය සහ මනෝ-සමාජීය සහාය මෙන්ම ප්‍රජා මූලික වැඩසටහන් ද අඛණ්ඩව මෙහෙයවමින් සිටී. මේ අතර ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය රට පුරා පිහිටි සහජීවන සංගම් 7,000කට අධික සංඛ්‍යාවක් හරහා බිම් මට්ටමේ සම්බන්ධතා පුළුල් කර ඇත.

ජාත්‍යන්තර සහයෝගීතාව සම්බන්ධයෙන් ගත්තාම, පසුගිය වසර දෙක තුළ පෙන්නුම් කළ අඛණ්ඩ සහ ඵලදායී සම්බන්ධතාවෙන් පැහැදිලි වන පරිදි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පද්ධතිය සමඟ ඵලදායීව කටයුතු කිරීමට රජය අපේක්ෂාවෙන් පසු වේ. දේශීය යාන්ත්‍රණයන්හි ප්‍රගතිය පිළිබඳව අපි මානව හිමිකම් කවුන්සලය - HRC - නිරන්තරයෙන් දැනුවත් කර ඇති අතර, අපගේ අවශ්‍යතාවන්ට අනුකූලව තාක්ෂණික සහාය ලබා ගැනීමට ද විවෘතව කටයුතු කර ඇත්තෙමු.

මේ ONUR, OR සහ OMP පසුගිය කාලයේ අකර්මණ්‍ය කරලා තිබුණේ. මුදල් ප්‍රතිපාදන වෙන් කළේත් නැහැ, මානව සම්පත් වෙන් කළේත් නැහැ. අපි බලයට ආපු ගමන් මේ ආයතන තුනම ශක්තිමත් කරලා භෞතික වශයෙනුත් අපි යම් යම් සම්පත් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය කාර්යාල තවත් පුළුල් කරලා තිබෙනවා. මානව සම්පත් ප්‍රමාණයත් වැඩි කරලා පරීක්ෂණ කඩිනම් කරන්න පටන් අරගෙන තිබෙනවා.

(ඈ) වෙම්මනි සමූහ මිනී වළට අදාළව මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ ප්‍රශ්න ලැයිස්තුවට ශ්‍රී ලංකා රජය විසින් පහත ප්‍රතිචාරය දැනුම් දී ඇත:

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය - OMP - ජාතික නීති රාමු සහ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව සමූහ මිනීවළවල් ඇතැයි සැක සහිත ස්ථාන හඳුනා ගැනීම, විමර්ශනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සංයුක්ත පියවර මාලාවක් ගෙන ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ පනතේ 13(1)(K)(iii) වගන්තියට අනුව, සමූහ මිනී වළක් යැයි සැලකිය හැකි ස්ථානයක් හඳුනා ගත් විට, මහේස්ත්‍රාත්වරයෙකු, අධිකරණ වෛද්‍ය නිලධාරීන්, අධිකරණ වෛද්‍ය විශේෂඥයින් සහ නීතිය ක්‍රියාත්මක කරන්නන් සම්බන්ධ අධිකරණ අධීක්ෂණය යටතේ කැණීම් සහ විමර්ශන ඇතුළු අවශ්‍ය පියවර ගනු ලබන අතර, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සම්බන්ධීකරණය සහ තාක්ෂණික සහාය ලබා දෙයි. ස්ථාන කළමනාකරණය සහ අධිකරණ වෛද්‍ය විශ්ලේෂණය ආවරණය වන ලෙස විමර්ශන සඳහා මූල්‍ය සම්පත් අධිකරණ අමාත්‍යාංශය විසින් සපයනු ලබයි.

කැණීම්වලින් අනාවරණය කරගත් අස්ථි හඳුනා ගැනීමේ හැකියාව සහ සංරක්ෂණය සහතික කිරීම සඳහා අධිකරණ වෛද්‍ය ප්‍රොටෝකෝල භාවිත කරනු ලැබේ. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වෙමින්, වෙම්මනි, කොළඹ වරාය සහ කොක්කුතොඩුවායිහි සිදුකළ මෑත කාලීන විමර්ශන මඟින්, අධිකරණ වෛද්‍ය හැකියා වැඩිදියුණු කිරීම, විනිවිදභාවය සහතික කිරීම සහ පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීම සඳහා වන අඛණ්ඩ කැපවීම් ඉස්මතු කරයි.

(ඉ) ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ වැදගත් අංගයක් ලෙස ඉඩම් නැවත පවරා දීම සැලකිය හැක. ආරක්ෂක හමුදා විසින් මීට පෙර භාවිත කරන ලද ඉඩම්වලින් බහුතරයක් මේ වන විට නැවත පවරා දී ඇත. ඉඩම් නිදහස් කිරීම, ඉඩම්වල වටිනාකම ගෙවීම සහ විශේෂ වන්දි ලබා දීම සම්බන්ධ ගැටලු විමර්ශනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් විශේෂ අන්තර් අමාත්‍යාංශ කමිටුවක් පත් කර ඇත. ගැටුම් පැවති කාල සීමාවේදී භාවිත කරන ලද ඉඩම්වලින් බහුතරයක් මේ වන විට නැවත පවරා දී ඇති අතර, ඉතිරි ප්‍රදේශ සාමාන්‍ය ආරක්ෂක ක්‍රියා පටිපාටිවලට යටත්ව පවතින නමුත්, මහ ජනතාවට ප්‍රවේශ විය හැකි තත්ත්වයේ පවතී.

දැනටමත් එම විශේෂ කමිටුව මඟින් එම දිස්ත්‍රික්කවල ඉඩම් පිළිබඳ සමාලෝචනයක් කරලා ක්‍රමානුකූලව ඉඩම් නිදහස් කිරීම ආරම්භ කරලා තිබෙනවා. එහිදී වන්දි මුදලට අමතරව මානුෂීය දීමනාවක් ලබා දෙන්නත් රජය තීරණය කර තිබෙනවා. උදාහරණයක් විධියට කිව්වොත්, යාපනය ගුවන් තොටුපළ සඳහා ඉඩම් පවරා ගැනීමක් සිද්ධ වෙලා තිබුණා. ඒ සඳහා අතීතයට බලපාන පරිදි ඇත්තටම සාධාරණ මානුෂීය වන්දි දීමනාවක් ලබා දෙන්න රජය තීරණය කර තිබෙනවා. ඒ අනුව සියලු ඇස්තමේන්තු කටයුතු අවසන් වුණාට පස්සේ, ඉඩම් පවරා ගැනීමට අදාළ ගැසට් නිවේදනය නිකුත් කළ දවසේ ඉඳලා ලැබිය යුතු වන්දි මුදලට අමතරව මානුෂීය දීමනාවක් විධියටත් යම් මුදලක් ලබා දෙන්න රජය දැනටමත් තීරණය කර තිබෙනවා.

(ඊ) එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ අදහස් ඇතුළුව පුළුල් උපදේශන ක්‍රියාවලියකින් අනතුරුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කර ඒ වෙනුවට ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීම පිළිබඳ නව නීති සම්පාදනයක් හඳුන්වා දී ඇත. අනිසි භාවිතයන්ට එරෙහි ආරක්ෂණ විධිවිධාන සහ මූලික නිදහස තහවුරු කරන විධිවිධාන ඇතුළත් මෙම නව නීති කෙටුම්පතට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර, 2026.09.22 දින ගැසට් කර 2026.10.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

(උ) පළාත් සභා මැතිවරණ පැවැත්වීමට අදාළව පවතින නීතිමය ගැටලු විසඳූ වහාම එම මැතිවරණ පවත්වන බව ශ්‍රී ලංකා රජය අවස්ථා කිහිපයකදීම එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත දැනුම් දී ඇත. මා සභාපතිත්වය දරන, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ද සාමාජිකයෙකු වන විශේෂ කමිටුවක් මඟින් මෙම ක්‍රියාවලිය සමාලෝචනය කරමින් පවතී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සිදු කිරීමට රජය අඛණ්ඩව කැප වී සිටී.

(ඌ) සාක්ෂි එකතු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ යාන්ත්‍රණය වැනි බාහිර යාන්ත්‍රණ මඟින් සිදු වන්නේ බෙදීම් ඇති කිරීම පමණක් වන අතර, එමඟින් දේශීය මට්ටමින් ආරම්භ කර ඇති අව්‍යාජ සහ ප්‍රායෝගික ජාතික ක්‍රියාවලි අනතුරේ හෙළන බැවින්, එවැනි යාන්ත්‍රණ සම්බන්ධයෙන් අපි නිරන්තරයෙන්ම දැඩි විරෝධතා සහ ගැටලුකාරී ස්ථාවර පළ කර ඇත්තෙමු. ජාත්‍යන්තර මැදිහත්වීම් මඟින් ජාතික ප්‍රයත්නයක් ආදේශ කිරීම නොව, ඒවාට අනුබල දීම සහ ශක්තිමත් කිරීම සිදු විය යුතුය.

තවද, සාක්ෂි එකතු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ යාන්ත්‍රණය පිහිටුවීමට මඟ පෑදූ මානව හිමිකම් කවුන්සලයේ යෝජනා 46/1 සහ 51/1 මෙන්ම, එහි කාල සීමාව දීර්ඝ කිරීම සම්බන්ධයෙන් පසුව සම්මත වූ යෝජනා ද ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතික්ෂේප කර ඇති බව මෙහිදී සඳහන් කළ යුතුය.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Shanakiyan Rasamanickam, you can seek a brief clarification.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, to get something clarified on this will take an extensive amount of time, but I would not take that much time.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Be very brief, please.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Okay, Sir. But, give me a reasonable amount of time because the Hon. Minister made a very lengthy response. And, I will limit my questions to a few areas.

Hon. Minister, you mentioned that you all were taking certain actions regarding the Chemmani mass graves. However, we have repeatedly stated, on behalf of the victim community, their position, that they have no faith in any domestic mechanism. And especially on Chemmani, why is your Government still hesitant to seek international expertise for DNA testing? You and I both know that the Government of Sri Lanka, the Sri Lankan administration, the police force or any other judicial structure, which the Hon. Minister concerned also confirmed, does not have the expertise to do DNA testing, especially on human remains which may date back to 20, 30 years. So, there is no point in us excavating or exhuming another 500 skeletons with no action being taken on the already exhumed skeletons.

Then, the next issue, Hon. Minister, is about the release of lands occupied by the military. You very correctly said that access has been given to certain areas; the public can now access those areas. For example, the Vasavilan-Palaly Road, which they can travel on, but cannot go to their lands. In Myliddy, Palaly and Keppapilavu, protests have been going on for more than 12 to13 weeks. So, you have to tell us either you are not going or you are going to release those lands.

Also, with regard to the Prevention of Terrorism Act, Hon. Minister, you have said that the Government is planning to repeal it. But, Saliya Peiris, President's Counsel has, on his Facebook account, mentioned that he disagrees with the report of the committee he was also part of, saying that what was given in the report is not what was agreed on the Bill at the Committee. There are three things that he has contradicted. And, the Bill you are bringing in to replace the PTA seems not far better than the PTA; it seems to be worse than the PTA, in some sense.

The last one, Sir, is this. காணாமலாக்கப்பட்டோர் சம்பந்தமான விடயத்தில், கடந்த அரசாங்கங்கள் வெவ்வேறு நிலைப்பாடுகளைக் கடைப்பிடித்தது. அதாவது, மஹிந்த ராஜபக்ஷ அவர்கள் LLRC என்று சொன்னார். 2015ஆம் ஆண்டில் இருந்த 'நல்லாட்சி' அரசாங்கமானது, "நாங்கள் ஒத்துழைப்பு வழங்கி, விசாரிக்கிறோம்" என்று சொன்னது. கோட்டாபய ராஜபக்ஷ அவர்கள், "நாங்கள் எதுவுமே செய்ய மாட்டோம்" என்று சொன்னார். ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் TRCஐக் கொண்டுவந்தார். இந்த அனைத்து உள்நாட்டுப் பொறிமுறைகளையும் நாங்கள் முழுமையாக நிராகரித்தோம்.

இந்த அரசாங்கத்தினர் ஐக்கிய நாடுகள் சபையில் போய் சொல்கிறார்கள், "நாங்கள் OSLAPஐ நிராகரிக்கின்றோம்; உள்நாட்டுப் பொறிமுறையைத்தான் ஏற்றுக்கொள்ளப் போகின்றோம்; எந்தவிதமான சர்வதேச பொறிமுறையையும் ஏற்றுக்கொள்ளமாட்டோம்" என்று. ஆனால், உள்நாட்டுக்குள் இருக்கின்ற OMP, OR போன்ற நிறுவனங்களை, இலங்கையிலே இருக்கின்ற பாதிக்கப்பட்ட தரப்பினருடைய பிரதிநிதிகளாகிய நாங்களும் பாதிக்கப்பட்ட தரப்பினரும் நிராகரித்ததற்குப் பிறகு, உள்நாட்டுப் பொறிமுறை ஊடாக எப்படி நீங்கள் தீர்வு காணப் போகிறீர்கள்? அதுமாத்திரமல்ல, நாட்டுக்குள் உள்நாட்டுப் பொறிமுறைமீது நம்பிக்கை வரக்கூடிய வகையிலான எந்த நடவடிக்கையும் இல்லை. நீங்கள் சொன்னதுபோல, 2024ஆம் ஆண்டுக்குப் பிறகு கடத்தல் சம்பவங்கள் நடக்கவில்லை என்பதை நாங்கள் ஏற்றுக் கொள்கின்றோம்; அதனை வரவேற்கின்றோம்.

ආණ්ඩුව ගෙන යන වංචා, දූෂණ මර්දන වැඩ පිළිවෙළට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. හැබැයි, අපට accountability පිළිබඳව යම්කිසි සැකයක් තිබෙනවා. Progress පිළිබඳව, we are a little disappointed, Hon. Minister.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චෙම්මනි සමූහ මිනී වළ විතරක් නොවෙයි, අනෙකුත් සියලු සමූහ මිනී වළවල් සම්බන්ධයෙන් කැණීම් කටයුතු සිදු කරනවා. අධිකරණ අධීක්ෂණය මත තමයි ඒ සියල්ල සිද්ධ වෙන්නේ. එහිදී අපි අනිවාර්යයෙන් ජාත්‍යන්තර විශේෂඥ සහාය ලබා ගන්න දැනටමත් කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. මගේ ප්‍රකාශයේදීත් මම ඒක පැහැදිලිව කිව්වා. UN එකෙන් හෝ ICCRP එකෙන් හෝ විද්‍යාත්මක විශේෂඥ දැනුම ලබා ගන්න අපි මැදිහත් වෙනවා. නමුත් චෙම්මනි සමූහ මිනී වළ ගත්තොත්, තවමත් එහි කැණීම් කටයුතු කරනවා. ඒ සියල්ල අවසන් වනකොට අපි අවශ්‍ය අවස්ථාවලදී - DNA පිළිබඳ වාර්තා ගන්න, කාල නිර්ණය කරන්න අවශ්‍ය කරන විට - විශේෂඥ සහාය ගන්න ඉදිරියේදී මැදිහත් වෙනවා.

ඉඩම් නිදහස් කිරීම ගත්තොත්, ඔබතුමා ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. අපි බලයට එනකොට පලාලි ප්‍රදේශය ඔහොම නොවෙයි තිබුණේ, barriers දාලා යන්නත් බැරිව පාරවල් වහලා තිබුණේ. දැන් අපි barriers අයින් කරලා තිබෙන නිසා බස් ධාවනය වනවා. ගමනාගමනය - ප්‍රවාහන කටයුතු - සිද්ධ වෙනවා. උතුරේ වාගේම නැඟෙනහිර පළාතෙත් ගොඩක් barriers අපි දැනටමත් අයින් කර තිබෙනවා. දැන් උතුරු පළාතේ military checkpoint එකක්වත් නැහැ. ඔබතුමා ඒ ගැන සතුටු වෙන්න ඕනෑ. අපි ඒ වාගේ ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ වාගේම ඉඩම් නිදහස් කිරීම ක්‍රමානුකූලව සිද්ධ කරනවා. ඒ ඉඩම්වල අයිතිය තහවුරු කරන්න ඕනෑ. ඉඩම් කච්චේරි තියන්න ඕනෑ. මොකද, සමහර අයිතිකරුවන් ඇත්තටම ලංකාවේ නැහැ. සමහරු මිය ගිහිල්ලා, අයිතිකරුවන් කියලා වෙන අය ඇවිල්ලා අයිතිවාසිකම් කියනවා. එවැනි ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අපි ඒ ප්‍රශ්නවලට ක්‍රමානුකූලව මැදිහත් වෙමින් ඉන්නවා. අපේ ස්ථාවරය තමයි, උතුරු පළාතේ හා නැඟෙනහිර පළාතේ යුද කටයුතු සඳහා ලබා ගත් සියලු පෞද්ගලික ඉඩම් හැකි ඉක්මනින් නැවත නිදහස් කිරීම. ඉඩමක් නිදහස් කරන්න බැරි නම්, යම්කිසි සංවර්ධන කටයුත්තක් සඳහා එය ගන්න තිබෙනවා නම් ඒ සඳහා අනිවාර්යයෙන්ම සාධාරණ වන්දි මුදලක් ලබා දෙනවා.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් අපිම - කැබිනට් මණ්ඩලයෙන්ම - විශේෂ කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ යම් යම් සාමාජිකයන්ගේ අදහස්වල වෙනස්කම් තිබුණා. වෙනස් අදහස් ඇතිව තමයි අවසාන වාර්තාවක් සකස් කළේ. වෙනස් අදහස් තිබුණු අයගේ යෝජනාත් වාර්තාවේ සඳහන් වෙනවා. අවසානයේදී ඒ වාර්තාව අරගෙන කැබිනට් මණ්ඩලයත් ඒ සම්බන්ධයෙන් නැවත යෝජනා ඉදිරිපත් කරනවා. ගරු

මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කරපු ආකාරයට සාලිය පීරිස් නීතිඥ මහත්මයා ඒ කමිටුවේදී යෝජනා කරපු දේ වෙනුවට ඊට වඩා වෙනස් යෝජනාවක් කැබිනට් මණ්ඩලයෙන් ඉදිරිපත් වුණා. ඒක සාමාන්‍ය දෙයක්. කමිටුවෙන් දීපු වාර්තාවම පිළිගන්න ඕනෑ කියලා එකක් නැහැ. අපි කමිටුවක් පත් කරන්නේ ඒ කාර්යය පහසු කිරීම සඳහායි. ඒක කැබිනට් මණ්ඩලයේදී වෙනස් කරන්නත් පුළුවන්, නැවත පාර්ලිමේන්තුවට ආවාට පස්සේ පාර්ලිමේන්තුවේදී වෙනස් කරන්නත් පුළුවන්. ඒ වාගේම දැනටමත් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු කිහිපයකුත් දාලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය මඟින්ුත් ඒක තව වෙනස් කරන්න පුළුවන්. එම නිසා කමිටුවෙන් දීපු වාර්තාව එලෙසම ක්‍රියාත්මක කරන්න ඕනෑ කියන එක වැරැදි අදහසක්. මම හිතන විධියට, එතුමාට ඒක පැහැදිලියි, තේරෙනවා. ඔබතුමාටත් ඒක පැහැදිලියි නේ, ගරු මන්ත්‍රීතුමනි.

කමිටුවෙන් වාර්තාවක් දුන්නා. ඒක කමිටුවේ සියලු දෙනාගේම ඒකමතික අදහස නොවෙයි. ඒක හරි. විවිධ අදහස් තිබෙනවා. ඔය කාරණාව විතරක් නොවෙයි, වෙනත් කරුණු සම්බන්ධයෙනුත් කමිටුවේ හිටපු සාමාජිකයන් වෙනත් අදහස් දැරුවා. පොලීසියේ අය මැදිහත් වුණා. පොලීසියේ පැත්තෙන් ගත්තාම, ඔවුන් සමහර ඒවා වෙනස් කරන්න ගොඩක්ම අකැමැතියි. එහෙමත් තිබෙනවා. අපි ඒ සියල්ලම සැලකිල්ලට අරගෙන තමයි අවසානයේදී මේ අලුත් පනත් කෙටුම්පත සකස් කරලා තිබෙන්නේ.

ඊළඟට, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ යන්ත්‍රණය පිළිබඳව, LLRC එක පිළිබඳව ඔබතුමා මතු කළා. අවසානයේදී ගත්තොත්, අපේ දේශීය යන්ත්‍රණය තමයි ඇත්තටම විනිවිදභාවයෙන් යුක්ත විශ්වසනීයම යන්ත්‍රණය. ඒකට බාහිර බලපෑම් අවශ්‍ය නැහැ. මම කලින් සඳහන් කළා වාගේම බාහිර බලපෑම්වලින් වෙන්නේ නැති ප්‍රශ්න ඇති කරන එක, නැති බෙදීම් ඇති කරන එක, නැවත ජාතිවාදී ගැටුමකට තල්ලු කරන එක, අනවශ්‍ය බාහිර අත පෙවීමකට ලක් වන එක. එම නිසා අපි කැමැති නැහැ, ජාතික සංහිඳියාව නැති කරන්න. අපට අවංකවම අවශ්‍ය කරන්නේ රටේ ජාතික සංහිඳියාව, ජාතික සමගිය ඇති කිරීමයි.

ඒක අපේ රටේ ජනතාවට පුළුවන්. අපේ ආණ්ඩුවට පුළුවන්. ඒ විශ්වාසය අපේ රටේ ජනතාවට තිබෙනවා. ඒ නිසා තමයි ජාතික ජන බලවේගයට උතුරෙන්, නැඟෙනහිරෙන් අතිවිශාල ජන වරමක් ලැබුණේ. ඒ විශ්වාසය දැන් පැහැදිලිව තිබෙනවා. අපි ඒ විශ්වාසය වෙනුවෙන් උතුරු නැඟෙනහිර පළාත්වල සංවර්ධන කටයුතු වේගවත් කරලා විශාල සංවර්ධන කටයුතු ප්‍රමාණයක් කරගෙන යනවා. ඒ වාගේම මානව හිමිකම් ආරක්ෂා කරමින් ජාතික සංහිඳියාව දේශීය යන්ත්‍රණයක් තුළ ශක්තිමත් කරන්න අපි ශක්තිමත්ව පියවර ගනිමින් තිබෙනවා. අපි විශ්වාස කරන්නේ අපේ දේශීය යන්ත්‍රණය. අපි ඒ මත පදනම් වෙලා ඉදිරියටත් කටයුතු කරනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, I wish to raise a point of Order under Standing Order No. 121.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member, what is it?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කිව්වා, පළාත් සභා ඡන්ද විමසීම පිළිබඳ වන විශේෂ කාරක සභාව - Select Committee එක - පිළිබඳව. මමත් එහි සාමාජිකයෙක් කියලා කිව්වා. ඔබතුමා දන්නවා, අපි ඒ කමිටුවෙන් ඉවත් වුණා කියන එක. මොකද, ඒ පළාත් සභා ඡන්ද විමසීම පිළිබඳව තිබෙන විශේෂ කමිටුව කල් මැරීමේ උපක්‍රමයක් කියලා අපට සැක හිතෙන නිසා විපක්ෂයේ අපේ ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේදී සඳහන් කළා, විපක්ෂයේ හතර දෙනාම ඒකට සහභාගි වෙන්නේ නැහැ කියලා. හැබැයි, ඔබතුමාගේ ප්‍රකාශයේදී ඔබතුමා කිව්වා, ඔබතුමා එම කමිටුවේ සභාපති කියලා. ඒක ඇත්ත. මම සාමාජිකයෙක් කියලා කිව්වා. ඒ "සාමාජික" කියන එක වැරදියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඇවිල්ලා, "ඉදිරියේදී දැඩි ක්‍රියාමාර්ගයක් ගන්න වෙනවා" කියලා කමිටුවට සඳහන් කරලා ගියා. හැබැයි, කමිටුවේ සාමාජිකත්වයෙන් ඉවත් වෙනවා කියලා මෙතෙක් ලිඛිතව දැනුම් දීලා නැහැ. *[බාධා කිරීමක්]* අනෙක් සාමාජිකයන් කිසි කෙනෙක් "මේ කමිටුවෙන් අපි අනිවාර්යයෙන්ම ඉල්ලා අස් වෙනවා" කියලා මේ වනතෙක් දැනුම් දීමක් කරලාත් නැහැ. ඒ නිසා ඒ සාමාජිකත්වයෙන් ඉවත් වෙන්න නම්, ඔබතුමන්ලා ලිඛිතව,- *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා දන්නවා නේ, කමිටුවක ක්‍රමවේදය. පක්ෂයක මහ ලේකම්වරයෙක් නේ. ඒ නිසා ඒ ක්‍රමවේදයට අනුව කටයුතු කරන්න. එතැන් සිට අපි නීත්‍යනුකූලව පිළිගන්නවා. හැබැයි, කමිටුවේ වැඩකටයුතු ඉදිරියට යනවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next Ministerial Statement is to be made by the Hon. Anura Karunathilaka, Minister of Ports and Civil Aviation and Minister of Energy.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Did he mention your name, Hon. Member?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම ඒ කමිටුවේ සාමාජිකයෙක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කමිටුවේ සාමාජිකයන් 12දෙනෙක් ඉන්නවා. *[බාධා කිරීමක්]*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
රාසමාණික්කම් මන්ත්‍රීතුමා මගේ නම කිව්වා.*[බාධා කිරීම]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I mentioned his name, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Why do you have to mention names?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sorry, Sir, I will not do it in the future; I will refrain from doing it in the future.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

159දෙනාගේම නම් කියනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

හරි ඉතින්,-*[බාධා කිරීමක්]* මේක ඒකාධිපති ජේවීපී එක නොවෙයි. -*[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, නරක විධියකට නම කිව්වේ නැහැ. ඔබතුමාට අපහාස කරන විධියට නම කියලා නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

What is your point of Order, Hon. Chaminda Wijesiri?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 28(උ) සහ ස්ථාවර නියෝග 91(උ) යටතේ මම කියන්නේ.

ස්ථාවර නියෝග 28(උ) හි තිබෙන්නේ මූලික කටයුතුවලට කලින් මේ සභාව තුළ සිදුවෙච්ච දෙයක් පිළිබඳව ඔබතුමාගෙන් අපට ප්‍රශ්න කරන්න පුළුවන් කියන එක. ස්ථාවර නියෝග 91(උ) යටතේ කටයුතු කිරීමේ බලය තිබෙන්නේ තමුන්නාන්සේට. ඒක 91(උ) යටතේ තිබෙන්නේ ඔබතුමාට තමයි. ඒක සභානායකට නැහැ. ඊළඟට, ස්ථාවර නියෝග 146 යටතේත් බලය තිබෙන්නේ තමුන්නාන්සේට. වේලාව දෙනවාද, නැද්ද කියන කාරණා. ඒකට සභානායකට බලය දෙන්න යන්න එපා. ඒක කථානායකතුමා දීලා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ නිසා ඔබතුමා ඒ බලය දෙන්න හදන්න එපා, සභානායකට. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Now, Hon. Anura Karunathilaka, you can make your Ministerial Statement.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Now, give ear to the Hon. Anura Karunathilaka. I will get back to you later, Hon. Ravi Karunanayake.

## සූර්ය බලශක්ති උත්පාදනය සඳහා "නෙට් ප්ලස්"ක්‍රමවේදය හඳුන්වා දීම: බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## சூரிய மின்சக்தி உற்பத்தி சம்பந்தமாக 'நெட் பிளஸ்' முறைமை அறிமுகம்: வலுசக்தி அமைச்சரினது கூற்று
## INTRODUCTION OF NET PLUS BASIS FOR SOLAR POWER GENERATION: STATEMENT BY MINISTER OF ENERGY

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025/2026 කාලය තුළ ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳව ගැටලුවක් පැන නැඟුණු නිසා ජනනය වන සමාගමට වාගේම ඒ ජනනය වන අතිරේක ජනනය සොයා ගැනීම සඳහා NSO සමාගමටත් කිසියම් බලපෑමක් ඇති වුණා. ඒ වාගේම ඒ අවස්ථාවේදී අපි ප්‍රකාශයට පත් කළා, මේ ක්‍රියාවලිය අවසන් වූ වහාම ඒ පිළිබඳව ගණනය කරලා මහජනතාවටත්, මේ සභාවටත් දැනුම් දෙනවා කියලා. ඒ අනුව, මේ ප්‍රමිතිය පිළිබඳ ගැටලුව නිසා NSO සමාගමට තමන්ගේ නොලැබිච්ච megawatt ප්‍රමාණය ලබා ගැනීම සඳහා අතිරේක පිරිවැය හැටියට බිලියන 8.572ක් වැය වෙලා තිබෙනවා. ඒ වාගේම ගල් අඟුරු වැඩිපුර ලබා ගැනීමට සහ අත්‍යවශ්‍ය maintenance කටයුතු පවත්වාගෙන යාමට, additional handling cost එකක් හැටියට EGL සමාගමට බිලියන 7.192ක් ගිහිල්ලා තිබෙනවා.

ඒ වාගේම මේ අවස්ථාවේදී මම සඳහන් කරන්න කැමැතියි, ගරු ජනාධිපතිතුමාත්, අපිත් රජයක් හැටියට කිව්වේ, මේකේ බර කිසි ලෙසකින්වත් ජනතාවට - විදුලි පාරිභෝගිකයන්ට - ලබා දෙන්නේ නැහැ කියලායි. ඒ අනුව මේ සමාගම විසින් කාර්ය සාධන ඇපකරයක් වාගේම ඒ ඒ අවස්ථා සඳහා කළ දඬුවම් මුදල හැටියට බිලියන 16.989ක් මේ වෙනකොට ලංකා ගල් අඟුරු සමාගම විසින් රඳවා ගෙන තිබෙනවා. ඒ අනුව සම්පූර්ණ අලාභය වශයෙන් දැනට ගණන් හදලා තිබෙන්නේ, බිලියන 15.765ක්. සමාගම විසින් රඳවා ගෙන තිබෙනවා, බිලියන 16.989ක්. මම දැන් ප්‍රධාන ප්‍රකාශයට එන්නම්. මේක අතිරේකව කියපු කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වහලය මත සවිකරන ලද සූර්ය බලාගාර සම්බන්ධතා පිළිබඳව පසුගිය දිනවල මේ සභාවේ යම් යම් අදහස් ප්‍රකාශ වුණා. මතු වුණු ඇතැම් කරුණු ජනතාව නොමඟ යවනසුලු ඒවා නිසා ඒ ගැන යම් පැහැදිලි කිරීමක් මේ සභාවට ඉදිරිපත් කරන්න මා කල්පනා කළා.

ඇතැම් අය මතු කරන්නට හදනවා සැප්තැම්බර් 11වැනි දා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමා නිකුත් කරපු ලිපිය විදුලිබල මණ්ඩලයේ අනුප්‍රාප්තික සමාගම්වලට නිකුත් කළ නියෝගයක් කියලා. එය සම්පූර්ණ අසත්‍යයක්. ලේකම්තුමා සිදු කළේ, EDL සමාගමෙන් කරුණු පැහැදිලි කිරීමක් ඉල්ලා එවන ලද ලිපියට කරුණු පැහැදිලි කරමින් පිළිතුරු ලිපියක් යැවීම පමණයි.

EDL සමාගමට නිරාකරණය කර ගැනීමට සිදුවූ කාරණය තමයි, ගැසට් පත්‍රයේ කැබිනට් අනුමැතිය සහිතව පළවෙලා තිබෙන ජාතික අයකුම ප්‍රතිපත්තියට - National Tariff Policy එකට - අනුව පසුගිය මාර්තු 5වැනි දා සිට වහලය මත සවිකරන සූර්ය බලාගාර සම්බන්ධතා ලබා දිය හැක්කේ Net Plus පදනමින් පමණක් යැයි තිබියදී මහජන උපයෝගිතා කොමිසම යම් තර්කනයක් උඩ Net Accounting සහ Net Metering කියන ක්‍රම යටතේ තවමත් සම්බන්ධතා ලබා දිය හැකි බවට ඔවුන්ගේ තීරණයක් මඟින් දැනුම් දී තිබීම මත ඇති වී තිබූ පරස්පරතාව. මේ යැවූ පිළිතුරු ලිපියේ තිබෙන්නේ ඒ සම්බන්ධවයි. ජාතික අයකුම ප්‍රතිපත්තියේ සඳහන් කාරණය ඉතා නිරවුල් නිසා එම ගැසට් පත්‍රයට අනුව කටයුතු කරන ලෙසයි ඒ ලිපියේ සඳහන් වෙන්නේ. ඊයේ දවසේත් යම් වචන හරඹයක් කරන්නට සිදු වුණා, National Tariff Policy එකේ සඳහන් "Net Plus basis"කියන කාරණය පිළිබඳව. එහි පැහැදිලිව සඳහන් වෙන්නේ, "...all new agreements for on-grid rooftop solar PV generating facilities from the date of the coming into force of this Policy, shall be on a 'Net Plus' basis" කියායි.

මෙතැනදී යම් තර්කයක් ගොඩනඟන්න උත්සාහ කරනවා මේ "Net Plus basis" කියන වචන ගැන. "Net Plus" කියන්නේ ජාත්‍යන්තර වශයෙන් නිර්වචනය වුණු යම් තාක්ෂණික පාරිභාෂික වචනයක් නොවෙයි. එය, ශ්‍රී ලංකාවේ පමණක් වහලය මත සවිකරන සූර්ය බලාගාර සම්බන්ධතා සඳහා භාවිත වුණු වාණිජ මොඩලයට දාපු නමක්. කවුරු හරි Net Plus basis කියලා කියන්නේ, අන්න ඒ ශ්‍රී ලංකාව තුළ පසුගිය අවුරුදු 10ක් පමණ පුරාවට භාවිත වුණු ක්‍රමය පදනම් කරගෙන ඉදිරි ගිවිසුම්වලට එළැඹෙන්න කියන එක. ඒක වචන හරඹයක් කර ගන්න අවශ්‍ය නැහැ. කවුරුහරි ඇහුවොත් Net Plus කියන්නේ මොකක්ද කියලා, එහි හොඳම පැහැදිලි කිරීම තමයි PUCSL website එකේ තිබෙන්නේ. සරලවම කිව්වොත්, Net Plus කියන්නේ යම් prosumer කෙනෙකුට, ඒ කියන්නේ ජනනය කර භාවිත කරන කෙනෙකුට බිල් දෙකක් එනවා. ජනනය කර පද්ධතියට ලබා දෙන විදුලියට ගිවිසුම්ගත feed-in tariff එකට අනුව ඔහුට ලැබිය යුතු අගයට එක බිලක් දෙනවා. ඒ prosumer පාවිච්චි කරන විදුලියට වෙනම බිලක් දෙනවා. කිසිම වෙලාවක ඔහු ජනනය කරන විදුලි ඒකක, තමන් භාවිත කරන විදුලි ඒකක එක්ක හිලව්වීමක් සිද්ධ වෙන්නේ නැහැ. මේ සඳහා මීටර් දෙකක් භාවිත කරනවා. සමහර අවස්ථාවලදී තාක්ෂණිකව එකම මීටරය තුළ මේ සඳහා පහසුකම් සපයන්නත් පුළුවන්. Importsවලට එකකුත් exportsවලට එකකුත් විධියට තමයි තිබෙන්නේ. ඕක තමයි basis එක.

වැදගත්ම කාරණය මෙකයි. PUCSL එක feed-in tariff ගණනය කරන්නේ Net Plus basis එක පදනම් කරගෙනයි. එහිදී ඔවුන් සියයට 14ක Rate of Equity - RoE - එකක් සලකා වහලය මත සවිකරන සූර්ය බලාගාර ආයෝජකයින්ගේ ප්‍රතිලාභය ගණනය කර තිබෙන්නේ ඔවුන් ජනනය කළ සියලු ඒකක පද්ධතියට අලෙවි කරනවා සේ සලකායි. එතැනදී ඔවුන් පරිභෝජනය කළ ඒකක සමඟ හිලව් කිරීමක් සලකා නැහැ. ඒක තමයි Net Plus basis කියන්නේ. සියයට 14ක ප්‍රතිලාභයක් කියන්නේ වසර 5-6කින් ආයෝජනය කළ මුදල පියවා ගන්න පුළුවන් වෙනවා කියන එක. එතැනින් පසු දිගටම ගිවිසුම අවසන් වනතුරු එම ප්‍රතිලාභය ලැබෙනවා. ඒ ප්‍රතිලාභය අපි දකිනවා සාධාරණ ප්‍රතිලාභයක් විධියට.

මම නැවත මතක් කර සිටිනවා, ලේකම්තුමාගේ පැහැදිලි කිරීම නිසා PUCSL එක ආයෝජකයාට දීමට බලාපොරොත්තු වූ ප්‍රතිලාභ සතයකින්වත් අඩුවෙලා නැති බව. අත්තටම ගත්තොත්, PUCSL එක ඉන්නෙත් Net Plus basis එකේ; ලේකම්තුමා ඉන්නෙත් Net Plus basis එකේ; කැබිනට් මණ්ඩලය ඉන්නෙත් Net Plus basis එකේ. සමහර අය පමණයි Net Plus basis එකේ නැත්තේ.

මේ සභාවේ නිතරම කියැවුණා, ඒකක 500ක් භාවිත කරන විදුලි පාරිභෝගිකයන් ගැන. අපි මතක තියාගන්න ඕනෑ, ඒකක 500ක් භාවිත කරන්නේ ලක්ෂ 70ක් වූ මුළු පාරිභෝගිකයන් අතරින් සියයට 1කටත් වඩා අඩු ප්‍රතිශතයක් බව. ඒකක 500ක් භාවිත කරන පාරිභෝගිකයෙකු අද දවසේ රුපියල් 41,384.62ක බිලක් ගෙවනවා. ඒ පාරිභෝගිකයා අද අයදුම් කරලා රුපියල් ලක්ෂ 9ක් වියදම් කරලා කිලෝවොට් 5ක සූර්යබල පද්ධතියක් සවි කර ගත්තොත්, ඔහුට මාසයකට ඒකක 600ක් පමණ නිෂ්පාදනය කරන්න පුළුවන්. Net Plus ක්‍රමය අනුව ඔහුට රුපියල් 13,866ක් මාසිකව උපයන්න පුළුවන්. ඒ රුපියල් ලක්ෂ 9 ස්ථිර තැන්පතුවක දමනවාට වඩා මේ ක්‍රමය හරහා ඔහුට ප්‍රතිලාභයක් ලැබෙනවා. ඔහුගේ පරිභෝජනයයි, මේ ආයෝජනයයි අතර සම්බන්ධයක් නැහැ. මේ ආයෝජනයේ ප්‍රතිලාභ අනිවාර්යයෙන්ම සාධාරණයි කියා අපට පිළිගන්න පුළුවන්. පරිභෝජනය පැත්තෙන් ගත්තාම, ඔහු අඩුවෙන් පරිභෝජනය කළොත් අඩු බිලක් එනවා; වැඩියෙන් පරිභෝජනය කළොත් වැඩි බිලක් එනවා. මේ දෙක පටලාගන්නේ නැහැ.

Net Accounting ක්‍රමය තිබුණා නම්, මේ පාරිභෝගිකයාට මාසයකට රුපියල් 43,695.62ක ප්‍රතිලාභයක් ලැබෙනවා. එනම්, අවුරුද්දට රුපියල් 524,347ක් ලැබෙනවා. ඔහු අවුරුදු දෙකක් යන්නටත් පෙර රුපියල් ලක්ෂ 9ක් වන මූලික ආයෝජනය පියවා ගන්නවා. ගිවිසුමේ ඉතිරි අවුරුදු 10ම මේ ප්‍රතිලාභය විදුලි බිල උද්ධමනය සමඟ වැඩිවීමත් සමඟ වැඩි වෙමින් ලැබෙනවා. මේ ආයෝජනයේ RoE එක සියයට 50ටත් වඩා වැඩියි. අපට කියන්න පුළුවන්ද, මේ ප්‍රතිලාභය සාධාරණයි කියලා? ඒ වාගේම අතිරේකව ලබන ලාභය ගෙවන්න සිද්ධ වෙන්නේ ලක්ෂ 70ක් වන solar power නැති සාමාන්‍ය විදුලි පාරිභෝගිකයන්ටයි. PUCSL එකත් Net Plus basis එකෙන් මේ ගණනය කිරීම කරලා තිබෙන්නේ. කවුද එතකොට මේ ප්‍රතිලාභය ලබා දෙන්නේ? සූර්ය බලය ලබා ගැනීමට අවස්ථාව අහිමි වුණු ලක්ෂ 70කට ආසන්න පාරිභෝගිකයන්ට තමයි මේ බර වැටෙන්නේ.

මේ Net Accountingවලට සම්බන්ධ වී සිටින අයට විශාල ප්‍රතිලාභයක් ලැබෙනවා නේද කියලා යමෙක් ඇහුවොත්, උත්තරය "ඔව්" කියන එකයි. පසුගිය අවුරුදු 10 තුළ මෙගාවොට් 3 ඉඳලා මෙගාවොට් 2,500 දක්වා වහලය මත සවි කරන සූර්ය බලාගාර සම්බන්ධතා ප්‍රවර්ධනය කළේ මේ තරම් විශාල ප්‍රතිලාභයක් ලබා දීමෙනුයි. සාමාන්‍යයෙන් කියැවෙන දෙයක් තමයි, රජයට කිසිදු බරක් නැතිව සූර්ය විදුලි නිෂ්පාදකයන් විදුලිය ජනනය කළා කියන එක. රට වෙනුවෙන් ආයෝජනය කිරීම ගැන අපි ඔවුන් සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා. නමුත් මේ තරම් ආකර්ෂණීය ප්‍රතිලාභයක් එම ආයෝජකයන්ට ලබා දීමට රටේ සමස්ත

[ගරු අනුර කරුණාතිලක මහතා ]

ජනතාවට තම විදුලි බිලෙන් දායක වෙන්න සිද්ධ වුණා. අපි ඒ බව මතක් කරන්න ඕනෑ. මෙගාවොට් 3 සිට මෙගාවොට් 2,500ක් වැනි ප්‍රමාණයකට අප වාගේ කුඩා රටකට වසර 10කින් යන්න පුළුවන්කම ලැබුණේ එක් ඇමතිවරයෙකුගේවත්, එක ආණ්ඩුවකවත්, මෙකී සූර්ය බලාගාරවල ආයෝජනය කළ ආයෝජකයන්ගේවත් තනි උත්සාහයෙන් පමණක් නොවෙයි. සමස්ත ජනතාවම එකතු වෙලා ඒ සඳහා දායක වෙලා තිබෙනවා. එය සමස්ත ජනතාවගේ ජයග්‍රහණයක් හැටියට තමයි අපට සලකන්න වෙන්නේ.

සාමාන්‍යයෙන් වෙළෙඳ භාණ්ඩයක් මුලින් ජනගත කරද්දී වෙළෙන්දන් ප්‍රවර්ධන උපක්‍රම - promotional strategies - භාවිත කරනවා. සබන් කැට දෙකක් ගත්තාම එකක් නොමිලේ දෙනවා කියලා කියන්නේ අන්න ඒ වාගේ එකක්. නමුත් වෙළෙඳ පොළ අත්පත් කර ගත්තාට පස්සේ සබන් කැට දෙකක් ගත්තාම තව සබන් කැටයක් නොමිලේ ලබා දෙන්නේ නැහැ. ඒ වාගේම, විදුලි පාරිභෝගිකයා හැමදාම සූර්ය බලය ප්‍රවර්ධනය කිරීමට Net Accounting පන්නයේ ආකර්ෂණීය ප්‍රතිලාභයේ බර අනෙකුත් පාරිභෝගිකයන් දැරිය යුතු නැහැ. ඒ නිසා මෙතැන් සිට ඉදිරියට එන ආයෝජකයන්ට සාධාරණ reasonable ප්‍රතිලාභයක් ලැබෙන Feed-in Tariff එකක් Net Plus basis එකෙන් PUCSL එක ඉදිරිපත් කරලා තිබෙනවා.

බලශක්ති අමාත්‍යාංශය විධියට අපි මේ පවතින Net Plus ක්‍රමයේ සිදු විය යුතු යම් යම් වෙනස්කම් කරන්නත් බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් පද්ධතියේ අතිරික්ත සූර්ය බලය තිබෙන නිසා සූර්ය බලය තිබෙන වෙලාවට තම පරිභෝජනය වෙනස් කර ගන්න අවස්ථාවක් දෙන්න පුළුවන් නම් වටිනවා. ඒ සඳහා අපි මීටර් දෙකේ Net Plus ක්‍රමය වෙනුවට තනි මීටරයේ Net Plus ක්‍රමයක් හඳුන්වා දෙන්න බලාපොරොත්තු වෙනවා. එහිදී සිද්ධ වෙන්නේ import සහ export සඳහා වෙන වෙනම බිල් නිකුත් කිරීමයි. නමුත් තමන්ගේ සූර්ය බලය ජනනය වන මොහොතේ, ඒ කියන්නේ දවල් කාලයේදී පරිභෝජනය කිරීමෙන් ලැබෙන import බිල අඩු කර ගන්න අවස්ථාවක් ඔවුන්ට ලබා දෙනවා. ඒ කියන්නේ, දවල් කාලයේ ජනනය කරන ඒකක ප්‍රමාණයෙන් දවල් කාලයේ ඔවුන් පරිභෝජනය කරන ඒකක ප්‍රමාණය අඩු කරලා ඉතිරි මුදල සඳහා ගෙවීම් කරන්න කටයුතු කරනවා. හැබැයි, රාත්‍රි කාලයට වෙනම බිලක් නිකුත් කරනවා. ඒ වාගේම මීටරය පිටුපස බැටරි පද්ධතියකට - Behind-the-Meter BESS - ආයෝජනය කිරීමටත් එයින් අවස්ථාව ලැබෙනවා. එයින් ආයෝජකයාගේ පරිභෝජන රටාව වෙනස් කර ගැනීමෙන් ප්‍රතිලාභ වැඩි කර ගැනීමට අවස්ථාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතා කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්නම්, මේ අලුත් යෝජනා ක්‍රමය අනුව ප්‍රතිලාභය ලැබෙන විධිය ගැන. මා කලිනුත් කිව්වා, කෙනෙක් කිලෝවොට් පැය 600ක් ජනනය කළාම ලැබෙන ප්‍රතිලාභය පිළිබඳව. විදුලිය ඒකක 495ක් පරිභෝජනය කරන කෙනෙකුට සෝලා පද්ධතියක් තිබුණේ නැත්නම් රුපියල් 34,661ක බිලක් එනවා.

විදුලිය ඒකක 495ක් පරිභෝජනය කරන ඒ තැනැත්තා Net Accounting ක්‍රමය යටතේ solar panel එකක් සවි කරලා කිලෝවොට් පැය 600ක් ජනනය කළා කියලා හිතමු. 600න් 495ක් අඩු කළාට පස්සේ ඔහුට export කරන්න ඒකක 105ක් ඉතිරි වෙනවා. ඒ කියන්නේ, රුපියල් 34,661ක් වන තමන්ගේ බිල පියවා ගැනීමට අමතරව රුපියල් 2,426ක් ඔහුගේ අතට ලැබෙනවා. ඒ අනුව ඔහුට සම්පූර්ණ ලාභය හැටියට රුපියල් 37,087ක් ලැබෙනවා. ඔහු Net Plus ක්‍රමය තිබෙන පාරිභෝගිකයෙකු වුණා නම්, ඒකක 495ක් පරිභෝජනය කරනවා වාගේම කිලෝවොට් පැය 600ක් ජනනය කරලා දෙනවා. භාවිත කරපු ඒකක 495 වෙනුවෙන් රුපියල් 34,661ක බිලක් එනවා; ඒ වාගේම ජනනය කරලා ලබා දුන්නු විදුලි ඒකක වෙනුවෙන් රුපියල් 13,866ක් ලැබෙනවා. ඒ නිසා ඔහුගේ මාසික බිල රුපියල් 20,795 දක්වා අඩු වෙනවා. ඔහුට රුපියල් 13,886ක benefit එකක් ලැබෙනවා. සියයට 14ක් හැටියට සලකා මෙන්න මේ ලාභය ගණනය කරලා බැලුවොත්, ආයෝජනය කළ ඒ මුදල අවුරුදු 4ක්, 5ක් ඇතුළත ලබා ගන්න ඔහුට පුළුවන් වෙනවා. එතැනින් පසුව ඔහුට ලැබෙන්නේ ප්‍රතිලාභ.

අලුතින් හඳුන්වා දෙන්න යන මේ Net Plus ක්‍රමය අරගෙන බලමු. මේ කියපු පරිභෝජන රටාවම උදාහරණයකට ගත්තොත්, ඔහුට විදුලි ඒකක 330ක් import කරන්න වෙනවා. ඒ වෙනුවෙන් රුපියල් 20,276ක බිලක් ගෙවන්න ඔහුට සිද්ධ වෙනවා. ඒ වාගේම, ඔහු විදුලි ඒකක 435ක් export කරනවා. ඒ සඳහා ඔහුට ලැබෙනවා, රුපියල් 10,053ක්. ඒ කියන්නේ ඔහුගේ බිල import cost එක හැටියට රුපියල් 10,223 දක්වා අඩු වෙනවා. රුපියල් 34,661ක වටිනාකමක් තිබෙන විදුලි ඒකක පරිභෝජනය කරන නමුත් ඔහු ගෙවන්නේ රුපියල් 10,223ක් විතරයි. ඒ හරහා ඔහුට benefit එක හැටියට එනවා, රුපියල් 24,438ක්. ඒ නිසා ඔහුගේ ආයෝජනය අවුරුදු 3ක් ඇතුළත පියවා ගන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, could you make it brief, please?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊට අමතරව, යම් පාරිභෝගිකයෙකුට තමන්ගේ ප්‍රදේශයේ සූර්යබල අතිරික්තයක් තිබෙන නිසා ට්‍රාන්ස්ෆෝමරය පිරී තිබෙන අවස්ථාවල යම් අහිමි වීමක් වෙලා තිබෙන්න පුළුවන්. එම නිසා zero export ක්‍රමයත් ඉතා ඉක්මනින් හඳුන්වා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව, තමන් පරිභෝජනය කරන විදුලිය තමන්ට නිෂ්පාදනය කිරීමට අවස්ථාවක් ලබා දීමට කෙටි කාලයකින් කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ඒකට අවශ්‍ය වන බැටරි පද්ධතිය සඳහාත් මේ වනකොට සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ප්‍රමිතීන් සහ ක්‍රමවේදයක් සකස් කරමින් ඉන්නවා. අපි මුදල් ඇමතිවරයා වන ගරු ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කර තිබෙනවා, ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් කිසියම් බදු සහනයක් ලබා දෙන්න පුළුවන්ද කියන කාරණය ගැන.

මට කාලය ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, what is your point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මම විෂය භාර ගරු අමාත්‍යතුමාගෙන් ස්ථාවර නියෝග 27(2) යටතේ මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇහුවාම එතුමා උත්තරය හැටියට ලබා දුන්නේ, ඉදිරියට තවත් කරුණු හෙළිදරව් කිරීමේ පදනම මත උත්තරය ලබා දෙනවා කියලායි. ඊයේ එතුමා එහෙම කිව්වා. ඊයේ මා අහපු ඒ ප්‍රශ්නයට අදාළ උත්තරවලින් කොටසක් අද එතුමා ලබා දුන්නු නිසා, අද මට එතුමාගෙන් ප්‍රශ්න කරන්න අවස්ථාව තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, yesterday we spent a lot of time on this.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ඒ අවස්ථාව ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

We spent a lot of time on this and because of that, the staff had to forgo their lunch. If that is the case, I suggest that we call for a debate on this on another day.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවශ්‍ය නම් එතුමා මතු කළ ප්‍රශ්නය වෙනම අරගෙන බලන්න අපට පුළුවන්. ඒ වාගේම, මා අද කළ ප්‍රකාශයේ තොරතුරු පිළිබඳවත් වෙනම බලන්න පුළුවන්. එතුමා මතු කළ ප්‍රශ්නවලට පිළිතුරු හැටියට නොවෙයි, මේ ප්‍රකාශය කළේ. ඇත්තටම Net Accounting, Net Metering සහ Net Plus පිළිබඳ පැහැදිලි කිරීමක් සහ ඉදිරියේදී අප කරන්න බලාපොරොත්තු වන කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් තමයි මා කළේ. ඒ නිසා එතුමා මතු කළ කාරණය වැරැදියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

We are not going for a debate on this. Yesterday, we spent a lot of time on this. Hon. Leader of the Opposition, please understand, we had a long session on this yesterday.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, what is it?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙය වගකීමෙන් ඔබතුමාට කියන්නේ. ඔබතුමා හැන්සාඩ් වාර්තාව - unedited එක හරි - ගෙන්වා ගෙන බලන්න. Net Accounting, Net Metering and Net Plus ක්‍රමවේද ගැන මම ඊයේ ප්‍රශ්න කළා. මා ඊයේ අහපු ඒ ප්‍රශ්නයේ කොටසකට අදාළ විග්‍රහයක් අද එතුමා කළා. ඒ නිසා මට අයිතියක් තිබෙනවා ප්‍රශ්න කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

That was his reply, Hon. Leader of the Opposition. The Hon. Anura Karunathilaka is not going to take that on. Are you going to take that on, Hon. Anura Karunathilaka?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Allow me to raise that.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

It was a Ministerial Statement.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, that was a Ministerial Statement. It is not aimed at you, Hon. Leader of the Opposition.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

දැන් මට මතකයි. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාටත් මතක ඇති. මම ආයෙත් සැරයක් කියන්නේ,-

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

What are you standing up for, Hon. Marikkar?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Hon. Deputy Speaker, please consider my request.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

We spent a lot of time on this, Hon. Leader of the Opposition. You understand what happened yesterday. We spent a lot of time on this particular topic yesterday.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, it is not a matter of time. The Hon. Minister gave part of his Answer today.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
So, if it has been provided today, it is up to you to take it, if you wish.

Hon. Marikkar, why are you on your feet?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ ඔවුන්ගේ Report එක අද යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට භාර දුන්නා. *[බාධා කිරීමක්]* මට විනාඩියක් දෙන්න. අධික ගල් අඟුරු භාවිතය නිසා පාඩුව - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is not a point of Order, Hon. Member.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, why are you on your feet?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ලොකු පැහැදිලි කිරීමක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Is it the same thing we went into yesterday?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
No, Sir. Let me ask this. ගරු ඇමතිතුමාගෙන් ඉතාම කෙටි පැහැදිලි කිරීමක් කරගන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, if it is the same thing we went into yesterday, ask for another day for a debate, please.

Next, we have another Ministerial Statement to be made by the Hon. (Dr.) Anil Jayantha, Minister of Labour and Deputy Minister of Finance and Planning on behalf of the Minister of Finance, Planning and Economic Development in reply to the Questions raised by the Hon. Ravi Karunanayake under Standing Order No. 27(2) on 09.06.2026.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order? Could you please be brief because we have lost a lot of time? - *[Interruption.]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
That Answer took almost 39 minutes. When we have to answer, you basically push for time. We have two Questions to be answered. I am being called upon to - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you do not have to answer; you have to ask questions.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The previous Answer went on from Chennai to Provincial Council Elections to everything. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That was a Ministerial Statement.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
There must be a sense of decency. Anyway, I like that and I know that more time should be given for that.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කියපු කාරණයට මමත් එකඟයි. පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම්, හංස අබේරත්න මැතිතුමාටත් මම දැන් කිව්වේ, විජිත හේරත් ඇමතිතුමාගේ උත්තරයට අදාළ ප්‍රශ්නය ගත්තොත්, ඒක ප්‍රශ්න පත්තරයක් කියලායි. මහ ලේකම්තුමියනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ප්‍රශ්න සම්බන්ධව ඔබතුමියලාම මහ ලේකම් කාර්යාලයෙන් දීපු criteria

උල්ලංඝනය කරලා එහෙම එකකට අනුමැතිය දුන්නේ කොහොමද? ඒ නිසා තමයි ඒ තරම් වෙලාවක් මේ සඳහා ගත වුණේ. මම රවී කරුණානායක මැතිතුමාට නොවෙයි මෙය කියන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන දේ සමඟ මම එකඟයි. ඒ නිසා මම ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නේ මෙකයි. ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ප්‍රශ්න සම්බන්ධව අපි එකඟ වුණු ක්‍රමවේදයක් තිබෙනවා. ඊට අනුව විතරක් මේ ප්‍රශ්න යොමු කරන්න අවස්ථාව දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. අපට time management එකක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා ඒක කරන්න. Let the Hon. Minister make the Statement.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බිමල් රත්නායක ඇමතිතුමා කියපු දේ මම අගය කරනවා. මම ඊයේ දිනයේ ගරු අගමැතිතුමියට යොමු කරන ප්‍රශ්නයක් භාර දුන්නා. ඒකේ තිබෙනවා වචන 353ක්. ඒක reject කර තිබෙනවා, ඒ ප්‍රශ්නයම වෙනත් ආකාරයකින් තිබෙනවා කියලා. ඒ නිසා මගේ අවස්ථාවක් පැහැර හැර තිබෙනවා. මොකක්ද මේකේ තේරුම? අපි සුළු ජාතිකයින් වෙන්න ඕනෑද, මේ පාර්ලිමේන්තුවෙන් උත්තරයක් ලබා ගන්න? මෙකෙන් හරිම භයානක තත්ත්වයක් ඇති වන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I have noted your concern. I will clarify it with the Secretary-General's Office.

Hon. (Dr.) Anil Jayantha, you may make your Ministerial Statement - *[Interruption.]* Hon. Member, please give ear to the Hon. (Dr.) Anil Jayantha.

## ශ්‍රී ලංකාවට ලබා දුන් IMF විස්තීර්ණ ණය පහසුකමෙහි ආර්ථික, සමාජයීය සහ මූල්‍ය ප්‍රතිඵල: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## IMF இலங்கைக்கு வழங்கிய நீட்டிக்கப்பட்ட கடன் வசதியால் ஏற்படும் பொருளாதார, சமூக மற்றும் நிதிசார் விளைவுகள்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று
## ECONOMIC, SOCIAL AND FISCAL OUTCOME OF IMF EXTENDED FUND FACILITY TO SRI LANKA: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

Hon. Deputy Speaker, on behalf of the Minister of Finance, Planning and Economic Development, I would like to answer the Question raised by the Hon. Ravi Karunanayake on 09.06.2026 under Standing Order No. 27(2).

(a) The outcomes of the IMF-EFF programme are explained under three aspects.

**Economic Outcomes**

- Real GDP, which contracted by 7.3 per cent in 2022, grew by 5.0 per cent in 2025, the second consecutive year of growth and by 4.7 per cent in the first half of 2026.
- GDP per capita increased to US Dollars 5,003 in 2025, surpassing the US Dollars 5,000 threshold for the first time. The World Bank upgraded Sri Lanka from a lower middle-income to an upper middle-income country with effect from 01st July, 2026.

The World Bank released its latest Sri Lanka Development Update titled "From Recovery to Transformation", that is from recover to pre-crisis levels, following 12 consecutive quarters of expansion through the first half of 2026. As a result, the World Bank upgraded its growth projection for Sri Lanka from 3.6 per cent earlier to 4.4 per cent in 2026. Poverty estimated at 16.9 per cent in 2026 significantly elevated above the pre-crisis rate.

- Tourist arrivals reached 2,362,521 in 2025, with earnings of US Dollars 3.2 billion. The Current Account recorded a surplus of 1.6 per cent of GDP in 2025, the third consecutive year of surplus, marking a structural improvement in Sri Lanka's external position.
- Workers' remittances rose by 22.8 per cent to US Dollars 8,076.2 million in 2025, reflecting improved confidence and formal channel usage.

The growing trend continues in 2026 and from January to August, 2026, it amounted to US Dollars 6,131 million.

- Export earnings also grew by 6.3 per cent to US Dollars 13,581.4 million in 2025, whereas the total export earnings from January to August, 2026 had been US Dollars 14,076 million.

**Fiscal Outcomes**

- The Central Government primary balance improved from a deficit of 3.7 per cent of GDP in 2022 to a historic surplus of 5.4 per cent of GDP in 2025, the highest ever recorded. As at end-June, 2026, the primary balance surplus stood at Rs. 1,244 billion.
- Tax revenue nearly doubled from 7.3 per cent of GDP in 2022 to 15.4 per cent in 2025. As at end-September, 2026, tax revenue increased significantly compared to the same period of 2025, by recording 85 per cent of the annual target of 2026.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා ]

- Central Government debt has also declined from 114.2 per cent of GDP in 2022 to 94.9 per cent in 2025, which is already below the programme target of 95 per cent by 2032.

**Social Outcomes**

- Social spending targets were met for the first time in the programme's history in 2025.
- The Government incurred 3.4 per cent of GDP on household subsidies and transfers in 2025, of which 0.7 per cent was directed to the Aswesuma programme.
- Headline inflation fell from nearly 70 per cent in September, 2022 to 2.1 per cent in December, 2025.

All in all, the achievements confirm that the EFF programme has delivered transformative outcomes, moving Sri Lanka from crisis to recovery to stabilization within three years, while building an institutional resilience to manage further shocks, including Cyclone "Ditwah" and the Middle-East conflict.

(b) The assessment of the objectives of this particular programme is analysed under seven pillars.

**Pillar 1- Revenue-Based Fiscal Consolidation: Exceeded**

The Central Government primary balance moved from a deficit of 3.7 per cent to 5.4 per cent of GDP in 2025, far exceeding the programme target of 2.3 per cent of GDP. Tax revenue also rose from 7.3 per cent to 15.4 per cent of GDP, nearly doubling within three years. The Public Financial Management Act No. 44 of 2024 was enacted, establishing binding fiscal rules and accountability mechanisms. The Integrated Treasury Management Information System - ITMIS - was fully rolled out, the SVAT system was repealed and replaced with a risk-based VAT refund scheme, and the Fiscal Strategy Statement and the Fiscal Risk Statement were published for the first time in June, 2025. Cost-recovery pricing for fuel and electricity was established through automatic, formula-based adjustment mechanisms.

**Pillar 2 - Stronger Social Safety Nets: Achieved**

The "Aswesuma" social protection programme was established with a new, objectively determined eligibility framework based on a national Social Registry. Social spending targets were met for the first time in the programme's history in 2025. Energy subsidies were targeted exclusively to low-consumption households, ensuring that support reached those who need it most. The Government incurred 3.4 per cent of GDP on household subsidies and transfers in 2025, of which 0.7 per cent was directed to the "Aswesuma" programme.

**Pillar 3 - Sovereign Debt Restructuring: Substantially Realized**

Sri Lanka's debt restructuring is near completion. Agreements-in-principle or signed agreements have been reached with the Official Creditors Committee, China Exim Bank, China Development Bank and ISB bondholders. Sovereign bond spreads fell from approximately 1900 basis points at the onset of the crisis to around 520 basis points by early 2025.

The Public Debt Management Office was established in December, 2024 and the Medium-Term Debt Management Strategy 2025-2029 was published. Central Government Debt declined from 114.2 per cent of GDP in 2022 to 94.9 per cent in 2025.

**Pillar 4 - Resorting Price Stability and Rebuilding International Reserves: Achieved**

Headline inflation fell from nearly 70 per cent in September, 2022 to 2.1 per cent in December, 2025. Even amid the Middle Eastern crisis, inflation has remained broadly around the target, recording 6.8 per cent in June, 2026. Gross Official Reserves were rebuilt from near-zero in early 2022 to US Dollars 6.9 billion by end-August, 2026. The Central Bank Act was enacted in July, 2023, establishing price stability as the primary mandate and prohibiting monetary financing. The exchange rate operates under a fully market-determined, flexible framework. Monetary financing has been fully eliminated.

**Pillar 5 - Safeguarding Financial Stability: Achieved**

The Banking Act was amended in April, 2024, strengthening supervisory standards, governance and audit independence for State-owned banks. The *parate* execution moratorium was lifted in 2025, enabling banks to resolve Non-Performing Loans and expand credit. Private sector credit was expanded by approximately 25 per cent year-on-year by end-2025.

**Pillar 6 - Addressing Governance and Corruption Vulnerabilities: Achieved**

The Anti-Corruption Act was enacted in July, 2023, harmonized with the United Nations Convention Against Corruption - UNCAC. The asset recovery law, that is, the Proceeds of Crime Act, No. 5 of 2025, was also enacted. The IMF Governance Diagnostic Assessment Report was published in September, 2023. CIABOC was operationalized with a new strategic plan and electronic Asset Declaration System. Amendments to the Strategic Development Projects Act and the Colombo Port City Economic Commission Act introduced transparent, rules-based eligibility criteria for tax incentives. The Beneficial Ownership Registry was operationalized in August, 2025.

**Pillar 7 - Structural Reforms to Unlock Growth Potential: On Track**

All import restrictions on motor vehicles were fully removed in January, 2025, removing a major impediment to trade and investment. Para-tariff rationalization is ongoing under the World Bank DPO commitments. The Women Empowerment Act was enacted in July, 2024. The MSME support framework has been strengthened through targeted credit programmes. SOE restructuring is ongoing, supported by improved governance and performance monitoring frameworks.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, can you make it brief and mention only the salient features?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

There are many points to make, but I will just try to summarize, Sir.

(c) The Government acknowledges the challenges and hardships faced by the people of Sri Lanka due to a nation-driven to bankruptcy and the elevated cost of living during the adjustment period. These measures were necessary to restore fiscal sustainability and were not without cost. However, had these reforms not been implemented, the economic situation would have been far worse. The country is now seeing the benefits of these reforms with the benefits of macroeconomic stability and renewed growth being felt directly by the people of Sri Lanka.

The Government is continuing efforts to ensure the flow of these benefits to citizens across the country. These reforms have resulted in improvements in economic well-being, as evidenced by the following measurable outcomes:

1. The Aswesuma Social Protection Programme has ensured that the most vulnerable households were protected throughout the period of adjustment. The Government incurred 3.4 per cent of GDP on household subsidies and transfers in 2025.

2. The labour force participation rate has also risen to 49.4 per cent in 2025, reflecting improved confidence and economic opportunities.

3. Energy subsidies-2026 were targeted exclusively to low-consumption households consuming less than 180 kWh per month, ensuring that support was directed to those who need it most rather than subsidizing higher-income households, as the previous system had done.

4. Headline inflation, which peaked as nearly 70 per cent in September, 2022, was brought down to 2.1 per cent in December, 2025. Even in the midst of the Middle Eastern crisis, inflation has remained broadly around the target, recording 6.8 per cent in June, 2026, and is expecting to remain around the flexible inflation target of 5.0 per cent in the medium term.

5. Private sector credit, which contracted during the crisis, was expanded by approximately 25 per cent year-on-year by end-2025.

6. Commercial bank lending rates, which reached around 29 per cent in late 2022, have declined to approximately 10.6 per cent by end-July 2026.

(d) Yes. The economic growth, employment generation and export performance envisaged at the commencement of the programme have been achieved. Investment recovery has shown encouraging early signs, though the full materialization of foreign direct investment remains an ongoing priority, reflecting structural challenges in the investment environment that are being actively addressed.

**Economic Growth: Achieved and Exceeded**

- The recovery has been broad-based. The industry sector was expanded by 7.8 per cent in 2025, supported by construction, manufacturing and mining and quarrying. The service sector, which accounts for 54. 6 per cent of GDP, grew by 3.3 per cent, driven by food and accommodation, financial services, information technology and transportation.

- The recovery has demonstrated resilience in the face of significant external shocks, Cyclone "Ditwah" in November, 2025 and the Middle-East conflict beginning in February, 2026, without abandoning fiscal discipline or reversing core reforms.

**Employment Generation: Materializing**

- The unemployment rate declined to 3.7 per cent in June, 2026 from 4.4 per cent in 2024, reflecting the absorption of workers into a recovering economy.

- The labour force participation rate rose to 49.4 per cent in 2025, reflecting growing confidence and economic opportunity.

- Employment generation has been broad-based, with positive contributions from the industry sector, particularly construction, services and agriculture.

**Export Expansion: Positive Performance**

- Merchandize export earnings grew by 6.3 per cent to US Dollars 13, 581. 4 million in 2025, driven by improvements across both industrial and agricultural exports.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

- Tourism arrivals reached 2,362,521 in 2025 with earnings of US Dollars 3.2 billion. Workers' remittances grew by 22. 8 per cent to US Dollars 8,076.2 million in 2025.

**Investment Inflows: Showing Early Recovery**

• Foreign direct investment has shown early signs of recovery (net inflow US Dollars 661.5 million in 2023 vs US Dollars 945.7 million in 2025), supported by improved macroeconomic stability, a market-determined exchange rate and gradual implementation of investment climate reforms.

(e) Yes. The Government has assessed the impact of programme reforms on SMEs, self-employed persons, salaried employees and vulnerable groups and has provided targeted relief accordingly. Their economic conditions have materially improved as a result of macroeconomic stabilization, lower interest rates and targeted support measures.

Small and Medium-Sized Enterprises (SMEs) and Self-Employed Persons

- The normalization of inflation and the progressive reduction of commercial bank lending rates from around 29 per cent in late 2022 to approximately 10.6 per cent by end -June, 2026 have substantially improved operating conditions for SMEs and self-employed persons, who were among the most severely affected by the crisis.
- Private sector credit expanded by approximately 25 per cent year-on-year by end-2025, restoring the availability of working capital and investment finance for small businesses.
- In 2025, over Rs. 11 billion was disbursed to more than 1,500 MSMEs under the SMELOC and SMELOC2 credit facilities, supporting enterprise recovery and expansion.
- The National Credit Guarantee Institution Limited - NCGIL- established as a public-private partnership, provided guarantees worth Rs. 5.1 billion to 1,234 enterprises, significantly improving access to finance for businesses lacking collateral. Of these, 20 per cent of guarantees were provided to women-led businesses, and 25 per cent were directed to priority sectors including agriculture, IT, exports and tourism.
- The MSME Re-energizing Programme refinanced Rs. 14.6 billion in loans, providing critical relief to both performing enterprises and distressed businesses recovering from the economic crisis.

Salaried Employees

- Public sector employees received their first substantive salary adjustment since 2016 in 2025, with the full adjustment being implemented in phases through 2027.
- The Personal Income Tax exemption threshold was increased from Rs. 1,200,000 per annum to Rs. 1,800,000 per annum, providing direct relief to lower and middle-income salaried employees.
- A phased revision of the pensions of all public servants who retired before January, 2020 was introduced, addressing long-standing pension anomalies and improving the financial well-being of retirees.

Vulnerable Groups

- The "Aswesuma" Social Protection programme, established with objectively determined eligibility criteria based on the national Social Registry, provides targeted monthly cash transfers to poor, extremely poor, elderly, disabled and chronically ill persons. Social spending targets were met for the first time in the programme's history in 2025.
- The Government incurred 3.4 per cent of GDP on household subsidies and transfers in 2025, of which 0.7 per cent was directed to the "Aswesuma" programme, ensuring that the most vulnerable households were protected throughout the period of adjustment.
- Energy subsidies which were provided in response of the Middle-East conflict were targeted exclusively to low-consumption households consuming less than 180 kWh of electricity per month, ensuring that support is directed to those who need it most.

(f)

- Sri Lanka has made significant progress in restoring macroeconomic stability following the severe economic crisis experienced in 2022, which disrupted economic activity, generated exceptionally high inflationary pressures, weakened the external sector and created substantial macroeconomic imbalances. The implementation of a comprehensive macroeconomic adjustment and reform programme has since supported a gradual, but notable recovery, helping restore stability, rebuild confidence and advance debt sustainability. Key macroeconomic indicators now demonstrate a marked improvement compared to conditions that prevailed during the crisis period.
- Price stability has improved substantially following the unprecedented inflationary pressures experienced during the 2022

crisis. Supported by prudent monetary policy measures and improved macroeconomic conditions, inflation declined significantly during 2024 and 2025, with headline inflation reaching 2.1 per cent by end-2025. Although inflation increased during the first half of 2026, largely reflecting the pass-through of higher global energy prices and related domestic price adjustments, inflation remained broadly aligned with the Central Bank's medium-term target, and is under control.

- The external sector has demonstrated notable resilience during the recovery period, with the Current Account of the balance of payments recording a surplus for the third consecutive year in 2025. Improved foreign exchange inflows strengthened liquidity conditions in the domestic foreign exchange market and supported the continued accumulation of official reserve assets, resulting in Gross Official Reserves increasing significantly to around US Dollars 6.9 billion by end-August, 2026, despite external debt servicing obligations and higher imports mainly on account of energy and vehicle imports.

- The Central Bank has maintained a flexible and market-based exchange rate policy throughout the recovery period, allowing exchange rate movements to reflect underlying market conditions while ensuring orderly functioning of the domestic foreign exchange market.

- However, risks to macroeconomic stability remain. Despite the Iran-US ceasefire agreement, external risks persist from possible escalation of geopolitical tensions, including in the Middle East, which could disrupt global energy markets and increase import costs, thereby exerting inflationary pressures and affecting the external sector. In addition, tighter global financial conditions, fragmentation in global trade and slower growth in key trading partner economies could also weigh on export earnings, tourism inflows and worker remittances. On the domestic front, climate-related vulnerabilities, including adverse weather patterns associated with El Nino conditions, could affect agricultural output, hydropower generation and food price stability. These developments highlight the need to maintain strong policy buffers and growth enhancing reforms.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, can you make it brief, please.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Sir, I will finalize in a minute.

(g) & (h) Sri Lanka's current IMF EFF programme is on track to conclude successfully in March, 2027, marking the completion of its economic reform and recovery efforts under the arrangement. In parallel, discussions are currently underway regarding the options beyond the current programme, reflecting a shift from crisis-driven support towards a more sustainable, long-term growth targeted engagement model.

(i) Does not arise.

(j) Details are given in Annex 01.

I will just read out the total number relevant to debt servicing of the IMF programme. Based on the loans received as of now, the total debt servicing amounts to US Dollars 3.04 billion spanning up to 2036.

(k) Details are given in Annex 02.

As regards the Debt Service Payments to Creditors from 2028 to 2048, just to mention 2028, the total debt servicing will amount to US Dollars 3.2 billion, whereas in 2048, it will amount to US Dollars 2.5 billion.

Sir, I **table*** Annexes 01 and 02.

Thank you very much.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, you want to seek a clarification, I believe.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I have many clarifications to be sought, Sir, within the limited time. But, I will do my best.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Go ahead, please.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, you did not have that sense of adventurousness during the Answer to the previous Question, which took 39 minutes. That is my problem. But, I will restrict myself.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

Hon. Minister, I asked this Question owing to certain matters also referred to in the present IMF Report. You mentioned that the economic situation in the country is healthy. But, you would see that pawning, during the past six months, has increased by 128 per cent over last year. For six months, the total pawning has gone up by Rs. 1.1 billion. That is a problem of the people.

Then, the total debt of the country has moved up from Rs. 28.3 trillion in September, 2024 to Rs. 33.6 trillion, as of this moment. That is an increase of Rs. 5.2 trillion in 23 months. You also say that inflation has come down, but it has gone up to 8.1 per cent; food inflation went up by 8.7 per cent.

Likewise, the cost of capital, which was previously at 8.3 per cent, is at 11.3 per cent overall today. It is a 2 per cent increase on the Rs. 33.4 trillion cost that is there. So, the problem that exists is that people basically face ill-affordability in today's context. You are saying that there is a primary surplus, but that happens because you are not spending on Capital Expenditure. So, as a result, the surplus goes against the primary surplus and then, artificially, you are showing that there is an increase. Hon. Minister, it is not we who are saying this, but it is your information that makes us question you.

Likewise, the World Bank says that Rs. 500 billion had been allocated for Cyclone "Ditwah", but only 8.3 per cent of it has been spent. The displaced by "Ditwah" do not have houses; their children are unable to go school and they do not have food. And, the Government has money, but you all are not spending it.

Now, there is a limited amount of money or scarce resources, and you are allocating those scarce resources to meet the total demand that is there across the country. But, the issue is, you all are not solving the problems, but only increasing the debt of this country. So, Hon. Minister, your Answer has not given the solutions to the problems we have raised.

The seventh tranche of the IMF has not been approved *in toto* simply because they see that State-owned enterprises have not been commercialized and the debt-to-GDP ratio - you all are living in the dead past - as of today, is still 103 per cent of GDP.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, come on to your particular clarification, please.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
My clarification is that we are talking of the same statistics. Unlike various other matters which are theoretical in nature, these are not about human rights, but about the living conditions of the people. Hon. Minister, I know you have a bad brief, and you have got to take that bad brief from the little that is there, but please ensure there is a sense of honesty. Do not let the fiscal side take responsibility for the monetary failure. I do not understand why you need to basically take upon yourself the incompetence of the Ministry of Finance when the responsibility lies somewhere else. Repeatedly, this defence is the problem.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, we are not going into a lengthy debate on this.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Sir, I will give a very brief explanation.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Give a very very brief explanation because we have to move on to the main Business of the Day, Hon. Minister.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Okay, Sir.

Regarding credit expansion, of course, what matters for the Government with regard to stabilization and moving from stabilization to transformation is Government debt sustainability, and that is on track. Our target is to achieve 95 per cent by the end of 2032, and we have already achieved that target. That is what matters for governance. However, in the economy, in a way, the growth in private credit is also good, as long as it really expands economic activities. To some extent, I agree that private credit may go towards importation, expansion of businesses or maybe towards consumption as well. Also, I agree that pawning may have increased. That is mainly due to some exceptional situations and not due to the prolonged or continuing issue. That is mainly due to the Middle East crisis, which has put an enormous pressure on the prices of food and other items. So, that is the reason.

When it comes to inflation, that is connected. Inflation goes up to 8 per cent, which, of course, is by a little bit.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, make yourself brief please.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Sure, Hon. Deputy Speaker.

That eight per cent is just above the inflation target framework of 5 per cent. Then, we will continue with this particular framework for the next three years as well. Our upper bound is 7 per cent and now, it is 8 per cent. We are hopeful that we could maintain a single-digit inflation.

The rise in the cost of capital is also for the time being; yes, it is due to these temporary measures. Sir, we have to give an answer to these. Otherwise, the facts given or highlighted by Hon. Member will be taken as the truth. Then, again- *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, could you please wrap up? - *[Interruption.]*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
When it comes to the fiscal consolidation, revenue mobilization and the spending efficiency, the Hon. Member mentioned that we have achieved this target by not spending, which is not true. Our revenue mobilisation has increased. As of now, of the total target, we would have achieved only 75 per cent, but already, we have achieved 85 per cent. It clearly indicates how efficiently we have mobilized our revenue. Therefore, that is not true.

Whatever slowness that is there with regard to expenditure would be caught up by the end of the year. Even any deficiencies in spending the allocation for "Ditwah" would be settled towards the end. If there is anything related to Capital Expenditure, we will move it forward to next year to complete all these targets.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Public Business.

Item No. 1 in today's Order Paper, Anti-Corruption (Amendment) Bill, to be moved by the Hon. Leader of the House.

## දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත
## ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்டமூலம்
## ANTI-CORRUPTION (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Chief Government Whip?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් වෙලාව පස් වරු 12.15යි. මම යෝජනා කරනවා, දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු දැන් අත්හිටුවා පැය භාගයකට පසුව ආරම්භ කරමු කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House is suspended for lunch.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. **12.45**ට නැවත පවත්වන ලදී.*
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 12.45 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 12.45 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
To start the Debate on Anti-Corruption (Amendment) Bill, the Hon. Bimal Rathnayake, Leader of the House.

[අ.භා. 12.47]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ දෙවන වර කියවීමේ විවාදය ආණ්ඩු පක්ෂය පැත්තෙන් ආරම්භ කිරීමට මට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම මෙහි නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ තත්ත්වය ගරු අධිකරණ ඇමතිතුමා අදහස් දක්වන අවස්ථාවේදී ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා, එතුමා මේ වෙලාවේදී ගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡාවක නිරත වෙලා සිටින නිසා.

[ගරු බිමල් රත්නායක මහතා]

අද දිනයේදී මේ කාල කළමනාකරණයේ ගැටලුවත් එයට බලපෑවා. කෙසේ වුවත් මා කැමැතියි, මේ ලැබී තිබෙන වේලාව තුළදී දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ කරුණු ගණනාවක් අවධාරණය කරන්න.

ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය අනුව, 1883 තරම් ඈත කාලයක සිට තමයි දූෂණයට සහ අල්ලසට එරෙහිව නීති සම්පාදනය කර තිබෙන්නේ. ඒ ආකාරයට ඉදිරියට ඇවිත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත 1994 වසරේදී සම්මත කරනවා. නමුත් 2015 වර්ෂය වෙනකම් වාගේ එම කොමිසම ප්‍රායෝගික වශයෙන් පුළුල්ව ශක්තිමත්වීමක් වෙලා නැහැ. ඒ ආකාරයේ ගමනක් ඇවිත් තමයි 2023 වර්ෂයේ අගෝස්තු 08වැනි දා වර්තමාන දූෂණ විරෝධී පනත සම්මත කර තිබෙන්නේ. ඒ, 2023 අගෝස්තු මාසයේ. එය ක්‍රියාත්මක වන දිනය විධියට 2023 සැප්තැම්බර් 15 කියන දිනය අමාත්‍යවරයා විසින් ගැසට් කර තිබෙනවා. ඉන්පසුව එය ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පනතකින් ආයතන පිහිටෙව්වාට විතරක් මදි. ආයතනවලට අවශ්‍ය කරන පරිපාලන, නීතිමය සහ අනෙකුත් ශක්තීන්, අනෙකුත් පහසුකම් ලබා දුන්නේ නැත්නම් එම ආයතන බිඳ වැටෙනවා. ඒ අනුව එම පනත මඟින් ඒවා සම්මත කළාට 2023 සැප්තැම්බර්වල ඉඳලා තිබෙන්නේ නීති නිලධාරීන් 31දෙනෙක් පමණයි. ඒ නිසා අධ්‍යක්ෂ ජනරාල්වරයා 2025 ජනවාරි 08වන දා වාර්තා කර තිබෙනවා, නඩු නොපවරන ලද ලිපිගොනු 4,000කට ආසන්න ප්‍රමාණයක් එතැන තිබෙනවා කියලා, නිලධාරි හිඟය සහ සම්පත් හිඟය නිසා. ඒ නිසා ඒ පනත සංශෝධනය කර අදාළ නිලධාරීන් ලබා දීමට අපි විශාල මහන්සියක් ගෙන තිබෙනවා. පසුගිය කාලය තුළදී නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් පත් කර තිබෙනවා. ඒ වාගේම පත් කරමින් තිබෙනවා. ඒ වාගේම තමයි මුදලුත් විශාල වශයෙන් වැඩි කර තිබෙනවා. ඒ වාගේම ඒ කොමිෂන් සභාව දැනුම් දීලා තිබෙනවා, එතුමන්ලා දිස්ත්‍රික්ක විසිපහේම ශාඛා කාර්යාල දාන්න යනවා කියලා. අල්ලස හා දූෂණයට විරුද්ධව කටයුතු කිරීම රටක විශාල වගකීමක් සහ ශක්තියක්. ඒ වාගේම ඒක අපේ ජනවරමේ ප්‍රධාන බලකණුවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස හා දූෂණයට විරුද්ධව කටයුතු කිරීම, ඒ වාගේම නීතියේ විධානය ඇති කිරීම, ස්වාධීන අධිකරණයක්, ස්වාධීන විමර්ශන ආයතන, ස්වාධීන විතරක් නොවෙයි, කාර්යක්ෂම අධිකරණ, කාර්යක්ෂම විමර්ශන ආයතන ඇති කිරීම හුදු නීතිමය වශයෙන් ඵලප්‍රයෝජනයක් තිබෙන දෙයක් පමණක් නොවෙයි. එහි ප්‍රයෝජන රාශියක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එකක් තමයි, රටක තිරසර ආර්ථික, සමාජයීය සංවර්ධනයක් උදෙසා නීතියේ පාලනය අවශ්‍යයි. මම තේරෙන භාෂාවෙන් කිව්වොත්, පසුගිය කාලයේ අපේ අයවැය ආදායම් බදු ඉලක්ක, රේගු බදු ඉලක්ක වැඩි වෙන්න බලපෑ ප්‍රධානම හේතුවක් තමයි, නීතිය කාටත් එකයි කියලා, එතෙක් බදු ගෙවපු නැති ව්‍යාපාරිකයන් සහ විවිධ පුද්ගලයන් තුළ නීතියට ඇතිවෙච්ච බිය. මට මතකයි, එක දේශනයකදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමා පැහැදිලිව කිව්වා, "වැඩිපුර බදු ගෙවන්න බලපා තිබෙන ප්‍රධාන හේතුව තමයි නීතිය කාටත් සාධාරණ වීම, නීතිය කාටත් ක්‍රියාත්මක වීම, ඒ වාගේම අල්ලසක් දීලා, දූෂණයක් කරලා, නිලධාරියෙක් හෝ ඇමතිවරයෙක් අල්ලාගෙන තමන්ගේ බදු වංචා කරගන්න බැහැ" කියලා. ඒක නිසා නීතියේ පාලනය, අල්ලස හා දූෂණයට විරුද්ධව සටන් කිරීම කියන්නේ හුදු කවුරු හරි වංචාවක් කරපු මනුස්සයෙකුට දඬුවම් දීමට එහා ගිය දෙයක්. ඒක විශාල ක්ෂේත්‍ර ගණනාවකට බලපානවා.

එකක් තමයි, නීතියේ ආධිපත්‍යය තහවුරු වීම. මම ඒ ගැන කිව්වා. අද ඉතා පැහැදිලිව ඔප්පු වෙමින් තිබෙනවා, නීතිය සැමට උඩින් තිබෙන්නේ කියලා. රටක් හොඳින් පාලනය වෙන්න ඕනෑ කරන ප්‍රධාන සාධක කිහිපයක් තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදීව පත්වෙච්ච ආණ්ඩුවක් තිබෙන්න ඕනෑ. ස්වාධීන අධිකරණයක් තිබෙන්න ඕනෑ. නීතිය කියන එකට කවුරුත් යටත් වෙන්න ඕනෑ. ඒක යටත් වීමම තමයි. නීතියට යටත් වෙන්න ඕනෑ, නීතියට භය වෙන්න ඕනෑ. තනි තනි පුද්ගලයන්ට නොවෙයි, නීතියට බය වෙන්න ඕනෑ. ඒක ඇති කරන්නම අවශ්‍යයි. ඒක හරහා අපිට තවත් දෙයක් වෙනවා. ඒ මොකක්ද? අපි එවැනි අධිකරණයක් තිබෙන රටක් වුණාම, විශේෂයෙන්ම ආර්ථිකය පැත්තෙන් ගත්තොත්, දේශීය සහ විදේශීය වශයෙන් ගත්තොත්, අපේ රටේ ආයෝජනය කරන්න, ව්‍යාපාර කරන්න මිනිස්සු භය නැතිව කටයුතු කරනවා. ඒ වාගේම, මිනිස්සුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පුළුල් වෙනවා. පොලීසියේ පහළම නිලධාරියාගේත්, මැද නිලධාරියාගේත්, රාජ්‍ය නිලධාරීන්ගේත් පෞරුෂය, ඔවුන්ගේ තීන්දු ගැනීමේ හැකියාව එතකොට යම්කිසි ආකාරයකින් වැඩි වෙනවා. ඒක නිසා මේ නීතියේ පාලනය ඇති කිරීම කියන එක, හුදු අල්ලස හා දූෂණය අඩු කරනවා, නැති කරනවා කියන එක, නිකම්ම නිකම් වැරැද්දක් කරන මිනිහෙක් අල්ලලා හිරේ දානවා වාගේ දෙයක් නොවෙයි. එහි ඊට වඩා පුළුල් අදහසක් තිබෙනවා.

මේකේ පසුබිම විධියට මම මේ කාරණයත් කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නීතියේ විධානය, කාර්යක්ෂම විමර්ශන ආයතන, කාර්යක්ෂම අධිකරණ, ස්වාධීන අධිකරණ පද්ධති හරහා, අල්ලසට විරුද්ධව සටන් කිරීම හරහා, ලෝකයේ ආර්ථික සංවර්ධනයේ ඉහළට ආපු රටවල් ගණනාවක් ගැන අපි කවුරුත් කථා කරනවා. උදාහරණයක් විධියට ගත්තොත්, බොහෝ අය සිංගප්පූරුව අගය කරන්නේ ඒකයි. සිංගප්පූරුවේ අල්ලසට, දූෂණයට විරුද්ධව ඉතාම ඉහළ මැදිහත්වීමක් ඒ රටේ නායකයන්ගේ සිට අධිකරණ පද්ධතිය හරහා තිබෙනවා. ඒක මෙතැන ඉන්න අපි කවුරුත් පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව අගය කරනවා. මම පොඩි වෙලාවක් අරගෙන රුවන්ඩාව ගැන කියන්න කැමැතියි. රුවන්ඩාව 2000 වසරේ සිට වර්තමානය දක්වා පෝල් කගාමේ ජනාධිපතිතුමාගේ නායකත්වය සහ ඒ පාලනය තුළ තිබෙන රටක්. එම රට අතිවිශාල ලෙස බෙදාවාචකයකට පත් වූ රටක්. නීතියේ විධානය, අල්ලසට එරෙහිව කටයුතු කිරීම, බොරුකාර වංචනිකයන්ට විරුද්ධව, විවිධාකාර වංචනිකයන්ට විරුද්ධව, දූෂිතයන්ට පමණක් නොවෙයි, විවිධාකාර වංචනිකයන්ට විරුද්ධව කටයුතු කිරීම නිසා අද රුවන්ඩාව "අප්‍රිකාවේ සිංගප්පූරුව" විධියට සලකනවා. ඒ නිසා මේ නීතියේ පාලනය කියන එකෙන් ජාත්‍යන්තර කීර්තිය ඇති වෙනවා. ඒකෙන් ලෝකය තුළ අපේ ආර්ථික සහ විවිධ index වර්ධනය වෙනවා. ඒවා බලලා තමයි ලෝකයේ සමහර ආයෝජකයන් ලංකාවට ආයෝජනය කරන්න වුණත් එන්නේ. ඒ නිසා ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි වෙනවා. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වල අපේ මට්ටම ඉහළ යනවා. ඒ වාගේම, ගෝලීය මූල්‍ය ආයතනවල සහාය ලැබෙනවා. ඒ වාගේම, ව්‍යාපාරිකයන්ට ease of doing business කියන එක වැඩි වෙනවා.

මම නැවතත් මේ කාරණය කියන්න කැමතියි. මීට මාස හයකට විතර කලින් අපේ අගමැතිතුමිය නායකත්වය දුන්නු ප්‍රධාන conference එකකදී, ලංකාවේ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීමකදී, ලංකාවේ ඉතාම ඉහළම සමාගමක ප්‍රධාන විධායක නිලධාරියෙක් කියලා තිබුණා, - මීට මාස හයකට විතර කලින් එතුමා කියලා තිබුණේ - "මේ අවුරුදු එකහමාර තුළ මට උදේ නැඟිට්ටාම පුදුම හිතෙනවා, මම ජීවත් වෙන්නේ ලංකාවේද කියලා" යනුවෙන්. මොකද, මීට කලින් තමන්ගේ

ව්‍යාපාරයක් කරගන්න තිබිච්ච බාධාවන්, විශේෂයෙන්ම දේශපාලන සහ ඉහළ නිලධාරින්ට වංචා දූෂණ හරහා, පගාව දීම හරහා කරන්න තිබිච්ච බාධාවන් එකක්වත් අද නැහැ. ඒක තමයි එතුමා කියපු දේ; එතුමා publicly කියපු දේ. එහෙම නැතිව අගමැතිතුමියට නිකම් මේ conversation එකේදී කියපු දෙයක් නොවෙයි. ඒක fact එකක්. ඒ නිසා ease of doing business කියන එක පැහැදිලිවම වැඩි වෙලා තිබෙනවා. මොකද, අද කිසිම ව්‍යාපාරිකයෙකුට ඇමතිවරු පස්සේ ගිහිල්ලා බිස්නස් ගන්න අවශ්‍ය නැහැ. ඒ නිසා අපි කියන්න කැමතියි, රටක දියුණුවට මේ අල්ලසට විරුද්ධව කටයුතු කිරීම කොච්චර වැදගත්ද කියලා.

උදාහරණයක් විධියට මම පෝල් කගාමේ සහ රුවන්ඩාව ගැන කියන්න හිතුවා. මොකද, අපේ මෙන්න මේ විධියේ පුරුද්දක් තිබෙනවා. දැන් පෝල් කගාමේ කළාම ඒක හොඳ වෙනවා; ලී ක්වාන් යූ කළාම ඒක හොඳ වෙනවා. ඒක ලංකාවේ වෙනකොට හොඳ නැහැ. රුවන්ඩාව මහා ටුට්සි, හුටු කියන ගෝත්‍ර අතර fight එකෙන් සහමුලින්ම විනාශ වෙලා, නමත් කැත වෙලා තිබිච්ච රටක්. මොකක්ද ඒ රටේ පෝල් කගාමේ ජනාධිපතිතුමා මුලින්ම කළේ? එතුමා මුලින්ම කළේ නීතියේ පාලනය සහ මහජන ආරක්ෂාව ඇති කළ එක. චණ්ඩි, පිල්ලෙයාන්ලා, වීරප්පන්ලා ඇතුළු අරගොල්ලෝ මෙගොල්ලෝ නේ මේ රටේ හිටියේ. සමහර areas තිබුණා, රාජපක්ෂලාගේ හෙංචයියෝ තමයි ඒවා control කළේ. නැත්නම් රනිල්ලාගේ හෙංචයියෝ. නැත්නම් අමුතු අමුතු තගාලා. අද එක තගෙක් නැහැ. අද දෙවුන්දර තුඩුවේ ඉඳලා ඩෙල්ෆ්ට් දූපත දක්වා එක ජන්දෙන් පත්වෙච්ච ආණ්ඩුව විතරයි ඉන්නේ. මොකුත් නැහැ. පැනලා ඉන්න කුඩු මුදලාලිලා තව කිහිපදෙනෙක් ඉන්නවා අල්ලන්න. වෙන චණ්ඩි නැහැ. ඔක්කෝම නොචණ්ඩි වෙලා තිබෙන්නේ. මොකක්ද කළේ, පෝල් කගාමේ ජනාධිපතිතුමා? එතුමා ඉස්සෙල්ලාම නීතියේ පාලනය සහ මහජන ආරක්ෂාව ඇති කිරීම සඳහා අධිකරණයේ ප්‍රතිසංස්කරණ සිදු කරන්න බැලුවා. හැබැයි, එතුමා ඉතා ඉක්මන් දෙයක් කළා. ඒ මොකක්ද? එතුමාගේ රටේ පාරම්පරිකව තිබුණා Gacaca නමින් community-based justice system එකක්. මා හිතන විධියට ඒක අපේ වරිග සභාව වගේ එකක් වෙන්නත් පුළුවන්. එතුමා ජනතාව එකතු කර ගත්තු අධිකරණ පද්ධතියක් හැදුවා. ජනතාවට කිව්වා, කරපු අපරාධ ගැන කියන්න කියලා. ඒ ඔක්කෝටම දඬුවම් දුන්නාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. හැබැයි, ඒකෙන් යම්කිසි සංහිඳියාවක් ඇති කළා. අඩු ගණනේ, වරද කරපු මිනිහා හඳුනා ගත්තා. හැබැයි, දඬුවම් දෙන්න පුළුවන් වුණාද බැරි වුණාද කියලා මම දන්නේ නැහැ.

පෝල් කගාමේ ජනාධිපතිතුමා එහෙම තමයි ජන සංහාරයට අදාළව reconciliation එක පටන් ගත්තේ. ඊට පස්සේ එතුමා දූෂණයට එරෙහිව කටයුතු කළා. Zero tolerance කියලා කවුරුත් ආඩම්බරයෙන් කියනවා නේ. හැබැයි, මෙහේ zero tolerance කරන්න ගියාම කියනවා, "හොරු අල්ලනවාය කියලා එච්චරටම අල්ලන්න එපා" කියලා. හිටපු සෞඛ්‍ය ඇමතිවරයෙකු එහෙම කියලා තිබෙනවා මම දැක්කා.

කගාමේ ජනාධිපතිතුමා ඊට පස්සේ, වෘත්තීය සහ විනයගරුක පොලිස් සේවාවක් ඇති කළා. තිබුණු එක වෙනස් කරලා Rwanda National Police එක හැදුවා. රුවන්ඩාවට තම අළු දූලි මතින් නැඟිටීමට හැකි වූ ප්‍රධානම හේතුවක් - එකම හේතුව නොවෙයි - වුණා, එය. සිංගප්පූරුව ගැන අපි කවුරුත් දන්නවා නේ. ඒ වාගේම, දකුණු කොරියාවේ 1997න් පසුව පත් වුණු ජනාධිපතිතුමා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් වෙත තම රට ගෙන යද්දී දූෂණයට විරුද්ධව විශාල වැඩ කොටසක් කළා. දකුණු කොරියාවේත් මහා පරිමාණ සමාගම් තම රටේ පාලනයත් එක්ක සම්බන්ධ වෙලා බදු සහන ලබා ගත්තා. "සිය රට දේ සිරි සැප දේ" කියන එක misuse කරලා බොරු patriotism එකක් යොදාගෙන බදු වංචා කරමින් මහා පරිමාණ සමාගම් 30ක්, 40ක් හදා ගත්තා. ඒවාට විරුද්ධව ඒ රටේ ජනාධිපතිතුමා නීතිය හරියාකාරව ක්‍රියාත්මක කළා; දූෂණයට වංචාවට විරුද්ධව කටයුතු කළා. එහෙම තමයි දකුණු කොරියාව 1997න් පසුව ඉස්සරහට ආවේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම නැත්නම්, එය ප්‍රජාතන්ත්‍රවාදය අඩු, අතිශය දූෂිත රාජ්‍යයක් බවට පත් වෙලායි තිබුණේ.

දූෂණයට විරුද්ධව සටන් කිරීම, දූෂණයට විරුද්ධව තිබෙන ආයතන ශක්තිමත් කිරීම, ඒවායේ නිලධාරින්ට අවශ්‍ය කරන ශක්තිය සහ ඇගයීම ලබා දීම මඟින් රටකට නිකම්ම නිකම් වැරැදිකරුවෙකුට දඬුවම් කිරීමට එහා ගිය පුළුල් බලපෑමක් ඇති කරනවා.

අපට ජනවරමකුත් තිබෙනවා. හැබැයි, ඒ ජනවරමට අමතරව විශාල ජාත්‍යන්තර පසුබිමකුත් තිබෙනවා. අද අපේ පක්ෂ, විපක්ෂ ඕනෑම නායකයෙකුට ලෝකය ඉස්සරහට ගිහින් කොන්ද කෙළින් තබාගෙන කථා කරන්න පුළුවන්. අද විදේශ කටයුතු ඇමතිතුමා කිව්වා, මේ අවුරුදු දෙකටම එක පැහැර ගැනීමක්වත් - abduction එකක් - වෙලා නැහැ කියලා. ඒවා, නීතියේ පාලනය නිසා වෙච්ච දේවල්. අද සුදු වෑන් එකක්වත් නැහැ. ඒවා, නීතියේ පාලනය නිසා වෙච්ච දේවල්. ඒ වාගේම, මිනිසුන් නිදහස් කරන්නම් කියලා බොරුවට අත්අඩංගුවට අරගෙන වෙනම පගාව අරන් සමහර නීතිඥ මහත්වරුන් හරහා කරන සෙල්ලම් පවා දැන් ඉතාම අඩුයි. වැරැදිකරුවෙකු වෙච්ච හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙකු බේරා ගැනීම සඳහා මේ ළඟදි පගාවක් දෙන්න ගිය කෙනෙකුත් අල්ලලා තිබෙනවා මම දැක්කා. ලංකාවට ඉස්සරහට යන්න නම් අල්ලසට, දූෂණයට විරුද්ධ සටන අතිශය වැදගත් වෙනවා.

විරුද්ධ පක්ෂයේ මෙතුමන්ලා මතු කරන තවත් ලොකු කාරණයක් තිබෙනවා. හොරු විතරක් නොවෙයි, හොරුන්ගේ පිහිටෙන් එක එක දේවල් සම්බන්ධයෙන් ආණ්ඩුවට ගහන්න හදන කට්ටිය කරන දෙයක් තිබෙනවා. මොකක්ද ඒ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමානයේ සිදු කරන මේ අත්අඩංගුවට ගැනීම්, දඬුවම් දීම් පළිගැනීම් ලෙස ඒ අය අර්ථකථනය කරනවා. මේවා පළිගැනීම්ලු. නමුත් ඒ අය කියනවා, "අපි දූෂණයට විරුද්ධව සටන් කරනවා, අපි දූෂණයට විරුද්ධව අත් දෙකම ඔසවනවා" කියලා. හැබැයි, දූෂිතයෙකුට උසාවියෙන් දඬුවමක් දුන්නොත්, දූෂිතයෙකුට උසාවියෙන් තාවකාලිකව ඇප නොදුන්නොත්, ඒ අයට ඒක දඩයමක් වෙනවා. ඒ කියන්නේ, ප්‍රතිපත්තියට එකඟයි; ක්‍රියාවට විරුද්ධයි. ඒ දෙබිඩි දේශපාලනයට කවදාවත් ඉස්සරහට යන්න බැහැ. පරමාදර්ශී සටන් පාඨ පාවිච්චි කරනවා නම්, ඒ පරමාදර්ශී සටන් පාඨවල තිබෙන ක්‍රියාමාර්ගවලටත් සහයෝගය දිය යුතුයි. නැත්නම් ව්‍යාජයක් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015ත් අදත් අතර කාලය තුළ අත්අඩංගුවට ගත් හෝ උසාවියෙන් වැරැදිකරුවන් වෙච්ච හෝ දේශපාලනඥයන් ඇතුළු ප්‍රධාන පුද්ගලයන් 50දෙනෙකු පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015-2019 කාලය අතරතුර තමයි මේ 50දෙනාටම අදාළව නඩු පවරා තිබෙන්නේත්, පැමිණිලි ගොනු කරලා තිබෙන්නේත්. ඒ සියල්ලම කරලා

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

තිබෙන්නේ ඒ කාලය තුළදීයි. මේවා පළිගැනීම් නම්, මේවා අලුතින් විය යුතු දේවල්. මේ නඩු කටයුතු ඔක්කෝම පටන් ගෙන තිබෙන්නේ ඒ කාලයේයි. හැබැයි, ඊට පසුව ඒගොල්ලන්ගේ තිබෙන යාළු හිතවත්කම් මත ඒ පරීක්ෂණ කළේ නැහැ. ඒවා, ඩීල් දාලා බේරා ගත්තා. හැබැයි, විමර්ශන නිලධාරින්ට කොන්ද පණ තිබෙන නිසා මෙච්චර දුරක් ගියා.

2019දී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කළාට පසුව ඒවා එක්කෝ සදාකාලිකවම හැංගුවා; එහෙම නැත්නම් ඉවත් කර දැමුවා.

මම ඉතාම ඉක්මනින් ඒ නම්වලින් කීපයක් කියන්නම්. ජොන්ස්ටන් ප්‍රනාන්දු; චෝදනාව, සතොස සේවකයන් 150දෙනෙකු නිල රාජකාරිවලින් ඉවත් කර දේශපාලන කටයුතුවල යෙදවීමෙන් රජයට මිලියන 40ක් පාඩු කිරීම; නඩුව ගොනු කළ දිනය, 2016 මැයි 12. නඩු අංකයත් තිබෙනවා. වෙලාව නැති නිසා කියන්නේ නැහැ. හිටපු අමාත්‍ය විමල් වීරවංශ; චෝදනාව, 2010-2015 කාලය තුළ නීත්‍යානුකූල ආදායම ඉක්මවා යමින් මිලියන 75.4ක නොනිසි වත්කම් උපයා ගැනීම; නඩුව ගොනු කළ දිනය, 2017 ඔක්තෝබර් 03. හිටපු අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ; චෝදනාව, 2014 ජනාධිපතිවරණ සමයේ කැරම් බෝඩ් 14ක ප්‍රශ්නය; නඩුව ගොනු කළ දිනය, 2016 අගෝස්තු 18. බැසිල් රාජපක්ෂ; චෝදනාව, 'දිවි නැගුම' අරමුදලින් රුපියල් මිලියන 2,991ක් වැය කර ජනාධිපතිවරණ සමයේ ලෝහ තහඩු - GI sheets - බෙදා හැරීම; නඩුව ගොනු කළ දිනය, 2015 අප්‍රේල් 15. හිටපු අමාත්‍ය රාජිත සේනාරත්න; මෝදර ධීවර වරාය අඩු මුදලකට බදු දීම මගින් රජයට මුල්‍ය පාඩුවක් සිදු කිරීම; නඩුව ගොනු කළ දිනය, 2020 ඔක්තෝබර් 29. රවී කරුණානායක; චෝදනාව, 2016 මහ බැංකුවේ වෙන්දේසියේදී බිලියන 51.9ක් අලාභ සිදු කිරීම; නඩුව ගොනු කළ දිනය, 2021 ජූලි 06. ප්‍රසන්න රණතුංග; චෝදනාව, මීගමුව තලාහේනේ ඉඩමකට පස් යෙදවීමට අවසරය ලබා දීමට ව්‍යාපාරිකයෙකුගෙන් රුපියල් මිලියන 64ක් ඉල්ලා තර්ජනය කිරීම; නඩුව ගොනු කළ දිනය, 2015 ජූලි 20. හිටපු අමාත්‍ය පියංකර ජයරත්න; චෝදනාව, සිවිල් ගුවන් සේවා අධිකාරියේ අරමුදලින් ලක්ෂ 91ක් අවභාවිත කිරීම සහ නීති විරෝධී පත්වීම් 5ක් දීම; නඩුව ගොනු කළ දිනය, 2017 ඔක්තෝබර් 27. ඒ.එච්.එම්. ෆවුසි; චෝදනාව, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට නෙදර්ලන්තයෙන් ලැබුණු ලෑන්ඩ් කෲසර් රථයක් පෞද්ගලික පරිහරණයට ගැනීම; නඩුව ගොනු කළ දිනය, 2016 සැප්තැම්බර් 09. සරණ ගුණවර්ධන; චෝදනාව, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරද්දී රජයේ මුදල් අවභාවිත කරමින් නීති විරෝධී ලෙස වාහන කුලියට ගැනීම; නඩුව ගොනු කළ දිනය, 2016 මාර්තු 15.

ඊට පස්සේ ඉන්නවා, රාජපක්ෂ පවුලේ අය. නාමල් රාජපක්ෂ; චෝදනා ගොඩක් තිබෙනවා; Indian Krrish නඩුව; නඩුව ගොනු කළ දිනය, 2016 ජූලි 01. යෝෂිත රාජපක්ෂ; චෝදනාව, CSN නාළිකාවට අයථා ලෙස මිලියන 237ක් උපයා ගැනීම; නඩුව ගොනු කළ දිනය, 2016 ජනවාරි 30. ගෝඨාභය රාජපක්ෂ; චෝදනාව, මැදමුලන ඩී.ඒ. රාජපක්ෂ ස්මාරකය ඉදි කිරීමට ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවෙන් මිලියන 33.9ක් යෙදවීම; නඩුව ගොනු කළ දිනය, 2015 සැප්තැම්බර් 08. ශිරන්ති රාජපක්ෂ; චෝදනාව, සිරිලිය පදනම - දැන් ඔය යන එක - සහ තාජුඩීන් ඝාතනයට අදාළ කරන ඩිෆෙන්ඩර් රථ භාවිතය; නඩුව ගොනු කළ දිනය, 2015 ජූනි 15. රෝහිත රාජපක්ෂ - රොකට්; චෝදනාව, සුප්‍රීම් සැට් චන්ද්‍රිකාව ව්‍යාපෘතිය සඳහා රජයේ මුදල් සහ රාජ්‍ය සම්පත් අවභාවිත කිරීම; නඩුව ගොනු කළ දිනය, 2015 මාර්තු 20. හිටපු කථානායක චමල් රාජපක්ෂ; වරාය සහ නාවික අමාත්‍යාංශයේ අරමුදල්වලින් අනුමත නොකළ ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීමේ පැමිණිල්ල; නඩුව ගොනු කළ දිනය, 2016 සැප්තැම්බර් 18. හිටපු අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ; චෝදනාව, මහියංගනය ප්‍රදේශයේ රජයේ ඉඩම් අක්කර ගණනාවක් නීති විරෝධි ලෙස තම හිතවතුන් අතර බෙදා දීම; නඩුව ගොනු කළ දිනය, 2015 නොවැම්බර් 12. හිටපු ඇමෙරිකානු තානාපති ජාලිය වික්‍රමසූරිය; චෝදනාව, වොෂින්ටන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල ගොඩනැඟිල්ල මිල දී ගැනීමේදී ඇමෙරිකානු ඩොලර් 332,000ක මුදලක් වංචා කිරීම; නඩුව ගොනු කළ දිනය, 2016 නොවැම්බර් 17. උදයංග වීරතුංග; චෝදනාව, MiG case එක; නඩුව ගොනු කළ දිනය, 2015 ජූනි 09. හිටපු නියෝජ්‍ය අමාත්‍ය නිරූපමා රාජපක්ෂ; චෝදනාව, පැනමා, පැන්ඩෝරා පත්‍රිකා හරහා හෙළි වූ ජාත්‍යන්තර බැංකු ගිණුම් සඟවා තිබූ රහස් වත්කම් - offshore assets; නඩුව ගොනු කළ දිනය, 2021 ඔක්තෝබර් 08.

ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරිනුත් ඉන්නවා. ලලිත් වීරතුංග මහතා; නඩුව ගොනු කළ දිනය, 2015 සැප්තැම්බර් 25. අනූෂ පැල්පිට; සිල් රෙදි ප්‍රශ්නය; නඩුව ගොනු කළ දිනය, 2015 සැප්තැම්බර් 25. පූජිත් ජයසුන්දර; පාස්කු ප්‍රහාරය පූර්ව බුද්ධි තොරතුරු තිබියදී වළක්වපු නැති එක; නඩුව ගොනු කළ දිනය, 2021 අගෝස්තු 10. එම චෝදනාවටම හේමසිරි ප්‍රනාන්දු; නඩුව ගොනු කළ දිනය, 2021 අගෝස්තු 10. අර්ජුන මහේන්ද්‍රන්; 2018. අර්ජුන් ඇලෝෂියස්; 2018. කසුන් පලිසේන, පර්පෙචුවල් ට්‍රෙෂරීස්; නඩුව ගොනු කළ දිනය 2018 පෙබරවාරි 02. හිටපු නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා. ඒ අර, රෝද පුටුවෙන් ඇවිල්ලා ඇප දුන්නාට පසුව නැඟිටලා ගිය එක්කෙනා වෙන්න ඕනෑ. නඩුව ගොනු කළ දිනය, 2018 ඔක්තෝබර් 25. ඊයේත් එහෙම එකක් වුණා නේද? Operation එක කරලා තිබුණේ උසාවියට යද්දී. ජයන්ත වික්‍රමරත්න; නඩුව ගොනු කළ දිනය, 2017 දෙසැම්බර් 18. හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක; තාජුඩීන් case එක; නඩුව ගොනු කළ දිනය, 2016 මැයි 23.

ඊට පසුව තිබෙනවා, පළාත් සභා, නගර සභා සහ සංස්ථාවලට අදාළ ඒවා. චාමර සම්පත් දසනායක මැතිතුමා; නඩුව ගොනු කළ දිනය, 2018 අගෝස්තු 14; චෝදනාව, ඌව පළාත් සභාවේ පාසල් සඳහා රෙදි මිල දී ගැනීමේ ලක්ෂ 160ක කථාව. උතුරු මැද පළාත් හිටපු ඇමති එස්.එම්. රංජිත් සමරකෝන්; චෝදනාව, නිල ඉන්ධන දීමනා ලබා ගනිමින් අතිරේකව ඉන්ධන ලබා ගැනීමෙන් රජයට පාඩු සිදු කිරීම; නඩුව ගොනු කළ දිනය, 2017 ජූලි 10. පියසේන ගමගේ; චෝදනාව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ඉඩමක් අඩු තක්සේරුවට ලබා දීම; නඩුව ගොනු කළ දිනය, 2017 නොවැම්බර් 10. බන්දුල ගුණවර්ධන; චෝදනාව, සතොස හරහා සහල් ආනයනය කිරීමෙන් රජයට පාඩු කිරීම; නඩුව ගොනු කළ දිනය, 2015 අගෝස්තු 04. ඕනෑ නම් තවත් කියන්න පුළුවන්. රූපවතී කේතීස්වරන්, කිලිනොච්චියේ හිටපු දිසාපති. ජයන්ත ප්‍රනාන්දු, හිටපු පොලිස් අතිරේක ලේකම්. තවත් එක්කෙනෙක් තමයි, ගීතා කුමාරසිංහ. අපි ගරු කරපු නිළියක් එතුමිය. හැබැයි, එතුමියගේ දේශපාලනයට ගරු කරන්නේ නැහැ; නඩුව ගොනු කළ දිනය 2015 මාර්තු 24. රෝහිත බෝගොල්ලාගම; විදේශ කටයුතු අමාත්‍යාංශයේ අරමුදල් සහ නිල බලය අවභාවිත කිරීම; 2016 නොවැම්බර් 15.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

Sir, I rise to a point of Order. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභානායකතුමා මගේ නම කිව්වා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Chamara Sampath Dasanayake?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

අපේ සභානායකතුමා list එකක් කිව්වා. 2016 අවුරුද්දේ, 2015 අවුරුද්දේ තමයි. හැබැයි, ඒ දූෂණ විරෝධී කමිටුවේ හිටියේ ආනන්ද විජේපාල මහත්මයායි, අනුර කුමාර දිසානායක මහත්මයායි. සමන්ත විද්‍යාරත්න තමයි මට විරුද්ධව ඒ පැමිණිල්ල ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leader of the House.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්න හැදුවේ මේකයි. ඉන්න, මේ ටිකත් කියනකම්. වසීම් තාජුඩීන් ඝාතන නඩුව; 2015. ලසන්ත වික්‍රමතුංග; 2009. ප්‍රගීත් එක්නැලිගොඩ; 2019. ලලිත් සහ කුගන්; 2011. කීත් නොයාර්ට පහර දීම; 2017. උපාලි තෙන්නකෝන්ට පහර දීම; 2016. රවීන්ද්‍ර සමරවීර හිටපු අමාත්‍ය; රජයේ සහල් තොග අඩු මුදලට පෞද්ගලික අංශයට ලබා දීමෙන් අක්‍රමිකතා සිදු කිරීම; 2016. විජයදාස රාජපක්ෂ; ඇවන්ට් ගාර්ඩ් සිද්ධියට අදාළව නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතුවලට බලපෑම් කළ බවට වූ පැමිණිල්ල; 2017. නිශ්ශංක සේනාධිපති; 2019. තිලාන් විජේසිංහ; 2018. මේ වාගේ නම් 50ක් තිබෙනවා.

දැන් කියනවා නේ, පළිගන්නවා කියලා. ලක් අම්මා අත්අඩංගුවට ගත්තා කියලා නේ කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට පළමුවැනි අවුරුදු එකහමාරේ මොකක්ද කිව්වේ? "කෝ, රාජපක්ෂලා අල්ලනවාද?" "මේවා ඩීල්, ගේම්." ඕවා තමයි කිව්වේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේවාට මැදිහත් වෙන්නේ නැහැ. අපි විමර්ශන අංශ ශක්තිමත් කරනවා. ඒක අපි කළ යුතුයි. ඒ සඳහා ශක්තිය දෙනවා. අධිකරණයට තමයි ඒ අවස්ථාව දීලා තිබෙන්නේ. ඒ නිසා තමයි මේ ඔක්කෝම පැමිණිලි. මම හිතන විධියට, එකක් හෝ දෙකක් වාගේ ඉතා කුඩා ප්‍රමාණයක් ඇති, අපේ කාලයේ දමපු ඒවා. මොකද, ඒවා process වෙන්න කාලයක් යනවා. ඒවා විමර්ශනය කරන්න ඕනෑ. නමුත් මෙතැන කිසිම පළිගැනීමක් නැහැ. කිසිම පළිගැනීමක් නැහැ. විධායක ජනාධිපති ධුරයකුයි, තුනෙන් දෙකක බලයකුයි, දැවැන්ත ජන වරමකුයි තියාගෙන රාජපක්ෂලා, වික්‍රමසිංහලා, ප්‍රේමදාසලා, ජේ.ආර්. ලා පළිගත්ත විධියට අපි හිතුවා නම් මොකද වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? නමුත් අපට එහෙම වුවමනාවක් නැහැ. ඒ නිසා අපි කියන්න කැමැතියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට කරන මේ පළිගැනීම් කියන චෝදනාවේ කිසිම පදනමක් නැහැ කියන එක. පෞද්ගලිකව අපිත් ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. අපි දන්නවා, මේ මන්ත්‍රීතුමන්ලාට, මේ පුද්ගලයන්ට මේකෙන් පෞද්ගලිකව කරදරයක් වෙනවා කියලා. ඒ ගැන අපට කිසිම සතුටක් නැහැ. එතුමන්ලාගේ දරුවන්ට, එතුමන්ලාගේ නෝනලාට, එතුමන්ලාගේ අම්මලාට වෙන බලපෑම ගැන අපට හැඟීමක් තිබෙනවා. හැබැයි, අපි දරන්නේ public office. අපේ වගකීම මොකක්ද? අපි නීතියට, ජනතාවට වග කියන්න ඕනෑ. ඒගොල්ලන්ගේ දරුවන්ට සිද්ධ වන දේ ගැන අපට කනගාටුවක් තිබෙනවා.

ඔබතුමන්ලා අඳුරු යුගයක බිලි. ඔබතුමන්ලා වික්‍රමසිංහලාගේ, ප්‍රේමදාසලාගේ, චන්ද්‍රිකාලාගේ, රාජපක්ෂලාගේ අපත දේශපාලන ව්‍යාපෘතිවල බිලි. සමහර මන්ත්‍රීවරු අතිදක්ෂයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් හිරේ යන්න ඉන්නේ. දේශපාලන පක්ෂයක් මොකක්ද කරන්න ඕනෑ? දේශපාලන පක්ෂයක් කරන්න ඕනෑ, තමන්ගේ මන්ත්‍රීවරු හරි පාරේ ගෙනයන එක. ඔබතුමන්ලාට මොකක්ද වුණේ? ඔබතුමන්ලා සුළියකට අහු වුණා. තමන්ගේ බලය පවත්වා ගන්න දූෂණයම කරන නායකයන්ගෙන් සමන්විත පක්ෂවලට ඔබතුමන්ලා අහු වුණා. ඔබතුමන්ලා ඒක ඇතුළේ ගිහිල්ලා බිලි වුණා. දේශපාලන පක්ෂ ගත්තාම, අපිත් දේශපාලන පක්ෂයක්. අපේ පක්ෂයට ආවාට පස්සේ අපි ඒවා නිවැරදි කරනවා. අපි පක්ෂය ඇතුළේම පුළුවන් තරම් ඒවා නිවැරදි කරනවා; recycle කරනවා. බැරිම වුණාම සමහර අයට අපි ගේට්ටුව ඇරලා දෙනවා, යන්න කියලා. ඒ නිසා ඔබතුමන්ලා ගැන අපට කනගාටුවක් තිබෙනවා. ඔබතුමන්ලා පාපතර යුගයක බිලි. නමුත් ලෝකයේ නායකයෝ මේ වාගේ අවස්ථාවලදී කටයුතු කරලා තිබෙන්නේ කොහොමද? සමහර මන්ත්‍රීතුමන්ලා අපට කියනවා, ඇමතිතුමා, මට මෙහෙම වෙලා තිබෙනවා කියලා. යම්කිසි හෘදය සාක්ෂියක් එක්කයි අපි වැඩ කරන්නේ.

ලී ක්වාන් යූ මැතිතුමා මොකක්ද කියා තිබෙන්නේ? එතුමා කියා තිබෙනවා, "මිත්‍රයෙක් ලෙස, සගයෙක් ලෙස පෞද්ගලිකව ඇති වන කනගාටුව පසෙකලා, රජයේ සහ නීතියේ විශ්වසනීයත්වය සුරැකීමට දූෂණයට එරෙහිව තරාතිරම නොබලා ක්‍රියාත්මක විය යුතුයි, නීතිය ක්‍රියාත්මක කළ යුතුයි" කියලා. මාග්‍රට් තැචර් කියන්නේ මම හිතන විධියට විපක්ෂය පැත්තේ ප්‍රධාන පෙළේ පක්ෂ දෙකම පිළිගන්නා නායිකාවක්. මොකක්ද, එතුමිය කියන්නේ? "මෙය පෞද්ගලික කාරණයක් නොවෙයි. මහජන පදවි දැරීමේදී තිබිය යුතු වගකීම පිළිබඳ කාරණයක්. ඕනෑම අයෙකුගේ පවුලකට මුහුණ දීමට සිදු වන දුෂ්කරතාව ගැන මානුෂීයව කනගාටු විය හැකි නමුත් නීතිය සහ මහජනතාව වෙත ඇති වගකීම ඊට වඩා ඉහළින් පවතී." එහෙමයි එතුමිය කියන්නේ. බැරැක් ඔබාමා දේශපාලන වශයෙන් අපට ආසන්නවම හිටපු කෙනෙක්. එතුමා මොකක්ද කියන්නේ? "මෙවැනි අවස්ථාවලදී සම්බන්ධ වන පවුල්වලට සහ දරුවන්ට සිදු වන මානසික බලපෑම ගැන අපට සංවේදී විය හැකියි. නමුත් නීතිය ඉදිරියේ කිසිවෙකුට විශේෂ සැලකිල්ලක් හිමි වන්නේ නැහැ". ඔබතුමන්ලා ඔබාමා කිව්වාම පිළිගන්නවා, තැචර් කිව්වාම පිළිගන්නවා. ලංකාවේ වෙන දේ ගත්තාම ඒකට කියනවා, වෙන පළිගැනීම් කියලා. මට ඒක තේරෙනවා. චෝදනාවට ලක් වෙලා ඉන්න මන්ත්‍රීවරු ඒක කිව්වාට ප්‍රශ්නයක් නැහැ. පැහැදිලිවම මේ රටේ විවිධ දූෂණ, වංචා, ජාතිවාදී, ආගම්වාදී විවිධ දේවල් කරලා ඒවාට අදාළව යම් යම් ගැටලු ආවාට පස්සේ ඒවාට විරුද්ධව වෙන වෙන මත හදනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ කිසිම පළිගැනීමක් නැහැ කියන එකයි අපි කියන්නේ. අපි පළිගන්න හිතලාවත් නැහැ. ඔබතුමන්ලා කරපු දේවල්වලින් සියයට එකක් අපි කරන්න හිතුවොත් ඔබතුමන්ලාට අත්වන ඉරණම ගැන හිතලා බලන්න. අපට අවශ්‍ය වෙන්නේ ලංකාව වෙන යුගයකට ගෙනියන්න. අවසන් වන යුගයක, අවසාන අවතාර ටික වාගේ ඔබතුමන්ලාගෙන් සමහරු ඉන්නේ. එවැනි දූෂිත පාලනයක් නැවත එන්නේ නැහැ. නැවත එන්නේ එක්කෝ අපි, එහෙම නැත්නම් අපට වඩා හොඳ ආණ්ඩුවක්. නැවත මේ ශ්‍රී ලංකාව රාජපක්ෂලාගේ, ප්‍රේමදාසලාගේ, වික්‍රමසිංහලාගේ යුගයකට යන්නේ නැහැ. ඒ ගැන සැකයක් නැහැ. එක්කෝ ජාතික ජන බලවේගය දිගටම ඉදිරියට යනවා, නැත්නම් අපට වඩා හොඳ කණ්ඩායමක් ඉදිරියට යයි. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, මේ රටේ අපට කලින් පැවති ආණ්ඩුවලින් පාරවල් හදලා තිබෙන බව, බස් ගෙනැල්ලා තිබෙන බව, කෝච්චි දාලා තිබෙන බව, බිල්ඩින් හදලා තිබෙන බව, ඉස්කෝල හදලා තිබෙන බව. ඒවායින් යම්කිසි ප්‍රයෝජනයක් තිබෙනවා. ඒවායෙන් ප්‍රයෝජනයක් නැතිවා නොවෙයි. හැබැයි, මේ රටේ පසුගිය අවුරුදු තිහේම මොකක්ද

[ගරු බිමල් රත්නායක මහතා]

වුණේ? සමාජය ප්‍රතිශෝධනය කරන්න බැරි වුණා, නීතියේ පාලනය ඇති කරන්න බැරි වුණා, ස්වාධීන අධිකරණ පද්ධතියක් හදන්න බැරි වුණා, කොන්ද පණ තිබෙන පොලීසියක් හදන්න බැරි වුණා. ඒ අමාරු වැඩ ටික තමයි අපි මේ කරමින් යන්නේ. ඒ නිසා අපට පළිගැනීමේ කිසිම චේතනාවක් නැහැ. මම ඉතාම ගරුත්වයෙන් විපක්ෂයේ ඉන්න වැදගත්, decent මන්ත්‍රීතුමන්ලාට කියන්නේ, කරුණාකරලා මේ rhetoric එකට join වෙන්න එපා කියලායි. පැරදිලා, කුණු වෙලා වැටෙන යුගයක අවසානයේ හොල්මන් අවතාර වාගේ ඔබතුමන්ලා ඒකට බිලි වෙන්න එපා. ඒකට උදවු කරන්න එපා. මොකද, ඔබතුමන්ලාට කවදාවත් එහෙම කරලා ඉස්සරහට යන්න බැහැ. අපට තිබෙන කනගාටුව මේකයි. වැදගත්, හොඳ මන්ත්‍රීතුමන්ලා විපක්ෂයේ ඉන්නවා. අපට ඒගොල්ලන් වැදගත්. ඒ අය වටිනවා. අපි කියන්නේ ඒකයි, පැරදුණු, කාලකණ්ණි යුගයට උදවු කරන්න එපා කියලා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙලාවේ, අපි උසාවිය අතට ගන්න යන්නේ, ඒකාධිපතියෙක් වෙන්න යන්නේ කියලා විපක්ෂයෙන් අපේ ගරු ජනාධිපතිතුමාට සහ ආණ්ඩුවට කිව්ව බව. එහෙම නේ, කිව්වේ. ඡන්දයට විරුද්ධත් වුණා නේ, මේගොල්ලන්. ලොකු මතයක් හැදුවා, ජනාධිපතිතුමා උසාවියට බලපෑම් කරන්නයි යන්නේ කියලා. සමහර නඩු තීන්දු, පරණ නඩු තීන්දු. සාකච්ඡාවට ලක් වෙලා තිබෙන ඔක්කොම නඩු තීන්දු,- මම ඒ නම මෙතැන කියන්න ගියේ නැහැ, සංවේදී නිසා. ඒ ඔක්කොම පරණ නඩු. එතකොට කියනවා, ජනාධිපතිතුමාට මැදිහත් වෙන්නය කියලා. ඉතින්, ජනාධිපතිතුමා උසාවියට මැදිහත් වුණාම ඒකාධිපතියෙක් වෙනවා කියලා නේ ඔබතුමන්ලා කිව්වේ. ඔබතුමන්ලා මීට සති දෙකකට කලින් කිව්වා, ජනාධිපතිතුමා උසාවියට මැදිහත් වෙන්න යන්නේ, මැදිහත් වුණාම ඒකාධිපතියෙක් වෙනවා කියලා. දැන් ඔබතුමන්ලා සහ සමහරු කියනවා, ජනාධිපතිතුමාට මැදිහත් වෙන්න කියලා. ඉතින්, ඒක ප්‍රතිවිරෝධීයි නේ. ඒ නිසා අපි පැහැදිලිව කියන්න කැමැතියි, අද මේ කරන සංශෝධනයේ දේශපාලන සමාජ පසුබිම ඔන්න ඔකයි කියන එක. අපට ලංකාව වෙන තලයකට ගෙන යාම පමණයි අවශ්‍ය වෙන්නේ.

අපටත් මෙවැනි ප්‍රතිවිරෝධී, ඉතාම තියුණු ලෙස බෙදුණු සමාජයකින් තොරව, ගෞරවනීය විධියට මන්ත්‍රීවරුන් එක්ක කථා බහ කරමින් - විපක්ෂය සහ ආණ්ඩු පක්ෂය - ගමනක් යන රටක් තව අවුරුද්දකින්, දෙකකින්වත් හදා ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ අරමුණ ඒකයි. අපට වෙන කිසිම පළිගැනීමේ අරමුණක් නැහැ. මම ඒකයි අභියෝග කළේ, පුළුවන් නම් ඒ ගැන කියන්න කියලා. මේ එකක්වත් අපි පටන් ගත්ත ඒවා නොවෙයි. මේ විමර්ශන සාර්ථක වෙන්නේ, අල්ලසට විරුද්ධව කරන කටයුතු සාර්ථක වෙන්නේ, භය නැතිව, කොන්ද කෙළින් තියාගෙන තමන්ගේ ජාතික වගකීම, තමන්ගේ මනුෂ්‍යත්වයේ වගකීම ඉටු කරන ඉහළ, මැද සහ පහළම ඉන්න රාජ්‍ය නිලධාරීන්ගෙන්. ඒගොල්ලන්ගේ සේවය ඉතාම ඉහළින් අගය කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Mujibur Rahuman. You have 11 minutes.

[අ.භා. 1.16]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. අපේ සභානායකතුමාගේ කථාවෙන් පස්සේ කථා කිරීමට අවස්ථාව ලැබීම ගැනත් මම සතුටු වෙනවා. එතුමා කථාවක් කළා. මම එතුමාට මතක් කිරීමක් කරන්න ඕනෑ. ඔය කියපු නඩු රාශියක්ම 2015 යහ පාලන ආණ්ඩුව යටතේ දමපු නඩු කියලා එතුමාම කිව්වා. ඒ දමපු නඩු තමයි දැන් මේ ඉස්සරහට ඇවිල්ලා තිබෙන්නේ. එතකොට, සමගි ජන බලවේගය හැටියට අපි කිසි විටෙකත් දූෂිතයන් ආරක්ෂා කරන්නවත්, දූෂිතයන්ට උදවු කරන්නවත් පෙනී ඉඳලාත් නැහැ, පෙනී හිටින්නෙත් නැහැ. මොකද, අපේ කාලයේ දාපු සමහර නඩුවලට තමයි දැන් තීන්දු දෙන්න පටන් අරගෙන තිබෙන්නේ. බිමල් රත්නායක මැතිතුමාම ඒක පිළිගත්තා. අපේ ආණ්ඩු කාලයේ නඩු දාලා තිබෙනවා කියලා එතුමා පිළිගත්ත එක හොඳයි. ඒකෙන්ම පෙන්වනවා, මේ රටේ වංචා, දූෂණ අවම කර ගන්න අපට වුවමනාවක් තිබුණු බව. 2015-2019 කාලයේ පැවති ආණ්ඩුව ඒ සම්බන්ධව යම් උනන්දුවකින් වැඩ කරලා තිබෙනවා. ඒක එතුමා පිළිගත්තා, ඒක හොඳ දෙයක්. ඒ පිළිගැනීම හොඳයි. ඒ වාගේම එතුමාට අමතක වෙච්ච දේකුත් තිබෙනවා.

අද එතුමන්ලා චෝදනා කරන, චෝදනාවලට ලක් වෙලා ඉන්න උදවිය මේ රටට ඒ තරම් විනාශයක් කළේත් එතුමන්ලාම ඒ අයව බලයට ගෙනා නිසයි. සමගි ජන බලවේගයවත් අපේ කවුරුවත් ඒකට උදවු කළේ නැහැ. එතුමන්ලා දූෂිතයි කියන ඒ කණ්ඩායම 2005දී බලයට ගෙනාවේ එතුමන්ලාම තමයි, අපි ගෙනාවේ නැහැ, අපි ඡන්දයවත් දීලා නැහැ. අපි වේදිකාවලට නැඟලා ඒගොල්ලන්ට ඡන්දය දෙන්න කියලා, ඒගොල්ලන් ගැන recommendation එකක් දුන්නේත් නැහැ, ඔබතුමන්ලා තමයි ඒ recommendation එක දුන්නේ. ඔබතුමන්ලා එදා ගත් වැරදි දේශපාලන තීන්දුවේ වන්දිය තමයි තවම රටක් හැටියට අපි ගෙවන්නේ. ඒක පිළිගන්න. නමුත් ඒක පිළිගන්නේ නැතිව තමුන්නාන්සේලාම බලයට ගෙනා ඒ කණ්ඩායමට දැන් බණිනවා. අපි නම් ඒ අය බලයට ගෙනාවේ නැහැ. ඒකයි මට මතක් කරන්න ඕනෑ වෙලා තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් දූෂණ විරෝධී පනතට සංශෝධන ගෙනැල්ලා තිබෙනවා. මේ අලුත් සංශෝධනත් එක්ක ගැටලුත් මතු වෙලා තිබෙනවා. ප්‍රසිද්ධ කරන වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශ මහජනතාවට භාවිත කළ හැකි ආකාරය සීමා කිරීම, එම ප්‍රකාශනවලින් අනාවරණය කෙරෙන තොරතුරු ඉවත් කිරීම පිළිබඳ පැහැදිලි නිර්වචනයක් ලබා නොදීම, ජාතික ඔලිම්පික් කමිටුව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ක්‍රමයෙන් බැහැර කිරීම, එකම නිවසේ සහවාසයේ ජීවත් වන පුද්ගලයින්ගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ගොනු කිරීමේ අවශ්‍යතාව ඉවත් කිරීම කියන ගැටලු මේ අලුත් සංශෝධන මත පැන නඟිනවා. අපි දූෂණ විරෝධී පනතට සහයෝගය දීපු පක්ෂයක්. 2023දී මේ පනත ගේනකොට සමගි ජන බලවේගය විධියට අපි ඡන්දය දුන්නා, ඒක සම්මත කරන්න. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. මොකද, ඒ පනත හරහා තමයි තමුන්නාන්සේලා ඉස්සරහට වැඩ කරගෙන යන්නේ.

නමුත් දැන් ප්‍රශ්නයක් තිබෙනවා. දැන් තමුන්නාන්සේලා ඒ පනතටත් සංශෝධන ගේනවා. ඇයි, මේ සංශෝධන ගේන්නේ? මේ සංශෝධනයේ මූලිකම අරමුණ විධියට තමුන්නාන්සේලා

යෝජනා කළා, මැති ඇමතිවරුන් සහ රාජ්‍ය සේවකයින් ආවරණය කර ගන්න, ඔවුන්ගේ වත්කම් සහ බැරකම් හෙළි නොකර සිටීමට. ඒ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ගැන විවාද නොකර සිටීම ගැන පසුගිය කාලය පුරාම තමුන්නාන්සේලා සාකාච්ඡාවට ගත්තා. ඇයි, එහෙම එය සාකච්ඡාවට ගත්තේ? එහෙම සාකච්ඡාවට ගැනීම තුළම අද මේ පනත් කෙටුම්පත ගැන යම් ගැටලුවක් මතු වෙලා තිබෙනවා. මේ, තමුන්නාන්සේලාට ලැබුණු ජන වරමට පිටුපාලා ගේන සංශෝධන වගයක්. ජන වරමේ විනිවිදභාවය, වගකීම තමුන්නාන්සේලා අමතක කරලා තිබෙනවා. ඒ හින්දා තමයි තමුන්නාන්සේලාගේ මැති ඇමතිවරුන්ගේ වත්කම් සහ බැරකම් ගැන පසුගිය කාලයේ සාකච්ඡාවට ලක් වුණේ, තමුන්නාන්සේලාගේ මැති ඇමතිවරුන්ට චෝදනා ආවා, කොහොමද මේ තරම් මුදලක් හෙව්වේ කියලා. ඒ චෝදනාව හින්දාම තමුන්නාන්සේලාට යම් වුවමනාවක් තිබුණා, මැති ඇමතිවරුන් ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳව එළිපිට කථා නොකරන ආවරණයක් ලබා ගන්න. නමුත් අවසානයේදී සමාජ විරෝධය, නොයෙකුත් සංවිධානවලින් ආ විරෝධය තුළ තමුන්නාන්සේලාට සිද්ධ වුණා, මැති ඇමතිවරුන් ඒකෙන් අයින් කරලා රාජ්‍ය නිලධාරීන්ට විතරක් ඒ ආවරණය ලබා දෙන්න. නමුත් තමුන්නාන්සේලා සාකච්ඡාව පටන් ගත්තේ මැති ඇමතිවරුන්ගේ වත්කම් සහ බැරකම් සාකච්ඡාවට ලක් නොකර සිටීමටයි. තමුන්නාන්සේලා සංශෝධනය ගෙනාවෙත් ඒකටයි. නමුත් අන්තිමට ශ්‍රේෂ්ඨාධිකරණයේදී තමුන්නාන්සේලාට එකඟ වෙන්න සිද්ධ වුණා, මැති ඇමතිවරුන්ගේ වත්කම් සහ බැරකම් ගැන සාකච්ඡාවට ලක් කරන්න පුළුවන්, ඒවා ගැන කථා කරන්න පුළුවන් කියන එකට. ඒ අනුව ඒ සංශෝධනය අයින් කරගෙන රාජ්‍ය නිලධාරීන්ගේ වත්කම් සහ බැරකම් සාකච්ඡා නොකර පැමිණිලි විතරක් කරන මට්ටමට ගෙනියන්න එකඟ වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රශ්නයකුත් තිබෙනවා. රාජ්‍ය නිලධාරීන්ගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක සංස්කරණය කළ පිටපතක් ලබා ගන්න පුළුවන්. ඒක ගැන ගැටලුවක් නැහැ. මේ අලුත් සංශෝධනය අනුව, ඒ කියන්නේ මේ සංශෝධන පනත් කෙටුම්පතේ 11(2) වගන්තිය අනුව එම පිටපත ගත හැක්කේ පැමිණිලි කිරීමට පමණයි. ඒකයි මෙහි තිබෙන සංශෝධනය. ඒ කියන්නේ, පිටපත් ගන්න පුළුවන් වන්නේ පැමිණිලි කරන්න විතරයි. වෙන දේකට පිටපත් ගන්න බැහැ. ඒ ගැන ගවේෂණය කරන්න, ඒ ගැන පරීක්ෂණ කරන්න පිටපත් ගන්න බැහැ. එහෙම කළොත්, ඒ පිටපත අවභාවිත කළා කියලා රුපියල් ලක්ෂයක දඩ මුදලක් ගහන එක විතරක් නොවෙයි, අවුරුද්දක් හිරේ දාන්න පුළුවන් දඬුවමක් දෙන්නත් ඒ වැරැද්ද හේතු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුරුන් හෝ පුද්ගලයෙක් රාජ්‍ය නිලධාරීන්ගේ හෝ කාගේ හෝ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක පිටපතක් අරගෙන අවභාවිත කළොත් දැනටත් නීති තිබෙනවා, නඩු දාන්න. දැනුත් නීති තිබෙනවා, අලුත් නීති ඕනෑ නැහැ. දැනුත් පුළුවන්, defamation නඩු දාලා වන්දි අය කර ගන්න. එවැනි නීති තිබියදී අලුත් නීති ගෙනෙන්නේ මොකටද? දැන් මේ ගෙනෙන අලුත් නීතියේ ගැටලුවක් තිබෙනවා. ජාත්‍යන්තර මිනුම් දඬුවලට අනුව මේ සංශෝධනය ගැළපෙන්නේ නැහැ. අද වනකොට IMF එක පවා කනස්සල්ල මතු කරලා තිබෙනවා, මේ සංශෝධනය තුළින් විනිවිදභාවය හා වගවීම් පිළිබඳ ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා කියන එක ගැන. ඒ අනුව ඔවුන්ගේ විරෝධයත් මේ සඳහා පළ කරලා තිබෙනවා.

මෙම දඬුවමට ලක් වන නිසාම දැන් කවුරුවත් මේවා ගැන හොයන්න එන්නේ නැහැ. මොකද, මේකට භය වෙනවා. මොකද, යම් රාජ්‍ය නිලධාරියෙකුගේ වත්කම් හා බැරකම් අනුව ඔහු අයුතු ලෙස යමක් උපයා ගෙන තිබෙනවා කියලා කවුරුන් හෝ හොයන්න ගියොත් ඔහුට දැන් රුපියල් ලක්ෂයක දඩ මුදලක් ගෙවන්නත්, හිරේ යන්නත් සිද්ධ වනවා කියන ඒ සංශෝධනයත් එක්ක හැම කෙනාම දැන් අධෛර්යවත් වනවා, මේ දේවල් ගැන හොයන්න. ඒ වාගේම මේක දූෂණයටත් රුකුලක් වනවා. මේ සංශෝධනය දූෂණයට රුකුල් දීමක් හැටියට අපට හඳුන්වන්න පුළුවන්. ඒ නිසා ජාත්‍යන්තර මිනුම් දඬුවලට ගැළපෙන්නේ නැති වගන්තියක් හැටියට අද මේ වගන්තිය හඳුනා ගෙන තිබෙනවා. ඇයි මේක reverse කරන්නේ? ඒකයි තිබෙන ගැටලුව.

එදා අපි ආංශික අධීක්ෂණ කාරක සභාවට ගියා. එදා කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇවිල්ලා හිටියා, ඒ ආංශික අධීක්ෂණ කාරක සභාවට. එතුමා කිව්වා, මේ පනත ලෝකයේ තිබෙන ඉහළම පනත්වලින් එකක් කියලා. එදා එතුමා එහෙම කියනකොට මම කිව්වා, මේ පනතට ඡන්දය දීපු කෙනෙක් නිසා ඒ ගැන මට හරි ආඩම්බරයි, ඒ ගැන මම සන්තෝෂ වනවා කියලා. 2015 සිට 2023 දක්වා ඉදිරියට ආපු පනතක් අද තමුන්නාන්සේලා reverse කරන්නේ ඇයි? ඒකයි තිබෙන ප්‍රශ්නය. මේක reverse කිරීම තුළ තමුන්නාන්සේලා රාජ්‍ය නිලධාරීන්ට දූෂණයට ලක් වෙන්න පුළුවන් ආවරණයක් අනියම් ආකාරයෙන් ලබා දෙනවා. මේ තුළ ඊළඟට එන ප්‍රශ්නය මොකක්ද? රාජ්‍ය නිලධාරීන්ට ලබා දෙන වරප්‍රසාද හා වරදාන තුළ ඒවා හොයා ගන්න බැරි වෙනවා. ඒ වාගේම ඒවා හොයන එකත් නවතිනවා. එතකොට රාජ්‍ය නිලධාරීන්ට තමුන්නාන්සේලා ලබා දෙන ඒ වරදාන හා වරප්‍රසාද නිසා ඔවුන් හරහා මේ රටේ ඉන්න විරුද්ධ දේශපාලන පක්ෂ නායකයින්ව දඩයම් කිරීමේ සැලැස්මක් මේක යට තිබෙනවාද කියලා අපට ප්‍රශ්නයක් මතු වනවා. ඔවුන්ව මේ සඳහා පාවිච්චි කරන්න පුළුවන්. මොකද, ඔවුන් ගැන හොයන්න බැහැ. ඔවුන්ට ලැබෙන දේවල් හංගලා තිබෙන්නේ. ඔවුන්ට ලැබෙන දේවල් ගැන කාටවත් ගවේෂණය කරන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපි මේ ගැනත් කරුණු මතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් වැදගත් දෙයක් තිබෙනවා. මෙහි ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තියේ (ඉ) ඡේදය අනුව, රජයේ නිලධාරියෙක් තමාගේ වත්කම් සහ බැරකම් පමණක් නොව, තමා සමඟ එකට නිවසේ ජීවත් වන අන්‍යෝන්‍ය අයිතිවාසිකම් සහ බැඳීම් ඇති අයගේ සියලු වත්කම් සහ බැරකම් ද ප්‍රකාශ කළ යුතුව තිබුණා. නමුත්, මේ සංශෝධන පනත් කෙටුම්පතේ 7(3) වගන්තිය අනුව ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කර තිබෙනවා.

අපි දන්නවා, හොරකම් කරන අය සාමාන්‍යයෙන් ළඟම ඉන්න අයගේ නමට තමයි ඒ තුළින් උපයා ගත් නොයෙක් දේපළ ආදිය ලියන්නේ කියලා. ඒක දූෂණයේ උපක්‍රමයක්. ළඟ ඉන්න යහළු මිත්‍රාදීන්ගේ නම්වලට තමයි ඒවා ලියන්නේ. දැනුත් ලියලා තිබෙනවා. තමුන්නාන්සේලාත් ඒ ගැන දන්නවා. දැනුත් සමහර අයගේ වත්කම් හොයාගෙන යනකොට ඒ අයගේ නම්වලට නැහැ, වෙනත් අයගේ නම්වලට ඒවා තිබෙනවා. නමුත්, තමුන්නාන්සේලා ඒ වගන්තිය අයින් කරනවා. ඒ වත්කම් හා බැරකම්වල ලියවිලි ඔහුත් එක්ක ඉන්න පුද්ගලයන්ගෙන් - ඔහු ආශ්‍රය කරන පුද්ගලයන්ගෙන් - ඉල්ලා තිබෙන වගන්තිය තමුන්නාන්සේලා අයින් කර ගන්නවා. ඒ අයින් කර ගැනීම තුළ ඒ නිලධාරීන්ට පුළුවන්කම ලැබෙනවා, තමන්ගේ යහළු මිත්‍රාදීන්ට තමන් අයුතු ලෙස උපයා ගන්න ඒවා පවරන්න, ඔවුන්ගේ නමට ලියන්න. හැබැයි, වර්තමානයේ බලපැවැත්වූ නීතියේ ඒක අහුරා තිබුණා. ඒ අහුරපු නීතිය තමුන්නාන්සේලා දැන් අයින් කරලා තිබෙනවා. ඒකයි මම කිව්වේ තමුන්නාන්සේලා ගෙනෙන සමහර සංශෝධන දූෂණයට අත වනන සංශෝධන, දූෂණයට රුකුලක් දෙන සංශෝධන කියලා. තමුන්නාන්සේලාට ඡන්දය දීපු ජනතාව බලාපොරොත්තු වුණේ මේවා නොවෙයි. විනිවිදභාවය, වගවීම හා දූෂණය අවම කර ගැනීම වෙනුවෙන් තමයි ඒ ජනතාව

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

තමුන්නාන්සේලාට mandate එක ලබා දුන්නේ. නමුත්, තමුන්නාන්සේලා ඒ mandate එක අරගෙන ජනතා බලාපොරොත්තු නැති කරන විධියේ යම් යම් සංශෝධන දැන් මේ පනතට ගෙන ඒම ගැන අපි කනගාටු වනවා. පනත ශක්තිමත් කිරීම වෙනුවට නීති ලිහිල් කර දූෂිතයන්ට ආවරණ ලබා දීම ගැන අපි කනගාටු වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Mujibur Rahuman, you have exhausted your time.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මට මේ කාරණයත් කියන්න අවස්ථාව ලබා දෙන්න.

දූෂණ විරෝධී පනතේ තිබෙනවා, රාජ්‍ය ආයතනවල සියයට 25ක කොටස් හිමිකම තිබෙන සමාගම්වල නිලධාරින් ඔවුන්ගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන්න ඕනෑ කියලා. තමුන්නාන්සේලා දැන් ඒකට සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා, සියයට 25, සියයට 50 කරලා. ඒ කියන්නේ, සියයට 50ට වැඩි කොටස් හිමිකම තිබෙන සමාගම්වල නිලධාරින් තමයි වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන්න ඕනෑ. එතකොට. සියයට 40ක් කොටස් හිමිකම තිබෙන අය අයින් වනවා. ඇයි, ඒ සියයට 25 සීමාව සියයට 50 දක්වා ඉහළට ගෙන ගියේ? එහෙම ඒ සීමාව ඉහළට ගෙන යන්නේ ඇයි? මොකක්ද තිබෙන ප්‍රශ්නය? එයට ඉදිරිපත් කරන තර්කය මොකක්ද? සියයට 50ට අඩු කොටස් හිමි සමාගම්වල නිලධාරින්ට වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන්න අවශ්‍ය නැත්තේ ඇයි? ඒ පත් වන නිලධාරින්ගෙන් දූෂණයක් වෙන්නේ නැහැ කියලා කියන්නේ කොහොමද? මෙන්න මේ වාගේ සැක සංකා රාශියක් තමුන්නාන්සේලාගේ මේ ක්‍රියාමාර්ගය තුළ ඇති කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දූෂණ විරෝධී පනතට ගෙනා සංශෝධන ගැන අපට ගැටලු රාශියක් තිබෙනවා. මට වෙන් වූ වෙලාව තුළ ඒ ගැටලු කිහිපයක් ගැන මම තමුන්නාන්සේලාට අවධාරණය කළා. ඒ එක්කම මම කියන්න ඕනෑ, වර්තමාන ආණ්ඩුව යටතේ වුණු දූෂණ ගනුදෙනු රාශියක් ගැනත් මේ වනකොට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් වෙලා තිබෙන බව. ඒ තමයි, කන්ටේනර් 323 බැහැර කිරීම, ගල් අඟුරු වංචාව, මහා භාණ්ඩාගාරයෙන් ඩොලර් මිලියන 2.5ක් සයිබර් හැකර්වරු වංචා කිරීම - ඩොලර් මිලියන 2.5 අවතැන් වීම - හා මධ්‍යම අධිවේගී මාර්ගයේ ටෙන්ඩර් වංචාව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you need to wind up now.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්.

ඊළඟට, ගරු කථානායකතුමාට එරෙහි දූෂණ චෝදනා ගැන, තත්ත්වයෙන් බාල බෙහෙත් ආනයනය කිරීම, තැපැල් දෙපාර්තමේන්තුවෙන් ඩොලර් 625,000ක් අතුරුදහන් වීම, ඉන්ධන බැරලයකට ඩොලර් 286ක් ගෙවීම, නොරොච්චෝලේ බලාගාරයට ගෙනා රුපියල් මිලියන 16ක ඩීසල් බවුසර් 3ක් අතුරුදහන් වීම සහ අයථා වත්කම් ඉපැයීම සම්බන්ධව මාලිමාවේ ඇමතිවරුන්ට හා මන්ත්‍රීවරුන්ට චෝදනා තිබෙනවා. එම චෝදනා සියල්ල ගැන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කර තිබෙනවා. එහි වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් අපි ඉල්ලා සිටිනවා, මේවා යට ගහන්නේ නැතුව මේ පැමිණිලිත් විභාග කරන්න කියලා. ජනාධිපතිතුමාගේ වචනවලින් කියනවා නම්, කාලයේ වැලිතලාවට යට වෙන්න දෙන්නේ නැතුව මේ පරීක්ෂණත් ඉක්මනින් පටන් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Prime Minister. The Floor is yours.

[අ.භා. 1.30]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොරු කියන එකෙත් සීමාවක් තිබෙන්න ඕනෑ. මේක මහා විකාරයක් වෙලා තිබෙන්නේ. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු බොරු කියන විධිය සහ සත්‍ය විකෘති කරන විධිය ගැන ඇත්තටම අප කනගාටු වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථාව පටන් ගන්නේ අපි දූෂණයට විරුද්ධයි, අපේ යහ පාලන ආණ්ඩුවෙන් තමයි මේ සියල්ලම පටන් ගත්තේ කියමින්. දූෂණයට විරුද්ධ වීමේ චරිත සහතිකය දීලා, ඊළඟ වාක්‍යයේ ඉඳන්ම කරන්නේ දූෂණයට එරෙහිව සටන් කරන අයට විරුද්ධව මතයක් ගොඩනඟන්න බොරු කියන එක. දූෂණයට විරුද්ධව සටන් කරන එකට විරුද්ධ වෙන්න පුළුවන්, ඒකට එරෙහිව වැඩ කරන්න පුළුවන්. ඒ කියන්නේ, දූෂණය ආරක්ෂා කිරීම වෙනුවෙන් වැඩ කරන්න පුළුවන් ක්‍රම ගණනාවක් තිබෙනවා. විවෘතවම කියන්න, දූෂණය ප්‍රශ්නයක් නැහැ, අපි ඒකට පක්ෂපාතියි, අපි ඒකට විරුද්ධ වෙන්නේ නැහැ කියලා. ඒ කියන්නේ, අමුම ගොන් විධියට දූෂණය ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී ඉන්නත් පුළුවන්. ඊට වඩා ටිකක් මහත්මා ගතියෙන් දූෂණ විරෝධයට එරෙහිව මතයක් ගොඩනඟනවා, ඒක හොඳයි, අපිත් දූෂණයට විරුද්ධයි කියලා. ඊට පස්සේ ඇත්තටම දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වන නිලධාරින්, වෙන ආණ්ඩුවලට එරෙහිව බොරු මත construct කරගෙන ඒ narrative එක එළියට දමන එක තමයි තවත් ක්‍රමයක්. ඒ ක්‍රමය තමයි විපක්ෂය දැන් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් කියනවා, දූෂණයට අහු වුණු ඒ සියලුදෙනාම බලයට ගෙනෙන්න එදා ජනතා විමුක්ති පෙරමුණ ඩීල් ගැහුවා, 2005දී ඔවුන් වෙනුවෙන් වේදිකාවල කථා කළාය කියලා. හොඳයි, අපි ඒක පිළිගනිමුකෝ.

නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අඩුම තරමින් අපි - ජනතා විමුක්ති පෙරමුණ - 2005දී ඒ election campaign එක කළේ විවෘතව. මෙතුමන්ලා ඩීල් ගහන්නේ හොරෙන්.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
රට රට.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
රට රට. *[බාධා කිරීමක්]* Election campaign එකේ එක කථාවක් කිව්වාට, ඔවුන් රට රට ගහන ඩීල්වල තමයි ඇත්ත දේශපාලනය සිද්ධ වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක ඔවුන්ගේ රාජ්‍යකරණයේ governance model එකේ එක principle එකක්. පාර්ලිමේන්තුවට ඇවිල්ලා අය වැය ගැන එකක් කියනවා. හැබැයි, පසුගිය අවුරුදු දෙක වෙනකල් අය වැය අනුව නොවෙයි රට පාලනය වුණේ කියන එක මේ රටේ සියලු දෙනාම දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දූෂණයට විරුද්ධයි, මෙන්න අපි නඩු ගෙනාවා කියලා ඒ ඔක්කෝම කියනවා. හැබැයි, ඩීල් යන්නේ වෙන කාමරයක, වෙන තැනක, වෙන ගෙවල්වල.

2015 අවුරුද්දේ සිට 2019 අවුරුද්ද දක්වා කාලය තුළ දූෂණ විරෝධී ක්‍රියාවලිය ආරම්භ වුණාට කවුරුවත් ඒක seriously ගත්තේ නැත්තේ ඇයි? මොකද, ඒවා ඩීල් එක්ක වෙච්ච දේවල් නිසා. එක පැත්තකින් කියනවා, යහ පාලන ආණ්ඩුවෙන් තමයි මේවා සියල්ලම කළේ කියලා. නමුත් අනෙක් අතට ඊට පස්සේ තව පාර්ශ්වයක් කියනවා, මේක අනුර කුමාරගෙයි, ආනන්ද විජේපාලගෙයි ඩීල් එකක් කියලා. ඉතින්, දෙකෙන් එකක් වෙන්න ඕනෑ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම කියන්නේ මේ විධියට බොරු කියලා තවදුරටත් මේ රටේ ජනතාව නොමඟ යවන යුගය දැන්වත් අවසන් කරන්න කියලායි. මේ දේශපාලන සංස්කෘතිය හරහා තමයි ඔබතුමන්ලා පරාජයට පත් වුණේ. නැවත නැවතත් පරාජයට පත් වෙන්න ඕනෑ නම් ඔහොම ඉන්න. හැබැයි, රට වෙනස් වෙලා තිබෙනවා කියන එකත්, පුරවැසියා වෙනස් වෙලා තිබෙනවා කියන එකත් පොඩ්ඩක් හරි තේරුම් ගන්න උත්සාහ කරන්න කියලා අපි යෝජනා කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම වරද්දලා මේ කාරණය තේරුම් ගත්තාද කියලා හිතලා අපේ වටගල නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් නැවත ඒ ගැන ඇහුවා. අපි කොතැනකවත් - ඒ කියන්නේ යෝජනාවලිය ඉදිරිපත් කරනකොටවත් - යෝජනා කරලා තිබුණේ නැහැ, මැති ඇමතිවරුන්ගේ assets declare කරන්න ඕනෑ නැහැ කියලා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
Supreme Court එක එහෙම දෙයක් කිව්වෙත් නැහැ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Supreme Court එකත් එක්ක සාකච්ඡා කරලාලු, ඒක වෙනස් කළේ. අපට කිසිසේත්ම එහෙම අරමුණක් තිබුණේ නැහැ. මොන බොරුවක්ද, ඒක. *[බාධා කිරීමක්]* අපි ඒක යෝජනා කරනකොටම කියලා තිබුණේ ජනතා වරමින් පත් වෙච්ච, ඒ කියන්නේ public Representativesලා ඒකෙන් ඉවත් කළ යුතුයි කියායි. ඒ කියන්නේ, පනතේ තිබෙන විධියටම ඒගොල්ලන්ගේ assets declare කරන්න ඕනෑ කියන එකයි. මේ කථා පට්ටපල් බොරු නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා නොදැනුවත්කමට නොවෙයි නේ මේවා කියන්නේ. දැන-දැන නේ මේ බොරු කියන්නේ. එලෙස දැන-දැන කියන බොරු අතිශයින්ම භයානක වෙන්නේ එතැනදී ඔවුන්ගේ ඇත්ත එළියට පනින නිසායි. ඔවුන්ගෙන් එළියට පනින ඇත්ත තමයි, මේ දූෂණ විරෝධී ක්‍රියාවලිය සාර්ථකව කරගෙන යන එකට ඔවුන් ඇත්තටම විරුද්ධයි කියන එක. මේ ආණ්ඩුවත් ඒ වාගේ, මේ ආණ්ඩුවත් හදන්නේ තමන්ගේ අය ආරක්ෂා කරන්න, මේ ආණ්ඩුවත් හදන්නේ ඩීල් ගහලා මේක මොකක් හරි විධියකට දියාරු කරන්න කියන මතවාදය ඔවුන් එළියට දමන්න මෙච්චර උත්සාහ කරන්නේ ඒ නිසායි. මොකද, ඔවුන් ආසා, ඔවුන් කැමැති, ඔවුන්ට පුරුදු ඒ ඩීල් ගහන දූෂිත දේශපාලන සංස්කෘතියයි. ඒක රැක ගන්න තමයි මේ සියල්ලම කරන්නේ කියන එක ඉතාම පැහැදිලියි. මේක බොහොම අවාසනාවන්ත තත්ත්වයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, ඇත්තවශයෙන්ම දූෂණ විරෝධී පනත් ගෙන ඒම සම්බන්ධයෙන් සහ ආයතන පිළිබඳව සාකච්ඡාවක් ඇති වුණාට, 1994දී තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පත් වෙන්නේ. 2023දී තමයි මේ දූෂණ විරෝධී පනත ගෙනෙන්නේ. නමුත්, මෙහෙම Commission එකක් තිබෙනවා, මේකෙන් එලක් තිබෙනවා, මේකෙන් වැඩක් වෙනවා කියලා මේ රටේ ජනතාවට දැනෙන්න පටන් ගත්තේ කවදාද? ඒ, 2025 අවුරුද්දෙන් පසුව. මෙච්චර කල් මොනවාද සිද්ධ වුණේ? පනතක් විතරක් ගෙනැල්ලා රටේ දේශපාලන සංස්කෘතිය හෝ දූෂණ විරෝධී ක්‍රියාවලිය ශක්තිමත් කරන්න බැරි බව අපි හැමෝම දන්නවා. මේවා නමට විතරයි තිබුණේ. ඒවා සඳහා ආයතන පිහිටුවා තිබුණත්, එම ආයතනවල වැඩ කරන්න අවශ්‍ය මිනිස්සු සිටියේ නැහැ; මානව සම්පත දුන්නේ නැහැ. සල්ලි දුන්නේ නැහැ, සම්පත් දුන්නේ නැහැ, යටිතල පහසුකම් දුන්නේ නැහැ. අපි රජය භාර ගන්නකොට පොලිස් නිලධාරින් 16දෙනෙකු පමණයි එහි සිටියේ. කිසිම guideline එකක් තිබුණේ නැහැ, කිසිම Regulation එකක් තිබුණේ නැහැ. මෙම පනත පණ ගැන්වීම සඳහා කිසිම දෙයක් කර තිබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මේ සංශෝධන ගෙන එන්නේ ඇයි? ඇත්ත වශයෙන්ම අපි මේ පනත ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. CIABOC එක වැඩ කරන්න පටන් ගත්තා. එහිදී මෙම පනතේ තිබෙන අඩුපාඩු, සීමාවන් සහ මානව සම්පත් සම්බන්ධ ප්‍රශ්න අපි තේරුම් ගත් නිසා ඒවා නිවැරදි කිරීම සඳහා තමයි අපි මේ සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද කාරක සභා අවස්ථාවේ අපි සංශෝධන ඉදිරිපත් කරනකොට බලන්න පුළුවන් මේ සියලු සංශෝධන ගෙන එන්නේ කුමක් සඳහාද කියලා. CIABOC එකේ මානව සම්පත ශක්තිමත් කිරීම සඳහා, බඳවා ගැනීමේ ක්‍රියාවලිය නිසි පරිදි සහ අවශ්‍ය පරිදි සිදු කර ගැනීම සඳහා, permanent staff එක නිසි පරිදි බඳවා ගැනීම සඳහා, මේ පනතේ භාෂාවේ තිබෙන inconsistencies නිවැරදි කිරීම සඳහා, පනතේ සිංහල සහ ඉංග්‍රීසි භාෂා දෙකේ පවතින වෙනස්කම් නිවැරදි කිරීම සඳහා, එහි ඇති inconsistencies නිවැරදි කිරීම සඳහා, පනත ක්‍රියාත්මක කිරීමේදී මතුවන ප්‍රායෝගික ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම සඳහා තමයි අපි මේ සංශෝධන ගෙන එන්නේ. ඔව්, අපි ඒ පිළිබඳව කල්පනා කළා, අපි සාකච්ඡා කළා. මොකද, මේ disclosures කරනකොට ජනතා නියෝජිතයන්ට පමණක් නොව රාජ්‍ය නිලධාරින්ටත්, රජය සමඟ සම්බන්ධ වන සියලු දෙනාටත් මෙම පනත අදාළ වෙනවා. ගරු

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

නියෝජ්‍ය කථානායකතුමනි, ජනතා නියෝජිතයන් ඒකෙන් අයින් කරලා බැලුවත්, ඒ අනෙක් අයගේ පෞද්ගලිකත්වයට හානියක් සිදු වෙනවාද කියන එකත් අපි මෙහිදී බලලා ඒක balance කරන්න ඕනෑ. ඒ නිසා අපි ඒ පිළිබඳව සාකච්ඡා කළා. මම නැවත වතාවක් කියන්නේ, මහජන නියෝජිතයන්ට අදාළ වන විධියට නොව, රජයේ අනෙකුත් නිලධාරින්ගේ පෞද්ගලිකත්වයත් රැක ගන්න යම් සංශෝධන ගේන්න පුළුවන්ද කියන එකත් අපි සාකච්ඡා කළා කියන එකයි. නමුත්, අපි අද ඉදිරිපත් කරන මෙම සංශෝධනවල අර කියන විධියෙ සංශෝධනයක් නැහැ. එහෙම නම්, මොනවාද මේ කියන බොරු? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ පනතේ objective එක දියාරු කරනවා කියලා කියනවා. පාර්ලිමේන්තුවේ ඉඳගෙන මෙහෙම බොරු කියන්නේ කොහොමද කියන එක මට නම් තේරෙන්නේ නැහැ. ඒකෙන් පෙන්නුම් කරන්නේ, දූෂණ විරෝධී සංස්කෘතියක් මේ රට තුළ ඇති වීම සහ එය effectively මේ විධියට ක්‍රියාත්මක වීම පිළිබඳව මේ විපක්ෂය මොන තරම් කලබලයකින් සහ මොන තරම් අසහනයකින් සිටිනවාද යන්නයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ බව තමයි මේ බොරුවලින් ඔප්පු වෙමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාටත් මතක ඇති, අරගළයේ තිබුණු ප්‍රධාන සටන් පාඨයක් තමයි, ජනතා මුදල් හොරකම් කළ අය අත්අඩංගුවට ගෙන ඔවුන්ට දඬුවම් ලබා දීමත්, සොරකම් කළ මුදල් නැවත අයකර ගැනීමත් කරන්න ඕනෑය කියන එක. එහෙම Section එකක් මෙම පනතේ තිබුණේ නැහැ. ඒක නිවැරදි කරන්නත් අපි උත්සාහයක් අරගෙන තිබෙනවා. Punishment කරන එක පමණක් නොව, සිදු වූ loss එක නැවත recover කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳවත් මෙම සංශෝධනවල තිබෙනවා.

මේ සංශෝධන ගෙන ඒම තුළ තිබෙන්නේ මෙම පනතේ අරමුණ දියාරු කිරීමේ උත්සාහයක් නොවෙයි. එම චෝදනාව අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා. ඇත්ත වශයෙන්ම, මෙය ශ්‍රී ලංකා ඉතිහාසයේ පළමු වතාවට දූෂණයට එරෙහි ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දෙන ප්‍රායෝගික ගැටලු, ආයතනික ගැටලු සහ මානව සම්පත් පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම සඳහා ගන්නා උත්සාහයක් මිස, මෙම පනතේ අරමුණ දියාරු කිරීමේ උත්සාහයක් නොවෙයි. මොකටද අපි මෙය දියාරු කරන්නේ? මේක අපේ mandate එකේ ප්‍රධාන සටන් පාඨයක්. මේක දියාරු කරලා අපට තිබෙන පැවැත්ම මොකක්ද? අපට දිනාගත හැකි දෙය මොකක්ද? මෙය දියාරු කිරීමෙන් හෝ දූෂණයට එරෙහි අපගේ සටන අතහැරීමෙන් අපට දිනාගන්න දෙයක් නැහැ. ඒක අපට පරාජයක්. අපි මොකටද එහෙම දෙයක් කරන්නේ? ඇත්ත වශයෙන්ම, මෙම පනත ක්‍රියාත්මක කිරීමේදී පැන නඟින ප්‍රායෝගික ගැටලු සහ පනතේ පවතින inconsistencies නිවැරදි කිරීමට ගන්නා උත්සාහයක් හැර වෙන කිසිම දෙයක් මේ තුළ නැහැ. මම ඇත්තටම කනගාටු වෙනවා, විපක්ෂය මේ විධියට බොරු තර්ක හදමින් දූෂණයට එරෙහිව විශාල ජන මතයක් ඇති කළ, විශාල අරගළයක් කරපු මේ රටේ ජනතාව මේ විධියට නොමඟ යවන්න ගන්නා උත්සාහය ගැන. එය ඉතාම කැතයි, ඉතාම වැරදියි. ඒක තුළිනුත් නැවත කරන්න හදන්නේ දූෂිත දේශපාලන සංස්කෘතියක් ආරක්ෂා කරන එකයි කියන එක සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

මට කාලය ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Ajith P. Perera. You have seven minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 1.43]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු අගමැතිතුමියට මම මතක් කරන්න ඕනෑ, මේ රටේ තොරතුරු දැන ගැනීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් කළේ අපියි කියන එක. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14වන ව්‍යවස්ථාව සංශෝධනය කරලා මේ රටේ දූෂණය අවහිර කරන්න බිම් මට්ටමේ ඉඳලා ඉහළටම පුරවැසියාට තිබෙන වැදගත්ම අයිතිය තහවුරු කළේ අපි. *[බාධා කිරීමක්]* අසම්පූර්ණයි? අමතක කරන්න එපා, මැරිලා ඉපදුණේ නැහැ, මේ රටේ මිනිස්සු.

ඊළඟට, මේ රටේ සාමාන්‍ය මිනිහාට, මේ රටේ මාධ්‍යවේදියාට මේ රටේ දූෂණය හා සම්බන්ධ මොනවා හරි දෙයක්, පහළ මට්ටමේ ඉඳලා ඉහළටම මොනවා හරි දෙයක් දැන ගන්න තිබෙනවා නම්, ඒක ප්‍රායෝගිකව තහවුරු කරන්න 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත - ඒක මේ රටේ විතරක් නොවෙයි, ලෝකයේම තියෙන විශිෂ්ටතම පනතක් විධියට සම්මානයට පත් වෙච්ච පනතක් - අරගෙන ඇවිල්ලා, ඒ තත්ත්වය ස්ථාවර කළේ යහ පාලනය. කරු ජයසූරිය මැතිතුමා මුල් අවස්ථාවේ, 2015ට කලින් ඒ පනත් කෙටුම්පත අරගෙන ආවාම මේ පාර්ලිමේන්තුව තුළ ඒක පළමුවර කියවීමේදී පරාජයට පත් කළා. ඔව්, අපි පිළිගන්නවා කලින් පැවති රජයන් තොරතුරු දැන ගැනීමට එරෙහිවයි හිටියේ කියලා; දූෂණයට සෘජුව සහ වක්‍රව පක්ෂවයි හිටියේ කියලා. හැබැයි, යහ පාලන රජය තුළ අපි ඒ ක්‍රියාදාමය සම්පූර්ණයෙන් වෙනස් කළා. ඒ වාගේම කලින් රජය තුළ හිටපු ඉහළම ඇමතිවරු, ඉහළම ලේකම්වරු ඇතුළු ඒ සියලු දෙනාම මේ රටේ නීතියේ විධානයට යටත් කළා. ඒ ක්‍රියාදාමය තුළ 2015දී ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත්, එතුමාගේ ලේකම් වශයෙන් කටයුතු කරපු අද පොලීසිය භාර ඇමතිතුමා වන ආනන්ද විජේපාල මැතිතුමාත් ඒ දූෂණ විරෝධී කමිටුවේ වගකීම් භාර අරගෙන අරලියගහ මන්දිරය ඇතුළේ අපිත් එක්ක වැඩ කළා. ටික දවසක් යනකොට ඒ ෆයිල් ටික පිටපත් කරගෙන පිටත් වෙලා ගිහිල්ලා, ඔවුන් ඒ ක්‍රියාවලියට විරුද්ධව කථා කරන්න පටන් ගත්තා. හැබැයි, අදටත් මේ රටේ දූෂණය හා සම්බන්ධව ප්‍රබල පුද්ගලයෙක් මේ රටේ අධිකරණයකින් වරදකරු කරලා තිබෙනවා නම්, ඒ හැම නඩුවකම පරීක්ෂණ ආරම්භ කළේ යහ පාලනය; ඒ අයට විරුද්ධව නඩු පැවරුවේ යහ පාලනය; ඒ

අයට විරුද්ධව සාක්ෂි ගොනු කළේ යහ පාලනය. එහෙම කරන්න පුළුවන්; කරන්න ඕනෑ. රජයේ, දේශපාලනයට සම්බන්ධ පුද්ගලයන් කරන ඒ දූෂණය මැඩලීමට අවශ්‍ය ඒ කටයුතු කළේ යහ පාලනයයි කියන කාරණය අපි සතුටින් කියනවා. ඒක ආඩම්බරයෙන් කියනවා. ඒක ලජ්ජා වෙන්න කාරණයක් නොවෙයි.

මොන දේකටද අපි දූෂණයට වක්‍රව පක්ෂ වෙන්නේ? මේ රටේ අල්ලස හා දූෂණය මැඩලීම සඳහා අද සංශෝධනය කරන මේ පනත එවකට තිබුණු දූෂණ විරෝධී සියලු නීති ඒකාබද්ධ කරලා තනි නීතියක් වශයෙන් අරගෙන ආවේ, මේ පාර්ලිමේන්තුවේ යහ පාලනය යටතේ නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ යෝජනාවක් පරිදියි. මේ කෙටුම්පතේ වැඩකටයුතු සියයට 90කට වැඩිය අවසන් කරන්න යහ පාලන රජයට පුළුවන්කම ලැබුණා. ඊළඟ රජය ඒ නීතිය සම්මත කළා. අඩුපාඩු හදන එක ගැන සන්තෝෂයි. අඩුපාඩු හදන්න ඕනෑ. හැබැයි, ඒ අඩුපාඩු හදන ගමන් යහ පාලනය මොනවාද කළේ කියලා බලන්න. මේ වෙනස සඳහා පදනම සකස් කළේ, කෙටුම්පත් සකස් කළේ, මහන්සි වුණේ, ඒ පිළිබඳව කැප වුණේ අපි. එහෙම කියන්න මටත්, මගේ පක්ෂයටත් අයිතියක් තියෙනවා. එදා දූෂණයට එරෙහිව අපි හිටපු දේශපාලන පක්ෂයෙන් ඉවත් වෙලා, දූෂණය හා සම්බන්ධ පුද්ගලයන් යම් පැත්තකින් පිටු දැකලා ඒ හා සම්බන්ධව වෙනම දේශපාලන ව්‍යාපාරයක් අරගෙන සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වයෙන් අපි එළියට ආවේ, දූෂණයට විරුද්ධව අවංක කැපවීමක් තිබෙන කණ්ඩායම අපි නිසායි. අපි ඒක ආඩම්බරයෙන් කියනවා. ගරු අගමැතිතුමියනි, අමතක කරන්න එපා, එදා ඔයගොල්ලෝ 2015දී අපිත් එක්ක හිටිය බව; එදා අපිත් එක්ක වැඩ කළ බව. හැබැයි, ඒ වාගේම අද ඉතිහාසය අමතක කරලා මැරිලා ඉපදිලා වාගේ, " ඔයගොල්ලන් වක්‍ර ලෙස මේ දූෂණයට පක්ෂයි" කියන එක නම් බොහොම අකෘතඥයි. 'අකෘතඥයි' කියලායි ඒකට කියන්නේ.

මීට මාසයකට කලින් බිමල් රත්නායක ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වේ මොකක්ද? අපි බොරු කියනවා කියලා කිව්වා නේ. අගමැතිතුමිය කිව්වා, අපි කියන්නේ බොරුලු. මොකක්ද බොරුව? මොකකටද උත්සාහ කළේ? අපි දන්නවා, සියලුම රාජ්‍ය සේවකයන්ට වාගේම දේශපාලනඥයන්ටත් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දීමේ ක්‍රමවේදයක් තිබෙනවා කියලා. ඒ ක්‍රමය ඉදිරියටත් කරගෙන යන්න ඕනෑ. හැබැයි, ප්‍රශ්නයක් මතු වුණා ලාල් කාන්ත ඇමතිතුමා, හඳුන්නෙත්ති ඇමතිතුමා, වසන්ත සමරසිංහ ඇමතිතුමා ඇතුළු ඇමතිවරු රාශියකට. දුප්පතුන් ලෙස පෙනී හිටපු ඔබතුමන්ලා රුපියල්වලින්, ඩොලර්වලින්, cryptocurrencyවලින් පොහොසත් වෙච්ච පුද්ගලයන් බව මේ රටේ මිනිස්සු දැනගත්තා. එහෙම දැනගත්තාට පස්සේ සාකච්ඡාවක් ආවා, මේ තොරතුරු දුන්නාට කමක් නැහැ, හැබැයි එළියේ සාකච්ඡා කරන්න දෙන්න එපා කියලා. ඒ නිසා මහජන නියෝජිතයන්ගේ සහ දේශපාලනයට සම්බන්ධ පුද්ගලයන්ගේ තොරතුරු සමාජය තුළ සාකච්ඡා කිරීම වළක්වන්න, මාධ්‍යවල සාකච්ඡා කිරීම වළක්වන්න, රූපවාහිනියේ සාකච්ඡා කිරීම වළක්වන්න, සමාජ මාධ්‍ය තුළ සාකච්ඡා කිරීම වළක්වන්න කෙටුම්පතක් සකස් කළා. ඒ පිළිබඳව සමාජ විරෝධය එනකොට බිමල් රත්නායක ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේ මේ ඉස්සරහ පුටුවේ වාඩි වෙලා කිව්වා, "හරි හරි. අපි ඕක අයින් කර ගන්නම්" කියලා. කවුද උත්සාහ කළේ, ඒ පුරවැසි අයිතිය යටපත් කරන්න? මේ රටේ දේශපාලනය කරන නොකරන මිනිස්සුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ පිළිබඳව සොයා බැලීමට තිබෙන අයිතිය යටපත් කරන්න උත්සාහ කළේ කවුද? උත්සාහ කළේ, අනුර කුමාර දිසානායකගේ මේ ආණ්ඩුව. අපි නොවෙයි. ඒකට විරුද්ධ වුණේ කවුද? ඒක ආවාම හරවා ගත්තේ කවුද? අනුර කුමාරගේ ආණ්ඩුව. එතකොට වක්‍ර ලෙස දූෂණයට පක්ෂ වෙන්නේ කවුද? අද ආණ්ඩු බලය එනකොට, ධන බලය එනකොට, ගල් අඟුරුවලින් ගාණ ලැබෙනකොට මොකක්ද මේ වෙන්නේ? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හිටපු කැබිනට් ඇමතිවරයෙක් කැබිනට් ඇමතිකමේ ඉන්න ගමන් පරණ දූෂණ වරදකට අධිචෝදනා ලබා තිබෙනවා. අයින් කළාද ඇමතිකමෙන්? නැහැ. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අනුර කුමාර දිසානායක මැතිතුමා බොහොම වගකීමෙන් කිව්වා, ඒක පරණ වරදක්, ඇමතිකමේදී වැරැදි නැහැ කියලා. ඊට පස්සේ අපි ඒ ඇමතිවරයාට විරුද්ධව මේ පාර්ලිමේන්තුවේ විශ්වාසභංග යෝජනාවක් ගෙනැල්ලා කරුණු පෙන්වා දෙනකොට ලජ්ජාවට පත් වෙලා ඉවසාගන්නම බැරිව අන්තිමට ඉල්ලා අස්වෙන්න කියන්න සිද්ධ වුණා ඇමතිටයි, ලේකම්ටයි සියලුදෙනාටම. කොමිෂන් පත් කරන්නත් සිද්ධ වුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි 5ක කාලයක් ලැබී තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මට ලැබෙනවා, තවත් විනාඩි 5ක්.

***ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මතක තියාගන්න, ඉතිහාසයේ කවදාවත් නොවුණු දෙයක් මේ පාර්ලිමේන්තුවේ සිද්ධ වුණ බව. ඒ තමයි වත්මන් කථානායකතුමා,- කථානායකකම කියන්නේ, මොන පක්ෂය නියෝජනය කරලා පාර්ලිමේන්තුවට ආවත් එම තනතුරට පත් වුණාට පසුව පක්ෂ, පාට භේදයක් නැතිව, පක්ෂ තනතුරුවලිනුත් අයින් වෙලා ස්වාධීනව කටයුතු කරපු ඉතිහාසයක් තිබෙන ධුරයක්. හැබැයි, අද ඉන්න කථානායකතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පරීක්ෂණ ආරම්භ කරලා තිබෙනවා. ලජ්ජා නැද්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? ලජ්ජා හිතෙන්නේ නැද්ද, පාර්ලිමේන්තුවක් වශයෙන් අපි හැමෝටම? ඒක නිසා තමයි අද,- [බාධා කිරීමක්] ඒ මොනවාද තිබෙන්නේ?***

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පාර්ලිමේන්තුවේදී සාක්ෂි ඉදිරිපත් වුණා නේ, ප්‍රශ්නවලට උත්තර වශයෙන්. ඉතින්, අපට, මේ පාර්ලිමේන්තුවට ලජ්ජා නැද්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දූෂණ විරෝධී ආණ්ඩුවක තුනෙන් දෙකක බලයෙන් පත් වෙච්ච කථානායකවරයා මේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ විධිමත් චෝදනාවකට ලක් වෙලා තිබෙන කොට? මේ පාර්ලිමේන්තුව තුළ අහපු ප්‍රශ්නවලට දීපු උත්තරවලින්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බැලූ බැල්මට පෙනෙන කොට, ඒක ඉවසාගෙන ඉන්න බැරි නිසා තමයි අපි විශ්වාස භංග යෝජනාවක් අරගෙන ඇවිල්ලා තිබෙන්නේ.

ගල් අඟුරු පිළිබඳ චෝදනාව කරනකොට මොකක්ද කළේ? පාඩුව බිලියන කොච්චරද? බිලියන 20කට වැඩියි. බිලියන 20කට වැඩි පාඩුවක් මේ දූෂණයෙන් සිද්ධ වෙලා තිබෙනවා. මේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

දූෂණයෙන් රටේ ජාතික ආරක්ෂාව, රටේ බලශක්ති ආරක්ෂාව සම්බන්ධයෙන් ගැඹුරු ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා කියලා අපි කල් තියා කිව්වා. ඇහුවේ නැහැ. දූෂණය සිද්ධ වෙන්න ඉඩ හැරියා; දිගින් දිගටම ඉඩ හැරියා. නතර කළේ නැහැ. අවසානයේදී වෙච්ච පාඩු විමර්ශනය කිරීම සඳහා ජනාධිපති කොමිසමක් පත් කළා. දූෂණයට විරුද්ධ නම් මේ ක්‍රියාදාමය ජනාධිපතිවරයා කලින්ම හොයලා බලලා, ඉන්න ඇමතිවරයා වෙනස් කරලා, අලුත් ඇමතිවරයෙක් පත් කරලා දූෂණය අවම කර ගන්න තිබුණා; වෙච්ච වරද නිවැරදි කර ගන්න තිබුණා. හැබැයි, වැඩේ ඉවර වෙනකල්ම ගියා; රෙදි ගැලවෙනකල්ම ගියා. ජනාධිපතිතුමාව, ධම්මික මහත්තයාව, අර මහත්තයාව, මේ මහත්තයාව ආරක්ෂා කරන ගල් අඟුරු සමාගමේ සභාපති මෝඩයෙක් වගේ දූරකථන සංවාදයකට ඇවිල්ලා හඬපටය එළියට එනකල්ම හිටියා. ඒ මහත්තුරු ආරක්ෂා කර ගන්න අවසානයේදී ඇමතිට ඉල්ලා අස් වෙන්න සිද්ධ වුණා. ඊට පස්සේ දැම්මා කොමිසමක්. ඒ කොමිසම දමන කොට කිව්වා, "හරි, හරි. ගල් අඟුරු මිල දී ගැනීම සම්බන්ධව මෙතැනදී විතරක් නොවෙයි, ඉස්සරත් වැරදි වුණා. අපි ඒ ඔක්කොම හොයනවා" කියලා. එම කොමිෂන් සභාව වගඋත්තරකරුවන් 18දෙනෙකු නම් කරලා තිබෙනවා. ඒ 18දෙනා අතර හිටපු ඇමතිවරු නැහැ. ඉන්නේ එකම කෙනායි. ඒ, මේ ආණ්ඩුව පත් කරපු කුමාර ජයකොඩි මහත්මයා විතරයි. ඒ වගඋත්තරකරුවන් 18දෙනා අතර ඉන්නේ මේ ආණ්ඩුවේ - තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ - හිටපු ඇමතිවරයෙක් විතරයි. JVP එකේ අනුර කුමාර දිසානායක කෘෂිකර්ම ඇමති කාලයේ තමන්ගේ ගජ මිත්‍රයා පොහොර සංස්ථාවේ මිල දී ගැනීමේ කළමනාකරු - Purchasing Manager - ලෙස පත් කළා. එහෙම කරපු කුමාර ජයකොඩි හිටපු ඇමතිතුමා තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දේශපාලනයේ ඉන්න එකම වගඋත්තරකාරයා. නමුත් ඔබතුමන්ලා අපට කියන්නේ මොකක්ද? අපි බොරු කියනවාලු; වක්‍ර ලෙස සහයෝගය දෙනවාලු. දූෂණයට විරුද්ධව කැපවීමෙන් කටයුතු කරපු, මේ ප්‍රධාන පනත හදන්න - කෙටුම්පත් කරන්න - දායක වෙච්ච අපි, යහ පාලනයේ අපි, අද සමගි ජන බලවේගයේ ඉන්න අපි මොන දෙයකටද වැරැදිකරුවන්ට දඬුවම් දෙනවාට විරුද්ධ වෙන්නේ? අපි සහයෝගය දක්වනවා, නිවැරැදි හැම දෙයටම. අපි විරුද්ධ වෙනවා, වැරැදි හැම දෙයටම. ඒ වාගේම නිවැරැදිකරු ලෙස පෙනී ඉන්න, දූෂණ විරෝධී ලෙස පෙනී ඉන්න, හොර තක්කඩිකම් කරන කිසියම් කෙනෙක් ඉන්නවා නම් මේ පාර්ලිමේන්තුවේ ඔය 159දෙනා අතර, ඒ හැමෝටම විරුද්ධව ඍජුව පෙනී ඉන්න තරම් ආත්ම ශක්තියක් මගේ නායකයා වන සජිත් ප්‍රේමදාසටත්, මුජිබුර්ටත්, අප හැමෝටමත් තිබෙනවා. මොකද, අපි ඒ දූෂණයට ඍජුවවත්, වක්‍රවවත් සම්බන්ධ නැති හින්දා.

මේ රජය යටතේ වගකිව යුතු දූෂණවලට, අපරාධවලට සම්බන්ධ වෙලා ඉන්න පුද්ගලයන්ට ආත්ම ගරුත්වයක් ඇතිව උත්තර දෙන්න පුළුවන්ද? ඔබතුමන්ලා මොනවාද කිව්වේ? වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, "කෙසෙල් කැන අරගෙන ගිහින් ජීවත් වුණේ. පාක්ෂිකයාගෙන් ජීවත් වුණේ. අමාරුවෙන් කෝච්චියේ ගියේ. හරිම දුප්පත්" කියලා. ඊට පසුව අපි හදපු පනත අනුව වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන්න වුණා. ඔය පනත ඔබතුමන්ලා නොවෙයි හැදුවේ, අපි. අපි හදපු පනතෙන් වත්කම් බැරකම් ප්‍රකාශ දමලා අමාරුවේ වැටුණාම කියනවා, "අපි ඉතින් පාරම්පරිකව හරිම පොහොසත් මිනිස්සු. අපට ධනයක් තිබෙනවා. අපි බිස්නස් කළා. අපි ක්‍රිප්ටෝ කළා. අපි ගාව ඩොලර් තිබෙනවා. අපට පාරම්පරික ධනය තිබෙනවා" කියලා. ලාල් කාන්ත ඇමතිතුමා තට්ටු තුනේ හතරේ ගෙවල් හදනකොට මොනවාද කියන්නේ? "කන්න, අඳින්න නැහැ. ළමයාට කන්න දෙන්න දෙයක් නැහැ. භාර්යාවට ජීවත් වෙන්න විධියක් නැහැ" කියලා මිනිස්සු ඉස්සරහා අඬලා වැලපිලා ඡන්දය ඉල්ලපු මිනිස්සු තට්ටු තුනේ නවීන මාලිගා හදන කොට කියනවා, "ඇයි මොකද? මගේ අක්කර 20 වික්කා. අනුරාධපුරේ එක වික්කා. නුවර එක වික්කා. මේවා අපේ පරම්පරාවේ තිබෙන ඒවා" කියලා. දෙවියනේ! මොනවාද එදා කිව්වේ? එදා එකක් කියලා අද එකක් කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දූෂණයට පක්ෂ කවුද, අවංකව දූෂණයට විරුද්ධ කවුද, දූෂණ විරෝධය වෙනුවෙන් අවංකව පෙනී සිටින්නේ කවුද, බොරු දූෂණ විරෝධීන් කවුද කියලා අද පෙනෙනවා.

මේ පනතේ තිබෙන යහපත් දේට අපි කැමැතියි. මේ පනතෙන් අරගෙන එන්න උත්සාහ කරපු ඒ තක්කඩි ක්‍රියාදාමය වළක්වා ගන්න සහාය දුන්නු සමාජ මාධ්‍යයට සහ මේ රටේ නීතිඥ ප්‍රජාවට, ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයට මගේ ස්තුතිය ප්‍රකාශ කරමින්, මම නතර වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්ථාවර නියෝග 86, "විවාද රීති" යටතේ මම කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මගේ කථාව කරගෙන යනකොට අගමැතිතුමිය ඒක වැරැදි ලෙස තේරුම් අරගෙන මම බොරු කියනවාය කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කිසිම බොරුවක් කිව්වේ නැහැ. ආණ්ඩුව විසින් ගැසට් කරපු දෙයක්- *[බාධා කිරීමක්]* සභානායකතුමා පැහැදිලිවම මෙතැනදී පිළිගත්තා- *[බාධා කිරීමක්]* සභානායකතුමා පිළිගත්තා, ඒක අයින් කරනවා කියලා. ඒ හින්දා මම බොරු කිව්වේ නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මම බොරු කිව්වේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 1.56]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වංචාවක, දූෂණයක යෙදීමට පෙළඹීම ඇති වෙන්නේ දේශපාලන බලයත් එක්ක. මේ පාර්ලිමේන්තුවේ පසුගිය ඉතිහාසය තුළම ඒක ඔප්පු කරලා තිබෙනවා. ඉතිහාසයේ ඉඳන්ම දේශපාලන බලය තිබුණු බොහෝ අය එක්කෝ සෘජුවම ඒ බලය පාවිච්චි කළා වංචාවේ, දූෂණයේ යෙදීමට. එහෙම නැත්නම් ඒ අය දේශපාලන බලය වක්‍රව හෝ පාවිච්චි කළා වංචාවේ, දූෂණයේ යෙදීමට. ඒකට උදාහරණ ඕනෑ තරම් තිබෙනවා.

අපටත් පුළුවන්, මහා හයියෙන් කෑගහලා කියවන්න. උදාහරණයක් ගත්තොත්, ලංකාවේ දිස්ත්‍රික්ක 25ක් තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයෙන් මම උදාහරණයක් ගන්නම්. හරක් කටාලාත් එක්ක ඩීල් දාලා තිබෙන්නේ කවුද? මේ ළඟ උදාහරණ කියන්නේ, මේ අය කෑගහන නිසා. හරක් කටාලා එක්ක ඒ ඩීල් දාලා හෙන වීරයෝ වාගේ ඉඳලා අන්තිමේදී අද දේශපාලනය දාලා යන්න වෙලා තිබෙන අබේසිංහලා ජීවත් වෙන්නේ කොහේද? ඒ වරින් අබේසිංහලාට දේශපාලන රැකවරණය දුන්නේ මොන වාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ද? තමන්ගේ ආසනවලින් ඒ හයිය කොයි විධියට උන්දැලාට දීලා තිබුණාද? ඒකට පාවිච්චි කළේ මම මේ කියන දේශපාලන හයිය නොවෙයිද, බලයේ හයිය නොවෙයිද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒවා තමයි පාවිච්චි කරලා තිබුණේ. කෑගහන්න පුළුවන්.

සිද්ධ වෙච්ච ලොකුම වංචාව, මහ බැංකු මංකොල්ලය සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේ COPE එකේ සාකච්ඡා කරලා ඒ වාර්තාව එළියට දමන කොට ඒකට footnotes දැම්මේ කවුද? ඒක වෙන කොහෙන් හරිද කළේ? ඒවායේ කවුද හිටියේ? *[බාධා කිරීමක්]* ඒ විධියට තමයි මේ රටේ ඉතිහාසයේ කටයුතු වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ ඉතිහාසයට නැවතීමේ ලකුණ තියලා ඉවරයි. වංචාව වෙනුවෙන්, දූෂණය වෙනුවෙන් දැන් සෘජුව හෝ වක්‍රව දේශපාලන බලය, ආණ්ඩු බලය පාවිච්චි වෙන්නේ නැහැ. ඇත්තටම කියනවා නම්, මේ අණපනත් අපිට අදාළ වන්නේම නැහැ. ආණ්ඩුවක ආරක්ෂාව වෙනුවෙන් මේ අණපනත් අදාළ වන්නේම නැහැ. හැබැයි, අපි ඒ අණපනත් මේ පාර්ලිමේන්තුවේ සම්මත කරලා තියන්න ඕනෑ. අපිට විශ්වාසයක් තිබෙනවා, මේ බලය ආපහු වෙනස් වෙන්නේ නැහැ කියලා. අර අපේ සභානායකතුමා කිව්වා වාගේ එහෙම නම් අපිට වඩා හොඳ කට්ටියක් නම් කවදාවත් මේ රටේ ආපහු බලය කියන එක පාවිච්චි කරන්නේ නැහැ වංචාව හා දූෂණය වෙනුවෙන්. ඒ වාගේම තමයි, පාලකයින්ට බලය හදා ගන්න පිටට පෙනෙන්න හරි ප්‍රගතිශීලී අණපනත් සම්මත කර ගන්න පුළුවන්. හැබැයි, පාලකයා කරන්නේ මේ රටේ මහජනතාවට, අහිංසක මිනිස්සුන්ට කොළය වහලා, ඒ තමන් හදා ගන්නා වූ අණපනත් ඇතුළේ කවුළු හදා ගන්නා එකයි. ඒ විධියට තමයි මේ ක්‍රමය ඇතුළේ ක්‍රියාත්මක වෙන්නේ. ඒ කවුළුවෙන් තමයි, ආණ්ඩු බලයේ යෙදෙන්නන්, පාලකයා විසින් රිංගන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම නීතිඥයෙක් නොවන නිසා මම ඇත්තටම හොයලා බැලුවා මේ "අපේක්ෂිත ඇප" කියන එක කොහෙන්ද ආවේ කියලා. ඔබතුමියට අත්දැකීමක් තිබෙනවාද, කවදාකවත් අපේ ගමක සාමාන්‍ය මිනිහෙක් අපේක්ෂිත ඇප ඉල්ලා තිබෙනවා කියලා? මා දන්නා තරමට මා ජීවත් වන සාමාන්‍ය සමාජයේ නම් අපේක්ෂිත ඇප ඉල්ලපු කිසිවෙක් නැහැ. කවුද අපේක්ෂිත ඇප ඉල්ලන්නේ? අපේක්ෂිත ඇප ඉල්ලන්නේ දේශපාලකයන්. බලය තිබුණු කෙනා, එහෙම නැත්නම් බලය තිබෙන කෙනා තමයි අපේක්ෂිත ඇප ඉල්ලන්නේ. ඒ අපේක්ෂිත ඇප ඉල්ලන එකේ තේරුම මොකක්ද? "මාව අත්අඩංගුවට ගන්න එපා, මම ඇවිල්ලා උසාවියට ඉදිරිපත් වෙනවා" කියන එක. මම දන්නේ නැහැ, කොයි විධියටද ගරු විනිශ්චයකාරතුමන්ලා ඒ අපේක්ෂිත ඇප තීරණය කරන්නේ කියලා. හැබැයි, මම මේ රටේ සාමාන්‍ය පුරවැසියෙක් විධියට කථා කරන්නේ. එහෙම හිතලා කථා කරන්නේ. මම විශ්වාස කරනවා, අපේක්ෂිත ඇප කියලා කියන්නේ, බලය තිබෙන කෙනා තමන් විසින් හදා ගත්ත නීතියෙන් රිංගා යෑමට ඇති කවුළුවක් කියලා. රිංගා යෑමට ඇති කවුළුවක් තමයි අපේක්ෂිත ඇප කියලා කියන්නේ. මම එහෙම විශ්වාස කරනවා. මේ රටේ සාමාන්‍ය මිනිස්සු නියෝජනය කරමින් ඒ මිනිස්සු හිතන විධියට හිතලා මම කියනවා, ඒ "අපේක්ෂිත ඇප" කියලා කියන්නේ එහෙම හදා ගත්ත කවුළුවක් කියලා.

වංචාවට, දූෂණයට වැට බඳිනවා කියන එක හැම දාම මේ රටේ තිබුණු සටන් පාඨයක්. වංචාවට, දූෂණයට වැට බඳිනවා කියන සටන් පාඨය කවදත් තිබුණා. හැබැයි, කවුරු බලයට පත් වුණත් කවදාවත් වංචාවට, දූෂණයට වැට බැඳිලා නැහැ. වංචාවට, දූෂණයට වැට බඳිනවාය කියපු කට්ටිය කළේ වංචාවේ යෙදුණු, දූෂණයේ යෙදුණු කලින් හිටපු පාලකයන් ආරක්ෂා කරන එකයි. ඒක තමයි අපේ රටේ සිද්ධ වුණේ. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අලුත් තත්ත්වය, මේ අලුත් පරිවර්තනය සිදු වුණේ. මෙතෙක් මේ රට පාලනය කළ සහ ඒ පාලනයන්ට උඩගෙඩි දීපු, ඒ හරහා වංචාවට, දූෂණයට support එක දුන්, guard එක දුන් කවුරුවත් හිතුවේ නැහැ, පැවති ඒ තත්ත්වය වෙනස් වන අලුත් පාලනයක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හැදෙයි කියලා. ඒක තමයි මේ හැදිලා තිබෙන පාලනය. ඒක තමයි දැන් සමහර අයට තිබෙන අවුල. මින් ඉදිරියට ජනතාවට පිටුපාලා, එහෙම නැත්නම් තමන්ගේ බලය ශක්තිමත් කර ගැනීමේ පැත්තෙන් හිතලා මේ පාර්ලිමේන්තුවේ කිසිම අණ පනතක්, රෙගුලාසියක් සම්මත වෙන්නේ නැහැ. වංචාවට, දූෂණයට අවශ්‍ය ඉඩකඩ සැපයෙන කවුළුවක් හදාගන්නා වූ කිසිම නීතියක්, රෙගුලාසියක් මේ පාර්ලිමේන්තුවේ ආපසු කවදාවත් සම්මත වෙන්නේ නැහැ. ඒක බොහොම විශ්වාසයෙන් යුතුව මේ රටේ මිනිස්සුන්ට අපි කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපිට තව කාර්යභාරයක් තිබෙනවා. නැවතත් මේ රටේ පාලනයක් ඇතුළේ එවැනි දුර්දාන්ත තත්ත්වයක්, එවැනි අමිහිරි තත්ත්වයක් ඇති නොවන්න කටයුතු කරනවා වාගේම අපිට වගකීමක් තිබෙනවා, ඉතිහාසයට සාධාරණත්වය ඉෂ්ට කරන්නත්. අපි ඒ සාධාරණත්වය ඉෂ්ට කරන්න ඕනෑ. අපි ඒ සාධාරණත්වය ඉෂ්ට කරන්නේ නැත්නම් කවුද ඒ සාධාරණත්වය ඉෂ්ට කරන්නේ? ඇත්ත, මේ රටේ මේ පාර්ලිමේන්තුවේ ඕනෑ තරම් අණ පනත් සම්මත වෙලා තිබෙනවා. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මේ පාර්ලිමේන්තුවේ සම්මත වුණා. හැබැයි, ඔය කෑ ගහන විධියට නොවෙයි, සම්මත වුණේ. සමහර ඒවා සම්මත කර ගත්තේ බල්ලෝ නාවන්න ගෙනියනවා වාගේයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මේ පාර්ලිමේන්තුවේ ප්‍රගතිශීලී විධියට සම්මත වුණේ නැහැ. එය සම්මත කරන්න අපි අනෙක් පැත්තේ ඉඳිමින් ලොකු කාර්යභාරයක් කළා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් කොමිෂන් සභා පිහිටුවන්න බලය ලැබුණා. ඒවා මේ පාර්ලිමේන්තුවේ නිකම් සම්මත වුණේ නැහැ. අපි ඒ

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

වෙනුවෙන් ලොකු කාර්යභාරයක් පාර්ලිමේන්තුවේ හිටියා නම් පාර්ලිමේන්තුව ඇතුළේදීත්, පාර්ලිමේන්තුවෙන් පිටතදීත් සිද්ධ කළා. ඇත්ත, අපි මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ගත් දවසේ ඉඳලා විපක්ෂයේ ඇත්ත කාර්යභාරය කළේ අපියි. ඒකට, දෙදෙනාද, තුන්දෙනාද, හයදෙනාද ඉන්නේ කියන එක අදාළ වුණේ නැහැ. අද මේ විපක්ෂයට ඔය ඉරණම අත්වෙලා තිබෙන්නේ ඇයි? ඇත්ත කාර්යභාරය කරන්න මේ විපක්ෂයේ කවුරුවත් නැහැ. ඒකයි මේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය. අපි විපක්ෂයේ සිටියදී කවදත් ඒ කාර්යභාරය හරියට සිද්ධ කළා. ඒ නිසා රටට ඕනෑ කරන, වැදගත් කිසි පනත් කෙටුම්පතක් අපි නැතුව මේ පාර්ලිමේන්තුවේ සම්මත වෙලා නැහැ. හොඳ පනත් කෙටුම්පතක් සම්මත වෙලා තිබෙනවා නම්, අපි ඒ සඳහා support එක දුන්නා. Support එක දුන්නා විතරක් නොවෙයි, ඒක ප්‍රගතිශීලී පනතක් විධියට සම්මතවීම සඳහා කරන්න ඕනෑ කාර්යභාරය; විපක්ෂය කළ යුතු කාර්යභාරය අපි සිද්ධ කළා. හැබැයි, කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, අද මේ විපක්ෂයේ අයට අඩුම ගණනේ එහෙම හිතන්නවත් වෙලාවක් නැහැ කියන එක. මොකද, බලය අහිමි වීම කියන වේදනාව ඒ තරමට ඒගොල්ලන්ට දරුණුයි. ඇඟට දැඩි විධියට දැනෙන වේදනාවක් බවට එය පත් වෙලා තිබෙනවා. ඔවුන්ට ඇත්තටම විපක්ෂයේ කාර්යභාරය අමතක වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු අගමැතිතුමියත් කිව්වා වාගේ, අත්‍යවශ්‍ය සංශෝධන කිහිපයක් විතරයි මේ පනතට මේ ගෙනෙන්නේ. කොහොමත් මේ සම්බන්ධව අලුතින් පනතක් මේ පාර්ලිමේන්තුවේ සම්මත විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.07]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்தில் எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

ஊழல் என்பது வடக்குடனோ அல்லது தெற்குடனோ அல்லது ஓர் இனத்துடனோ அல்லது ஒரு சமூகத்துடனோ மட்டும் சம்பந்தப்பட்ட விஷயம் அல்ல. அது மக்களின் பணத்தையும், அவர்களின் வாய்ப்புகளையும், எதிர்காலத் தையும் பாதிக்கின்ற ஒரு தேசியப் பிரச்சினை ஆகும். இந்தச் சபையில் எனக்கு முன்னர் பேசியவர்கள் குறிப்பிட்ட சில விடயங்களை மீண்டும் சொல்லலாமென நினைக்கின்றேன். ஊழலுடன் சம்பந்தப்பட்டவர்கள் தொடர்பாக இங்கு நீண்ட பட்டியலொன்று வாசிக்கப்பட்டது. இந்தப் பட்டியலில் இருப்பவர்கள் யார்? இந்த நாட்டை ஆண்டவர்கள்தான் பெரும்பாலும் இருக்கின்றார்கள். ஒருசில அரச அதிகாரிகளின் பெயர்கள் இங்கு குறிப்பிடப்பட்டாலும், இந்த நாடு சுதந்திர மடைந்த பிற்பாடு, நாட்டை மாறி மாறி ஆட்சி செய்த ஆட்சியாளர்கள் ஊழல் சம்பந்தமான விசாரணைகளில் ஈடுபடுத்தப்பட்டு இருக்கின்றார்கள் என்று சொல்லும்போது, பொதுமக்களின் பணம் ஆட்சியாளர்களால் எவ்வளவு மோசமாகத் துஷ்பிரயோகம் செய்யப்பட்டுள்ளது என்பதை இந்த உலகம் அறியக்கூடியதாக இருக்கிறது.

ஒரு காலத்தில் எங்களுடைய இலங்கை நாட்டைப் பார்த்து, இப்போது எல்லா வசதிகளோடும் இருக்கின்ற சிங்கப்பூரானது, இலங்கையைப்போல் வர வேண்டுமென அந்த நாட்டின் தந்தையான லீ குவான் யூ கனவு கண்டதாக - சொன்னதாக - நாங்கள் அறிகின்றோம். சகல வளங்களையும் கொண்ட ஒரு நாடாக இருந்த எமது நாடு, முக்கியமாக இரண்டு காரணங் களால் மிகவும் மோசமான பொருளாதார நெருக்கடியை எதிர்கொள்கின்ற ஒரு நாடாக மாறியது. அந்த இரண்டு முக்கியமான காரணங்களில் முதலாவது, இந்த நாட்டை ஆட்சி செய்தவர்களும், அவர்களுக்கு உறுதுணையாக இருந்த மோசமான நடத்தையைக் கொண்ட நிருவாகிகளும், அரச உத்தியோகத்தர்களும் இந்த நாட்டின் வளங்களைச் சூறையாடி, இந்த நாட்டை ஓர் ஏழை நாடாக மாற்றியமை. இரண்டாவது காரணம், இந்த நாட்டில் வாழுகின்ற எண்ணிக்கையில் சிறுபான்மையாக உள்ள மக்களை, இந்த நாட்டில் எண்ணிக்கையில் பெரும்பான்மையாக உள்ள மக்களைப்போல நடத்தாமல், அவர்களை அடக்கி ஒடுக்கியதும், அதனால் ஏற்பட்ட யுத்தமும் ஆகும்.

இந்த நாடு வளர்ச்சியடைந்த ஒரு நாடாக, இந்த நாட்டில் வாழுகின்ற மக்கள் சுதந்திரத்தை அனுபவிக்கக்கூடிய ஒரு நாடாக வர வேண்டுமாக இருந்தால், இந்த இரண்டு விடயங்களும் இல்லாதொழிக்கப்பட வேண்டும். அதாவது, ஊழல் முழுமையாகத் துடைத்தெறியப்பட வேண்டும். அதேபோல, இந்த நாட்டில் எண்ணிக்கையில் சிறுபான்மை யாக வாழ்கின்ற மக்கள், ஏனையவர்கள் அனுபவிக்கின்ற சகல உரிமைகளையும் சுதந்திரத்தையும் அனுபவித்து வாழ்வதற்கு வழி ஏற்படுத்தப்பட வேண்டும். அவ்வாறு செய்யாவிட்டால், நிச்சயமாக இந்த நாடு முன்னேற்றமடையாது என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

2023ஆம் ஆண்டு ஊழல் எதிர்ப்புச் சட்டம் கொண்டு வரப்பட்டபொழுது, புதிய சுயாதீன ஊழல் விசாரணை அமைப்புக்கு அதிகாரங்கள் வழங்கப்பட்டன. அதுமாத்திர மல்ல, சொத்து மற்றும் பொறுப்பு அறிவிப்புகள், ஊழல் விசாரணை, வழக்குத் தொடர்தல் மற்றும் ஊழலிலிருந்து பெறப்பட்ட சொத்துக்களை மீட்பது போன்ற பல நல்ல விடயங்களும் இதில் உள்ளடக்கப்பட்டன. இப்பொழுது இந்தச் சட்டத்தில் பல திருத்தங்கள் செய்யப்படுகின்றன. அந்தத் திருத்தங்கள், ஏற்கனவே இருக்கின்ற ஊழலைத் தடுக்கும் திறனை அதிகரிக்கின்றதா? அல்லது குறைக்கின்றதா? என்பதை ஆராய வேண்டிய பாரிய பொறுப்பு இந்தச் சபைக்கு இருக்கிறது. அந்த வகையில், இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்தத் திருத்தச் சட்டமூலம் தொடர்பில் ஒருசில விடயங்களை முன்வைக்கலாமென நினைக்கின்றேன்.

முதலாவது, சொத்து மற்றும் பொறுப்பு அறிவிப்புகள் தொடர்பான விடயம். அரசின் முதலீடு 50 சதவீதத்தைவிடக் குறைவாக இருக்கும் அரச அல்லது பொது நிறுவனங்களில் வேலைசெய்பவர்கள் சொத்து மற்றும் பொறுப்பு அறிவிப்பைச் சமர்ப்பிக்க வேண்டிய தேவையில்லை என்ற ஒரு சந்தேகம் இருக்கின்றது. அதனை இந்தச் சபை இன்றைக்குத் தெளிவுபடுத்த வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன். அடுத்து, இணைந்து வசிப்பவர்கள் சொத்துப் பிரகடனம்

செய்யத் தேவையில்லை என்ற கருத்துப்பட Clause ஒன்று இதில் சேர்க்கப்பட்டு இருப்பதாக வாசித்து அறியக்கூடியதாக இருக்கின்றது. அது தொடர்பில் இந்தச் சபைக்குத் தெளிவு படுத்த வேண்டிய பாரிய பொறுப்பு உங்களுக்கு இருக்கின்றது. அடுத்து, உடந்தையாக இருப்பவர்களுக்கு எதிரான வழக்குகள். Clause 4மூலம் Section 70 திருத்தப்பட்டு, குற்றத்தில் உடந்தையாக இருந்த ஒருவர் முழுமையான அல்லது உண்மையான தகவல்களை வழங்கினால், அவருக்கு எதிராக வழக்குத் தொடராமல் இருப்பதற்கான அதிகாரம் தொடர்பில் மாற்றம் முன்வைக்கப்படுகின்றது. இதற்கான அதிகாரம் ஆணைக்குழுமூலம் ஆணையாளர் நாயகத்துக்கு வழங்கப் படுவதாகக் குறிப்பிடப்பட்டுள்ளது.

இதற்கான அதிகாரம் ஆணையாளர் நாயகத்துக்கு வழங்கப்பட்டால், யாரை வழக்கிலிருந்து விடுவிப்பது? எந்த அளவுகோலின் அடிப்படையில் விலக்குவது? அந்த முடிவுக்கு எதிராக என்ன கண்காணிப்பு இருக்கும்? என்பதை மேலும் தெளிவாகச் சொல்ல வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, சொத்து அறிவிப்புகளின் தகவல் மற்றும் தனியுரிமை - personal privacy - சம்பந்தமாக இங்கு குறிப்பிடப்படுகின்றது. இவை இரண்டும் balance செய்யப்பட வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன். அடுத்து, பிணை மற்றும் தனிநபர் சுதந்திரம் தொடர்பான Clause 17. இதனை நான் மிகவும் முக்கியமானதொரு விடயமாகவே பார்க் கின்றேன். ஆணையாளர் நாயகத்துக்கு அதிகமான அதிகாரங்கள் வழங்கப்படுகின்றது. பிணையில் விடலாமா, இல்லையா? என்பது தொடர்பில் -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
தயவுசெய்து, இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව තත්පර 30ක කාලයක් ලබා දෙන්නම්.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
ஆணையாளர் நாயகம் முடிவு எடுக்கக்கூடிய ஒரு நிலை ஏற்படுத்தப்படுகிறது. அதுமாத்திரமல்ல, பிணை வழங்கும் அதிகாரம் Magistrate's Courtஇலிருந்து High Courtக்கு மாற்றப்படுவதாகச் சொல்லப்படுகிறது. ஆகவேதான் உயர் நீதிமன்றம், இந்த Magistrate's Courtஇன் நியாயாதிக்கம் இவ்வாறு கட்டுப்படுத்தப்படுவது அரசியலமைப்புக்கு முரணானது என்று சொல்கின்றது. எனவே, இவ்வாறான முக்கியமான விடயங்களைச் சீரமைத்து, இந்த நாட்டில் மீண்டும் ஊழல் தலைவிரித்தாடாத வகையில், மிகவும் இறுக்கமான சட்டத்தைக் கொண்டுவந்து, ஊழலற்ற நாடாக இந்நாட்டை மாற்ற வேண்டும். அதற்கு நாங்களும் உங்களுக்கு உறுதுணையாக இருப்போமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.15]

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2023ஆம் ஆண்டின் 09ஆம் இலக்க, ஊழல் எதிர்ப்புச் சட்டத்தைத் திருத்துவதற்கான சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதை யிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

எமது அழகான நாடு ஒரு காலத்தில் பொருளாதாரத்தில் நிமிர்ந்து நின்றது. இங்கு எனக்கு முன்னர் உரையாற்றிய உறுப்பினர் குறிப்பிட்டதைப்போல, சிங்கப்பூர் நாடானது எமது நாட்டைப் பார்த்து பெருமைகொள்ளும் அளவுக்கு இருந்தது. கடந்த காலத்தில் இந்த நாட்டில் நடந்த ஊழல் காரணமாக, எமது நாடு பொருளாதாரத்தில் மிகவும் பின்தங்கிய, வங்குரோத்து அடைந்த நாடாக மாறியது. சிறிது நேரத்துக்கு முன்னர் எதிர்க்கட்சியைச் சேர்ந்த ஓர் உறுப்பினர் தெரிவித்திருந்தார், ஆளுங்கட்சி உறுப்பினர்கள் திருடர்கள் என்று.

"திருட்டுப் பயலே திருட்டுப் பயலே சேதி கேளடா
ஒவ்வொரு மனிதனும் ஒவ்வொரு வகையில்
திருடன் தானடா உள்ளே திருடன் தானடா..."

என்று ஒரு பாடல் இருக்கிறது. இந்தப் பாடலைக் கேட்கும்போது எனக்கு விளங்குகின்றது, எமது அரசாங்கமும் ஒரு வகையில் திருடன்தான்; சனாதிபதியும் ஒரு வகையில் திருடன்தான் என்று. காரணம், எமது சனாதிபதி அவர்கள் இலங்கையில் இருக்கின்ற மக்களுடைய உள்ளங்களைத் திருடி யுள்ளார்; உலக மக்களுடைய உள்ளங்களைத் திருடியுள்ளார். ஆனால், மற்றவர்களோ இலங்கை நாட்டின் பணத்தையும் சொத்துக்களையும் திருடினார்கள். இந்த அடிப்படையில் பார்த்தால், எதிர்த்தரப்பு உறுப்பினர் தெரிவித்தது உண்மைதான் என்பதை நான் இந்தத் தருணத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

ஊழலானது, ஆரம்பத்தில் கண்டறிவதற்குக் கடினமாகவும், ஒழிப்பதற்கு எளிதாகவும் இருக்கும். ஆனால், இதைக் கண்டுகொள்ளாமல்விட்டால் காலப்போக்கில் கண்டறிவது எளிதாகவும், ஒழிப்பதற்குச் சாத்தியமற்றதாகவும் போய்விடும். இலங்கையில் ஊழல் தலைவிரித்தாடிய ஒரு காலம் இருந்தது. ஆனால், தற்போது எமது அரசாங்க காலத்தில் ஊழல் செயற்பாடுகள் குறைவடைந்து செல்கின்றது. ஊழல் தொடர்பான தரவரிசைப் பட்டியலில் இலங்கையானது, 2024ஆம் ஆண்டு 180 நாடுகளில் 121ஆவது இடத்தில் இருந்தது. 2025ஆம் ஆண்டு அது 107ஆவது இடத்துக்கு வந்திருக்கிறது. இதையிட்டு நாங்கள் பெருமைகொள்ள வேண்டும். அத்துடன், எமது ஆட்சி பற்றியும் பெருமைகொள்ள வேண்டும். மேலும், ஊழல் புலனாய்வுச் சுட்டெண்ணில் இலங்கையானது, 2025ஆம் ஆண்டு 35 புள்ளிகளைப் பெற்றிருக்கிறது. இதையிட்டும் நாங்கள் பெருமையடைய வேண்டும்.

[ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා]

எதிர்காலத்தில் ஊழலை இல்லாதொழித்து, எமது நாட்டைச் சிறந்ததொரு நாடாக நாங்கள் மாற்றுவோம். ஊழலானது, ஒரு நாட்டின் அரசியல் சாசனத்தையே சீரழித்து, இறுதியில் புரட்சிக்கும் வழிவகுக்குமென அரிஸ்டோட்டில் அவர்கள் எச்சரித்தார். அவர் தெரிவித்ததைப் போன்றே, கடந்த காலத்தில் எமது நாட்டில் அரசியல் சாசனத்தை மீறிய செயற்பாடுகளால் நாடு சீரழிந்துபோனதால் நாங்கள் ஒரு புரட்சிக்குச் செல்லவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்பட்டது. சிறந்த, வளமான, மூவினங்களும் ஒற்றுமை யாகவும் சந்தோசமாகவும் வாழ்ந்த எமது நாட்டை கடந்த காலத்தில் இருந்த ஆட்சியாளர்கள் சீரழித்து குட்டிச்சுவராக்கி விட்டார்கள். ஏதோ தெய்வாதீனமாக எமது சனாதிபதி அவர்கள் இந்த நாட்டின் ஆட்சியைக் கைப்பற்றியதிலிருந்து, இங்கு வசந்த காலக் காற்று வீசுவதுபோன்ற ஒரு நிலை இருப்பதை எல்லோராலும் உணரக்கூடியதாக இருக்கின்றது. உண்மையிலே இதனை எமது நாட்டுக்குக் கிடைத்த ஒரு வரப்பிரசாதமாகவே நான் எண்ணுகின்றேன். எமது நாட்டில் பல்வேறுபட்ட சட்டங்களைக் கொண்டுவந்தாலும், அவற்றை முழுமையாக நடைமுறைப்படுத்த வேண்டும். அதேபோல, எமது நாட்டில் ஊழலை இல்லாதொழிப்பதற்கு அறநெறி சார்ந்த கல்வியை மாணவர்களுக்கு வழங்க வேண்டும். மேலும், தனிமனித ஒழுக்கம், பொறுப்புக்கூறும் தன்மை போன்ற வற்றை மக்களிடம் வளர்ப்பதன்மூலம் எமது நாட்டைப் பொருளாதாரம் உட்பட சகல விடயங்களிலும் முன்நோக்கிக் கொண்டுசெல்ல முடியும்.

கடந்த காலத்தில் எமது வடக்கு மாகாண மக்களுக்கு சனாதிபதி நிதியத்திலிருந்து எந்தவொரு நிதியும் வரவில்லை. கிட்டத்தட்ட 48 வருட காலமாக சனாதிபதி நிதியத்தின் நிதி தென்பகுதிக்குத்தான் சென்றதே ஒழிய, வட பகுதிக்கு வரவில்லையென நான் நினைக்கின்றேன். கடந்த வாரம் சனாபதிபதி நிதியத்தால் எமது வடக்கு மாகாணத்திலிருந்து பல்கலைக்கழகம் சென்ற 486 மாணவர்களுக்கு ஓரிலட்சம் ரூபாய் வீதம் நிதி வழங்கப்பட்டது. இதையிட்டு நாங்கள் பெருமையடைகின்றோம். கடந்த ஆட்சியில் இந்த நிதியத்தின் நிதியானது, இரண்டு அமைச்சர்கள் சிங்கப்பூருக்குச் சென்று சிகிச்சை பெறுவதற்காகச் செலவிடப்பட்டது.

ஆனால், இன்று வெலிஓயா, யாழ்ப்பாணம், முல்லைத்தீவு, மன்னார் போன்ற பிரதேசங்களிலுள்ள பெண் தலைமைத்துவக் குடும்பங்களிலுள்ள ஏழை மாணவர்களுக்கு இந்நிதியத்தால் நிதி உதவி வழங்கப்படுகின்றது. குறிப்பாக, சாதாரண தரத்துக்கு உட்பட்ட மாணவர்களுக்கு மாதாந்தம் 3,000 ரூபாயும் உயர் தர மாணவர்களுக்கு மாதாந்தம் 5,000 ரூபாயும் வழங்கப்படுகின்றது. கடந்த காலத்தில் இவ்வாறான கொடுப் பனவுகள் வடக்கு மாகாணத்திலுள்ள மாணவர்களுக்கு வழங்கப்படவில்லை. இவ்வாறான நல்லதோர் ஆட்சி எமக்குக் கிடைத்திருப்பதையிட்டு நாங்கள் மாத்திரமல்ல, எதிர்க் கட்சியில் இருக்கின்றவர்களும் பெருமைப்பட வேண்டும். இவ்வாறான உதவிகளைச் செய்யும்போது ஆளும்கட்சி, எதிர்க்கட்சி என்று நாம் பார்ப்பதில்லை. எமது அரசாங்க மானது, இந்த நாட்டில் இருக்கின்ற ஏழை மக்களை முன்னேற்றுவதற்கு இவ்வாறான பல திட்டங்களை வகுத்து வருகின்றது.

மேலும், 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட ஒவ்வோர் ஏழைக் குடும்பத்துக்கும் 50 இலட்சம் ரூபாய் வீதம் வழங்கி, அவர்களது இயல்பு வாழ்க்கையைக் கட்டியெழுப்புவதற்கும், அவர்கள் எதிர்காலத்தில் பொருளாதார ரீதியில் உயர்வடைவதற்கும் எமது அரசாங்கம் வழிவகுத்துள்ளது. மக்களுடைய எதிர்காலம் பற்றி சிந்திக்கின்ற ஓர் அரசாங்கம் ஆட்சிக்கு வந்திருப்பது உண்மையிலேயே பெருமைக்குரிய விடயமாகும். கடந்த காலத்தில் இவ்வாறெல்லாம் நிதி வழங்கப்படவில்லை என்றே நான் நினைக்கின்றேன். ஏனென்றால், இந்த நிதி வெவ்வேறு திசைகளில் சென்றது. மக்களிடமிருந்து பெற்றுக்கொள்ளப் பட்ட வரிப் பணமானது மக்களைச் சென்றடையவில்லை. தற்பொழுதுதான் அது மக்களைச் சென்றடைகின்றது என்பதை நான் இந்தத் தருணத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். "அறத்தின் வழியே இன்பம் - அறத்தின் வழியே பொருள்" என்பதற்கு அமைய, எதிர்காலத்தில் எமது நாடு பயணிக்க வேண்டும்; பயணிக்கும் எனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා.2.22]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන අද දවසේ අපි පිළිගන්නවා, දූෂණයෙන් හා වංචාවෙන් තොර යහපත් රටක් ගොඩනැඟිය යුතුයි කියලා. එය පාර්ලිමේන්තුව නියෝජනය කරන අප සියලුදෙනාගේ වගකීමක්. අප පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කළත්, යහපත් රටක් බිහි කිරීමේ අරමුණින් එය සද්භාවයෙන් කරනවා නම් ඒ සඳහා අපගේ සහයෝගය ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දූෂණ විරෝධී පනතට අදාළ සංශෝධන ගෙන එන අද දවසේ අපට මතක් කිරීමට සිදු වන තවත් කාරණයක් තිබෙනවා. "ඥානසාර හිමි සුදු ඇඳං ඉන්නවා දැකලා අපි පුදුම වුණෙමු" යනුවෙන් ත්‍රෛනිකායික මහානායක ස්වාමීන් වහන්සේලා කළ ප්‍රකාශ අද පත්තරවල මුල් පිටුවල අපට දකින්න ලැබෙනවා. අතිපූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර නායක ස්වාමීන් වහන්සේට අධිකරණයෙන් සිර දඬුවමක් ලබා දී තිබෙන බව අපි දැක්කා. උන්වහන්සේට එම සිර දඬුවම ලබා දීම අධිකරණ කටයුත්තක්. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, උන්වහන්සේට එම සිර දඬුවම ලැබුණේ උන්වහන්සේ දූෂණයක්, වංචාවක්, මංකොල්ලකෑමක් හෝ මිනී මැරුමක් කළ නිසා නොවෙයි. එහෙම දෙයක් නිසා නොවෙයි උන්වහන්සේට සිර දඬුවම ලැබී තිබෙන්නේ. උන්වහන්සේ විසින් මතයක් එහෙම නැත්නම් ප්‍රකාශයක් කරලා, ඒ ප්‍රකාශය තුළින් අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව මත තමයි උන්වහන්සේට එම සිර දඬුවම ලබා දී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි සිංහල බෞද්ධ අය. මම හොඳ සිංහල බෞද්ධයෙක්. එදාත් අපි මේ පාර්ලිමේන්තුවේදී සිංහල බෞද්ධකම ආරක්ෂා කළා. අදත්, හෙටත් අපි සිංහල බෞද්ධකම ආරක්ෂා කරනවා. ඒ වාගේම, අපි අනෙකුත් සියලුම ආගම්වලට ගරු කරනවා. අනෙකුත් ජාතීන්ට ආදරය කරනවා. ඒක තමයි සිංහල බෞද්ධ සමාජයේ අපේ හැදියාව. මේ රටේ ජනගහනයෙන් සියයට 70ක් පමණ සිංහල

බෞද්ධ ජනතාව. අපි හැමෝම, හැම උදෑසනකම අපේ ගෙවල්වල තිබෙන බුදු පිළිමය ඉදිරියට ගිහිල්ලා පන්සිල් සමාදන් වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මොකක්ද අපි කියන්නේ? "බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි". පන්සිල් සමාදන් වීමට පෙර අපි මුලින්ම එහෙම කියන්නේ ඇයි? අපි බුදුන් සරණ යනවා. ඊට පස්සේ අපි දහම් සරණ යනවා. ඒ වාගේම අපි සඟුන් -සංඝයා වහන්සේලා- සරණ යනවා. අපි පන්සිල් සමාදන් වෙන්න ඉස්සෙල්ලා මේ වන්දනාව කරමින් ආරක්ෂා කර ගත යුත්තේ කවුද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? මේ රටේ මහා සංඝ රත්නය. ඇයි, ඒ? අපේ බෞද්ධ දර්ශනය ආරක්ෂා කර ගන්න, බුදුරජාණන් වහන්සේ දේශනා කළ බෞද්ධ දර්ශනය අපට සරලව කියලා දෙන්න ඉන්නේ අපේ මහා සංඝ රත්නය. අපේ මහා සංඝ රත්නය ආරක්ෂා වුණොත් තමයි දහම ආරක්ෂා වෙන්නේ. බුද්ධ දර්ශනය ආරක්ෂා වන්නේත් මහා සංඝ රත්නය ආරක්ෂා වුණොත් විතරයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ නිසා අද මුළු රටේම බෞද්ධ සමාජය විතරක් නොවෙයි, ඉන්න අනෙකුත් ආගම්වල, අනෙකුත් ජාතීන්වල අයත් කම්පනයට පත් වෙලා තිබෙනවා, උන්වහන්සේගේ සිවුර ගැලවීම සම්බන්ධයෙන්. කවුද කළේ, කොතැනින්ද කථා කළේ කියන එක නොවෙයි ප්‍රශ්නය. ආණ්ඩුවක් හැටියට මේක නිවැරදි කරන්න ඕනෑ. මේක නිවැරදි විය යුතුයි. එහෙම නිවැරදි නොවුණොත් මොකක්ද සිද්ධ වෙන්නේ? තමුන්නාන්සේලා දන්නවා, මේ වෙනකොට මේ සම්බන්ධයෙන් ත්‍රෛනිකායික මහානායක හිමිවරුන් විතරක් නොවෙයි, කථා කරන්නේ. විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් පළමුවෙන්ම අපේ මහාචාර්ය කොටපිටියේ රාහුල හාමුදුරුවෝ - උන්වහන්සේ අපේ දිස්ත්‍රික්කයේ - ප්‍රකාශයක් කළා. ඇත්ත ඇති සැටියෙන් කථා කරන කොටපිටියේ රාහුල අනුනායක හාමුදුරුවෝ මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළා. බන්ධනාගාර කොමසාරිස්ට ලිපියක් යැව්වා. ඊට පස්සේ ඕමල්පේ සෝභිත හාමුදුරුවෝ, බෙංගමුවේ නාලක හාමුදුරුවෝ සහ යුරෝපයේ ඉන්න බෞද්ධ සංගම්වල මහානායක හාමුදුරුවරු අද මේ සම්බන්ධයෙන් කථා කරනවා. ඇයි මේ? මේ ගැන මේ විධියට කථා කරන්නේ ඇයි?

රජයක් හැටියට මේ ගැන තමුන්නාන්සේලාට වැඩි අවධානයක් යොමු කරන්න වෙනවා. මේක සෙල්ලමට ගන්න එපා. මේක සාමාන්‍ය දෙයක් විධියට ගන්න එපා. මොකද හේතුව, අපේ රටේ සිංහල බෞද්ධ විහාරස්ථාන 12,235ක් තිබෙනවා. අපේ බෞද්ධ රටේ විහාරස්ථාන 12,235ක් තිබෙනවා. අපේ රටේ භික්ෂූන් වහන්සේලා 42,122ක් වැඩ සිටිනවා. අපේ රටේ මහා සංඝරත්නය තමයි අපේ බෞද්ධ දර්ශනය, බෞද්ධ දහම ආරක්ෂා කරන්නේ. උන්වහන්සේලා තමයි අපට අවවාද අනුශාසනා දෙන්නේ. ඉතිහාසය ගත්තාමත් රජවරුන්ට, රට කරවපු රජවරුන්ට අනුශාසනා දුන්නේ බෞද්ධ සමාජයේ අපේ ගෞරවනීය මහා සංඝරත්නය. ඒවාට රජවරු ඇහුම්කන් දුන්නා. රජ කෙනෙක් වුණත් අපේ ගෞරවනීය මහා සංඝරත්නය ඉදිරියට ගිහිල්ලා වැඳලා නමස්කාර කරනවා. ඒ විධියට තමයි අපේ බෞද්ධ ශිෂ්ට සමාජය කටයුතු කරන්නේ. ඒ නිසා තමුන්නාන්සේලා මේ ගැන වැඩි අවධානයක් යොමු කරන්න.

අපි දැක්කා, අද ත්‍රෛනිකායික මහානායක ස්වාමීන් වහන්සේලා ජනාධිපතිතුමා හමු වනවා. හොඳයි. හමුවෙලා මේකට තීන්දුවක් ගන්න. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු 159ක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මේ නීති හදන්නෙත් පාර්ලිමේන්තුවෙන් නම්, නීති හදන්න පුළුවන් පාර්ලිමේන්තුවට නම්, අපට මේ කාරණයට අදාළව පාර්ලිමේන්තුවෙන් නීති හදන්න බැරි ඇයි? නීති හදන්න පුළුවන්. ඒවා මේ පාර්ලිමේන්තුවට වෙනස් කරන්න පුළුවන්. මේ අද ගෙනෙන්නෙත් දූෂණ විරෝධී පනතට සංශෝධනයක් නේ. ඒ වාගේ කටයුතු කරලා හරි මහා සංඝරත්නය, සිංහල බෞද්ධකම ආරක්ෂා කරන්න.

අපි උපදිනකොට මේ පක්ෂ, ඒ මොකක්වත් අරගෙන එන්නේ නැහැ. අපි උපදින්නේ ජාතියයි, ආගමයි අත්දෙකට අරගෙන. එක අතකට ජාතිය, එක අතකට ආගම. මම සිංහල ජාතියේ, බෞද්ධ ආගමිකයෙක්. ඒ විධියටයි මම ඉපදුණේ. පස්සේ තමයි අලියා, පොහොට්ටුව, දුරකථනය, ජේවීපී ආදී වශයෙන් මේ පක්ෂවලට බෙදුණේ. පක්ෂ ආවේ පස්සේ. ඒ නිසා අපි කියනවා, කරුණාකර මේකට අත තියන්න එපා කියලා. බොහොම පැහැදිලිව අපි කියනවා, තමුන්නාන්සේලා මේකට අත තියන්න එපා කියලා. මේකට අත තියන එක ඉතාම භයානක තත්ත්වයක්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

හොඳයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද තමුන්නාන්සේලා තමයි රජය හැටියට බලයට පත් වෙලා ඉන්නේ. විශේෂයෙන්ම මේ සිංහල බෞද්ධ දර්ශනය ගැන ඔබතුමන්ලා වැඩි වශයෙන් කල්පනා කරන්න ඕනෑ. ඒකට හේතුව මොකක්ද? තමුන්නාන්සේලාගේ පෙර වැරදි තිබෙනවා. ඒ පෙර වැරදි නිවැරදි කරගන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ පෙර වැරදි මොනවාද? ජනතා විමුක්ති පෙරමුණ එදා තහනම් කරපු දේශපාලන පක්ෂයක්. 1987, 1988 සහ 1989 කාලවල මොනවාද සිද්ධ වුණේ? තමුන්නාන්සේලා නොයෙකුත් ආණ්ඩු විරෝධී, විකල්ප වැඩ කළා. එදා විකල්ප වැඩ කරනකොට මොකක්ද සිද්ධ වුණේ? එදා ජනතා විමුක්ති පෙරමුණ විසින් එදා 41 නමක් ඝාතනය කළා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එදා කොටිකාවත්තේ සද්ධාතිස්ස නායක හාමුදුරුවෝ වාගේම අපේ දිස්ත්‍රික්කයේ මගේ ඥාති, පොහොද්දරමුල්ලේ පේමාලෝක හාමුදුරුවෝත් ඝාතනය කළා. අද රජයක් හැටියට ඔබ විශ්වාස කරනවා නම් එදා සිදු කළේ වැරදි ක්‍රියාවක් කියලා, අද ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ රජය ශාසනයට අත තැබිය යුතු නැහැ; මහා සංඝරත්නයට අත තැබිය යුතු නැහැ. ඒ ගැන වැඩි අවධානයක් යොමු කරන්න. පෙර වැරදි හදාගන්නවා නම් ඒක කරන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අපිත්, තමුන්නාන්සේලාත් දන්නවා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මේ රටේ යුද්ධය අවසන් කළා කියලා. එතුමා විරෝදාර රණවිරුවන්ට නායකත්වය දීලා අවුරුදු 30ක් තිස්සේ තිබ්බච යුද්ධය අවසන් කළා. ඒ යුද්ධය එදා ඉවර වුණා. නමුත්, එතුමාගේ පිටිපස්සෙන්, එතුමාගෙන් පළිගන්න ඉන්න යම් යම් කණ්ඩායම් තාමත් ඒ පළිගැනීම කරනවා. අද ඒවායේ ප්‍රතිඵල තමයි භුක්ති විඳින්න වෙලා තිබෙන්නේ. එදා අවුරුදු තිහක් තිස්සේ පැවැති යුද්ධයක් අවසන් කළා. අපට ඒවා අමතක කරන්න බැහැ. තමන්ගේ ජීවිතය ගැනවත් නොහිතා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා යුද්ධය අවසන් කළා. තමන්ගේ පවුලේ හැම දෙනාටම සිදුවිය හැකි අවදානම සම්බන්ධයෙන් වූ අභියෝගය එතුමා භාර ගත්තා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

මට විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා ]

අද වෙනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? එදා තුවක්කුවෙන් කරන්න බැරි වුණු දේ අද මුදලෙන් කරගන්න උත්සාහ කරනවා. තමුන්නාන්සේලා රජයක් හැටියට එක එක්කෙනාව සන්තෝෂ කරන්න මේ විධියට දේශපාලන වශයෙන් පළිගන්න එපා. ඒක එච්චර සුදුසු නැහැ. ඒක සුදුසු නැහැ. මොකද, ආණ්ඩු තිබෙන්න පුළුවන්; ආණ්ඩු නැති වෙන්නත් පුළුවන්. අපි බොහොම පැහැදිලිව කියනවා, යහපත් චේතනාවෙන් කරන සියල්ල හොඳයි, හැබැයි, දේශපාලන වශයෙන් දඩයම් කරන්න එපා කියලා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි එකොළහක කාලයක් ලැබෙනවා.

[අ.භා.2.32]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතිහාසය තිබෙන්නේ, කොක් හඬලා සිනාසෙන්නවත්, හඬා වැලපෙන්නවත් නොවෙයි, ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගෙන අනාගතය ගොඩ නඟාගන්නයි. ඒ නිසා මම ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමාට කියනවා, තමුන්නාන්සේ ඉස්සෙල්ලාම කණ්ණාඩියක් ඉදිරිපිටට ගිහිල්ලා තමන්ගේ අතීතය පිළිබඳව, තමන් කරපු කියපු දේවල් පිළිබඳව කල්පනා කර බලන්න කියලා.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය තමයි අපේ ජාතික තේමාව. එහි 201 වැනි පිටුවේ අල්ලස හා දූෂණය පිළිබඳව වත්මන් රජයේ ප්‍රතිපත්තිය ඉතාම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

> "සොරාගත් වත්කම් නැවත අයකර ගැනීමට අදාළව සොරකම් කරන ලද වත්කම් ප්‍රතිෂ්ඨාපනය සහ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳව එක්සත් ජාතීන්ගේ කාර්යාලය ආදී ජාත්‍යන්තර ආයතනවල තාක්ෂණික සහ උපදේශන සේවාවන් ලබාගැනීමට රාජ්‍ය වත්කම් ප්‍රතිෂ්ඨාපන ආයතනයක් පිහිටුවීම.
>
> 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ 34 වැනි වගන්තිය අනුව සොරාගත් වත්කම් නැවත අයකර ගැනීම සම්බන්ධීකරණය හා දූෂණය වැළැක්වීම සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීමේ බලධරයා වන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සම්පූර්ණ බලය පැවරීම සහ අවශ්‍ය පහසුකම් ලබා දීම.
>
> මූල්‍ය අපරාධ, අල්ලස් හා දූෂණ චෝදනා නඩු කාර්යක්ෂම කිරීම සඳහා ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ලක් පත් කිරීම.
>
> සෑම දිස්ත්‍රික්කයකම දූෂණ විරෝධී කොමිසමේ කාර්යාලයක් පිහිටුවීම. "

මේ ආකාරයෙන් කරුණු නවයක් සඳහන් වෙනවා. ඒ කරුණු නවය සම්පූර්ණ කිරීමේ ඓතිහාසික මොහොත තමයි මේ උදා වෙලා තිබෙන්නේ. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සංශෝධනය කිරීම සඳහා අද ඉදිරිපත් කරලා තිබෙන මේ පනත් කෙටුම්පත මේ කාරණා බලාත්මක කිරීම සඳහා ගෙනාපු ඉතාමත් විශිෂ්ට එකක් බව අපි පැහැදිලිව කියනවා.

"ජයග්‍රහණයට පියවරු සියයයි. පරාජය අවජාතකයි." මුජිබුර් රහුමාන් මැතිතුමා මේ සභාවේ දැන් නැහැ. එතුමා කිව්වා, අතීතයේ රාජපක්ෂලාගේ ආණ්ඩු, ඒ සන්ධාන ආණ්ඩු පිහිටුවන්න අපේ පැත්තෙන් සහයෝගය දීලා තිබෙනවා කියලා. ඔව්, අපි සහයෝගය දුන්නා. අපි ඉදිරියටත් ඕනෑම කෙනෙකුට සහයෝගය දෙනවා. හැබැයි, ඒ කොන්දේසි සහිතවයි. ඒක නිසා මතක තියාගන්න, අපි එදා ඒ අයට සහයෝගය දුන්නේ, ඒ අය බලයට ගෙනෙන්න සහයෝගය දුන්නේ වංචාව, දූෂණය, හොරකම, මැරකම, තක්කඩිකම නැති කරන්නයි; ඥාති සංග්‍රහය නැති කරන්නයි; දේශපාලන වංචනිකයන්ට දඬුවම් දෙන්නයි; මහජන දේපළ කොල්ලකන හොරුන්ට, මංකොල්ලකාරයන්ට එරෙහිව කටයුතු කරන්නයි; ජනතාවට යුක්තිය, සාධාරණය ඉටු කරන්නයි.

අපි එදා සහයෝගය දුන්නේ, මාධ්‍ය ආයතන ගිනි තියන්න නොවෙයි; මාධ්‍යවේදීන්ගේ අතපය කඩන්න නොවෙයි; සුදු වෑන් සංස්කෘතියක් ඇති කරන්න නොවෙයි; මිනිසුන්ගේ ඉඩම් මංකොල්ලකන්න නොවෙයි. ඒවාට එරෙහිව ජනතාවට යුක්තිය, සාධාරණය ඉෂ්ට කරන්න තමයි අපි ඒ සහයෝගය දුන්නේ. මොනවා දුන්නත්, මොන සහයෝගය දුන්නත්, තවමත් වෛද්‍ය ඉතිහාසය තුළ මොළය බද්ධ කිරීමක් සිදු කරලා නැහැ නේ. ඒක නිසා ඒ අයට මොළය දෙන්න පුළුවන්කමක් නැහැ. "නැහැදෙන එකා ගුණ දහමින් වෙළුවත්, උගේ ගතිය ඌ නාරී මැරුවත්" කියලා ආප්තෝපදේශයක් අපි අසා තිබෙනවා. 2015 සිට 2019 දක්වා පැවැති යහපාලන ආණ්ඩුවට ලබා දුන් ජනවරම ඒ තක්කඩින්ට, ඒ වංචාකාරයන්ට, ඒ දූෂිත දේශපාලකයන්ට ආරක්ෂා කරගන්න බැරි වුණා. ඔවුන් ඒ ජනවරම පාවා දුන්නා.

ඒ පාවා දීම දිගින් දිගටම සිදු වනකොට අපට සිද්ධ වුණා, අපට ජනවරම ලබා දුන්නු ඒ මිනිසුන්ට, රටට, අනාගත පරම්පරාවට යුක්තිය ඉෂ්ට කරන්න. ඒ නිසා තමයි අපි කොන්දේසි විරහිතව ඉවත් වෙලා ගිහින් විපක්ෂයේ වාඩි වෙලා, කොන්ද කෙළින් තියාගෙන ඒ දූෂිත ආණ්ඩුවේ දූෂිත ක්‍රියාකාරකම් නවත්වන්න අපේ හඬ නැඟුවේ. ඒක මතක තියාගන්න. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාටත් අතීතය අමතක වෙලා තිබෙනවා. ලංකා ඉතිහාසය තුළ සිදු වුණු ඒ මහා මූල්‍ය වංචාව කරපු; ඒ රුපියල් කෝටි 1,100 වංචාව කරපු එවකට හිටපු තමන්ගේ නායකයා හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ; ඒ වංචාකාරයා; ඒ ප්‍රෝඩාකාරයා; ඒ හොරා ආරක්ෂා කරන්න තමුන්නාන්සේලා හදපු footnote කල්ලියේ ක්‍රියාකාරි සාමාජිකයෙක් එතුමාත්. අද, කලිසම් සූට් ඇඳගෙන ඇවිල්ලා ලජ්ජා නැතිව කථා කරනවා. ඒවාත් මතක තියාගන්න ඕනෑ, ඒ මහත්වරු.

ඒ වාගේම, මේ දෙපිරිසම වසර 76ක් තුළ පෞද්ගලිකව සහ සාමූහිකව -එකට එකතු වෙලා- මුළු පරිසරයම දූෂණය කළා. ගස් කොළන්, වැලි, ගඩොල්, ගල් වැනි පරිසරයේ තිබෙන ද්‍රව්‍ය දැවැන්ත ලෙස විනාශ කළා. තමන්ගේ හෙංචයියලාට ඒවාට උඩගෙඩි දුන්නා. අද මුළු පරිසරයම විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපට "දිට්වා" ආදී සුළි කුණාටුවලට මුහුණ දෙන්න සිද්ධ වුණේ; දේපොළ සහ ජීවිත විශාල ප්‍රමාණයක් විනාශ වුණේ. ඒකත් මතක තියාගන්න. මේ දෙපිරිස එකතු වෙලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ කරපු මහා වංචා ඉහවහා ගිහින් තිබෙනවා. ඒ වංචා දූෂණ, හොරකම්, පරිසර විනාශය, පුරාවිද්‍යා ස්ථාන විනාශය සිදු කරමින් කරපු ඒ සංහාරය ගැන එක්තරා පොඩි ළමයෙක් මට මෙන්න මේ කවිය කියා දුන්නා.

කුළුගෙඩි පහර වැදුණේ බුදු සිරසටය
අලවංගුවේ තුඩ ඇනුණේ පපුවටය
රිදුණේ ඔබට නොව හිමියනි අපහටය
වසවර්තියෝ තාමත් හම්බන්තොටය

ඒකත් මතක තබාගන්න, සිල්වත් යැයි කියන මහත්වරු. හොරකමට, වංචාවට, දූෂණයට දේශ සීමාවක් නැහැ. අමතක නොවෙන තරමටම මේ ගොල්ලන් හොරකම් කරලා තිබෙනවා;

වංචා කරලා තිබෙනවා; දූෂණ සිදු කරලා තිබෙනවා. ඊට පස්සේ කියනවා, "මට අසනීපයි, මා ගැන අනුකම්පා කරන්න, ගුවන් තොටුපොළට එන විට මාව අත් අඩංගුවට ගන්න එපා, මම ගෙදර ගියාට පස්සේ ඕනෑම ඇප කොන්දේසියක් දමලා මාව අත් අඩංගුවට ගන්න" කියලා. අද එහෙම අඳෝනා නගන්න සිද්ධ වෙලා තිබෙනවා ඒ නෝනලාට මහත්වරුන්ට. ලජ්ජයි! අපි තමුන්නාන්සේලාට කියන්න ඕනෑ, මේ දෙපිරිස ඉතිහාසයේ කරපු වංචා, දූෂණ, හොරකම් ගැන විස්තර මහාවංශයේ පිටු ගණනටත් වඩා වැඩියි කියලා. "අපරාධය හා දඬුවම" කියලා පොතක් තිබෙනවා. ඒ පොතේ තිබෙන පිටු ගණනටත් වඩා ලොකුයි, මේ මිනිස්සු කරපු අපරාධ, වංචා දූෂණ, හොර මැරකම් පිළිබඳ විස්තර. ඒ නිසා වර්තමානයේදී අපට සිද්ධ වෙලා තිබෙනවා, තමුන්නාන්සේලා දෙගොල්ලන්ම පිළිබඳව අර කියපු පොත් දෙකටම වඩා දැවැන්ත පොතක් ලියන්න. හොරාට, වංචනිකයාට, දූෂිතයාට ලජ්ජා භයක් නැහැ, සාදාචාරයක් නැහැ, සංස්කෘතියක් නැහැ, හිරිකිතයක් නැහැ. ඒ නිසා තමයි කම්මලේ බල්ලන් වාගේ මෙතැනට ඇවිල්ලා කිසිම ලජ්ජාවක් නැතිව කටයුතු කරන්නේ.

අවසාන වශයෙන් මම තමුන්නාන්සේලාට මේ කාරණය කියනවා. මට මතකයි වත්මන් ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ හිටපු කාලයේ අවස්ථා කිහිපයකදීම කථා කරද්දී ආණ්ඩුව පැත්තට අත දිගු කරලා නම් වශයෙන්ම කිව්වා, "මට කවදා හරි මේ රටේ නායකත්වය ලැබුණොත්, ඔය පැත්තේ ඉදිරි පෙළ සිටින අයට අනිවාර්යයෙන්ම ඉන්න වෙන්නේ මේ පාර්ලිමේන්තුවේ නොවෙයි, හිර ගෙදර; මහ උළුගෙදර" කියලා. එදා මමත් එතුමා එක්ක විපක්ෂයේ වාඩි වෙලා හිටියා.

මතක තබාගන්න, අපි මොනම ආකාරයකින්වත් පළිගන්නේ නැහැ, වෛර කරන්නේ නැහැ. අපි ඒවා කරන්නේ නැහැ. එහෙම කරන්න අපට අවශ්‍ය නැහැ. නමුත් එදා හොරකම්, වංචා කරපු සෑම කෙනෙකුම තමුන්නාන්සේලා ආරක්ෂා කළා විපක්ෂය පැත්තේ සිටිද්දීත්; ආණ්ඩුව පැත්තේ සිටිද්දීත්. එදා ඔබ දෙගොල්ලන්ම ගේම් ගැහුවා. මතක තබාගන්න, අපි ඒ කුපාඩි වැඩේ කරන්නේ නැති බව. මහ ජනතාවගේ දේපළ හොරකම් කරපු, පිල්ලි ගහපු, වංචා කරපු හැම කෙනෙකුටම අප ආණ්ඩු බලයේ ඉන්න කාලය තුළ අදාළ ආයතනවල නිලධාරින්ට ක්‍රියාත්මක වෙන්න ඉඩ හැරලා, යුක්තිය ඉෂ්ට කරලා, මේ රටේ ජනතාවට සෙතක් ශාන්තියක් සලසන්න කටයුතු කරනවා. ඒ බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[2.43 p.m.]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Hon. Deputy Chairperson of Committees, first of all, I would like to ask the Hon. Ministers and the Hon. Members on both sides to wear their headphones because I believe everyone needs to listen to what I am going to say. முதலாவதாக, இங்கிருக்கின்ற அனைவருக்கும் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். ஏனென்றால், உரை பெயர்ப்பை கேட்பதற்கான கருவியைப் பயன்படுத்துமாறு நான் கேட்டுக்கொண்டதற்கு இணங்க, நீங்கள் எல்லோரும் அதனைப் பயன்படுத்துகிறீர்கள்.

அண்மையில் தியாகி திலீபனின் சிலை சம்பந்தமான பிரச்சினை நாடு பூராவும் பரவிக்கொண்டு இருந்தவேளையில், அநுராதபுரத்தில் இருக்கின்ற பிரபல தேசியப் பாடசாலையின் ஆசிரியர் ஒருவர் சமூக வலைத்தளத்தில் ஒரு விஷயத்தைப் பதிவிட்டிருந்தார். வடக்கு, கிழக்குத் தமிழர்களுக்கும் சமூக வலைத்தளங்களில் விவாதிக்கின்ற சிங்கள மக்களுக்கும் இருக்கின்ற பிரச்சினைக்கு மத்தியில், இந்த ஆசிரியர் பதிவொன்றை இடுகிறார். அந்தப் பதிவு என்னவென்றால், கழிவறைகளைக் கழுவுவதற்கும், தேயிலை பறிப்பதற்கும் இந்த நாட்டுக்கு வந்த மக்கள் இந்தப் பிரச்சினை பற்றி பேசக்கூடாது என்பதுதான். முதலாவதாக, அந்த ஆசிரியரின் அறியாமை சம்பந்தமாக நாம் அனைவரும் வெட்கப்பட வேண்டும். இன்றைக்கு ஓர் ஆசிரியர் இழிவானதொரு வார்த்தையைப் பாவித்து - தகாத ஒரு வார்த்தையைப் பாவித்து - ஒரு சமூகத்தைக் கேவலப்படுத்தி இருக்கிறார். நாங்கள் அவர்மீது சட்ட நடவடிக்கை எடுத்திருக்கிறோம்; காவல்துறையில் முறைப்பாடு செய்திருக்கிறோம்.

இன்றைக்கு மாணவ, மாணவிகள் அனைவரும் அவருடைய பதிவு மற்றும் அவருடைய நோக்கம் என்ன வென்று பார்த்துக்கொண்டு இருக்கிறார்கள். அப்படி இருக்கின்ற சூழலில், ஓர் ஆசிரியர் கொஞ்சம்கூட வெட்கமே இல்லாமல் இப்படியொரு விஷயத்தைச் சொல்லியிருக்கிறார். அதனால்தான் நாங்கள் பொலிஸில் முறைப்பாடு செய்திருக்கிறோம். என்னைப் பொறுத்தவரைக்கும், இந்த விஷயத்தில் நாங்கள் கட்டாயம் பாடமொன்றைக் கற்றுக் கொடுக்க வேண்டும். எந்தவொரு நபரையும் அவரின் பிறப்பின் அடிப்படையிலோ, சாதியின் அடிப்படையிலோ, வேலையின் அடிப்படையிலோ இழிவுபடுத்துவதை நாங்கள் ஏற்றுக்கொள்ளக் கூடாது; அதற்கு இந்த நாட்டின் சட்டமும் இடமளிக்காது. நாங்கள் இந்தப் பிரச்சினையைப் பேசி முடிக்கவில்லை. அதற்குள் பீட்றோ தோட்டத்திலுள்ள லவர்ஸ் லீப்பில் ஓர் உதவி முகாமையாளர் அங்கேயிருக்கின்ற ஒரு குடும்பத்தைப் பார்த்து, 'கள்ளத் தோணி' என்ற வார்த்தையைப் பயன்படுத்தி இருக்கிறார்.

முதலாவதாக, இந்த 'கள்ளத்தோணி' என்ற வார்த்தை எப்படி வந்தது என்பது மக்களுக்குத் தெரிந்தாக வேண்டும். 1948 வரைக்கும் - சுதந்திரம் கிடைக்கும் வரைக்கும் - நாங்கள் இங்கு தொழிலாளர்களாகத்தான் கொண்டுவரப்பட்டோம். குறிப்பாக, தமிழ்நாடு, கேரளா போன்ற பகுதிகளிலிருந்து நாங்கள் கொண்டுவரப்பட்டோம். அன்று இந்த நாட்டில் எந்தவிதமான விஷயமும் கிடையாது. நாங்கள் காடுகளை நாடாக்கினோம்; மலைகளுக்கூடாக பாதைகளை உருவாக்கினோம்; தேயிலைக் கன்றுகளை நட்டினோம். இவை எல்லாவற்றையும் செய்த எங்களுக்கு இன்றைக்குக் கிடைத்திருக்கின்ற பெயர் 'கள்ளத்தோணி'. இலங்கை அரசாங்கம் அன்றைக்கு எங்களுடைய குடியுரிமையைப் பறிக்கும்போது, 30 வருட காலமாகப் போற்றப்பட்ட பெயர்தான் 'கள்ளத்தோணி'. வரலாற்றை எடுத்துப் பார்த்தால், உண்மையிலேயே கள்ளத்தோணியில் யார் வந்தார்கள் என்பது அனைவருக்கும் தெரியும்.

நான் இந்த இடத்தில் ஒரு விஷயத்தைத் தெளிவாகச் சொல்ல விரும்புகிறேன். இன்றைக்கு மலையகத் தமிழர்கள் தேயிலை பறிக்கிறார்கள் என்பது உண்மை! ஆனால், அது வெறுமனே 7-8 சதவீதத்தினர்தான். பாராளுமன்றத்தில் என்னுடைய கன்னி உரையில் நான் சொல்லியிருந்தேன், 7-8 சதவீதமான மக்கள் செய்கின்ற தொழிலானது அவர்களுடைய முழு சமூகத்துக்கும் ஓர் அடையாளமாக வருகின்றது என்று. அது எவ்வளவு பெரியதொரு தவறு என்பதை நீங்கள்

[ගරු ජීවන් තොන්ඩමන් මහතා ]

சிந்தித்துப் பாருங்கள்! காணி உரிமை கேட்கும்போது, நீங்கள் அதனை மறுக்கிறீர்கள். காரணம், நாங்கள் அனைவருமே இலங்கையர்கள் என்று சொல்கின்றீர்கள். ஆனால், ஏதாவது ஒரு பிரச்சினை வரும்போது, கழிவறை கழுவ வந்தவர்கள், தேயிலை பறிக்க வந்தவர்கள், கள்ளத்தோணிகள் என்று சொல்கின்றீர்கள். தயவுசெய்து, யாருமே தப்பாக நினைக்க வேண்டாம். இங்கு நான் தமிழர்களுக்கும் சிங்களவர்களுக்கும் இடையில் பிரச்சினையை உருவாக்க விரும்பவில்லை. சிங்களவர்களை அவர்களது கலாசாரத்தின் அடிப்படையில், மதத்தின் அடிப்படையில் கேவலப்படுத்தினால் அதுவும் தவறு. அதேபோல், முஸ்லிம்களை அவர்களது மதத்தின் அடிப்படையில், கலாசாரத்தின் அடிப்படையில் அசிங்கப்படுத்தினால் அதுவும் தவறு. நாம் அனைவருமே இலங்கையர்! அப்படி இருக்கையில், இது எவ்வளவு பெரிய குற்றம் என்று யோசித்துப் பாருங்கள்!

கௌரவ இராதாகிருஷ்ணன் அவர்கள் லவர்ஸ் லீப் பிரச்சினை சம்பந்தமாக நிரோஷன் பீரிஸ் அவர்களுடன் கலந்துரையாடினார். இன்றைக்கு சமூக வலைத்தளங்களில் இந்த விடயம் பெரிதுபடுத்தப்பட்டவுடன், கம்பனி பக்கம் இருப்பவர்கள் உடனே சொல்கின்றார்கள், “எங்களை மன்னித்து விடுங்கள்! நாங்கள் உங்களுக்கு வீடுகட்ட அனுமதிக்கிறோம்” என்று. இன்றைக்கு அவர்கள் வீடுகட்ட அனுமதிப்பதன் நோக்கம் என்ன? இந்த விடயம் பெரிய பிரச்சினையாக மாறி, தங்களுடைய பெருந்தோட்ட நிறுவனத்தின் பெயர் கெட்டுப்போகக் கூடாது, “Ceylon Tea” brand கெட்டுப் போகக்கூடாது என்பதுதான் அவர்களுடைய நோக்கம்.

ஓர் இலங்கையரை 'கள்ளத்தோணி' என்று சொல்வது, சமூக வலைத்தளங்களில் காணொளி ஊடாகத் தெரிகிறது. அப்படிச் சொல்லக்கூடிய ஒரு மனுஷனால் ஏன் வெளிப்படையாக மன்னிப்புக் கேட்க முடியவில்லை? கேட்க கூசுதா என்ன! நாங்கள் இந்த இடத்தில் சும்மா கத்தி, ஆர்ப்பாட்டம் பண்ணி எங்களுடைய மரியாதையைக் கேட்டுத்தான் வாங்க வேண்டுமென்று அவசியமில்லை. நாங்கள் எங்கிருந்து வந்திருக்கிறோம் என்று சொல்வதற்கு நீங்கள் யார்? என்னைப் பொறுத்தவரைக்கும் உங்களுக்கு இருக்கின்ற அதே உரிமைதான் எங்களுக்கும் இருக்கின்றது. இன்றைக்கு தேயிலை பறிக்கின்றவர்களுக்குக் கொடுக்கப்பட்ட மரியாதையை தேயிலைத் தண்ணீர் குடிக்கின்றவர்களுக்குக் கொடுத்திருந்தால் நாடு ஏற்றுக்கொள்ளுமா?

ஒரு காலத்தில் இங்கு சுற்றுலாத்துறை மூலமான வருமானம் கிடையாது; வெளிநாட்டு வேலைவாய்ப்பு மூலமான remittances வருமானம் கிடையாது. அப்பொழுது, தேயிலை மட்டும்தான் இந்த நாட்டைக் காப்பாற்றியது. ஆனால், இன்றைக்கு அதற்கு எங்களுடைய மக்களுக்குக் கிடைக்கின்ற மரியாதை ‘கள்ளத்தோணி’! நீங்கள் எல்லோரும் சிந்தித்துப் பார்க்க வேண்டும்; உங்களுடைய மனசாட்சிக்கு நியாயமாகப் பேசியாக வேண்டும். நாம் இந்த விடயத்தை இன்னும் இப்படியே விடப்போகிறோமா? என்னைப் பொறுத்தவரைக்கும், இது ஆளும் கட்சிப் பிரச்சினையோ அல்லது எதிர்க்கட்சிப் பிரச்சினையோ கிடையாது. இது மனித உரிமை சம்பந்தப்பட்ட ஒரு பிரச்சினை! ஓர் அடிப்படை மரியாதைகூட எங்களுக்குக் கிடைக்கவில்லை என்றால், எங்களது நிலைமையைச் சற்று யோசித்துப் பாருங்கள்! ‘கள்ளத்தோணி’ என்ற வார்த்தையைப் பாவிக்கிறார்கள்; திரும்பவும் இந்தியாவுக்குப் போங்கள் என்று சொல்கிறார்கள். நாங்கள் இங்கு நூற்றாண்டு காலமாக இருக்கிறோம். இலங்கை வரலாற்றில், உங்களுடைய முன்னோர்கள் இருக்கிறார்களோ இல்லையோ, என்னுடைய முன்னோர்கள் இருக்கிறார்கள். அப்படி இருக்கும்போது, எங்களை ‘வந்தேறிகள்’ என்று சொல்வதற்கு உங்களுக்கு என்ன உரிமை இருக்கின்றது?

நீங்கள் ஒரு விடயத்தைக் கவனிக்க வேண்டும். அதற்கு ஆதாரம் எங்கே, அடையாளம் எங்கே என்று கேட்டால், ஒவ்வொரு தேயிலைக் கன்றிலும் எங்களின் முன்னோர்களின் கைரேகை இருக்கின்றது என்று சொல்வேன். அப்படி இருக்கும்போது, நீங்கள் அனைவரும் ஒரு விடயத்தைச் சிந்தித்தாக வேண்டும். இது ஒரு நபரின் பிரச்சினையோ அல்லது ஒரு தோட்டத்தின் பிரச்சினையோ கிடையாது. அதே பீட்றோ தோட்டத்தில், நான் அமைச்சராக இருந்த காலப்பகுதியில், தோடுகளைக் கழற்றி, பொட்டுகளை அழித்துவிட்டுத்தான் தொழிற்சாலைக்கு வந்து வேலைசெய்ய வேண்டுமெனச் சொன்னார்கள். அதற்கு எதிராக நான் நடவடிக்கை எடுத்தேன். ஏனென்றால், அன்றைக்கு எங்களுக்கு காவல்துறை ஒத்துழைப்புக் கொடுக்கவில்லை; சட்டம் எங்களைக் காப்பாற்றவில்லை. அதனால்தான் நாங்கள் சட்டத்தைக் கையிலெடுத்தோம். அதற்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் அநுராதபுரத்தில் சொன்னார், “தொண்டமானுடைய ரௌடித்தனத்தை நாங்கள் நிறுத்துவோம்” என்று. ஏன், அவர் தட்டிக்கேட்ட மாதிரித் தானே நாங்களும் தட்டிக்கேட்டோம். அவருக்கு ஒரு நியாயம்; எங்களுக்கு ஒரு நியாயமா?

இன்றைக்கு வெளிப்படையாகவே நான் உங்கள் எல்லோரிடமும் ஒரு விடயத்தைச் சொல்கின்றேன். இந்த நாட்டைப் பொறுத்தவரைக்கும் மலையக மக்கள் நிறைய விடயங்களை விட்டுக்கொடுத்து விட்டுக்கொடுத்துப் பழகிவிட்டார்கள். இன்றைக்கு ஒரு நம்பிக்கையில், நாட்டுக்கு ஒரு நல்ல தலைவர் கிடைத்திருக்கிறார் என்று நினைத்துக் கொண்டு, மலையகத்தின் ஆளுமையை விட்டுக்கொடுத்து இருக்கிறார்கள். இன்றைக்கு ஆளும் தரப்பிலுள்ள 159 உறுப்பினர்களில் எத்தனை உறுப்பினர்களுக்குத் திரும்பவும் தங்களது தொகுதிக்குப் போக முடியும்? ஏனென்றால், இன்றைக்குள்ள உண்மையான நிலவரம், மக்களுக்காக யாரும் பேசமாட்டார்கள். நான் இதை விமர்சனமாக முன்வைக்கவில்லை. இதுதான் யதார்த்தம்! இது சம்பந்தமாக அரசாங்கம் அறிக்கை விடுவதை நிறுத்திவிட்டு, கட்டாயம் நடவடிக்கை எடுத்தாக வேண்டும்.

தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினையைத் தீர்ப்பதற்காக குறித்த சம்பளத்தை வர்த்தமானியில் வெளியிடுமாறு - gazette பண்ணுமாறு - நாங்கள் ஆரம்பத்திலே சொன்னோம். அதற்கு நீங்கள் செய்த விடயம் என்ன? gazette பண்ணாமல், மறைமுகமாக பெருந்தோட்ட நிறுவனங்களுடன் பேசினீர்கள். எப்போது குத்தகைக் காலம் முடிவடையுமென, எப்போது எங்களுக்கு விடிவு வருமென நாங்கள் காத்துக் கொண்டு இருந்தபோது, "நீங்கள் சம்பளத்தைக் கூட்டிக் கொடுத்தால், நாங்கள் குத்தகைக் காலத்தை அதிகரிக்கிறோம்" என்று நீங்களே ஒரு வாக்குறுதியைக் கொடுத்துவிட்டு வந்திருக்கிறீர்கள். இதனை சனாதிபதி அவர்களே சொல்லியிருக்கிறார். ஏன் நாங்கள் வர்த்தமானி வெளியிடச் சொன்னோம்? ஏனென்றால், சம்பளம் முழுமையாக உரிய நேரத்தில் கிடைக்க வேண்டும் என்பதற்காகத்தான்.

இன்றைக்கு வெவர்லியில் ஒரு பிரச்சினை நடந்திருக்கின்றது. அதுதான் இதற்குச் சிறந்த உதாரணம். வெவர்லி தோட்டத்தில் 1,350 ரூபாய் சம்பளம்தான் வழங்குகிறார்கள்.

தனியார் தோட்டங்களைப் பொறுத்தவரைக்கும் 1,350 ரூபாய் சம்பளம்தான் வழங்குகிறார்கள். காரணம், 1,350 ரூபாய் என்பது ஜீவன் தொண்டமான் வர்த்தமானியில் வெளியிட்ட சம்பளமாகும். அப்படி இருக்கும்பொழுது, ஏன், உங்களால் வர்த்தமானி அறிவித்தலை வெளியிட முடியவில்லை? உங்களுடைய கண் முன்னாலேயே ஆதாரம் இருக்கின்றது. அதுமட்டுமல்ல, இன்றைக்கு தொழிற்சங்கப் பிரச்சினைகள் அனைத்துக்கும் நாங்கள்தான் முகங்கொடுத்துக்கொண்டு இருக்கிறோம். தொழிற்சங்கப் பிரச்சினைகளைத் தீர்ப்பதற்காக ஆளும் கட்சியிலிருந்து எங்களுக்கு எந்தவிதமான உதவியும் கிடைப்பதில்லை.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
ஆனால், அங்கிருக்கின்ற தோட்ட முகாமையாளர்களுக்கு மட்டும் உதவி கிடைக்கின்றது. தயவுசெய்து, இதனை விமர்சனம் என்று நினைக்காதீர்கள். எங்களின் ஆதங்கம்! ஏனென்றால், இன்றைக்கு எங்களை இந்தளவுக்கு இழிவு படுத்துகின்ற சிலர் இந்த மாதிரி அறியாமையில் இருக்கும்போது, இளைஞர், யுவதிகளிடம் எங்களுடைய வரலாற்றை மறைக்கிறார்கள். தயவுசெய்து, இதைக் கருத்தி லெடுத்து நடவடிக்கை எடுக்கும்படி கேட்டு விடை பெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ප්‍රියන්ත විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.52]

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ ව්‍යවස්ථාපිත අල්ලස් නීතියක් ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තේ 1883 අවුරුද්දේයි. 1883 අවුරුද්දේ පැනවූ දණ්ඩ නීති සංග්‍රහයෙන් තමයි ව්‍යවස්ථාපිතව අල්ලස් නීතියක් ආරම්භ වෙන්නේ. කාලයක් යනකොට පැහැදිලි වෙනවා, අපේ රටේ අල්ලස, දූෂණය තුරන් කිරීමට ඒ නීතිය ප්‍රමාණවත් නැහැ කියලා. ඒ අනුව 1954 අංක 11 දරන අල්ලස් පනත සම්මත කර ගන්නවා. ඒ අල්ලස් පනත ක්‍රියාත්මක වුණත් අපේ රටේ අල්ලස අඩු වුණේ නැහැ; දූෂණය අඩු වුණේ නැහැ. ඒ නිසාම අවබෝධ වෙනවා අල්ලස, දූෂණය තුරන් කිරීමට නම් අල්ලස් පනතත් ප්‍රමාණවත් නැහැ කියලා. ඒ නිසා අවශ්‍ය වෙනවා, අල්ලසට දූෂණයට විරුද්ධව කටයුතු කරන ස්වාධීන ආයතනයක් පිහිටුවන්න; ශක්තිමත්, බලාත්මක නීති පද්ධතියක් ඇති කරන්න. ඒ අනුව තමයි 1994දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත් කෙටුම්පත අපේ රටේ සම්මත වෙන්නේ.

හැබැයි, ඒ පනත් කෙටුම්පත් සම්මත වුණාට, ඒ පනත්වල අල්ලස, දූෂණය තුරන් කරන්න අවශ්‍ය නීතිමය රාමුව තිබුණාට ඒ පනත් ක්‍රියාත්මක කරපු ආණ්ඩු ඒ පනත්වල ප්‍රතිපාදන නිසි පරිදි ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබුණේ නැහැ; අවශ්‍ය පහසුකම් සලසා තිබුණේ නැහැ. විපක්ෂයේ එක කථාවකදී ඇහුණා, යහපාලන කාලයේදී තමයි ඔක්කෝම කළේ කියලා; "අපි තමයි මේ නඩු දමපු ඒවා ඔක්කෝම කළේ, අපි තමයි මේ සියලුම නීති හොඳ විධියට ප්‍රතිසංස්කරණ කළේ" කියලා. 2018 වනකොට තිබුණේ යහපාලන ආණ්ඩුව තමයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන අංශ 5ක් තිබෙනවා. ඒ 5න් එක විමර්ශන අංශයක විමර්ශන නිලධාරින් 20යි හිටියේ. පනත ලස්සන වුණාට, පනතේ ප්‍රතිපාදන තිබුණාට, ඒක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුබිම ඒ ආණ්ඩු හදලා තිබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බොහෝ නීති තිබුණාට ඇත්තටම ඒ නීති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පහසුකම් නැත්නම් ඒ නීති හුදෙක් මළ නීති බවට පත් වෙනවා. හැබැයි, වර්තමාන රජය බලයට පත් වුණාට පස්සේ ඇති වුණු වෙනස මොකක්ද? අපි නීති හදනවා වාගේම ඒ නීති ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුබිමත් සකස් කරලා දීලා තිබෙනවා. විශේෂයෙන්ම 2023දී දූෂණ විරෝධී පනත් කෙටුම්පත සම්මත කර ගන්නවා. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට තවතවත් බලතල, ශක්තිය ලැබෙනවා, අල්ලස, දූෂණය තුරන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන්න.

අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ කළේ මොකක්ද? සාමාන්‍යයෙන් ලෝකයේ පිළිගන්නා දෙයක් තමයි, විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ විශේෂඥයන් ලොව පුරා කරන ලද සමීක්ෂණවලින් අනාවරණ කර ගත්තු දෙයක් තමයි, යම් රටක අල්ලස, දූෂණය තුරන් කරනවා නම්, ඒ රටේ සමස්ත අය වැයෙන් අඩුම ගණනේ දශම එකක් ඒ ආයතනවලට වෙන් වෙන්න ඕනෑ කියන එක. අපේ රටේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට 2024 අවුරුද්දේ වෙන් වෙලා තිබුණේ, සමස්ත අය වැයෙන් ප්‍රතිශතයක් විධියට 0.0075 යි. 2025 අවුරුද්දේ අපි ඒක වැඩි කළා. 2025 වනකොට සියයට 0.155ක් දක්වා ඒ ප්‍රතිපාදනය වැඩි කරනවා. 2026දී ඒක තවත් වැඩි කරනවා. ඒ අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ, අදාළ අල්ලස් චෝදනා විමර්ශනය කරන ආයතනවලට ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණය සමස්ත අය වැයෙන් 0.234ක් දක්වා වැඩි කර තිබෙනවා. ඇත්තටම ඒකත් ප්‍රමාණවත් නැහැ. හැබැයි, ක්‍රමිකව අපි අර ප්‍රශස්ත මට්ටම දක්වා ඒ වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණය වැඩි කරන්න අවශ්‍ය කටයුතු ඉටු කර දී තිබෙනවා.

ඊට පසු දිස්ත්‍රික් මට්ටමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ශාඛා පිහිටුවන්න අවශ්‍ය කටයුතුත් අපි සකස් කර තිබෙනවා. ඒ යටතේ අලුතින් නිලධාරින් 967ක් බඳවාගන්න අපි කටයුතු කරනවා. ඒ අනුව හැම දිස්ත්‍රික්කයකටම විමර්ශන නිලධාරියෙක්, නීති නිලධාරියෙක් සහ නිවාරණ නිලධාරියෙක් පත් කරන්න අවශ්‍ය කටයුතු මේ වනකොට සිදු වෙමින් පවතිනවා. මේ ආකාරයට අල්ලසට විරුද්ධව කටයුතු කරන්න තිබෙන පනත ශක්තිමත් කරනවා වාගේම, ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනවලට ස්වාධීනව අදාළ කාර්යය ඉෂ්ට කරන්න අවශ්‍ය ශක්තිය ජාතික ජන බලවේගය ආණ්ඩුව ලබා දෙමින් තිබෙනවා.

අද සමහරු කිව්වා නේ, යහ පාලන ආණ්ඩුව කාලයේදී තමයි මේ ඔක්කෝම කළේ කියලා. පුළුවන් නම් කියන්න, යහ පාලන ආණ්ඩුව කාලයේ සිර දඬුවම් ලබා දීපු දේශපාලකයෙකුගේ නමක්, ඉහළ රාජ්‍ය නිලධාරියෙකුගේ නමක්. කවදාවත් එහෙම කියන්න බැහැ. හැබැයි, අර රෝයල් පාර්ක් එකේ මිනී මැරුම කරලා ඒකට වරදකාරයා වෙච්ච ධනවතාට නිදහස, එහෙම නැත්නම් සමාව ලබා දුන්නේ ඔය කියපු යහ පාලන ආණ්ඩුව කාලයේදී තමයි.

[ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා]

ඒ වාගේම අධිකරණයට අපහාස කළාට කමක් නැහැ කියන පූර්වාදර්ශය දුන්නේත් යහ පාලන ආණ්ඩුව කාලයේදීයි. ඔය කියන හාමුදුරුවන්ට දඬුවම් නියම වුණේ අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව යටතේයි. උන්වහන්සේට සමාව ලබා දෙන්න කියන එකෙන් කියන්නේ, කමක් නැහැ, ප්‍රශ්නයක් නැහැ, අධිකරණයට අපහාස කරන්න කියන පණිවුඩයයි. ඒක කළේ යහ පාලන ආණ්ඩුව කාලයේදීයි. හැබැයි, පුද්ගලයෙක් නම් කරලා කියන්න, මෙන්න මේ දේශපාලකයාට, මෙන්න මේ ධනවතාට, මෙන්න මේ ඉහළ රාජ්‍ය නිලධාරියාට අපේ කාලය යටතේ සිර දඬුවම් ක්‍රියාත්මක වුණා කියලා. එහෙම කියන්න හැකියාවක් නැහැ.

දැන් අපි මොනවාද කරලා තිබෙන්නේ? අපි කිසිම වෙලාවක කාටවත් දඬුවම් දෙන්න මැදිහත් වෙලා නැහැ, විමර්ශන කරන්න මැදිහත් වෙලා නැහැ. අපි චෝදනා, අධි චෝදනා පත්‍ර ගොනු කරන්න මැදිහත් වෙලා නැහැ. හැබැයි, අපි විමර්ශන නිලධාරීන්ට තමන්ගේ විමර්ශන ස්වාධීනව කරන්න අවස්ථාව දීලා තිබෙනවා. චෝදනා, අධි චෝදනා පත්‍ර ස්වාධීනව ගොනු කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. අපි දන්නවා, පසුගිය කාලයේ ගොනු කරපු සමහර අධි චෝදනා පත්‍රවල අත්සන් නැති නිසා, එක් අත්සනක අඩුවක් නිසා නඩුව withdraw කරගත්තා, එහෙම නැත්නම් නඩුව ආපසු කැඳවා ගත්තා කියලා. හැබැයි, ඒ නඩු නැවත පැවරුවේ නැහැ. ඒ, යහ පාලන කාලයේදීයි. හැබැයි, අපි කිසිදු අඩුපාඩුවකින් තොරව, අදාළ චෝදනා, අධි චෝදනා පත්‍ර ගොනු කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. කිසිම බාධාවකින් තොරව අධිකරණයට තමන්ගේ ස්වාධීන තීරණ ලබා දීමේ අවස්ථාව අපි ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අදාළ දඬුවම් ක්‍රියාත්මක කරන ආයතනවලට කිසිදු බාධාවකින් තොරව ඒ දඬුවම් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව අපි සලසා දී තිබෙනවා. ඒ ආයතන සියල්ල දැන් ස්වාධීනව වැඩ කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි, ඉස්සර හාල්මැස්සෝ විතරක් අහුවුණා කියන අල්ලස් දැලට දැන් තෝරු, මෝරු අහුවෙන්න පටන් අරගෙන තිබෙන්නේ.

අපි දන්නවා, 2024 ඉඳලා 2026 ඔක්තෝබර් වෙනකල් අල්ලසට විරුද්ධව කටයුතු කරන්න තිබෙන මේ පනත යටතේ 237දෙනෙකුට විරුද්ධව විමර්ශන ක්‍රියාත්මක කරලා අත්අඩංගුවට අරගෙන තිබෙන බව. මම හිතන්නේ, ඊයේ අත්අඩංගුවට ගත් කෙනා මේ list එකේ නැහැ. හැබැයි, මේ 237දෙනාගෙන් හාල්මැස්සෝ ඉන්නේ අතළොස්සක් විතරයි. අහුවෙලා ඉන්න අනෙක් සියලුදෙනා තෝරු, මෝරු. ඒ නිසා අපි විශ්වාස කරනවා, යහ පාලන රජයට වඩා හොඳ රජයක් ජාතික ජන බලවේගයේ අපි ගොඩනඟා තිබෙනවා කියලා. ඒ වාගේම අදාළ විමර්ශන ආයතනවලට, අධිකරණයට, දඬුවම් ක්‍රියාත්මක කරන ආයතනවලට ස්වාධීනව තමන්ගේ කටයුතු කිරීමේ අවස්ථාවත් අපි ලබා දී තිබෙනවා.

අද දවසේ අපි කථා කරන සංශෝධනයෙන් අපෙන් ජනතාව ඉල්ලපු ප්‍රධාන කාරණයක් ඉෂ්ට වනවා. ඒ තමයි, අල්ලස් ගත්ත අයට දඬුවම් දෙනවා වාගේම අල්ලස්වලින් හම්බ කරගත් දේවලුත් ආපසු ලබා දෙන්න කියන කාරණය.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
තත්පර 30ක් දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)
එතකොට මේ පනත යටතේ අපට අවස්ථාව ලැබෙනවා, යම් කෙනෙකු අල්ලසකින්, දූෂණයකින් යම් ප්‍රතිපාදනයක් ලබා ගත්තා නම්, එහෙම නැත්නම්, යම් වරප්‍රසාදයක් ලබා ගත්තා නම්, ඒ ලබා ගත්ත දේ, ඒ වරප්‍රසාදය නැවත ජනතාවට ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂ නායක, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

[අ.භා. 3.01]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ කරුණු කිහිපයක් පිළිබඳව ඉතාම කෙටියෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. එතුමිය අපට චෝදනා කළා, බොරු කියනවා කියලා. ඒ වාගේම එතුමිය ප්‍රකාශ කළා, ඩීල් දේශපාලනයක් ක්‍රියාත්මක වනවා කියලා. මම අහන්න කැමැතියි, එතුමිය, ගරු ජනාධිපතිතුමා, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණ ජනතාව එක්ක ඇති කරගත් සමාජ ගිවිසුම - social contract එක - ගැන. ජනාධිපතිකමත් ලැබුණා, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයත් ලැබුණා, පළාත් පාලන ආයතන බහුතරයක බලයත් ලැබුණා. එතකොට ලක්ෂ 220ක් වූ ජනතාවට තමන් පොරොන්දු වූ ඒ සමාජ ගිවිසුම, ඒ ඩීල් එක ක්‍රියාත්මක කර තිබෙනවාද?

සියයට 33කින් විදුලි බිල අඩු කරනවා කිව්වා. ඒ සමාජ ගිවිසුම ක්‍රියාත්මක කළාද? උපාධිධාරීන් 80,000ක් අද මහ පාරේ, රැකියා නැතිව. ඒ අයට රැකියා ලබා දෙනවා කියපු ඩීල් එක ක්‍රියාත්මක කළාද? ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු මුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේම පවතින වැටුප් විෂමතා ප්‍රශ්නය විසඳනවා කිව්වා. ගුරුවරුන්ට විශේෂයෙන්ම කිව්වා, ඉතුරු තුනෙන් දෙකත් ලබා දෙනවා කියලා. එහෙම කියලා නේ මහ පාරේ පෙළපාළි ආවේ. ඒ අයගේ පොරොන්දු මාලාව ඉටු කර තිබෙනවාද? ගුරු සංවර්ධන නිලධාරීන්ට ස්ථිර පත්වීම් ටික ලබා දීලා තිබෙනවාද? ඒ ගිවිසුම ක්‍රියාත්මක කළාද? ඒවා ඉටු නොකිරීම බොරුවක් නොවෙයිද? කවුද එහෙනම් බොරු කරන්නේ? වරායේ ගොඩබාන මිලට තෙල් ටික ලබා දෙනවා කිව්වා, බදු ඔක්කෝම ඉවත් කරනවා කිව්වා. නිලධාරීන්ට, ඇමතිට යන කොමිස් මුදල් ඔක්කෝම ඉවත් කරනවා කිව්වා. මහා භාණ්ඩාගාරයට ගෙවන මුදල් ඉවත් කරනවා කිව්වා. දැන් ඒක කරනවාද? ඒ සමාජ ගිවිසුම ක්‍රියාත්මක කරනවාද? කවුද එහෙනම් බොරු කරන්නේ?

කුඹුරට බැහැලා ගොයම් කමින් කිව්වා, වී කිලෝවකට රුපියල් 150ක් දෙනවා කියලා. ජනතාවට දුන් ඒ පොරොන්දු ඉටු කරනවාද? කවුද ඒ බොරුව කරන්නේ? අද අර්තාපල් ගොවියා අනාථයි. ඒ අයට කිව්වා, ඒ අයගේ නිෂ්පාදනවලට නිසි මිලක් ලබා දෙනවා කියලා. දැන් ඒ පොරොන්දුව ඉටු කරනවාද? කවුද බොරුව කරන්නේ?

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් ගොඩ නඟනවා කිව්වා. පරාටේ නීතිය හරහා අද ඒ අය පෝලිමට අරගෙන ගිහිල්ලා ඔවුන් අමාරුවෙන් උපයා ගත් දේපළ වෙන්දේසි කරනවා. කෝ, ඒ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් නංවාලනවා කිව්ව පොරොන්දුව ඉෂ්ට කිරීම? කෝ, ඒ ඩීල් එක? මොකක්ද, ඒ ඩීල් එකට වුණේ? එතැනත් කරන්නේ බොරුව නේද, ගරු අගමැතිතුමියනි?

බඩු මිල අඩු කරනවා කිව්වා. අද බඩු මිල අහස උසට නැඟලා. බදු බර අඩු කරනවා කිව්වා. අද හැමදෙනාටම අසීමිත, අසාධාරණ බදු බරක් පටවලා තිබෙනවා. කෝ, බදු බර අඩු කරනවා කියපු ඩීල් එක? ඒක ක්‍රියාත්මක කරන්නේ නැද්ද? ඒක ක්‍රියාත්මක නොකිරීම බොරුවක් නොවෙයිද? පාසල් උපකරණවලට ගහන VAT එක අයින් කරනවා කිව්වා, ඒක ඉෂ්ට කළේත් නැහැ.

ඒ වාගේම තොරතුරු තාක්ෂණය ඇතුළු සේවා අපනයන ක්ෂේත්‍රයෙන් උපයන ආදායමට බදු ගැහුවා. ඒවා ඉවත් කිරීම මැතිවරණවලදී වුණු පොරොන්දු නොවෙයිද? මම දැක්කා, ගරු අගමැතිතුමිය පසුගිය දිනවල පැවති ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට ගිහින් තිබුණා. ඒක බොහොම හොඳයි. විරුද්ධ පක්ෂයේ ඉන්නකොට එතුමියලා ඒ පොත් ප්‍රදර්ශනයට ගිහින් කිව්වේ මොකක්ද? මුද්‍රණ ක්ෂේත්‍රයට, පොත්පත් ක්ෂේත්‍රයට ගහන VAT එක අයින් කරනවා කිව්වා. දැන් ඒ ඩීල් එක ක්‍රියාත්මක කළාද? ඒ යුතුකම ඉෂ්ට කළාද? ඒක ඉෂ්ට නොකිරීම බොරුවක් නොවෙයිද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඔබතුමියගේ අවධානය යොමු කරනවා, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයට, ඒ ගැනත් කථා කළානේ. ඒකේ තිබෙනවා, IMF එකත් එක්ක ගහපු ණය තිරසරකරණ ගිවිසුම - Debt Sustainability Agreement එක - වෙනස් කරනවා කියලා. ඒක වෙනස් කළාද? තිබුණු ආණ්ඩුවටත් වැඩිය ඉතාම ඉහළින් IMF ගිවිසුම ක්‍රියාත්මක කරනවා. ඇත්තවශයෙන්ම මේ රජය නව ලිබරල්වාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් මේ රට විනාශ මුඛය කරා ගෙන යනවා.

අද මට සුනිත්‍ය බලශක්තිය පිළිබඳව ප්‍රශ්න කරන්නට ඇමතිතුමා ඉඩ දුන්නේ නැහැ. එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොරු වට්ටෝරුවක් කිව්වා. විපක්ෂයේ ඉන්නකොට කිව්වේ පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කරනවා කියලායි. අද ආණ්ඩු බලයට ඇවිල්ලා මොකක්ද කරන්නේ? තාප බලාගාර, ඉන්ධන බලාගාර මාෆියාව ශක්තිමත් කරනවා.

අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි මැතිතුමා ප්‍රකාශ කළා, විපක්ෂයට වේදනාවක් දැනෙනවා කියලා. ඔව්, අපට ලොකු වේදනාවක් දැනෙනවා. මොකද, ජනාධිපතිතුමා, අගමැතිතුමිය ප්‍රමුඛ ආණ්ඩුව ලක්ෂ 220ට කරපු බොරුව ගැන වේදනාවක් තිබෙනවා, රවට්ටපු එක ගැන වේදනාවක් තිබෙනවා, අන්දවපු එක ගැන වේදනාවක් තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඔබ පොරොන්දු වුණු "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති මාලාව දැන්වත් ක්‍රියාත්මක කරන්න. බොරුව ගැන කථා කරනවා නම් කැඩපත ඉදිරිපිටට ගියාම බොරු කරන්නේ කවුද කියන එක ගැන ඔබටත් හොඳ වටහා ගැනීමක් ලබා ගන්න පුළුවන්.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.08]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ විවාදයට සම්බන්ධ වෙලා විපක්ෂ නායකතුමා කියපු කාරණාව මාතෘකාවෙන් පිට කාරණාවක් වුණත්, මම එතුමාට උත්තරයක් දෙන්න ඕනෑ. අපේ සමාජ ගිවිසුම ගැන තමයි විපක්ෂ නායකතුමා කථා කළේ. අපේ සමාජ ගිවිසුම මොකක්ද, ජනතාවගේ mandate එක. අපි ඒ mandate එකට අනුව කටයුතු කරන්නේ නැහැයි කියන විවේචනය තමයි විපක්ෂ නායකතුමා කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි වර්ෂ දෙකක් යනකොට මීට පෙර කවදාවත් මේ රටේ පැවති ආණ්ඩු නොකළ තත්ත්වයක් ඇති කළා. සාමාන්‍යයෙන් ඕනෑම රජයක් පත් වුණාට පස්සේ ඒ රජයේ ජනප්‍රියත්වය අඩු වනවා. හැබැයි අපේ ජනාධිපතිතුමා තීරණය කළා, වර්ෂ දෙකක් යනකොට mandate එකට අපි මොනවාද කරලා තිබෙන්නේ කියන කාරණාව හරියටම සාකච්ඡා කළ යුතුයි කියලා. ඒ අනුව තමයි අපි mandate එකට ආමන්ත්‍රණය කරගෙන යන්නේ.

අපි දීපු පොරොන්දු ඉෂ්ට කළේ නැහැයි කියලා තමයි විපක්ෂ නායකතුමා කියන්නේ. විශේෂයෙන්ම අපේ රැකියා පොරොන්දුව අපි ඉෂ්ට කළේ නැහැ කියලා තමයි එතුමා කියන්නේ. මම එක කාරණයක් කියන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එතුමා කියන ප්‍රතිපත්තියට නම් අපිට රස්සා දෙන්න බැහැ. හම්බන්තොට, වීරවිල සියඹලා ගහක් යට කොට කලිසමක් ඇඳගෙන කකුල වන වනා ඉඳගෙන උපාධිධාරීන් පෝලිමේ ඉන්නකොට මොකක්ද කිව්වේ? "පොඩ්ඩක් අයින් වෙන්න, අයින් වෙන්න. මට හුළං වදින්න" කියලා කිව්වා. මොකක්ද තව කිව්වේ? "උස නම් සිකියුරිටි - මිටි නම් කම්කරු". ඒ විධියට තමයි රැකියා දෙනවා කිව්වේ. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ ප්‍රතිපත්තියට අපි නම් රස්සා දෙන්නේ නැහැ. අනේ විපක්ෂ නායකතුමනි, සභාවෙන් යන්න එපා. තව කාරණා ටිකක් කියන්න තිබෙනවා. ඒවාත් අහගෙන යන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. නැහැ. යන්නේ නැහැ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුජිබුර් රහුමාන් මැතිතුමා point of Order එකක් අරගෙන කිව්වා, එතුමා බොරුවක් කිව්වා කියලා ගරු අග්‍රාමාත්‍යතුමිය කිව්වාය කියලා. එතුමා පට්ට බොරුවක් කිව්වේ. එතුමා කියනවා, අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලාලු, මේ සංශෝධනය ඇතුළේ රජයේ සේවකයෝ, දේශපාලනඥයන් සම්බන්ධයෙන් තිබෙන යෝජනාව අයින් කර ගත්තේ. ඒ කියන්නේ, මේ පනතෙන් ඒ දේ බැහැර කර ගත්තේ අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලාලු. ඒක මොන පට්ට බොරුවක්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? එතුමාට වේදනාවක් දැනිලා point of Order එකක් අරගෙන නැඟිට්ටා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉස්සාගේ ඔළුවේ මොනවාද තියාගෙන "මම සුදනා. මම සුදනා" කියන්නා වාගේ, තමන්ට වේදනාවක්

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

එනකොට තමන් කරපු බොරුව මොකක්ද කියලා තමන් දන්නවා. ඒ නිසා, මේ කියන දේවල් සම්බන්ධව කරුණු කාරණා ප්‍රමාණයක් කියන්න මම ලැහැස්ති වෙලා ආවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් මෙතැන මාර පොරයක් තිබෙනවා, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට අයිතිකාරයෝ වෙන්න. අපි තමයි අයිතිකාරයෝ, ඒ පනත යටතේ නඩු පැවරුවේ අපියි කියන්න උත්සාහ කරනවා. මම කියා දෙන්නම්, මේක වුණේ කොහොමද කියලා. මේක වුණේ කොහොමද දන්නවාද? මේ පනත ආරම්භ වුණේ 2004 අවුරුද්දේ ඉඳලා, 2004 අවුරුද්දේ අපි එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියට අත්සන් කිරීමට ඇති වන බැඳීමට අනුව. ඒ කියන්නේ මේ සංශෝධනයේ මුල, මේ සංශෝධනයේ අවශ්‍යතාව එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තිය දක්වා දිවෙන අවශ්‍යතාවක්. 2004 අවුරුද්දේ ඉඳන් තමයි ලංකාව මේකට බැඳිලා තිබෙන්නේ.

ඔබතුමියට මම මේ කාරණයත් මතක් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. 2004දී එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියට අත්සන් කරමින් මේ කාර්යය ආරම්භ කරපු රජය කියන්නේ, 2004 අප්‍රේල් 02වැනි දා තිබුණු මැතිවරණයෙන් පත් වුණු රජය. ඒ කියන්නේ, චන්ද්‍රිකා බණ්ඩාරනායක රජය. ඒ රජයේ දෙවන බලවත්ම කණ්ඩායම වුණේ ආසන 39ක් දිනා ගත් ජනතා විමුක්ති පෙරමුණ. ඒ, අපි නිල වශයෙන් රජයක පාර්ශ්වකරුවන් වූ පළමු අවස්ථාව. වර්තමාන ජනාධිපතිතුමා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ධුරය දරපු රජය. ඒ නිසා අපිට - මේ රජයට - අත්හැරිය නොහැකි වගකීමක්, බැඳීමක් තිබෙනවා, මේ දූෂණ විරෝධී පනතට අවශ්‍ය උපරිම සහාය ලබා දෙන්න. ඒක තමයි ඉතිහාසය, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ අනුව පනතේ 26වන වගන්තිය යටතේ අපි මේ ආයතනය ස්වාධීන කළා. ස්වාධීන කාර්ය මණ්ඩලයක් ඉන්නවා. අරමුදල් සමස්තය ස්වාධීන කළා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මෙන්න මේ ස්වාධීන කිරීම යටතේ තමයි අද මේ ප්‍රතිඵල නෙළා ගෙන යන්නේ. ඒ නිසා අපේ කාලයේ තමයි නඩු දැම්මේ. ප්‍රියන්ත විජේරත්න මන්ත්‍රීවරයා කියනවා මම දැක්කා, නඩු දාලා වරදකාරයෝ කරපු එක්කෙනෙක් කියන්න කියලා. අපි ඒ ගැන කියන්නම්. අපේ ආණ්ඩුව ආවාට පස්සේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නඩුවල විතරක් තිබෙන නම් වගයක් අපේ ගරු බිමල් රත්නායක අමාත්‍යවරයා කිව්වා. ඒ නම්වලට අමතරව මම සංඛ්‍යාලේඛනයක් කියන්නම්. 2024 ඔක්තෝබර් සිට 2026 ඔක්තෝබර් දක්වා කාලය තුළ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මඟින් පවරන ලද නඩුවලට අදාළව හිටපු කැබිනට් අමාත්‍යවරුන් 16දෙනෙක් වරදකරුවන් වෙලා තිබෙනවා. හිටපු රාජ්‍ය අමාත්‍යවරුන් තුන්දෙනෙක් වරදකරුවන් වෙලා ඉන්නවා. හිටපු මහ ඇමති කෙනෙක් වරදකරු වෙලා ඉන්නවා. අමාත්‍යවරු වාගේම අමාත්‍ය බිරින්දෑවරුත් අල්ලස් අරගෙන තිබෙනවා. අමාත්‍ය බිරින්දෑවරු හතරදෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. අමාත්‍යවරුන්ගේ දරුවෝ හත්දෙනෙක් අත්අඩංගුවට අරගෙන ඉන්නවා. ඊළඟට, ප්‍රාදේශීය සභා සභාපතිවරු සහ නගර සභාවල සභාපතිවරු හයදෙනෙක් අත්අඩංගුවට අරගෙන ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අමාත්‍යවරයාත් හොරකම් කරලා, බිරිඳත් හොරකම් කරලා, ඒවාට දරුවොත් හවුල් වෙලා. මේ ලේඛනයේ තිබෙනවා, රියැදුරාටත් බලපෑම් කරලා රියැදුරාත් අල්ලස් අරගෙන තිබෙන බව. ඒ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. හැබැයි, දැන් මෙතැන කියනවා, අපි තමයිලු, මේවායේ අයිතිකාරයෝ, අපි තමයිලු, නඩු දැම්මේ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පනත් සම්මත කළ හැටි මම කියන්නම්. ඒ ගැන අග්‍රාමාත්‍යතුමියත් යම් කරුණු ප්‍රමාණයක් කිව්වා.

එදා දූෂණ විරෝධී පනත සම්මත කරලා යට ගැහුවා. ඇයි, එහෙම යට ගැහුවේ? ඒ යට ගහපු කාරණය මම කියන්නම්. ඒ මොකක්ද? දූෂණ විරෝධී පනත 2023දී ලහි ලහියේ සම්මත කර ගත්තා, විජයදාස රාජපක්ෂට ඕනෑ විධියට කොමිසමක් පත් කර ගන්න. කොමිසම පත් කරගෙන මොකක්ද කළේ? කොමිසම පත් කර ගැනීමේ ඒ හදිසිය, සද්භාවීය හදිසියක් කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ. මොකද, විජයදාසගේ ඒ හදිසිය ඇතුළේ තිබුණේ, තිබුණු කොමිසම වෙනුවට ඔහුට අවශ්‍ය නව කොමිසමක් පත් කර ගැනීම. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කාරණය කියන්න කනගාටුයි. කොමිසමේ ලිපි ගොනු ගණනාවක් අතුරුදහන් වෙන්නේ මේ විධියට හදිසියේ පත් කළ කොමිසම යටතේයි. ඒ සමහර ලිපි ගොනු අතිශය තීරණාත්මක ගනුදෙනු, අතිශය සංවේදී ගනුදෙනු, දේශපාලන බලවතුන් ගැන කියැවෙන ලිපි ගොනු. එය පුනස්ථාපනය කරන්න කොමිසමට අමතර වෙහෙසක් ගන්න සිද්ධ වෙලා තිබෙනවා. දැන් දූෂණ විරෝධී පනතට උප්පැන්න ලියන්න උත්සාහ කරන සමහරුන් ඇත්තටම උත්සාහ කරලා තිබෙන්නේ කොමිසම තමන්ගේ අතේ තබා ගැනීම මිසක් කොමිසම ස්වාධීන කරන්න නොවෙයි. ඔන්න, ඔයගොල්ලන් එදා පත් කළ කොමිසම. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2023දී දූෂණ විරෝධී පනත සම්මත කරගෙන තිබුණාට, ඒකට හපන්න දත් තිබුණේ නැහැ. ඒක තේරුණාද? වත්මන් ආණ්ඩුවෙන් තමයි නිසි guidelines දීලා, නිසි විධියට කාර්ය මණ්ඩලය බඳවාගෙන, කොමිසමට අවශ්‍ය බලතල දුන්නේ. ඒ ඔක්කෝම පැත්තකින් තියන්න. වත්මන් ආණ්ඩුව ආයතනවලට ස්වාධීනත්වය දීම තුළ තමයි මෙම කොමිසම ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

දැන් මොකද වෙන්නේ? මීට මොහොතකට කලින් කථා කළ රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් එන්න කිව්වා. එතුමා ඒක මඟ හැරියා. සතෙක් කෑවා කිව්වා. ඒ මොන සතාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නයා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
නයා කෑවා කිව්වා. හැබැයි, අල්ලස හා දූෂණයට එරෙහිව අද එතුමා කථාවකුත් කරලා ගියා. මේ මොන විහිළුවක්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? කියන්නේ එකක්, කෙරුවාව තව එකක්. ඒවා සම්බන්ධයෙන් අපට ඕනෑ තරම් - ඇති පදමට - කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්. ලංකාවේ අපරාධ නීතියටත් හයියක් ඇවිල්ලා තිබෙන්නේ දැන් තමයි. අපි දන්නවා, අපරාධ නීතියට අනුව, ඕනෑම වරදක් කරන්න අදහසක් තිබෙන්න ඕනෑ, වරද කරලා තිබෙන්න ඕනෑ කියන එක. අපි එයට කියනවා, *actus*

*reus* සහ *mens rea* කියලා. ඒ දෙක ඒක රාශි වීමෙන් තමයි අපරාධයක් සංස්ථාපනය වන්නේ. හැබැයි, අපරාධය සංස්ථාපනය වෙලා තිබුණා. පහුගිය ආණ්ඩුවල විමර්ශන ආයතනවලින් එය යට ගැහුවා. අපරාධය සංස්ථාපනය වෙලා තිබුණා. නීතිය ක්‍රියාත්මක කරන ආයතන පක්ෂපාතී වීම නිසා ඒවා යට ගියා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් තමයි අධිකරණය කෙළින් වැඩ කරන්නේ. දැන් තමයි නීතිපති දෙපාර්තමේන්තුව කෙළින් වැඩ කරන්නේ. දැන් තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කෙළින් වැඩ කරන්නේ. දැන් තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කෙළින් වැඩ කරන්නේ. නීතිය ක්‍රියාත්මක කරන ආයතන කෙළින් වැඩ කිරීම තුළ 2024 ඔක්තෝබර් මාසයේ ඉඳලා මේ දක්වා 226දෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ අයගෙන් 55දෙනෙක් දේශපාලනඥයෝ; මම අර කලින් කියපු වාර්තා අනුව 55දෙනෙක් දේශපාලනඥයෝ.

අපි අත්අඩංගුවට ගත්තේ හාල්මැස්සෝ නොවෙයි. ඔබතුමන්ලා වාගේ මෝරු තමයි අපි අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ. කලින් ආණ්ඩුව හාල්මැස්සෝ අත්අඩංගුවට ගනිමින් හිටියා. දැන් තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා අපි ඔවුන්ට යටිතල පහසුකම් ඇතුළු අවශ්‍ය පහසුකම් ලබා දීලා, මෙම පරීක්ෂණ කටයුතු නතර නොකර ඉදිරියටම කරගෙන යනවාය කියන ප්‍රතිඥාව ලබා දෙනවා. ඒක තමයි ජනතා ගිවිසුම. ඒකට තමයි mandate එක ලැබුණේ. අපි මේ රටේ ජනතාව ලබා දුන් mandate එක අනුව කටයුතු කරන ආණ්ඩුවක්ය කියන එක මේ වෙලාවේ මතක් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[பி.ப. 3.20]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த உலகத்தில் ஊழல் அல்லது இலஞ்சம் என்பது புற்றுநோயைப் போன்றது. காசு கொடுப்பதும் காசு வாங்குவதும் மட்டும் ஊழல் அல்ல. எத்தனையோ விதமான ஊழல்கள் நடக்கின்றன; துஷ்பிரயோகங்கள் நடக்கின்றன. ஆகவே, அவற்றுக்கு எல்லாம் முற்றுப்புள்ளி வைக்க ஒரு பிரேரணையை நாங்கள் முன்வைக்க வேண்டும். இந்த அரசாங்கம் - அரசியல்வாதிகளாக இருந்தாலும், அதிகாரி களாக இருந்தாலும் - இப்பொழுது தனது வேலையைச் சரியாகச் செய்துகொண்டு வருகின்றதை எங்களால் பார்க்கக்கூடியதாக இருக்கின்றது. இருந்தாலும்கூட, ஒரு சமுதாயத்தின் எதிர்பார்ப்புகளை மழுங்கடிப்பதும், அதை இல்லாமல் செய்வதும், ஒரு வகையான ஊழல் என்றுதான் செல்லலாம். ஒரு சமுதாயத்துக்குக் கிடைக்க வேண்டியவை கிடைக்காமல் போவதும் ஊழல்தான். இன்று பாடசாலைக்குப் போனால் அங்கேயும் இலஞ்சம் வழங்க வேண்டி இருக்கின்றது. பொலிஸ் நிலையத்துக்குப் போனால் அங்கேயும் இலஞ்சம் கொடுக்க வேண்டி இருக்கின்றது. அரச அதிகாரிகளிடம் போனால் அங்கேயும் இலஞ்சம் கொடுக்க வேண்டி இருக்கின்றது.

உங்களுக்கு நன்றாகத் தெரியும், அண்மையில் நோர்வூட், மஸ்கெலியா பகுதிகளில் 'அஸ்வெசும' கொடுப்பனவுகளில் பல ஊழல்கள் நடந்திருக்கின்றன; பலர் இலஞ்சம் வாங்கி இருக்கின்றார்கள். இந்த மாதிரியான விஷயங்களை நிறுத்து வதற்கு நடவடிக்கை எடுக்க வேண்டியது அரசாங்கத்தினுடைய பொறுப்பாகும். இன்று அரசாங்கம் அதனைச் செய்து வருகின்றது; இல்லையென்று சொல்லி மறுப்பதற்கு நாங்கள் தயாரில்லை. அதேநேரத்தில், ஒரு முதலாளி தொழிலாளி ஒருவரது சம்பளத்தை முறையாகக் கொடுத்தால் அவர் இலஞ்சம் வாங்க வேண்டிய அவசியமில்லை.

ஒரு மனுஷனுக்குப் பணம் என்பது தேவை; இல்லை யென்று சொல்லவில்லை. ஆனால், அதற்காக அதிகமான பணத்தைச் சம்பாதித்து இன்றைக்கு என்ன பிரயோசனம்? அதனை அனுபவிக்க முடியுமா? இன்றைக்கு அனுபவிக்க முடியவில்லை. ஆகவே, அந்த மாதிரியான விஷயங்களை ஒழிக்க வேண்டுமென்பது எங்களுடைய கருத்தாக இருக்கின்றது. துஷ்பிரயோகம் என்பது ஓர் அதிகாரி தனக்கு இருக்கின்ற power - அதிகாரத்தை - வைத்துக்கொண்டு சாதாரணமானவர்களை மிதித்துக்கொள்வது அல்லது அவர்களுக்கு அழுத்தத்தைக் கொடுப்பதுவும் ஒரு வகையான இலஞ்சம்தான். ஆகவே, இதனைத் திருத்திக்கொள்வதற்கான நடவடிக்கை எடுக்கப்பட வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இற்றைக்கு 100-200 வருடங்களுக்கு முன்பு பெருந் தோட்டங்களுக்கு வந்த மக்கள் அங்கு மரக்கறித் தோட்டம் செய்ய அந்தக் காலத்திலிருந்த management அனுமதி கொடுத்து இருக்கிறது. அந்தக் காணியில் வீடு கட்டுவதற்கு அனுமதி மறுக்கப்படுகின்றது. அதன் காரணமாகத்தான் தோட்டங்களில் பிரச்சினை ஏற்படுகின்றது.

இந்தப் பிரச்சினையைத் தீர்க்க வேண்டுமானால், அவரவர் அனுபவித்து வந்த தோட்டங்களில் - தமது சொந்தத் தோட்டம் என்று சொல்ல முடியாது - வீடு கட்டுவதற்கு அனுமதியைக் கொடுக்க வேண்டும். இன்று அவர்களுக்கு மின்சார -

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා ]

electricity - இணைப்பையோ, நீர் இணைப்பையோ பெற்றுக் கொள்ள முடியாது. ஆகவே, தோட்ட மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கான நடவடிக்கை எடுக்கப்பட வேண்டும். ஹட்டன் பிரகடனத்தை நாட்டிலே அமுல்படுத்த வேண்டுமென்று நாங்கள் மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் அன்பாகக் கேட்டுக் கொள்கிறோம். ஏனென்றால், ஹட்டன் பிரகடனத்தில் சொன்ன விடயங்கள் அத்தனையும் இந்த நாட்டிலே நடந்துவிட்டால், பெருந்தோட்ட மக்களுக்கும் சரி, இந்த நாட்டு மக்களுக்கும் சரி பிரச்சினை இருக்கவே முடியாது. ஆகவே, அதைச் செய்ய வேண்டுமென்று கேட்டு, என்னுடைய பேச்சை நிறைவுசெய்கின்றேன். நன்றி.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු මුනීර් මුලෆ්ෆර් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.24]

**ගරු මුනීර් මුලෆ්ෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு முனீர் முலபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைய தினம் ஊழலுக்கு எதிரான இந்தப் பிரேரணைமீதான விவாதத்திலே கலந்துகொள்ள சந்தர்ப்பம் கிடைத்ததையிட்டு சந்தோசமடைகின்றேன். மக்களின் நலனுக்காக நாட்டின் வளங்களை நேர்மையாகப் பயன்படுத்தும் நம்பிக்கையுடன் மக்கள் வாழ வழிவகை செய்யும் ஊழலற்ற ஒரு நாடு எம் அனைவருக்கும் அத்தியாவசியமானதாகும். இந்த உயரிய அவையிலே எதிர்க்கட்சித் தலைவர் உட்பட பலர் எமது அரசாங்கம் சம்பந்தமான பல்வேறுபட்ட கேள்விகளை எழுப்பினார்கள். குறிப்பாக, தேர்தல் விஞ்ஞாபனத்தில் வழங்கப்பட்ட வாக்குறுதிகளை எமது அரசாங்கம் நிறைவேற்றவில்லை என்ற தோரணையில் பலர் பல்வேறு விடயங்களைக் குறிப்பிட்டார்கள். ஆனால், 2015இல் ஊழலற்ற ஒரு நாட்டை அல்லது தேசத்தைக் கட்டியெழுப்புவதற்காக வாக்குகளைப் பெற்று ஆட்சிக்கு வந்த அந்த அரசாங்கத்தின்மீதும் பல்வேறுபட்ட ஊழல் குற்றச்சாட்டுகள் காணப்பட்டன.

எமது அரசாங்கம் பதவியேற்று 2 வருடங்கள் பூர்த்தியாகின்றபோது, நாட்டிலேயிருக்கின்ற எதிர்க்கட்சி உறுப்பினர்கள் மாத்திரமல்ல, சர்வதேச ரீதியாக இயங்கக்கூடிய நிறுவனத்தினர்கூட, இந்த அரசாங்கம் ஊழலை ஒழிப்பதற்காகப் பல்வேறுபட்ட முயற்சிகளை மேற்கொண்டு வருகின்றது என்பதை உணர்ந்திருக்கிறார்கள். CPI ஊடாக நாங்கள் அதனைப் பார்க்கின்றோம். அந்த அடிப்படையில், Transparency Internationalஉடைய அறிக்கையில் எமது நாடு ஊழல் தரப்படுத்தல் வரிசையிலே 2024ஆம் ஆண்டு 121வது இடத்தைப்பெற்று மிக அதலபாதாளத்திற்குத் தள்ளப்பட்டிருந்தது. இருந்தபோதிலும், இந்தக் குறுகிய 2 வருட காலத்திற்குள் எமது நாட்டை எம்மால் 14 இடங்கள் முன்னேற்றி 107வது இடத்திற்குக் கொண்டுவரக்கூடியதாக இருந்தது. எமது இந்த வேலைத்திட்டங்களை இத்தகைய சட்டதிட்டங்களின் ஊடாக நாம் செயற்படுத்தி, எதிர்காலத்தில் உலகில் ஊழலற்ற ஒரு தேசமாக எமது தேசத்தைக் கண்டிப்பாக நாங்கள் கொண்டுவருவோம் என்பதை இச்சந்தர்ப்பத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

அதேபோன்று, ஊழல் சார்ந்த விடயங்களுக்கு வழங்கப்படுகின்ற புள்ளிகள் அடிப்படையில் 2024இலே எமது நாடு 32 புள்ளிகளைப் பெற்றிருந்தது. ஆனால், 2025 ஆகின்றபோது 3 புள்ளிகள் அதிகமாகப் பெற்று 35ஐ அடையக் கூடியதாக இருந்தது. ஆனால், இந்த அரசாங்கம் நாட்டு மக்களுக்கு அளித்த வாக்குறுதிகளை நிறைவேற்றியதா? என்று கேட்கின்றார்கள். எப்போதுமே இந்த அரசாங்கம் பொய் கூறுகின்ற அரசாங்கம் என்று சொல்லி, அந்தப் பொய்யையும் இந்த எதிர்க்கட்சியினர் சொல்லிக்கொண்டு இருக்கிறார்கள். இந்த நாட்டில் ஊழல் ஒழிப்பு சம்பந்தமாகப் பல்வேறுபட்ட விடயங்களை அரசாங்கத்தால் மேற்கொள்ளக்கூடியதாக இருந்தது.

உண்மையிலே ஊழலற்ற நாடு ஏன் எமக்குத் தேவை என்பதற்குப் பல காரணங்கள் காணப்படுகின்றன. பொது நிதிகளைப் பாதுகாப்பதற்கான வழிவகையாக இத்தகைய சட்டதிட்டங்கள் அமைகின்றன. எமக்குத் தெரியும், கடந்த காலங்களிலே இந்த நாட்டுக்குக் கொண்டுவரப்பட்ட பல்வேறுபட்ட அபிவிருத்தித் திட்டங்கள் கிடைக்காமல் போனது. குறிப்பாக, இந்த நாட்டுக்கு அத்தியாவசியமாகத் தேவைப்பட்ட முக்கியமான சில அபிவிருத்தித் திட்டங்களைக் கூட எமது நாடு இழப்பதற்கு அடிப்படைக் காரணியாக அமைந்தது ஊழல் என்பது நாட்டிலுள்ள அனைவரும் மிகத் தெளிவாக அறிந்த விடயமாகும். கடந்த காலங்களில் ஓர் அபிவிருத்தித் திட்டத்திற்கென 100 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்குமாகவிருந்தால், அதில் வேலை நடப்பது வெறும் 30 மில்லியன் ரூபாய்க்குத்தான். மிகுதி 70 மில்லியன் ரூபாயும் பிழையான விடயங்களுக்கு - ஊழலாக இருக்கலாம் அல்லது வேறு விடயங்களுக்காக இருக்கலாம் - பயன்படுத்தப்பட்டதாக சர்வதேச அறிக்கைகளில் கருத்து வெளியிடப்பட்டு இருந்ததை நாம் அறிந்திருக்கின்றோம்.

அதுமாத்திரமல்ல, உலகில் அபிவிருத்தி அடைந்த நாடுகள் அல்லது அபிவிருத்தியை நோக்கி நகர்ந்துள்ள பல நாடுகளின் வரலாறுகளை நாங்கள் எடுத்து நோக்குகின்றபோது, எமக்கு சிங்கப்பூர்தான் ஞாபகத்திற்கு வருகின்றது. உதாரணமாக, இன்றைய ஆபிரிக்காவின் சிங்கப்பூராகக் குறிப்பிடக்கூடிய ருவண்டா போன்ற நாடுகளைக் குறிப்பிடலாம். அவர்கள் ஊழலற்ற ஒரு தேசமாக தங்களுடைய நாட்டைக் கட்டியெழுப்பி அபிவிருத்தியை நோக்கிக் கொண்டுசென்று இருக்கிறார்கள்.

இன்று எதிர்க்கட்சித் தலைவர் அவர்கள், இந்த அரசாங்கம் ஆட்சிக்கு வருவதற்கு முன்னர் தேர்தல் விஞ்ஞாபனத்தில் குறிப்பிட்ட பல்வேறு விடயங்களைச் சுட்டிக்காட்டி, அவற்றை நீங்கள் நிறைவேற்றி இருக்கின்றீர்களா? என்று கேள்வி கேட்கின்றார். குறிப்பாக, தொழில்வாய்ப்புகளை இந்த அரசாங்கம் வழங்கியதா? என்ற கேள்வியைக் கேட்டிருந்தார். எதிர்க்கட்சித் தலைவர் அவர்கள் அப்போது அமைச்சராக இருந்தபொழுது, தொழில் வழங்கிய முறைமையிலிருந்து விலகி, தகுதியானவர்களுக்கு வேலையை வழங்குகின்ற அந்த வேலைத்திட்டத்தைத்தான் எமது அரசாங்கம் கண்டிப்பாகச் செயற்படுத்துகின்றது. அம்பாந்தோட்டை பிரதேசத்திலே மரத்தடியிலே காற்சட்டை அணிந்து காலுக்குமேல் காலைப் போட்டுக்கொண்டு, உயரமாக இருந்தால் பாதுகாப்பு

உத்தியோகத்தராக - security - குட்டையாக இருந்தால் தொழிலாளியாக தெரிவுசெய்தது ஊழல் சார்ந்த முறைமை என்பதை அவர் விளங்கிக்கொள்ள வேண்டும்.

அந்த முறைமைதான் இந்த நாட்டைச் சீரழிவுக்குக் கொண்டு சென்றிருக்கின்றது. அவர்கள் நாட்டை அதலபாதாளத்துக்குக் கொண்டுசென்றது, தமது சுயலாபங் களுக்காகவும் அரசியல் இருப்புக்காகவுமாகும். வேலைவாய்ப்பு வழங்குவதைக்கூட சிலபோது ஊழலாகப் பயன்படுத்திய வர்கள், இந்த அரசாங்கம் வேலைவாய்ப்பு வழங்குவது சம்பந்தமாகக் கேள்வி கேட்கின்றார்கள். நாங்கள் நாட்டைப் பொறுப்பேற்ற பின்னர் வழங்கப்பட்ட ஒவ்வொரு வேலை வாய்ப்பும், பொருத்தமான தகைமையின் அடிப்படையிலும் வெளிப்படையான தேர்வுகள் ஊடாகவும்தான் வழங்கப் பட்டன. பொது அறிவித்தல்மூலம் பொருத்தமானவர்களிட மிருந்து விண்ணப்பங்கள் பெறப்பட்டு, முறையான வழி முறையில் தெரிவு செய்தோமே தவிர, அரசியல் ரீதியாக எம்மோடு இணைந்தமைக்காகவோ, உதவி செய்தமைக் காகவோ வேலைவாய்ப்புகளை நாங்கள் வழங்கவில்லை என்பதை இந்தச் சந்தர்ப்பத்தில் மிகத் தெளிவாகச் சொல்லிக்கொள்ள விரும்புகின்றோம்.

அதேபோன்று, இங்கே பலர் குறிப்பிட்ட விடயம்தான், இன்று கைது செய்யப்படுகின்றவர்களுக்கு எதிராக, நல்லாட்சிக் காலத்திலேயே வழக்குகள் தொடரப்பட்டது என்ற விடயம். அவர்கள் சொல்வதைப்போல, தமது ஆட்சிக் காலத்தில் அவர்கள் சிறப்பாகச் செயற்பட்டிருந்தால், அடுத்து வந்த தேர்தலில் அவர்கள் ஏன் தோல்வியடைந்து இருக்க வேண்டும்? அது நாட்டு மக்களுக்கு மிகவும் தெரிந்த விடயம்தான். எனது கையில் இருக்கின்ற ஆவணத்தின்படி, 2024 ஒக்ரோபர் மாதம் முதல் இன்று வரைக்கும் இந்த நாட்டில் பல துறைகளிலும் பல வகையான ஊழல் செயற்பாடுகளில் ஈடுபட்டமை தொடர்பாக 240 பேர் கைது செய்யப் பட்டுள்ளனர். அவர்கள் என்ன காரணத்திற்காகக் கைது செய்யப்பட்டார்கள் என்பது பற்றிய தெளிவான தகவல் திரட்டு பாராளுமன்ற நூல்நிலையத்தில் காணப்படுகின்றது.

உங்களுக்குத் தெரியும், கடந்த காலங்களில், குறிப்பாக 2015, 2019ஆம் ஆண்டு காலப்பகுதிகளில் சிலபோது வழக்குகள் தொடுக்கப்பட்டு, அந்த வழக்குகளுக்காகக் குறித்த குற்றஞ்சாட்டப்பட்டவர்கள் நீதிமன்றத்தில் ஆஜராகும்போது, மலர்ந்த முகத்துடனும் சிரித்த முகத்துடனும்தான் சென்றார்கள். காரணம், அவர்கள் அங்கு செல்வதற்கு முன்னர் அதற்கான சில உடன்பாடுகள் மேற்கொள்ளப்பட்டிருந்த நிலை காணப்பட்டது. ஆனால், இப்பொழுது அத்தகைய ஒரு நிலைமையை நாங்கள் காண்பதில்லை. இன்று இந்த அரசாங்கத்தின்மீது மக்கள் கொண்டுள்ள நம்பிக்கை பலமாக இருக்கின்றது. இந்த அரசாங்கத்தில் உள்ளவர்கள், ஊழலற்ற ஒரு நாட்டைக் கட்டியெழுப்புவதற்கான முயற்சிகளைக் கண்டிப்பாக மேற் கொண்டு வருகின்றார்கள் என்பதை அரசாங்கத்தின் பல விடயங்களும் செயற்பாடுகளும் தெளிவாக உறுதிப்படுத்திக் கொண்டிருக்கின்றன.

இந்த நாட்டில் உள்ள ஒரு நிறுவனத்தின் ஊடாக மக்களிடம் மேற்கொள்ளப்பட்ட ஆய்வுத் தரவுகளின் அடிப் படையிலே பார்த்தால், நாட்டில் மிகப் பெரிய பிரச்சினையாக அடையாளம் காணப்பட்டிருப்பது 'ஊழல்'தான் என்பது தெரியும். இதனை 79 சதவீதமான மக்கள் சுட்டிக்காட்டி இருக்கின்றார்கள். ஊழலைக் களைவதன் ஊடாக இந்த நாட்டிலே பல்வேறுபட்ட அபிவிருத்தித் திட்டங்களை எம்மால் மேற்கொள்ளக்கூடிய வாய்ப்புகள் காணப்படுகின்றன. இந்த நடவடிக்கைகள் பொது நிதிகளைப் பாதுகாப்பது மாத்திர மல்லாமல், பொருளாதாரத்தை மேம்படுத்துவதற்கான ஒரு சந்தர்ப்பமாகவும் அமைந்தன. ஊழலற்ற ஓர் இடத்தில்தான் எந்தவொரு முதலீட்டாளரும் முதலீட்டை மேற்கொள்ள ஆசைப்படுவார். அந்த வகையில், முதலீடுகள் அதிகரிப்பதற் கான சந்தர்ப்பமும் ஏற்படுகிறது.

பொதுவாக, பலமுள்ள அரசியல் தரப்பைச் சார்ந்தவர்கள் பிழைகள் செய்தாலும், அவர்கள் எந்தவொரு சந்தர்ப்பத்திலும் கைது செய்யப்படுவதில்லை. ஆனால், இன்று தராதரம் இன்றி அனைவருக்கும் நீதி சமமாகப் பிரயோகிக்கப்படுகின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது. வெளிநாட்டு முதலீட்டாளர் களாக இருக்கலாம், உள்நாட்டு முதலீட்டாளர்களாக இருக்கலாம், தமது பணத்தை இங்கே முதலிடுவதற்கான ஒரு சந்தர்ப்பம் இந்த ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்ட மூலத்தினூடாக ஏற்படுத்தப்பட்டுள்ளது.

ஒரு நியாயமான சமூகத்தைக் கட்டியெழுப்புவதன் மூலம்தான், தகுதி மற்றும் திறமையின் அடிப்படையிலான வாய்ப்புகளை வழங்கக்கூடியதாக இருக்கும். கடந்த காலத்தில் பல்வேறுபட்ட அபிவிருத்தித் திட்டங்கள் நாட்டின் எதிர்காலத்தை இலக்காகக் கொண்டதாக அல்லாமல், தம்மைச் சூழ உள்ளவர்களுடைய அபிவிருத்தியை இலக்காகக் கொண்டு மேற்கொள்ளப்பட்டன. அதன் காரணமாகத்தான், இன்று இத்தகைய நிலைமைக்குள் எமது நாடு விழுந்திருக்கின்றது. உண்மையிலே, ஊழலற்ற இத்தகைய திட்டங்களின் ஊடாகப் பொதுத்துறையில் திறனாக வேலை செய்கின்ற ஒரு நிலை உருவாகக்கூடிய சந்தர்ப்பம் காணப்படுகின்றது.

ஊழலற்ற ஒரு தேசமாக இந்த நாட்டைக் கட்டியெழுப்பி, அபிவிருத்திப் பாதையில் சிறப்பானதோர் இலக்கை நோக்கிப் பயணிப்பதுதான், எதிர்க்கட்சியினர், அரசாங்கம் மற்றும் இந்த நாட்டிலுள்ள ஒவ்வொருவருடைய எதிர்பார்ப் பாக இருக்கின்றது. எனவே, இந்த ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்டமூலத்தினூடாக அந்த இலக்கை நாம் அடையலாம் என்பதைக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
හරි පව් නේ! හරි, කමක් නැහැ. Thank you very much, Hon. Presiding Member. *[බාධා කිරීමක්]* අනේ, මිනිත්තු දෙකක් දෙන්න ඔබතුමාගෙන්. *[බාධා කිරීමක්]* අනේ, ඔබතුමා ඔය ටික කථා කරන කොට මට තවත් මිනිත්තු භාගයක් යනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට බාධා කරන්න එපා.

[பி.ப. 3.36]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதம் சம்பந்தமான விடயங்களைப் பற்றி பேசுவதற்கு முன்பு, முக்கியமான ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். அண்மையில் இந்திய உயர் நீதிமன்றம் மிக முக்கியமான ஒரு கட்டளையைப் பிறப்பித்தது. இலங்கையின் எல்லைக்குள் நுழைவது எமது நாட்டின் சட்ட நடவடிக்கை களுக்கு உட்பட்டது என்பதைத் தெளிவுபடுத்தியதற்கு New Delhi உச்ச நீதிமன்றத்துக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். எங்களுடைய இறையாண்மை, கடல் எல்லை, கடல் சூழல் பாதுகாப்பை இந்திய உச்ச நீதிமன்றம் அங்கீகரித்ததை நாங்கள் பெரிதும் பாராட்டு கின்றோம். அதே வேளையில், தமிழ் நாட்டு முதலமைச்சர் மாண்புமிகு ஜோசப் விஜய் அவர்கள் கோரிக்கை ஒன்றை இந்த அரசாங்கத்துக்கு முன்வைத்திருக்கின்றார். அதை நாங்களும் பரிசீலிக்க வேண்டிய ஒரு கடமைப்பாடு இருக்கின்றது. எங்களுடைய கடற்றொழில் அமைச்சர் கௌரவ ராமலிங்கம் சந்திரசேகர். தமிழ் நாட்டு முதலமைச்சர் மாண்புமிகு ஜோசப் விஜய் சந்திரசேகர். கிட்டத்தட்ட சமமான இரண்டு பெயர்கள்! இங்கு கைது செய்யப்பட்ட மீனவர்களின் விடுதலை மற்றும் படகுகளை விடுதலை செய்வதற்கான அவருடைய கோரிக்கையை நாங்கள் மனிதாபிமான அடிப்படையில் பார்க்க வேண்டும். அவர் மிகவும் நேர்மையான கோணத்தில் இந்த விடயத்தைக் கொண்டு வந்திருக்கின்றார். அதைக் கவனத்தில் கொண்டுவரவேண்டிய கடமைப்பாடு எங்களுக்கு இருக் கின்றது. Sir, I wish to **table*** before Parliament the request of the Chief Minister of Tamil Nadu to be placed in the Library.

எனவே, மீண்டும் மீண்டும் கைது, வழக்கு, விடுதலை என்று சுழற்சியாக இந்தப் பிரச்சினையைத் தொடர்வதற்குப் பதிலாக, நிலையான இருதரப்புப் பொறிமுறையை உருவாக்க வேண்டிய ஒரு தேவை ஏற்பட்டு இருக்கின்றது. ஆகவே, mutual methodology இரண்டு நாடுகளும் ஒன்றாகச் சேர்ந்து இயங்கக்கூடிய ஒரு பொறிமுறையை நாங்கள் கண்டுபிடிக்க வேண்டும். அதில் முக்கியமாக, வழக்குகளை விரைவாக முடிப்பதற்கான சிறப்பு நடைமுறை இருக்க வேண்டும். அத்தோடு, கைது செய்யப்படும் மீனவர்கள் தொடர்பான நீதிமன்ற நடவடிக்கைகள் தேவையற்ற தாமதமின்றி முன்னெடுக்கப்பட வேண்டும். அடுத்தது, கைது செய்யப்படும் மீனவர்களுக்கு உடனடியாகச் சட்ட உதவி பெற்றுக் கொடுக்கப்பட வேண்டும். மீனவர்களைத் தண்டிப்பது அல்ல முக்கியம். உண்மையாகச் செய்ய வேண்டியது, எமது மீனவர்களின் வாழ்க்கைத் தரத்தை உயர்த்த இலங்கைக் கடல் வளங்களைப் பாதிக்கும் சட்டவிரோத மீன்பிடி நடவடிக்கையை அனுமதிக்காமல் இருப்பதுதான்.

Having said that, I will now speak about the Anti-Corruption Act.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ඒක විනාඩි එකහමාරක් විතර කරමු.

දැන් හැම එක්කෙනාම මේකේ ඉතිහාසය කියනවා නේ. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය ඉතිහාසය පටන් ගන්නේ 1940 ගණන්වල. ඔබතුමන්ලා දන්නවා ඇති, ඉස්සෙල්ලාම ඔය දූෂණයට විරෝධී පනත් ආවේ 1940 ගණන්වල බව. එතකොට මම හිතන විධියට ඉස්සෙල්ලාම බැරිස්ටර් එල්.එම්. ද සිල්වා තමයි Special Commissioner හැටියට පත් කරලා තිබුණේ. නමුත් මේ දූෂණය මැඬීම සඳහා නීතිපතිට තමයි නඩු දාන්න පුළුවන්. ඔය නීතිපති දාන නඩුව කෙළින්ම ඒ අල්ලස් දෙපාර්තමේන්තුවට දාන නීතිය ගෙනාවේ කවුරු කියලාද ඔයගොල්ලන් හිතන්නේ? 1970 ගණන්වල ආපු රජය තමයි ඉස්සෙල්ලාම ඒක කළේ. 1958 අංක 40 දරන අල්ලස් පනත සමගි පෙරමුණ රජය විසින් සංශෝධනය කරලා යුක්තිය පසිඳලීමේ නීතිය ගෙනාවා. *[බාධා කිරීමක්]* I am just about to finish, Sir. මතක තියාගන්න, ඒ අවස්ථාවේදී ඒවා පාවිච්චි කළේ දේශපාලන අරමුණු ඉෂ්ට කර ගැනීමට බව.

අපට මතකයි, "සාගරයක් මැද" චිත්‍රපටය. එවැනි තත්ත්වයක් ආපසු ඇති කරන්න නම් එපා. අල්ලසට, දූෂණයට සම්බන්ධ පනත ස්වාධීන කොමිසමක් හරහා ක්‍රියාත්මක කිරීමේදී එවැනි තත්ත්වයක් නැවත ඇති නොවන විධියට වග බලාගන්න කියලා ඉල්ලමින් මගේ කෙටි කථාව අවසන් කරනවා.

ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.50]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைக்கு மிகவும் முக்கியமான ஒரு விவாதம் இடம்பெற்றுக் கொண்டு இருக்கின்றது. இலஞ்சம் மற்றும் ஊழல் மோசடிகளி லிருந்து இந்த நாட்டை மீட்டெடுக்க வேண்டும் என்ற கருத்தில் நாங்கள் இருக்கின்றோம். இலஞ்சம் அல்லது ஊழல் என்ற வார்த்தையை எடுத்துக்கொண்டால், அது பாராளுமன்றத்துக்கு மாத்திரமோ அல்லது இலங்கையில் இருக்கும் தமிழர்களுக்கு மாத்திரமோ, சிங்களவர்களுக்கு மாத்திரமோ, முஸ்லிம்களுக்கு மாத்திரமோ உரித்தானதல்ல. இது ஒட்டுமொத்த நாட்டுக்கும் உரித்தான ஒரு சொல்லாக இருக்கின்றது. இந்த ஊழலால் கடந்த கால கசடு நிறைந்த அரசியல் மூலமாகப் பாதிக்கப் பட்டிருப்பது இலங்கையில் வாழ்கின்ற ஒட்டுமொத்த மக்களேயாவர்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த ஊழல் மோசடியிலிருந்து உண்மையிலேயே நாட்டை மீட்டெடுக்க வேண்டிய தேவை இருந்தது. அந்தத் தேவையின் நிமித்தமாகவே தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள்

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

2024ஆம் ஆண்டுக்கு முன்னர் எங்களுடைய கொள்கைப் பிரகடனத்திலே, இந்த நாட்டில் ஊழல் சம்பந்தமான பிரச்சினை எவ்வாறு இருக்கின்றது, அதிலிருந்து எப்படி எங்களுடைய நாட்டை மீட்பது என்பன தொடர்பாக மிகவும் தெளிவாகக் குறிப்பிட்டு இருக்கின்றோம். அந்த வகையில், எங்களுடைய நாட்டை ஊழலற்ற நாடாக மாற்றியமைக்க வேண்டிய கடப்பாடும் பொறுப்பும் இந்த நாட்டு மக்களுக்கு இருக்கின்றது. இன்றைக்குக் கொண்டுவரப்பட்டிருக்கும் சட்டமூலம் தொடர்பில் கடந்த காலங்களில் பல்வேறு விதமாகப் பேசப் பட்டிருந்தது. இதற்கு முன்னர் இது தொடர்பாக கருத்துகளை வெளியிட்ட எதிர்க்கட்சியினருடைய கருத்துகளைப் பார்க்கின்றபோது, இன்றைக்கு ‘ஊழல்’ என்ற வார்த்தையை உச்சரிக்கின்றபோது அஞ்சுகின்ற -பயப்படுகின்ற- நபர்களாக எதிர்க்கட்சியினர் மாறியிருப்பதைக் காணலாம். அந்தப் பயத்தினுடைய வெளிப்பாடு எந்தளவுக்கு என்றால், இந்த நாட்டில் கடந்த காலங்களில் நடந்த அனைத்து ஊழல்களுக்கும் காரணகர்த்தாக்கள் வேறு யாருமல்ல, தேசிய மக்கள் சக்தியினரே என்று கூறுகின்ற அளவுக்கு எதிர்க்கட்சியினரின் அரசியல் கீழ்நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றது.

இன்றைக்கு எதிர்க்கட்சியைப் பிரதிநிதித்துவம் செய்கின்ற முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களும்கூட, இந்தப் பிரச்சினை தொடர்பாக மிகவும் ஆக்ரோசமாகப் பேசுவதைக் காணக்கூடியதாக இருக்கின்றது. ஆனால், நபிகள் நாயகத்தின் போதனையைப் பார்க்கின்றபோது, ஊழல் செய்கின்ற அல்லது திருடுகின்ற நபர்களுக்கு கைகளை வெட்டி தண்டனை வழங்கும்படி கூறப்படுகின்றது. அவ்வாறானதொரு மார்க்கத் தைப் பின்பற்றுகின்றவர்கள் என்று கூறுகின்ற இந்தப் பாராளுமன்ற உறுப்பினர்கள், இன்றைக்கு ஊழலில் ஈடுபடு கின்றவர்களைப் பாதுகாப்பதற்கு ஏதுவாகப் பேசுவது வெட்கக்கேடான விடயமாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இந்த நாட்டில் ஊழல் என்பது பேரிழப்பாகவும் பேரிடியாகவும் மாறியிருந்தது என்பதை நாங்கள் மிகவும் தெளிவாகச் சொல்கின்றோம். எனவே, இந்த நாட்டை ஊழலிலிருந்து மீட்க வேண்டிய தேவை இருக்கின்றது. அதன் வெளிப்பாடுதான் ஊழல் மோசடியில் ஈடுபட்ட நபர்கள் ஒருவர் பின் ஒருவராக இன்றைக்கு சிறைச்சாலையை நோக்கி ஓடிக்கொண்டு இருக்கிறார்கள். அவ்வாறான நேரத்தில்தான் இன்று இந்தச் சட்டமூலம் விவாதிக்கப்படுகின்றது. இது இன்று மாலை நிறைவேற்றப்பட்ட பிறகு, இந்தச் சட்டத்தின் அடிப்படையில் நாடு நகர்ந்து செல்லும் என்று நாங்கள் நிச்சயமாக நினைக்கின்றோம். அதன் பிறகு எமது நாட்டுக்குத் தேவை யான மாற்றம் இந்த ஊழல் எதிர்ப்பு திருத்தச் சட்டத்தின்மூலம் ஏற்படும் என்பதையும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னும் சில விடயங்களையும் இந்த வேளையிலே நான் கூற வேண்டும். முதலாவதாக, இந்திய உச்ச நீதிமன்றத்திற்கு நான் இந்தப் பாராளுமன்றத்தின் ஊடாக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். ஏனென்றால், கடந்த காலங்களில் DMK எனப்படும் திராவிட முன்னேற்றக் கழகம், அதேபோன்று ADMK எனப்படும் அண்ணா திராவிட முன்னேற்றக் கழகத் தைச் சார்ந்த இருவர் கச்சதீவை மீளவும் இந்தியாவிடம் ஒப்படைக்கும்படி கேட்டு நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்திருந்தார்கள். நீதிமன்றத்தில் அந்த வழக்குக்குத் தீர்ப்பு வழங்கிய நீதிபதிகள் மிகவும் தெளிவாகச் சொல்லி யிருக்கிறார்கள், கச்சதீவு மாத்திரமல்ல, அந்தக் கடற்பரப்பும் இலங்கைக்குச் சொந்தமானது; அதில் மாற்றுக் கருத்துக்கு இடமில்லை என்று. அதுமாத்திரமல்ல, இழுவைமடி படகுகள் மூலமாக எங்களின் கடல் எல்லையை மீறி இந்தியப் படகுகள் இங்கே வந்து செய்கின்ற செயற்பாடுகளையும் அவர்கள் மிகவும் தெளிவாகச் சொல்லியிருக்கின்றார்கள். எங்கள் கடற்பரப்பு மிகவும் சுத்தமாக பாதுகாக்கப்படுகின்றது. இந்தியாவின் தமிழ்நாட்டுக் கடற்பரப்பு மிகவும் அசுத்த மடைந்திருக்கின்றது. அவ்வாறு அசுத்தமடைந்ததன் காரணமாகவே அந்தப் பிரதேசத்தில் மீன்கள் மற்றும் நீர்வாழ் உயிரினங்கள் வாழமுடியாத நிலைமை ஏற்பட்டிருக்கின்றது. அதன் வெளிப்பாடாகவே இன்றைக்கு தமிழ்நாட்டுக் கடற்பரப்புகள் பாலைவனம்போல மீன்களற்ற பிரதேசமாக மாறியிருக்கின்றன. மிகவும் சுத்தமாகவும் தூய்மையாகவும் இருக்கின்ற இலங்கை கடற்பரப்புமீது கைவைக்கக் கூடாது என இந்திய நீதிமன்றம் தீர்ப்பு வழங்கியிருக்கின்றது. அந்தத் தீர்ப்புக்காக நாங்கள் மீண்டும் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இப்பொழுது வடக்கிலே விசேடமாக 4 இடங்களில் மதுபானசாலைகளுக்கான அனுமதிப் பத்திரங்கள் - bar licences - வழங்குவது தொடர்பாகப் பேசப்பட்டு வருகின்றது. அவை புதுப்பிக்கப்படுகின்றபொழுது ஏற்படக்கூடிய நிலைமைகள் இருக்கின்றன. தேசிய மக்கள் சக்தி அரசாங்கம் என்ற வகையிலே மூடப்பட்டிருக்கின்ற barsஐ அல்லது சட்ட விரோதமான bars இருக்குமாகவிருந்தால், சட்டத்திற்குப் புறம்பான முறையில் அவர்கள் barsஐ அமைத்திருப்பார்களாக இருந்தால், அந்த மதுபானசாலைகளை இழுத்து மூடுவதற்கு ஏதுவான நடவடிக்கைகளை நாங்கள் எடுப்போமெனக் கூறிக்கொள்ள விரும்புகின்றோம். அதுமாத்திரமல்ல, அது தொடர்பான சட்டரீதியான நடவடிக்கைகளை எடுப்பதற்கும் தயாராக இருக்கிறோம் என்றும் கூறிக்கொள்ள விரும்பு கின்றேன்.

இன்று தெல்லிப்பளையில் நடைபெற்ற ஆர்ப்பாட்டத்தின் பொழுது முன்னாள் பிரதேச சபை உறுப்பினர்களும் கலந்துகொண்டு மக்களுக்குக் கேடுவிளைவிக்கின்ற மதுபான சாலைகள் அகற்றப்பட வேண்டும்; அவற்றுக்கான அனுமதி இரத்துச் செய்யப்பட வேண்டுமென்று கோரியிருந்தனர். இதில் நாங்களும் மிகவும் தெளிவாக இருக்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னுமொரு விடயத்தை மாத்திரம் சொல்வதற்கு எனக்கு அனுமதி தாருங்கள்! விசேடமாக, மலையக மக்களின் பிரச்சினையை எடுத்துக்கொண்டால், அவர்கள் ஒரு நாள் இரண்டு நாட்கள் அல்ல, இருநூறு வருடங்களுக்கும் மேலாக இந்த நாட்டுக்காக உழைக்கின்ற மக்களாக இருக்கின்றார்கள். இன்றைக்கு ஜீவன் தொண்டமான் உள்ளிட்ட பலர் அது தொடர்பாகப் பேசியிருந்தார்கள்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් නිසා කථාව අවසන් කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

இன்றைக்கு மலையக மக்கள்மீது பல்வேறு அவதூறுகள் கட்டவிழ்த்து விடப்படுகின்றன. கடந்த காலங்களில் ‘கள்ளத்தோணிகள்’ -கள்ளத்தனமாக வந்தவர்கள்- என்று பல்வேறுவிதமான குற்றச்சாட்டுகள் எம்மீது சுமத்தப் பட்டிருந்தன. அவ்வாறு குற்றம் சுமத்தியபோதிலும்கூட,

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා ]

அவர்கள் நாட்டின் பொருளாதாரத்துக்கு முதுகெலும்பாக இருக்கின்றார்கள். அதுமாத்திரமல்ல, அவர்கள் முதுகிலே ஏறி அரசியல் ஓட்டம் ஓடுகின்ற நபர்களும் இருக்கிறார்கள். ஒரு சிலரின் இத்தகைய தனிப்பட்ட கருத்துகள் அரசாங்கத்தின் கருத்துகளோ அல்லது தேசிய மக்கள் சக்தியின் கருத்துகளோ அல்ல என்பதை அவ்வாறானவர்களுக்கு நாங்கள் கூறிக் கொள்கின்றோம். தேசிய மக்கள் சக்தியினராகிய எங்களுடைய நிலைப்பாடு என்னவென்றால், நாங்கள் நிச்சயமாக மலையகத்தில் வாழுகின்ற மக்களின் பக்கமே நிற்போம் என்று கூறி, விடை பெறுகின்றேன். நன்றி. வணக்கம்.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.50]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, බොහොම ස්තුතියි. எனக்கு நான்கு நிமிடங்கள்தான் இருக்கின்றன. அதில் இரண்டு நிமிடங்கள் தமிழில் உரையாற்றலாம் என நினைக்கின்றேன். அண்ணா ஓடாதீர்கள்! தெல்லிப்பளையில் barஇற்கு permission கொடுப்பது அரசாங்கம். அங்கே உங்களுடைய பிரதேச சபை உறுப்பினர்கள் 4 பேர் போய் நின்றுகொண்டு ஆர்ப்பாட்டம் செய்வதென்றால், நீங்கள் வெட்கப்பட வேண்டும். ஒரு பக்கம், உங்களுடைய பிரதேச சபை உறுப்பினர்களை அங்கு போய் நின்று கூச்சலிடுங்கள் என்று சொல்வது! அடுத்த பக்கத்தால் சொல்வது, bar permits நாங்கள் கொடுக்க மாட்டோம் என்று. அண்ணா, நீங்கள் வெட்கப்பட வேண்டும். உங்களை வடக்கில் யாழ்ப்பாணத்தில் மக்கள் நீண்டகாலத்துக்கு வைத்திருக்காது. அதை ஒருபக்கம் வைத்துவிட்டு, இன்னுமொரு விடயத்தைப் பற்றி கதைப்போம்.

අද පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙනවා, වංචා, දූෂණ අල්ලනවා කියලා. ඒකට බොහොම ස්තුතියි. හැබැයි, ප්‍රභාකරන්ටත් බැරිවෙච්ච එකක් දැන් ඔබතුමන්ලා අපට කරලා දුන්නා. ඇත්තටම මම මේ පාර්ලිමේන්තුවේදී කියනවා, ප්‍රභාකරන් කියන්නේ මගේ දෙවියෝ, මම අද වෙනකල් ගරු කරනවා. ඔයාලා වගේ අපි රණවිරුවන්ට කියන්නේ නැහැ, සෙබළු කියලා. ප්‍රභාකරන් අපේ දෙවියෝ කියලා මම ගරු කරනවා. ඒ මිනිස්සු මට ඡන්දය දීලා මෙතැනට එවලා තිබෙන්නේ ඔබතුමන්ලාත් එක්ක ඩීල් ගහලා ඒගොල්ලන් අතහරින්න නොවෙයි. ඒගොල්ලන්ව අතහරින්න බැහැ, මට. හැබැයි මතක තියාගන්න. ප්‍රභාකරන්ටත් බැරිවුණු එකක්, මහින්ද රාජපක්ෂගේ බිරිඳවයි, පුතාවයි ඔක්කොම හිරේ දාලා අපේ මිනිස්සුන්ට ඔයගොල්ලන් චූන් දෙන එකට අපට සතුටුයි. මම මේක කියන්නේ මගේ හදවතින් නොවෙයි. අපේ මිනිස්සුන්ට, ඩයස්පෝරාවට ඔබතුමන්ලා දෙනවා නේ මාර ආතල් එකක්, ගත්ත සල්ලිවලට. මම ඇත්තටම ඔබතුමන්ලාට ගරු කරනවා. ගෝඨාභය රාජපක්ෂ විතරයි තව ඉතිරි වෙලා ඉන්නේ. එයාත් අරගෙන දමන්න. අපට මාර සතුටුයි. මෙතැන වෙන්නේ, double game තමයි. මම ඇත්ත කියන්නේ. මේ, double game එකක්. ඩයස්පෝරාවට මාර සතුටුයි, ඔයගොල්ලන් කරන වැඩවලට.

හැබැයි, දුක් වෙන්න ඕනෑ. මම මේ මහත්වරුන්ට ගෙනැල්ලා දුන්නා, උතුරේ audit reports 5ක්. COVID-19 සම්බන්ධව ක්‍රිෂ්ණපුරම් audit report එකයි, මරදන්කර්නි audit report එකයි ගෙනැල්ලා දුන්නා. මෙතුමන්ලා කවදාවත් ඒක ගැන කථා කරන්නේ නැහැ. අද උතුරේ මිනිස්සු උද්ඝෝෂණය කරනවා, බාර් පර්මිට් හතරක් දෙනවා කියලා. කලින් කිව්වා, බාර් පර්මිට් දෙනවා කියලා ශ්‍රීතරන්ව අල්ලලා දමනවා කියලා. ඔක්කොම නම් ටික එළියට දමනවා කිව්වා. දැන් කෝ, ශ්‍රීතරන්ගේ බාර් පර්මිට් ගත්ත එක? අනුර කුමාර ජනාධිපතිතුමනි, ලජ්ජා වෙන්න ඕනෑ. හොරු අල්ලනවා නම් පොකට් එක දාලා අල්ලන්න. Double pockets නේ තිබෙන්නේ. Containers 323 ගැන අල්ලන්න, ගල් අඟුරු ගැන අල්ලන්න. ඔහොම අල්ලන්න ගියොත් ඉස්සරහ පේළියේ ගොඩක් අල්ලන්න වෙනවා. ජනාධිපතිතුමනි, දැන් මිනිස්සු බලාගෙන ඉන්නවා. දේශපාලනය කරන්න. ඔයාලට විරුද්ධ මිනිස්සු අරන් හිරේ දමන්න. අපට මාර සතුටුයි. අපේ ඩයස්පෝරාව සතුටු කරන්න. අපි දැන් මාර සතුටින් ඉන්නේ. අපි කියන්නේ දෙමළ මිනිස්සු. ඒගොල්ලන්, හිටපු ජනාධිපති මහින්දගේ බිරිඳව අරන් දැම්මා කියලා මාර සතුටින් ඉන්නේ. මම personally සතුටු වෙන්නේ නැහැ කවදාවත්. පාර්ලිමේන්තුවේ ඉන්න නිසා මම දන්නවා, ඔයගොල්ලන් දේශපාලනය කරනවා කියලා. මහින්ද රාජපක්ෂව මරන්න ඕනෑ නම් heart attack එකකින්, ඔයගොල්ලන්ට කරන්න තිබෙන්නේ එයාගේ බිරිඳව අරන් දමන එක. එහෙම අරන් දැම්මා නම් වැඩේ ඉවරයි. එතකොට ඒ මිනිහා නැති වෙනවා නේ. ඒක කරගන්න. අපේ මිනිස්සු සතුටු වෙලා ඉන්නවා. හැබැයි, උතුරට ඇවිල්ලා ටොන්පව ගහන්න එපා, බාර් පර්මිට් දෙන්නේ නැහැ කියලා. කරුණාකර මේක අහන්න. පැය 3කට මිලියන 14ක් වියදම් කළා, උතුරෙන් කුඩු ඔක්කොම ඉවත් කරනවා කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you, Hon. Presiding Member.

පැය 3කට මිලියන 14ක් වියදම් කරලා තිබෙනවා. කවුරුහරි කිව්වා නේ, පොඩි මිනිහා කියලා. පොඩි මිනිහා ඇවිල්ලා පැය 3ක් ඇතුළත මිලියන 14ක් වියදම් කළා, ගංජා, අරවා මේවා නැති කරනවා කියලා. අද බැලුවාම බාර් පර්මිට් 4ක් දෙනවා. මාර ලජ්ජා වැඩක් නේ. එක පැත්තකින් බාර්වලට පර්මිට් එක දෙනවා. මේ ආණ්ඩුව තමයි වැඩිපුරම බාර් පර්මිට් දීලා තිබෙන්නේ. ශ්‍රීතරන්ව අරන් දානවා කිව්වා, බාර් පර්මිට් දීපු හැටියේ. හැබැයි, මේගොල්ලන් ශ්‍රීතරන්ව අරන් දාන්නේ නැහැ. හේතුව, මේගොල්ලන්ට අපේ ඒවා එළියට දමන්න ඕනෑ මේ පාර්ලිමේන්තුවේ. ඒ නිසා ලජ්ජා වෙන්න ඕනෑ. ඔය පුටුවේ වාඩි වෙන ඇමති කෙනෙක් කියනකොට ලජ්ජා වෙන්න ඕනෑ. හැබැයි, සතුටුයි අපට. මටත් පෞද්ගලිකවම කියන්න තිබෙන්නේ මේකයි. අපේ ඩයස්පෝරාවෙනුත් කිව්වා, ගෝඨාවත්, මහින්ද රාජපක්ෂවත්, එයාගේ බිරිඳවත්, නාමල්වත් අරන් දාන්න කියලා. ප්‍රභාකරන්ටත් බැරිවෙච්ච එකක් මේ ආණ්ඩුව අපට කරලා දීපු එකට ඇත්තටම අපේ මිනිස්සු වෙනුවෙන් - මම පෞද්ගලිකව නොවෙයි - මම සතුටු වෙනවා. හැබැයි අපි ඉස්සරහදී බලනවා, පළාත් සභා මැතිවරණය තියන්න කලින් ඔයගොල්ලන් කොහොම හරි ගෝඨාවයි, මහින්ද රාජපක්ෂවයි අරන් ඇතුළට දාන්න. එතකොට ඔයගොල්ලන්ට උතුරේ ඡන්ද වැටෙනවා. උතුරේ ඡන්ද පෙන්වා දකුණේ ඡන්දත් ගන්න පුළුවන්. හැබැයි මේ කථාව මිනිස්සු බලාගෙන ඉන්නවා හොඳේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරනවා. මිනිස්සු හොඳටම මීටර් වෙලායි ඉන්නේ. හැබැයි පළාත් සභා මැතිවරණය තිබ්බොත් අපි ඒ කාලයේදී බලාගනිමු.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මං යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 3.56]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත සාකච්ඡාවට ගන්නා අද දවසේ විපක්ෂය බොහොම කලබලයට පත්වෙලා තිබෙනවා. කලබලයට පත්වන අතරේ, මේ නීතිය ගෙනාවේ ඒගොල්ලන්, ඒගොල්ලන් තමයි මේකේ නිර්මාපකයෝ කියලා ඒ වෙනුවෙන් පෙනී ඉන්නත් උත්සාහ ගන්නවා. අපට කියන්න තිබෙන්නේ මේකයි. මේ නීතිය ගෙනාවේ ඔයගොල්ලන් කියලා අපි පිළිගනිමු. එහෙම නම් දැන් තමුන්නාන්සේලා ගෙනාපු නීතියට අනුව තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඇතුළු නීතිය පසිඳලන ආයතන ක්‍රියාත්මක වෙන්නේ. ඒක යටතේ තමයි අත්අඩංගුවට ගන්නේ; ඒක යටතේ තමයි උසාවි දාන්නේ; ඒක යටතේ තමයි හිරේ යන්නේ; ඒක යටතේ තමයි විමර්ශන සිද්ධ වෙන්නේ. ඒ නිසා කෙඳිරි ගාන්න එපා. ඇයි, අඬන්නේ? මේවා දේශපාලන පළිගැනීම් කියලා කියන්න එපා. තමුන්නාන්සේලා නම් මේ නීති ගෙනාවේ තමුන්නාන්සේලා ගෙනාපු ඒ නීතිවලට අනුව දැන් මේ දේවල් ක්‍රියාත්මක වනකොට ඒකට වෙන වෙන අර්ථ කථන දෙන්න එපා. දේශපාලන පළිගැනීම් කියනවා, කෙඳිරි ගානවා. ඒවාට විවිධාකාර අර්ථ කථන දෙන්න එපා. තමුන්නාන්සේලාගේ කාලයේ මේ නීති ගෙනාවාට, තමුන්නාන්සේලා ඒවාට හයිය දුන්නේ නැහැ. ඒ වෙනුවට කළේ විනිසුරුවන්ගේ ගෙවල්වලට ගල් ගහපු එක, ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුතුමිය මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා අනුර යාපා, වීරවංශලා ඉස්සරහ තියාගෙන නඩු අහලා එතුමියව ඉවත් කරපු එක. ඔයගොල්ලන් ඒ විධියට තමයි කටයුතු කළේ. එහෙම නම්, ඔයගොල්ලන් ගෙනාපු නීතියම තමයි ඔයගොල්ලන්ගේ අර්ථ දැක්වීම්වලට අනුව දැන් ඔයගොල්ලන්ටම එරෙහිව ක්‍රියාත්මක වෙන්න පටන් ගෙන තිබෙන්නේ. ඒක ඉවසා වදාරන්න කියලා පළමුවෙන්ම අපි කියන්න කැමැතියි.

විශේෂයෙන්ම මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑකම තිබෙනවා. මට මේ සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමාට උත්තරයක් දෙන්නම වෙනවා. මොකද, එතුමා ප්‍රශ්න පත්‍රයක් ඉදිරිපත් කරලා මේ සභාවෙන් පිටව ගියා. විපක්ෂ නායකතුමා කියනවා, අගමැතිතුමිය උදේ මෙහෙම කිව්වා, මෙහෙම කිව්වා කියලා. උපාධිධාරීන්ට රැකියා දුන්නාද, ඒ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කළාද, ඒ ඩීල් එක ක්‍රියාත්මක කළාද, විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කිව්වා, ඒ ඩීල් එක ඉෂ්ට කළාද ආදී වශයෙන් එතුමා ප්‍රශ්න වැලක් ඉදිරිපත් කළා. අපට ඒ සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ මේකයි.

විපක්ෂ නායකතුමනි, ජනතාව අපට මේ ආණ්ඩුව දුන්නේ අවුරුදු පහකට. අපි කොතැනකවත් කියලා තිබෙනවාද, අවුරුද්දක් ඇතුළත මේ දේවල් ඔක්කෝම කරනවා කියලා? යන්තමින් ආණ්ඩුවට තවම අවුරුදු දෙකයි. ඔබතුමා කියන මේ දේවල් අවුරුදු දෙකක් ඇතුළත කරලා ඉවර කරනවා කියලා අපි කොතැනකවත් කියා තිබෙනවාද? එහෙම කියලා නැහැ. අපේ රටේ ජනතාව දන්නවා, පස්වැනි අවුරුද්දේ කරන්න තිබෙන වැඩේ හතරවැනි අවුරුද්දේ කරන්න බැහැ, හතරවැනි අවුරුද්දේ කරන්න තිබෙන වැඩේ තුන්වැනි අවුරුද්දේ කරන්න බැහැ, තුන්වැනි අවුරුද්දේ කරන්න තිබෙන වැඩේ දෙවැනි අවුරුද්දේ කරන්න බැහැ කියලා. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා යන්තම් අවුරුදු දෙකයි. අපි ආපහු ඒ අවුරුදු දෙක දිහා හැරිලා බලනකොට, අපේ රට තිබුණු තැනත් එක්ක ගත්තාම අද අප සැලකිය යුතු දුරක් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ජාත්‍යන්තර වශයෙන් අපි ඇගැයීම්වලට ලක් වෙලා තිබෙනවා; ප්‍රශංසාවට ලක් වෙලා තිබෙනවා; ආර්ථික ස්ථාවරත්වයක් ඇති කරගෙන තිබෙනවා.

තමුන්නාන්සේලාගේම පැත්තේ ඉඳගෙන ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා පසුගිය අය වැය විවාදයේදී මොකක්ද කිව්වේ? "සාර්ව ආර්ථිකය අංග සම්පූර්ණයි, අස්ථාවර ආර්ථිකය ස්ථාවරයි, වාහන වෙළෙඳ පොළ විවෘත කළා, මේ තරම් වාහන ගෙන්වන්න පුළුවන් වෙයි කියලා අපි හිතුවේ නැහැ, ඉතිහාසයේ පළමුවැනි වතාවට රාජ්‍ය භාණ්ඩාගාරය පිරී ඉතිරී ගොස් ඇත" කියලා කිව්වා. තමුන්නාන්සේලාගේ පැත්තෙන් තමයි එහෙම කිව්වේ. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුද්දක් ගත වනකොට තමයි එහෙම කිව්වේ. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු දෙකක්

[ගරු නාමල් කරුණාරත්න මහතා ]

ගත වනකොට අපේ රට ජාත්‍යන්තර ඇගැයීමට ලක් වෙලා තිබෙනවා. ලෝකයේ වේගයෙන්ම සංවර්ධනය කරා ගමන් කරන රටවල් කිහිපය අතරට අපේ රටත් ඇතුළත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානය වාගේ සංවිධානවල ඇගැයීමට අපේ රට ලක් වෙලා තිබෙනවා. අවුරුදු දෙකක කාල පරාසය තුළ තමයි අපි ඒ දුර ආවේ.

එහෙම නම් මතක තබා ගන්න, අපට තව අවුරුදු තුනක් තිබෙන බව. මම විපක්ෂ නායකතුමාට කියන්න කැමැතියි, මේ අවුරුදු තුන ගත වනකොට තමුන්නාන්සේ දැන් මෙතැන ඉඳගෙන ඉදිරිපත් කරපු ඔය කාරණා ඔය විධියටම තමුන්නාන්සේට ඉදිරිපත් කරන්න ඉඩක් ලැබෙන්නේ නැහැ කියන එක.

ඊළඟට, විපක්ෂ නායකතුමාට මම තවත් උත්තරයක් දෙන්න ඕනෑ. එතුමා හැම වෙලාවේදීම කියනවා, කුඹුරට බැහැලා මඩ කමින් වීවලට රුපියල් 150ක මිලක් දෙනවාය කිව්වා කියලා. ඒක එතුමා හැම දාම කියන කතන්දරයක්. අපි වීවලට රුපියල් 150ක් ඉල්ලා තිබෙන්නේ කොහේද කියලා කියන්නකෝ. කොතැනද අපි කියලා තිබෙන්නේ වීවලට රුපියල් 150ක් දෙනවාය කියලා? රසායනික පොහොර තහනම් කරපු වෙලාවේ තමුන්නාන්සේ ඔතැන ඔය පුටුවේම ඉඳන් කිව්වා, අපේ රටේ වී නිෂ්පාදනය සියයට 35කින් අඩු වුණා කියලා. මම මෙතැන ඉඳන්ම උත්තර දුන්නා, ඒක අපි සියයට සියයක් පිළිගන්නවා කියලා. එහෙම නම්, තමුන්නාන්සේගේ වචනවලට අනුව අස්වැන්න සියයට 35කින් අඩු වුණා නම්, වී කිලෝ 1,000ක් ගන්න ගොවියා ඒ අවස්ථාවේදී වී කිලෝ කීයක්ද ගත්තේ? කිලෝ 650යි. මේක තමයි ඇත්ත තත්ත්වය. පොහොර මිටිය රුපියල් 40,000ට ගියා. අන්න ඒ වෙලාවේ වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 150 පැන්නා. අපේ සටන් පාඨය වුණේ ඕක නොවෙයි මහත්මයෝ. එදා අපේ සටන් පාඨය වුණේ තිබෙන තත්ත්වය යටතේ අස්වැන්න අඩු වෙලා තිබෙනවා, පොහොර මිල වැඩි වෙලා තිබෙනවා, ඒ තත්ත්වය මත වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 150 පැනලා තිබෙනවා කියන එකයි. ඒ නිසා නිෂ්පාදන වියදම අඩු කරන්න, ගොවියාට වන්දි ගෙවන්න, රසායනික පොහොර තහනමත් ඉවත් කරන්න කියන එක තමයි අපේ සටන් පාඨය වුණේ. එහෙම නැතිව අපි කොතැනකවත් ඉල්ලුවේ නැහැ, වී කිලෝවකට රුපියල් 150ක්. ටොන් පව කියන්න එපා. මේක තමයි කියන්නේ. තමුන්නාන්සේ හැම වෙලාවේදීම කියනවා, අපි පව කියනවා කියලා. හැබැයි, තමුන්නාන්සේලා නේ පව කියන්නේ.

ඊළඟට, මේ සභාවේදී තවත් කාරණයක් කිව්වා. මේවා මාර කථා. දැන් අර්තාපල් ගොවියා අනාථයිලු. විපක්ෂ නායකතුමනි, ඊයෙත් මම මේ සභාවේදී කිව්වා, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ අර්තාපල් ගොවියාට, ලොකු ලූනු බීජ ගොවියාට, බඩ ඉරිඟු ගොවියාට අස්වැන්න අරගෙන සල්ලි ගෙවපු නැති කතන්දරේ. අල ගොවියා ගැන කියපු නිසා මම අල ගොවියා මුහුණ දුන් සිද්ධිය ගැන අදත් මතක් කරන්නම්. තමුන්නාන්සේ ඒ ආණ්ඩුවේ තුන්වැනියා. ජනාධිපති හිටියා, අගමැති හිටියා, කැබිනට් මණ්ඩලය තිබුණා. තමුන්නාන්සේ තුන්වැනියා. තමුන්නාන්සේ ආණ්ඩු කරපු පක්ෂයේ දෙවැනියා. මේ ඉදිරිපස ඉන්න බොහෝ දෙනෙක් එදා කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් හිටියා.

2018දී අල ගොවියා අනාථ කරපු විධිය මම කියන්නම්, විපක්ෂ නායකතුමනි. ඔන්න, හොඳට අහගන්න. තමුන්නාන්සේලා අල ගොවියාගේ අල ස්ථාන හයකදී මිලදී ගත්තා. කිලෝවකට රුපියල් 95 ගණනේ අල ගොවියාට සල්ලි ගෙවනවා කිව්වා. අල කිලෝ කීයක් ගත්තාද? තමුන්නාන්සේ කැබිනට් මණ්ඩලයේ හිටපු ඒ ආණ්ඩුව විසින් ගොවියාගෙන් අල කිලෝ 2,044,000ක් ගත්තා. බොරලන්ද, මොරගස්වැව, වැලිමඩ, ඌව පරණගම, කැප්පෙටිපොළ ආදි ස්ථාන හයකදී අල ගත්තා. ගොවියෝ හොඳ ලොකුම අල ගෙඩි ටික තෝරලා ගෙනැත් දුන්නා. සුපිං අයින් කෙරුවා. ගොවියාත් බැලුවා, රුපියල් 95 ගණනේ මිලක් හම්බ වෙනවා නේ කියලා. අල කිලෝ 2,044,000ක් තමුන්නාන්සේලා ගත්තා. ගොවියාට සත පහක් ගෙව්වේ නැහැ. මේක තමයි ඉතිහාසය. එදා තමුන්නාන්සේලා අල ගොවියාගේ ජීවිතය අල කෙරුවේ ඒ විධියට. අද මෙතැන කට මැත දොඩවන්න එන්න එපා.

එතකොට හිටපු ඇමති රිසාඩ් බදියුදීන්. එතුමා මෙතැන පුටුවේ හිටියේ. අපට සිද්ධ වුණා, ඒ අවස්ථාවේදී පෙළපාළි යන්න, උද්ඝෝෂණය කරන්න. අපි ඇවිල්ලා අමාත්‍යාංශය වැටලුවා. ඇමති පැන්නා, අමාත්‍යාංශයේ ලේකම් මාට්ටු කරලා. අපි අමාත්‍යාංශයේ නැවතිලා කිව්වා, අපි යන්නේ නැහැ කියලා. අපි එතකොට හිටපු ඇමති ගෙන්නුවා. එතුමාව ගෙන්වලා අපි එතුමා සමඟ සාකච්ඡා කළා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කටයුතු කළේ අන්න ඒ විධියටයි. අද අල ගොවියා ගැන කියන්න එනවා. අල ගොවියාගේ මුළු ජීවිතයම අල කරපු අය, මේ. මේක තමයි ඇත්ත තත්ත්වය. ඒ තත්ත්වය යටතේ ඒ ගොවියාට අදාළ වන්දි මුදල් ටික තවමත් ගෙවා නැහැ. කොටසක් ගෙව්වේ නැහැ, රුපියල් කෝටි ගණනක්. අන්න එහෙමයි තමුන්නාන්සේලා වැඩ කළේ. අද මැරිලා ඉපදුණා වාගේ මෙතැන කථා කරන්න ලැහැස්ති වෙන්න එපා කියන එක විපක්ෂ නායකතුමාට අපි කියන්න ඕනෑ. මා කියන්න කැමතියි, මේ වනකොට අප ආණ්ඩුවක් විධියට සාර්ථක ගමනක් ඇවිත් තිබෙන බව. තව අවුරුදු තුනක් අපට තිබෙනවා. ඒ ගමනත් අපි සාර්ථකව යනවා.

මිනිස්සු අල්ලසට පෙලඹෙන්නේ ඇයි? මිනිස්සු අල්ලස් ගන්න පෙලඹෙන්නේ ඇයි? අල්ලස් දෙන්න පෙලඹෙන්නේ ඇයි?

අද වනකොට මේ අල්ලස කියන එක මොන තරම් සාමාන්‍යකරණය වෙලා තිබෙනවාද කියන එක ගැන මම කියන්නම්. ඉතිහාසයේදී කාටූන් ශිල්පියා අල්ලස් ගන්න එක කාටූන් චිත්‍රයට නැඟුවේ කොහොමද? අත පිටිපස්සට කරගෙන "මගෝඩිස්තුමා" ඉන්නවා. මුදල් ටික අරගෙන හෙමිහිට සාක්කුවට දමා ගන්න විධියට තමයි කාටූන් චිත්‍රය ඇඳලා පෙන්නුවේ. පසු කාලීනව සෘජුවම කථා බහ කරලා අල්ලස් ගන්න පටන් ගත්තා. අල්ලස් අරගෙන ඒවා ගණන් කරන්නත් පටන් ගත්තා. එහෙම අල්ලස් අරගෙන ඒවා ගණන් කරන්න ගිහිල්ලා තමයි හිටපු ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සහ රාජ්‍ය දැව සංස්ථාවේ හිටපු සභාපති අතටම මාට්ටු වෙලා හිර ගෙදර ගියේ. පසුකාලීන වෙනකොට, project එක මේකයි, මේකෙන් සියයට මෙච්චරයි කිව්වා. මේ පාර්ලිමේන්තුවේ හිටපු සමහර අයට "සියයට 10 මහත්තයා" කියලා නම් පටබැඳුණේ අන්න ඒවාත් එක්කයි. එහෙම ගනුදෙනු කථා කරලා අල්ලස් ගත්ත අය තමයි අද හිරේ ඉන්නේ, රිමාන්ඩ් භාරයේ ඉන්නේ. එලෙස රිමාන්ඩ් භාරයේ ඉන්න අය මේ සභාවට ඇවිල්ලා අර පුටුවේ ඉඳන් අපට උපදෙස් දෙනවා, ආණ්ඩු කරන විධිය ගැන. අන්න එතැනට අද ඇවිල්ලා තිබෙන්නේ. මේ අල්ලස කියන එක කොයි තරම් ඉස්සරහට ආවාද කියනවා නම්, අන්තිමට පාතාලයෙනුත්, පාතාල නායකයින්ගෙනුත් අල්ලස් ගන්න පටන් ගත්තා. *[බාධා කිරීමක්]* ඔව්, අල්ලස් ගන්න පටන් ගත්තා. සජබ මධ්‍යම කාරක සභිකයෙකුත් අල්ලස් අරගෙන අහු වුණා. තවමත් ඒගොල්ලන් හිරේ. හිටපු අධිකරණ ඇමතිගේ පුතා අල්ලස් ගන්නවා. හිටපු පොලිස්පති පගාව ගන්නවා. හිටපු පොලීසිය භාර ඇමති පගාව ගන්නවා. මේක තමයි තත්ත්වය. පාතාල නායකයින්ගෙනුත් අල්ලස් ගන්නා තැනට, ඊට පස්සේ මාස්පතා පඩි ගන්නවා කියන තැනට අල්ලස කියන එක ඉස්සරහට ආවා. ඒ තරමට මේක සම්පූර්ණයෙන් ව්‍යාකූල තත්ත්වයකට පත් කරලා තිබෙන්නේ. අන්න ඒ පරිසරය තමයි අද අපි වෙනස් කරමින් එන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මේ කාරණයත් කියා මගේ කථාව ඉවර කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක අපි අනිවාර්යයෙන්ම වෙනස් කරනවා. ඒ වෙනසට මේ වනකොට භාජන වෙලා තිබෙනවා. අන්න ඒ වෙනස්කමත් එක්ක ඉස්සරහට යනකොට අපි ආණ්ඩුවක් විධියට ඊළඟට කල්පනා කරනවා, විශේෂයෙන්ම මිනිස්සු අල්ලස් ගන්න පෙලඹෙන්නේ ඇයි කියන කාරණය ගැන සොයන්න. එහෙම නම්, අන්න ඒ පෙලඹීමට අදාළව තිබෙන සමාජ වටපිටාව මර්දනය කරන අතරේ, ජනතාවගේ ආදායම වැඩි කිරීම සඳහාත් අපි කටයුතු කරනවා. රාජ්‍ය සේවකයින්ගේ, පෞද්ගලික අංශයේ සේවකයින්ගේ වැටුප් වැඩි කරමින්, ගොවි ජනතාව, ධීවර ජනතාව ආදී සකලවිධ ජනතාවගේ ආදායම් වැඩි කරන තැනට අපේ ආණ්ඩුව ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්තටම ආදායම් වැඩි කිරීම තුළත් අල්ලස් ගැනීමට අදාළව තිබෙන පෙලඹීම යම් ප්‍රමාණයකට අඩු කරන්න පුළුවන්. මෙන්න මේ තත්ත්වය තුළ අල්ලස් ගන්නා අය, හොරකම් කරන අය අල්ලන එක විතරක් නොවෙයි, ඊට අදාළව තිබෙන පසුබිම, පරිසරය සම්පූර්ණයෙන්ම මර්දනය කරලා, මුලිනුපුටා දැමීමට තමයි ආණ්ඩුවක් විධියට අපි අතගහලා තිබෙන්නේ. ඒ කාර්යය සාර්ථකව අපි ඉස්සරහට කරනවා කියන එක ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.08]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔය කිව්ව විධියට අල්ලනවා නම්, ඔය ඉස්සරහා පේළියේම ඉන්නවා අල්ලන්න එක්කෙනෙක්. මම තව ටිකකින් කියන්නම්, පුළුවන් නම් අල්ලන්න. අල්ලන්න බැහැ. ඔබතුමන්ලා ඒවා කියන්නේ නැහැ. ඔබතුමන්ලාගේ කථාව විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ පවවලට ඇබ්බැහි වෙලා දෝ කියලා සැකයක් තිබෙනවා. අද උදේ අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වේ මේකයි. මීට පෙර දූෂණ විරෝධී පනතින්, ඡන්දයෙන් තේරී පත් වෙලා ආපු දේශපාලන කණ්ඩායම්වල වත්කම් හා බැරකම් ප්‍රසිද්ධ කිරීමේ අයිතිය ලබා දීලා තිබුණා. තමුන්නාන්සේලා ඒක නැති කළා. ඒක තමයි මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වේ. අද උදේ අගමැතිතුමිය කියනවා, "නැහැ, බොරු කියනවා" කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දැන් බලන්න, - ඔබතුමාගේ මේසය මතත් තියලා ඇති - මේ සභාවට ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධනය වන වගන්තිය. මොකක්ද මේ දූෂණ විරෝධී (සංශෝධන) පනත කෙටුම්පතේ තිබෙන්නේ? ඒකේ 11(2) වගන්තිය යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "(1අ) (අ) වෙනත් යම් තැනැත්තකුගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක සංස්කරණය කළ පිටපතක් ලබා ගන්නා තැනැත්තකු විසින් 86 වන වගන්තිය යටතේ ඒ ප්‍රකාශය යම් නිලධරයකුට හෝ යම් ආයතනයකට ඉදිරිපත් කිරීමට හැර වෙනත් යම් කාර්යයකට එකී ප්‍රකාශය භාවිත කරනු නොලැබිය යුතු ය."

මේක හැමෝටම පොදුයි. මේක තමයි වහලා ගැහුවේ. අගමැතිතුමිය උපදෙස් ගත්තේ කාගෙන්ද? කවුද නීතිඥ මහත්මයෙකුගෙන් උපදෙස් ගත්තේ. එතුමා ඒ කාලයේත්, දැනුත් ඉන්නේ උසාවියේ පඩි පෙළේ. පඩි පෙළේ නඩු ඇහුවේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේක තමයි වෙනස් වෙන්නේ අද මේ සංශෝධනයෙන්. මේ සංශෝධනයෙන් නැවත තිබුණු වගන්තියට යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. උසාවියේදී එකඟ වුණා. බිමල් රත්නායක සභානායකතුමා පිළිගත්තා. ඇයි, මෙයාලා දැන් හොරකම් කරලා තිබෙන්නේ, කඳ බඩ මහත් වෙලා තිබෙන්නේ. ගෙවල්, යාන වාහන අරගෙන තිබෙන්නේ. ආවේ මේවා පෙන්වනවා කියලා. පෙන්වනකොට හෙළි වුණා මෙයාලාගේ හොරකම් ටික. තට්ටු තුනේ හතරේ ගෙවල් හදලා තිබෙන්නේ. දැන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බවට පත් වෙලා තිබෙන්නේ. "අපි දැන් කෙහෙල් කැන් ගන්නේ නැහැ, අපි දැන් කරවල ගන්නේ නැහැ. එදා ගත්තා, දැන් ගන්නේ නැහැ, අපිට තිබුණා" කියමින්, එහෙම නේ හැසිරුණේ. මේවා හෙළි වෙනකොට, අද ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පත ඇතුළේ හංගලා ගහන්න ගිය එකත් අගමැතිතුමිය දන්නේ නැහැ. දන්නේ නැහැ වාගේ කථා කරනවා. අපි බොරු කියනවා ලු.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**[ගරු චමින්ද විජේසිරි මහතා]**

අද බොරු කියන්න පුරුදු වෙලා තිබෙනවා. ඒකේ වෙනසක් වෙන්නේ නැහැ නේ. ඒක හොඳට පුරුදු වෙලා තිබෙනවා. ඒ නිසා අගමැතිතුමියට වෙන්නේ ඕකම තමයි. අර කථාවක් තිබෙනවා නේ, කාත් එක්කද හිටියොත් කාත් එක්කද නැඟිටින්න වෙනවා කියලා.

ඊළඟ කාරණය මේකයි. සභානායකතුමා ඇවිල්ලා ලේඛනයක් කියවා ගෙන, කියවා ගෙන ගියා. නියෝජ්‍ය ඇමතිතුමනි, මම කියන්නම්, එතුමාට කියන්න අමතක වුණු ඒවා. මේක, 2026.10.02 දිනට අදාළ එක; මෑතකම එක. මොකක්ද? අතුරුගිරියේ මිලේනියම් සිටි නිවාස සංකීර්ණයට අයත් භූමියක්, පෞද්ගලික දේපළක් බලහත්කාරයෙන් අත්පත් කර ගෙන තිබෙනවා. කවුද අත්පත් කරගෙන තිබෙන්නේ? නමත් කියන්නම්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සහ කඩුවෙල ඉන්න නගරාධිපති. අන්න පැමිණිල්ල දාලා තිබෙනවා, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු. අද නඩුත් නැහැ, පැමිණිලිත් නැහැ.

ඊළඟ එක මොකක්ද? මේවා අර කියපු ලේඛනයට ඇතුළත් නොවුණු ඒවා. 2026.02.11 දිනට අදාළ පැමිණිල්ලක් තිබෙනවා. හර්ෂණ රාජකරුණා පැමිණිල්ල දාලා තිබෙනවා, අල්ලස් කොමිසමට.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කොට්ට මෙට්ට ටික අතුරුදහන් වීම සම්බන්ධව. ඒවා කියන්නේ නැහැ. ඒවාත් හොරකම් තමයි මහත්තයෝ. ඒවාත් වංචා තමයි, ඒවාත් දූෂණ තමයි. ඒවා ජාතික ජන බලවේගයේ හොරකම් නිසා, ඒවා වහන්න කවුරුවත් කියලා නැත්නම්, කොන්දක් තිබුණා නම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒවාත් අද කියන්න තිබුණා.

ඊළඟට, 2026.06.26 දින ශ්‍රී ලංකාවට ප්‍රමිතියෙන් තොර බාල ගල් අඟුරු ගෙනාපු සිද්ධිය. ඇමතිකමින් අයින් වෙලා ෂේප් වෙන්න හදනවා. අදටත් ඒ හොරකමට, වංචාවට, දූෂණයට වැය වුණු මුදල් රටේ ජනතාව ගෙවනවා. කෝ, මේවාට නඩු? මේවා හොරකම් නොවෙයිද, වංචා නොවෙයිද? මේවාටත් පැමිණිලි දාලා තිබෙන්නේ. ඒවා අද විමර්ශනය වෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා.

ඊළඟට, වසන්ත සමරසිංහ ඇමතිතුමාට ගල්කිස්සේ තිබෙන නඩුව මොකක්ද? දැන් මම ඔබතුමන්ලාට කියනවා කිව්වා නේ. මෙන්න තිබෙනවා එම වාර්තාව. ගරු ඇමතිතුමනි, ඔබතුමා නැඟිටින්න ඉස්සෙල්ලා මම මේ අදාළ ලේඛන ටික **සභාගත*** කරනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම මේක කියවන්නම්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සහ රන්කොත් ගෙදර සිරිල් ආනන්ද සිරි යන අය තුන්කෝටි හැටලක්ෂයක ඉඩමක් වංචා කර තිබෙනවා. ඒ වංචාවේ වැඩ පිළිවෙළ ගැන තමයි මේකේ කියන්නේ. මේවා හොරකම් නොවෙයිද? මේ තිබෙන්නේ නඩු අංකය -

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ )
(The Hon. Wasantha Samarasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මගේ වෙලාව දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා පට්ටපල් බොරුවක් කියනවා. *[බාධා කිරීම්]* ඔව්, බොරුවක් තමයි කියන්නේ. ඔය නඩුවට අඩුම ගණනේ නම් කරලාවත් නැහැ. ඔය, වංචාකාරයෝ ටිකක් නඩුවක් දමලා ජනාධිපතිවරණයට කලින් ගහන්න හදපු ගේමක්. මම ඉතුරු ටික කියන්නම් ඔබතුමාට. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අනේ, ඔයා හරි සුදනා. ඉන්නකෝ, මහත්තයෝ. *[බාධා කිරීම්]* මෙන්න බී වාර්තාව - *[බාධා කිරීම්]* මෙන්න බී වාර්තාව ලියන පොලිස් නිලධාරියා, පො.සැ. 30602 - ස්ථානාධිපති ගල්කිස්ස. මොකක්ද කියන්නේ? මම එක කොටසක් කියන්නම්. "...එබැවින්, මෙම සිද්ධියට අදාළව මෙම පැමිණිල්ලේ සඳහන් ප්‍රශ්නගත දේපළ අංක 207 දරන බදු ඔප්පුවේ ගැණුම්කරුවන් වශයෙන් කටයුතු කර ඇති සේනක මුදියන්සේලාගේ ජයසිංහ හා ගල්මුණ ආරච්චිලාගේ රංජන් ජයලාල් පෙරේරා යන අයවලුන් විසින් බදු ගැනීමට රුපියල් 360,000ක මුදල ගෙවීම් කිරීම් සම්බන්ධයෙන් කරුණු අනාවරණය කර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීමට කාර්යාංශයට පැමිණෙන ලෙස ඔවුන්ට ලියාපදිංචි තැපෑලෙන් අදාළ ලිපි යවා තිබුණත් මේ දක්වා මේ අයවලුන් ස්ථානයට නොපැමිණීම නිසා ..." කියා සඳහන් වනවා. ගිහිල්ලා නැහැ. මේ තිබෙන්නේ බී වාර්තාව. එය ඉදිරිපත් කරනවා, අධිකරණයට. මෙන්න නඩු අංකය - බී 29984/24. එළියේදීත් ඕනෑ නම් කියන්නම්. මේ වාර්තාව අරගෙන ඇවිල්ලා මම මේ කියන්නේ. කෝ මේවාට, -*[බාධා කිරීම්]* මෙයාලා හරි සුදනෝ වෙන්න එනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අද මහ ලොකු සුද්දවන්තයෝ වෙන්න හදනවා. *[බාධා කිරීම්]* ඔන්න, දමනවා නම් නඩු දමන්න. *[බාධා කිරීම්]* මෙන්න ඔබගේ හොරකම. *[බාධා කිරීම්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මෙන්න ඔබ කර තිබෙන හොරකම. *[බාධා කිරීම්]* මේවාට නඩු නැහැ. හැබැයි, මතක තබා ගන්න ඔයගොල්ලන් අද ඔයගොල්ලන්ගේ ජනවරමේ සැක පිට ඉන්නේ. *[බාධා කිරීම්]* ඔයගොල්ලන්ට ඇප නැති වෙන, ඔයගොල්ලන්ට නඩු දමන යුගය අපි ඉදිරියේදී ගෙනෙනවා. *[බාධා කිරීම්]* ඔයගොල්ලන් අද ජනවරමේ සැකකාරයෝ. ඒක මතක තබා ගන්න. *[බාධා කිරීම්]* ඔයගොල්ලන්ට ඇප නැති වෙන්න -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට විනාඩි 10ක් තිබෙනවා නේ.

දැන් ඔයගොල්ලන් එක එක බිල්ලෝ මවා ඔයගොල්ලන්ගේ බලය රැක ගන්න උත්සාහ කරනවා. රාජපක්ෂවරු හිරේ දමලා ඔයගොල්ලන්ගේ නොහැකියාව වසා ගන්නයි උත්සාහ කරන්නේ. හැබැයි, අපි එකක් කියනවා. අර්ච්චුනා මන්ත්‍රීතුමා ඩයස්පෝරාව ගැන කියනවා. හැබැයි, ඒ ඩයස් පෝරාව සතුටු කරවන්න ඔයගොල්ලන් එක එක නාඩගම් නටනවා. අපි එක දෙයක් කියනවා. අපි ජාතිවාදයට විරුද්ධයි. ආගම්වාදයට විරුද්ධයි. ජාතිවාදය, ආගම්වාදය වෙනුවෙන් සමහරු හිරේ දැම්මාට කමක් නැහැ. හැබැයි, ආගම, සිවුර පාවිච්චි කරලා ඔයගොල්ලන්ට ඔය ජනවරම ලබා දුන්, ඔය ජනවරම වෙනුවෙන් සල්ලි වියදම් කරපු ඒ නඩ සතුටු කරන්න කවුරු හරි කටයුතු කරනවා නම් ඒකට විරුද්ධව පෙළ ගැසෙන්න සමගි ජන බලවේගයේ අපි පස්සට යන්නේ නැහැ කියන කාරණයත් මේ අවස්ථාවේ මා මතක් කරනවා. ආගම විකුණා, චීවරය විකුණා, චීවරය ගලවා ජාතික ජන බලවේගයට පැවැත්ම තිබෙන්නේ එතැන කියලා අද තමුන්නාන්සේලා හිතනවා නම්, එතැන තමයි තමුන්නාන්සේලා වරද්දා ගන්නේ. එහෙම වෙන්න දෙන්න බැහැ. ඒක කරන්න බැහැ. ආගම්වාදය, ජාතිවාදය මුලිනුපුටා දමන්න. *[බාධා කිරීම්]* ඔයගොල්ලන්ට බලය දුන් නිසා, බලය ගන්න උදවු කළ නිසා ඒ කට්ටිය වෙනුවෙන් පෙනී සිටිනවා නම් වැරදියි.

අජිත් පී. පෙරේරා මැතිතුමනි, බන්ධනාගාර කොමසාරිස්තුමා ඇවිල්ලා මාධ්‍ය ප්‍රකාශක හැටියට මොනවා කිව්වත්, ඕනෑම සිරකරුවෙකුට ඉල්ලීමක් කරන්න පුළුවන්, "මගේ නඩු කටයුත්තට යන විට, අධිකරණයට යන විට මට කැමැති ඇඳුමෙන් යන්න දෙන්න" කියලා. ඒකට අවසරය දෙන්න ඕනෑ. සිවුර ඇඳගෙන යන්න අවසරය දෙන්න ඕනෑ; ටයි එක, කෝට් එක දමාගෙන යන්න අවසරය දෙන්න ඕනෑ. ඒකට නීතියේ ප්‍රතිපාදන තිබෙනවා. හැබැයි, බන්ධනාගාර කොමසාරිස්වරයා ඇවිල්ලා පැලවත්තට ඕනෑ විධියට කියනවා නම්, ඔයගොල්ලන්ට ඕනෑ විධියට කියනවා නම්, ඒක වැරදියි. අද වනවිට ඔයගොල්ලන්ට දිට්ඨධම්ම වේදනීය කර්මය පටිසන් දීලා තිබෙනවා. විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එපාය කියලා, විසි දෙක හොඳ නැහැ කියලා මහ නායක හාමුදුරුවරුන් කිව්වා. අපිට ආරංචියි, අද මහ නායක හාමුදුරුවරුන් සරණං ගච්ඡාමි කරන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

යනවාය කියලා. මම දන්නේ නැහැ, කලිසමක් ඇඳගෙන යනවාද, වෙන මොකක් හරි ඇඳගෙන යනවාද කියලා. මහ නායක ස්වාමීන් වහන්සේලාගෙන් අපි අහනවා, ඔබවහන්සේලාට ඇහුම්කන් දුන්නේ නැති, ඔබවහන්සේලා කියන දේ අහන්නේ නැති, ඔබවහන්සේලාගේ ලියුම පිළිගන්නේ නැති උදවිය දැන් ඇවිල්ලා මේ ජාතියට, ආගමට කරන නිගරුව පිළිබඳව කියනකොට, මොනවාද ඔබවහන්සේලා කියන්නේ කියන කාරණය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වේලාවක් ලබා දෙන්න.

මම එක දෙයක් කියන්න ඕනෑ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපතිවරයා කියනවා, නීතිය සැමට එකයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මාධ්‍යයට ඇවිල්ලා එක තැනකදී කියනවා, පසුගිය ආණ්ඩුවක ඇමතිවරයෙක්, සභාපතිවරයෙක් හිරගත කර තිබෙනවා, ඒ හොරකම් කරලා නොවෙයි, අල්ලස් අරගෙන නොවෙයි, දේශපාලනය කළ නිසායි කියලා. ජනාධිපතිවරයා ප්‍රසිද්ධ වේදිකාවකදී කියනවා, මම ජාතික ජන බලවේගයේ ජනාධිපතිවරයා විධියට ඇවිල්ලා ඉන්නේ රජයේ මුදල් වියදම් කරලා - *[බාධා කිරීමක්]* ඒ අයව හිරේ දමන්නේ නැත්තේ ඇයි කියන කාරණය අපි අහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ අද දවසේ 7වැනි කථාව මම කළේ. මේ පාර්ලිමේන්තුව video links අනුපිළිවෙළට මාධ්‍යවලට මුදා හරිනවා. අද දවසේ 7වැනි කථාව විධියට මම කරපු කථාව තවමත් මුදා හැරලා නැහැ. නමුත්, 8, 9 සහ 10ත් මුදා හැරලා තිබෙනවා. ඒක විශාල අසාධාරණයක්. මම මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ප්‍රධාන කථිකයෙක්. මම අද කරපු කථාවේ video එක තමුන්නාන්සේලා රඳවාගෙන ඉන්නවා නම්, ඒක ඉතාම වැරැදියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි ඒ සම්බන්ධයෙන් සොයා බලනවා, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.18]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බෙහෙවින් සතුටු වෙනවා මට විපක්ෂය පැත්තෙන් විනාඩි 4ක කාලයක් හෝ ලැබීම සම්බන්ධයෙන්. *[බාධා කිරීමක්]* ආණ්ඩුව පැත්තෙනුත් මට පොඩි වෙලාවක් හරි දෙන්න, පුළුවන් නම්.

විශේෂයෙන්ම, මේ පනත් කෙටුම්පත සම්මත කිරීමට තමුන්නාන්සේලා උත්සාහ කළේ, ඇප ලබා දීමේ බලය මහාධිකරණයට පැවරෙන තැනකට තල්ලු කිරීමටයි. ඒ කියන්නේ, මහේස්ත්‍රාත් අධිකරණයේ එම බලය අහෝසි කරලා, එම අධිකරණයට තිබුණු ඇප ලබා දීමේ බලය අහෝසි කරලා ඒක Director General වෙත පැවරීමටයි තමුන්නාන්සේලා උත්සාහ කළේ. මම ශ්‍රේෂ්ඨාධිකරණයට ස්තුතිවන්ත වෙනවා, ඒක නතර කළාට. මොකද, එතැනින් තමයි ඒ කටයුත්ත නතර වුණේ. එහෙම නොවුණා නම්, අනාගතයේදී මේ රටේ සිය දහස් ගණනක් මිනිසුන් තමුන්නාන්සේලා ඇතුළට තල්ලු කරනවා.

අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මිනිසුන් අරගෙන ගිහිල්ලා තර්ජනය කරලා තමයි කට උත්තර ලබා ගන්නේ. හැම කෙනෙකුටම කියනවා, "අරයාගේ නම කියන්න, මෙයාගේ නම කියන්න" කියලා. චාමර සම්පත් මහත්මයාගේ නම කියන්න කියලා ලේකම්වරයාට කථා කරලා කියලා තිබෙනවා. ඊළඟට, ජානකී සිරිවර්ධන මහත්මියට කථා කරලා කියලා තිබෙනවා, "නාමල් රාජපක්ෂගේ නම කියන්න, එතකොට ඔයාට හොඳින් ඉන්න පුළුවන්" කියලා. මේක තමයි තමුන්නාන්සේලා කරන්නේ. මේකද තමුන්නාන්සේලා ප්‍රාර්ථනා කරපු නීතිය?

ඒ වාගේම මම තවත් කාරණයක් කියන්න කැමැතියි. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් අපේ මහානායක මාහිමිපාණන් වහන්සේලා මේ රටේ ජනාධිපතිවරයාට ලිපියක් යැව්වා. සති දෙකක් යනකල්ම, ඒ ලිපිය තිබුණේ කොහේද කියලා සොයා ගන්න බැරිව තිබුණා. ඊට පස්සේ බොහොම අමාරුවෙන් ඒක එළියට දැම්මා. ඒ ඉල්ලීමට ඇහුම්කන් දුන්නේ නැතිව හිටියා. ඊළඟට මහානායක මාහිමිපාණන් වහන්සේලා ලිපියක් යැව්වා, ගලගොඩඅත්තේ ඥානසාර හාමුදුරුවන්ට ජනාධිපති සමාව ලබා දී තිබුණු නිසා උන්වහන්සේ නිදහස් කරන්න කියලා. ඒ ඉල්ලීම ඉටු කරන්නේ නැතුව දැන් ගිහිල්ලා නායක හාමුදුරුවරුන් වහන්සේලා හමුවෙනවා. අපි ජනාධිපතිතුමාට කියන්නේ, කරුණාකරලා ඒ කටයුත්ත කරලා උන්වහන්සේලා හමුවෙන්න යන්න කියලායි. එහෙම නැත්නම්, මහානායක හාමුදුරුවන් වහන්සේලා හමුවෙන්න යනකොට දොර වහන එකයි කරන්න තිබෙන්නේ. මේ රටේ සිංහල බෞද්ධ නායකයන් විධියට අප මේ ගැන කථා කරන්නේ ලජ්ජාවෙන්.

මේ පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන් 159දෙනාගෙන් 40කට වඩා ඉන්නවා, 1988-1989 කාලයේදී සිවුර අස්සේ හැංගිලා හිටපු. ඒ අය ඒ කාලයේ සිවුර අස්සේ තමයි හැංගුණේ. හැංගිලා බේරුණා. දැන් තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා මේ රටේ අපේ හාමුදුරුවරුන්ගේ සිවුර ගලවන්න හදනවා. මේක බුද්ධාගමට වින කරන ආණ්ඩුවක්; සිංහල බෞද්ධයාට වින කරන ආණ්ඩුවක්. ආණ්ඩුවේ එක මන්ත්‍රීවරයෙක් ඊයේ කියනවා මම දැක්කා, "අපිත් බෞද්ධයෝ" කියලා. තමුන්නාන්සේලාත් බෞද්ධයෝ නම්, ඒ බෞද්ධකම රැකගන්න. මේ රටේ මිනිසුන්ව විනාශ කරන්න හදන්න එපා. අද අපේ රටේ උතුරු ප්‍රදේශයේ පන්සලකට යන්න දෙන්නේ නැහැ. ජනාධිපතිතුමා කියනවා, ඒක ජාතිවාදියි කියලා. ඒ වාගේම, අපේ සංස්කෘතිය රැක ගන්න ඉඩ දෙන්නේ නැහැ. ඒකත් ඉවරයි. ඒ වාගේම, මේ පාර්ලිමේන්තුවේ සභානායකවරයා බොහොම පැහැදිලිව කෙළින්ම කියනවා, බුද්ධ වන්දනාව, එහෙම නැත්නම් බුදු පිළිමවලට වන්දනා කිරීම ගෝත්‍රිකයි කියලා. ඊළඟට,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හේවගේ නියෝජ්‍ය අමාත්‍යතුමා කියනවා, "බෝ ගස්වලට වඳින්න එපා, ඒක ගෝත්‍රිකයි" කියලා. මොනවාද මේ කථා කරන්නේ? තමුන්නාන්සේලා මහා ලොකුවට "අපි බෞද්ධයෝ, අපි බෞද්ධයෝ" කිව්වාට, අනෙක් පැත්තෙන් මේ රට නිරාගමික තැනකටයි ගෙන යන්නේ.

ඥානසාර හාමුදුරුවන්ට නඩුව පවරන ප්‍රතිපත්ති කේන්ද්‍රය උල්ලංඝනය කරන්නේ මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වන ව්‍යවස්ථාව; බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කළ යුතුයි කියන ව්‍යවස්ථාව. 10වන ව්‍යවස්ථාව තමයි, තමන්ට අභිමත ආගමක් ඇදහීමට ඇති නිදහස ගැන කියැවෙන ව්‍යවස්ථාව.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක අමතර කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10වන ව්‍යවස්ථාවත් උල්ලංඝනය කරලා තමයි මේ නඩුව පවරා තිබෙන්නේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ඉන්නේ කවුද? ඒ අය සම්පූර්ණයෙන්ම එල්ටීටීඊ ඩයස්පෝරාවට අත වනන කට්ටිය. ඒ අය මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් ගැන කථා කරන අය නොවෙයි. ඒ දාපු නඩුව නිසා තමයි අද ගලගොඩඅත්තේ ඥානසාර හාමුදුරුවන්ගේ සිවුර ගලවන්නේ, මේ ආණ්ඩුව. මතක තබාගන්න, මේක අධිකරණයෙන් දුන්නු තීන්දුවක් නොවෙයි කියන එක. සිවුර ගලවන්න කියලා අධිකරණයෙන් නියෝග කළේ නැහැ. බන්ධනාගාර නීත්‍ය නියෝගවල 550වන වගන්තියේ සඳහන් වෙනවා, සිරකරුවකු නඩුවක් සඳහා අධිකරණයට රැගෙන යනවා නම්, ඔහුගේ ඇඳුමකින් ඔහු අරගෙන යන්න කියලා. ඒ අනුව, ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් ඒ නඩුවට වඩම්මවන්න තිබුණේ උන්වහන්සේගේ සිවුර සහිතවයි. නමුත් මොකක්ද කළේ? සුදු ඇඳුමක් අන්දවා අධිකරණයට රැගෙන ගියා. කවුද මේ විනාශය කරන්නේ? කවුද මේ රටේ සිංහල බෞද්ධයාගේ අයිතිවාසිකම්, හාමුදුරුවරුන් වහන්සේලාගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නේ? තමුන්නාන්සේලා වෙනුවෙන් ඡන්දය දුන්නු හාමුදුරුවන් වහන්සේලා ඉන්නවා. අපි ඒ හාමුදුරුවන් වහන්සේලාගෙන් අහනවා, මේකටද මේ ආණ්ඩුව පත් කර ගත්තේ කියලා. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම ගැන මේ අධිකරණ ඇමතිවරයා සම්පූර්ණයෙන්ම වග කියන්න ඕනෑ. එතුමා තමයි මේකට වග කියන්න ඕනෑ කෙනා. මොකද, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි බන්ධනාගාර තිබෙන්නේ. වහාම පරීක්ෂණයක් කරන්න ඕනෑ, කාගෙන් අහලාද ගලගොඩඅත්තේ ඥානසාර හාමුදුරුවන් වහන්සේගේ සිවුර ගලවලා අධිකරණයට එක්කරගෙන ගියේ කියන එක ගැන. අද මේක එතැනට තල්ලු වෙලායි තිබෙන්නේ.

අගමැතිතුමිය කියනවා, 2025දී දාපු සංශෝධනයේ තිබෙන secular State එකක් ගැන. මොකක්ද ඒකෙන් කියන්නේ? Secular State එකක් කියන්නේ, ආගමෙන් ස්වාධීන වූ රාජ්‍යයක්; කිසිදු ආගමකට රාජ්‍ය ආගමක් ලෙස විශේෂ ප්‍රමුඛතාවක් නොදී සියලු ආගම්වලට සමාන නීතිමය තත්ත්වයක්. අප කියන්නේ බුද්ධාගම පෝෂණය කර, ආරක්ෂා කර, අනෙකුත් ආගම්වලට අවශ්‍ය කරන ඒ සහයෝගය, ශක්තිය ලබා දෙන්න ඕනෑ කියලායි. අපි කියන්නේ නැහැ, ඒවා පැත්තකට විසි කරන්න කියලා. හැබැයි, මේ රටේ අවුරුදු 2,500ක් රැකගත්තු බුද්ධාගම විනාශ කරන වැඩ පිළිවෙළකටයි මේ යන්නේ. මේකේ අවසානයට ගියාම තමුන්නාන්සේලාට ඡන්දය දුන්නු මේ රටේ මිනිසුන්ගේ සරමත් ගලවලා තමයි තමුන්නාන්සේලා මේක නතර කරන්නේ. මතක තියාගන්න. *[බාධා කිරීමක්]* ඉන්න මහත්තයෝ, කෑගහන්නේ නැතුව. දන්නේ නැති බම්බුවලට කථා කරනවා. සිංහල බෞද්ධයා විනාශ කරලා- *[බාධා කිරීමක්]* සිංහල බෞද්ධයා විනාශ කරලා, තමුන්නාන්සේලා ලජ්ජා නැතුව- *[බාධා කිරීමක්]* කොළඹ දිස්ත්‍රික්කයේ- *[බාධා කිරීමක්]* නම කියන්නකෝ. කරුණාකරලා ගමට ගිහිල්ලා අහලා බලන්න, ඔයාට ඡන්දයක් දෙන්න පුළුවන්ද කියලා. අහලා බලන්න, ගමට යන්න පුළුවන්ද කියලා. මේ රටේ ජීවත් වෙන මිනිස්සු,- *[බාධා කිරීමක්]* යන්න මහත්තයෝ යන්න, දන්නේ නැති දේවල් කථා කරන්නේ නැතුව.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ රටේ සාධාරණයක් ගැන කථා කරන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම බොහොම පැහැදිලිව මේ රටේ සිංහල බෞද්ධයන්ට මේ කාරණය කියනවා. මේ ආණ්ඩුව පටන් ගත්තු දවසේ ඉඳලා හැමදාම අපේ රටේ බෞද්ධ සංස්කෘතිය විනාශ කළා; අපේ සභ්‍යත්වය විනාශ කළා; අපේ තිබිච්ච අයිතිවාසිකම් විනාශ කළා; අපේ ඉතිහාසය පොතෙන් අයින් කරන්න වැඩ කටයුතු කළා. මෙහෙම ආණ්ඩුවක් ඉතිහාසයේ කවදාවත් පහළ වුණේ නැහැ. අර කථාවක් තිබෙනවා, එළාර රජ්ජුරුවෝ සිංහලයෙක් වෙලා හරි රටෙන් පළිගන්නවා කිව්වා කියලා. එහෙම රජෙක් තමයි දැන් අද ඇවිත් තිබෙන්නේ. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා, තමුන්නාන්සේලාට මේක වැඩිකල් කරගෙන යන්න හම්බ වෙන්නේ නැති බව. මේ රටේ සිංහල බෞද්ධ මිනිස්සු ඉන්න කල්, අපේ හාමුදුරුවරු ඉන්නකල්, තමුන්නාන්සේලාට මේ විනාශය කරන්න ඉඩ දෙන්නේ නැහැ කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.25]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

දූෂණ විරෝධී පනතට ගෙනාපු සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තමයි අද දවස පුරාම මේ විවාදය පැවැත්වෙන්නේ. මම කැමැතියි මුලින්ම විපක්ෂයට කියන්න, shouting loudly would not suppress the truth; හයියෙන් කෑ ගැහුවා කියලා සත්‍යය යටපත් වෙන්නේ නැහැ. අපි දැක්කා, විපක්ෂයේ මන්ත්‍රීවරු හයියෙන් කෑ ගහනවා. හැබැයි, කිසිම හරයක් තිබෙන කථාවක් අපි විපක්ෂයෙන් අද දවසේ දැක්කේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ දූෂණ විරෝධී පනතට මේ සංශෝධනය ගෙන එන අවස්ථාව වන විට මේ රටේ පවතින තත්ත්වය ගැන අපි දන්නවා. ඒ වාගේම, 2024දී ජාතික ජන බලවේගය - මාලිමාව - මේ රටේ බලය ගන්න කලින් මොන වාගේ රටක්ද අපට උරුම වෙලා තිබුණේ කියලාත් අපි දන්නවා. මේ රටේ මහ ජනතාව පසුගිය කාලයේ විශ්වාස කළේ මොකක්ද? කවුරු හරි තමන් දන්නා ඉහළ නිලධාරියෙකු අල්ලාගෙන, දේශපාලනඥයෙකු පස්සෙන් ගිහිල්ලා, අල්ලසක් දීලා තමන්ගේ වැඩක් කර ගන්න එක සාමාන්‍ය සම්ප්‍රදාය වෙච්ච රටක තමයි අප ජීවත් වුණේ. මේ රටේ ජනතාව ඒක දන්නවා. මේ රටේ ජනතාව මැරිලා ඉපදිලා නැහැ. එහෙම වැඩක් කර ගන්න එක තමන්ගේ අවශ්‍යතාවක් ඉටු කර ගැනීමේ සංස්කෘතිය වෙලා තිබුණේ අල්ලසට මුල් තැන දීපු, බලයට මුල් තැන දීපු තත්ත්වයක් තිබුණු නිසායි. ඒ නිසා මේ නව නීති සංශෝධන ගෙන ඒම තුළ වඩා වැදගත් කාරණාව විධියට අප දකින්නේ, මේ රටේ සමස්ත ජනතාව තුළ මේ රටේ නීතිය, නීතියේ ආධිපත්‍යය පිළිබඳව විශ්වාසය කොහොමද තහවුරු කර ගන්නේ කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මොහොතකට කලින් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කළා. 2015 ජූනි මාසයේ 01වන දා තමයි ඔය කියන "සිරිලිය" ගිණුම සම්බන්ධයෙන් මුල් වතාවට ශිරන්ති රාජපක්ෂ මහත්මියට කථානායක නිල නිවසට එන්න කියලා ප්‍රකාශයක් සටහන් කර ගත්තේ. ඒක අපට මතකයි. 2015 වර්ෂයේ සිට අවුරුදු 11ක් ගිහිල්ලා තමයි නීතිය ක්‍රියාත්මක වුණේ. එතකොට, ඒ මුල් අවස්ථාවේදී ප්‍රකාශ ගන්න කොට කාගේ ආණ්ඩුවද මේ රටේ තිබුණේ? එතකොට කවුද මේ රටේ ආණ්ඩු කළේ? එදා ආණ්ඩු කරපු කණ්ඩායම තමයි අද විපක්ෂයේ ඉන්නේ. ඒ කාලයේ කරපු පැමිණිලි සම්බන්ධයෙන් නිසියාකාරයෙන් විමර්ශන සිද්ධ වුණා නම් මේ රටේ මිනිස්සුන්ට යුක්තිය ඉෂ්ට වෙනකම් අවුරුදු 10ක්, 11ක් බලාගෙන ඉන්න වෙන්නේ නැහැ. ඒ කාලයේ ආණ්ඩු කරපු අය අද රක්ෂිත බන්ධනාගාරයට යනවා මම දැක්කා, සැකකාරයෝ බලන්න. එවැනි දෙබිඩි ප්‍රතිපත්තියක ඉඳගෙන තමයි මේ උත්තරීතර සභාව තුළ කෑ ගහලා සත්‍යය යටපත් කිරීමට උත්සාහ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ දූෂණ විරෝධී පනතට අදාළව ගෙනෙන්නේ එම පනත තවත් ශක්තිමත් කිරීමට අවශ්‍ය වන සංශෝධනයක්. ඇයි, මේ ශක්තිමත්භාවය අවශ්‍ය කරන්නේ? දූෂණය නිර්මාණය වෙන්නේ බලය හේතුකොටගෙනයි. ඒ නිසා මේ බලය වගවීමට යටත් කිරීම සඳහා ඉතා තද නීති අවශ්‍ය වෙනවා. ඒ සඳහා තමයි අද මේ දූෂණ විරෝධී පනතට අදාළ සංශෝධන ගෙනෙන්නේ. දූෂණයේ යෙදෙන තැනැත්තන් නීතියේ රැහැනට හසුකර ගැනීම පමණක්ම නොවෙයි මේ නීති සංශෝධනයන්ගෙන් අපේක්ෂා කරන්නේ. මේ

[ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා]

රටේ ජනතාව, නිලධාරින්, දේශපාලනඥයින් දූෂණයට යොමු වීම වළක්වා ගැනීමත් මේ නීති සංශෝධනයන්ගෙන් අපේක්ෂා කරනවා.

ඒ වාගේම අපි දැක්කා, වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙනුත් විවිධ චෝදනා ඉදිරිපත් කරනවා. ඇත්තටම මේ වනවිට වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඩිජිටල් මාධ්‍යය හරහා online ක්‍රමයට ලබා දීමට පහසුකම් සපයා තිබෙනවා. ඒ එක්කම වත්කම් සහ බැරකම් ප්‍රකාශ සම්බන්ධයෙන් සමතුලිතතාවක් තිබීමත් අවශ්‍ය වෙනවා. මොකද, මහජන නියෝජිතයින්ගේ වත්කම් සහ බැරකම්වල විශ්වසනීයත්වය, ජනතාවට ඒ සඳහා තිබෙන ප්‍රවේශය ඉතාම වැදගත් වනවා. ඒ වාගේම ඇතැම් රාජ්‍ය නිලධාරින්ගේ පෞද්ගලික තොරතුරු අනිසි ලෙස භාවිතය වැළැක්වීමත් කාලීන අවශ්‍යතාවක් බවට පත් වෙලා තිබෙන බව අපි දන්නවා. ප්‍රධාන මාධ්‍යවල සහ සමාජ මාධ්‍යවල හැසිරීම දිහා බැලුවාම ඒ සම්බන්ධයෙන් යම්කිසි සීමා කිරීම් කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂණ විරෝධී පනතේ වැදගත්කම, අවශ්‍යතාව මේ මොහොත වනකොට අපි අත්දකිමින් ඉන්නවා. මෙතෙක් කල් මේ රටේ දුබලයන්ට පමණක් ක්‍රියාත්මක වෙච්ච නීතිය අද වනකොට දුබල, ප්‍රබල බෙදීමකින් තොරව සියල්ලන්ටම එක විධියට ක්‍රියාත්මක වන බවක් දකින්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සරණ ගුණවර්ධන හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයා සිර දඬුවම් ලැබූ අවස්ථාවේදී ඒ දඬුවම ලිහිල් කරවා ගැනීම සඳහා අධිකරණ නිලධාරියෙකුට අල්ලස් දීම සම්බන්ධයෙන් ඔහුගේ බිරිඳ අත්අඩංගුවට ගත් බව ඔබතුමා දන්නවා. ඒ වාගේම ඊට අදාළ අධිකරණ නිලධාරියා අත්අඩංගුවට ගත්තා. තවත් අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයෙක් අත්අඩංගුවට ගත්තා. මේක තමයි මේ රටේ දීර්ඝ කාලයක් තිස්සේ පැවති සංස්කෘතිය. ඒ සංස්කෘතිය අද වනවිට වෙනස් වෙලා තිබෙනවා. ඉස්සර පාරේ යනකොට රථ වාහන පොලිසියෙන් වාහනයක් නතර කළාම කීයක් හරි අතමිට මොළවලා යන්න පුළුවන් කියලා විශ්වාස කරපු මහජනතාව, අද එහෙම විශ්වාස කරන්නේ නැහැ. ඒ පරිවර්තනීය වෙනස මේ රජය විසින් මේ රටට ගෙනැල්ලා තිබෙනවා. ඒ මහජන විශ්වාසය මේ රජය විසින් මේ රට තුළ ස්ථාපිත කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022දී ආර්ථිකය බිඳ වැටීමෙන් පස්සේ - ආර්ථික අර්බුදයෙන් පස්සේ - ජාතික ජන බලවේගය රජය ඇවිල්ලා, මේ රට යම් ආර්ථික සංවර්ධනයක් සහිතව ස්ථාවර කරමින් පවතින අවස්ථාවක තමයි අපි මේ ඉන්නේ. එවැනි වෙලාවක දූෂණය කියන්නේ, අල්ලස කියන්නේ හුදු අපරාධමය වරදක් පමණක් නොවෙයි. ඒ හරහා මේ රටේ ව්‍යවසායකයින්ට, ව්‍යාපාරිකයින්ට තමන්ගේ ව්‍යාපාර කරද්දී සීමාවෙන් එහාට ගිහිල්ලා අධික පිරිවැයක් දරන්න වෙනවා. අතීතයේදී එහෙම සිද්ධ වෙලා තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තමන්ගේ ව්‍යාපාරය ගොඩනහනකොට එක එක ආයතනවලට, නිලධාරින්ට අල්ලස් විධියට කොයි තරම් මුදලක් දෙන්න වුණාද කියන එක මේ රටේ ව්‍යාපාර කරපු මිනිස්සු දන්නවා. ඒක ආර්ථිකයට බරක්. ඒක ජනතාවට බරක්. ජනතාවගේ එදිනෙදා කටයුතුවලට ඒක විශාල බරක් වෙලා තිබෙනවා.

ඒ වාගේම, ඒ තුළින් රජයට ලැබිය යුතු ආදායම් විශාල වශයෙන් අඩු වෙලා තිබෙනවා. මොකද, රේගුව වාගේ ආයතන ගත්තාම, නිල වශයෙන් ලැබිය යුතු ආදායම් නොලැබී ඒවා අල්ලස් විධියට වෙන වෙන පුද්ගලයින්ගේ සාක්කුවලට ගිහිල්ලා රජයට ලැබිය යුතු මුදල් අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම, වැදගත්ම කාරණාවක් කියන්න තිබෙනවා. මේ රටට එන ආයෝජකයන්ට මේ රටේ ආර්ථිකය පිළිබඳව, නීතිය පිළිබඳව තිබෙන විශ්වසනීයත්වය මේ නිසා නැති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩිජිටල්කරණය හරහා ස්ථාවර රටක් නිර්මාණය කරමින් තිබෙන මොහොතක, online ක්‍රමයට වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශ ලබා දෙන තැනට ගෙනැල්ලා, ඩිජිටල් පද්ධතියක් ඇතුළේ මේවා විමර්ශනය කරන්න, එක් පද්ධතියක් ඇතුළේ කරුණු සොයන්න, විමර්ශන හරහා නීතිය හමුවට පමුණුවන්න ඕනෑ පුද්ගලයින් නීතිය හමුවට පමුණුවන්න අවශ්‍ය අවස්ථාව අපි නිර්මාණය කරමින් තිබෙනවා. අපි මේ නිර්මාණය කරමින් ඉන්නේ අනාගතයේදී අල්ලසක් දීලා වැඩ කරගන්න ඕනෑ රටක් නොවෙයි, නිසි ක්‍රමවේදය යටතේ ගිහිල්ලා තමන්ට අවශ්‍ය වැඩේ කරගන්න පුළුවන් රටක්.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ දූෂණ විරෝධී පනත ගෙනාවේ අපිය කියලා මේකට අයිතිවාසිකම් කියන කණ්ඩායමක් ඉන්නවා. අපි මේ දූෂණයට විරුද්ධයි කියලා ඔවුන් මහා හඬින් හඬ නඟනවා. හැබැයි, අද විපක්ෂයේ ඉන්න අයගේ හොරණ සංවිධායකවරයා වූ වරිත් අබේසිංහ තමයි පාතාල ලෝකයෙනුත් අල්ලස් අරගෙන බන්ධනාගාරයට ගියේ. මේ මොහොතේ මතු වෙලා තිබෙන තත්ත්වය තුළ රට ජාතිය බේරා ගන්න, ආගම බේරා ගන්න එන්න හිටපු කෙනෙක් තමයි, විජයදාස රාජපක්ෂ මැතිතුමා. එතුමාගේ පුතාත් ඒ එක්කම බන්ධනාගාරයට ගියා. එදායින් පසු එතුමාත් වැඩිය පෙනෙන්න නැහැ. මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.34]

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට සංශෝධන ගෙනෙන මේ මොහොතේදී ඉතාම කෙටියෙන් හෝ ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත්, ඊට පෙර පොඩි පැහැදිලි කිරීමක් සිදු කිරීමට අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම අද උදෑසන ගරු අගමැතිතුමිය විසින් මේ සභාවට අසත්‍ය තොරතුරු කිහිපයක් සභාගත කළා, අපේ රටේ විශ්වවිද්‍යාලවල නේවාසිකාගාර සම්බන්ධයෙන්. එතුමියගේ වචනවලින්ම කිව්වොත් එතුමිය කිව්වා, "පසුගිය අවුරුදු 10, 15

තිස්සේ එකම නේවාසිකාගාරයක්වත් ආරම්භ කරලා නැහැ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි, 2015 වෙද්දී එවකට හිටපු උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වූ එස්.බී. දිසානායක මැතිතුමා විසින් නේවාසිකාගාර 30ක් අලුතින් ඉදිකිරීමට අඩිතාලම දැමූ බව. ඒ අනුව, 2015-2018 අතර කාලයේ ඒ නේවාසිකාගාර 30 ඉදිකිරීම සම්පූර්ණ කළා. ඒ වාගේම, උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරපු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා විසින් අලුත් නේවාසිකාගාර 24ක් ආරම්භ කර, 2018 වනකොට අලුත් ශිෂ්‍ය නේවාසිකාගාර 54ක් ආරම්භ කිරීමට සමත් වුණා. ඒ අනුව, ශිෂ්‍යාවන් විශාල සංඛ්‍යාවකට නේවාසිකාගාර පහසුකම් ලබා දීමට පුළුවන් වුණා. ඒ නිසා, ගරු අගමැතිතුමියගේ අසත්‍ය ප්‍රකාශය ඇත්තටම අපි හෙළා දකිනවා. අපට පෙනෙන විධියට මේ රටේ ජනතාව වාගේම මේ සභාවත් නොමඟ යැවීමක් හැටියට තමයි අපි එය දකින්නේ. අපට පෙනෙන විධියට අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන්න පටන් අරගෙන තිබෙනවා කියලා තමයි අපට කියන්න වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කරන ලද මේ සංශෝධනය වර්තමානයේ තිබෙන නීතිය පසුපසට යැමක් වශයෙන් හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන්ම Transparency International කියන ආයතනය විසින් ශ්‍රී ලංකාව rate කර තිබෙනවා. ඒ අනුව, රටවල් 180කින්, 107වන ස්ථානයට තමයි අපේ රට rank වෙලා තිබෙන්නේ. 2023දී මේ දූෂණ විරෝධී පනත සම්මත වුණායින් පසුව තමයි අපට එවැනි යම්කිසි සතුටුදායක ranking එකක් ලබා ගැනීමට හැකි වුණේ. මේ සංශෝධනය අපේ ranking එකට බලපානවා. මොකද, ඒ Transparency International ආයතනයට අනුව, "What kind of corruption does the CPI measure?" යටතේ කරුණු සඳහන් වෙනවා. මේකේ තිබෙනවා, CPI කියලා transparency index එකක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතින්, මේ index එක අනුව ලකුණු දමනකොට, legal protection for people who report cases of bribery and corruption කියන කාරණයත් බලනවා. ඒ කියන්නේ, එවැනි කටයුතු වාර්තා කරන අයට - report කරන අයට - නීතියෙන් දෙන ලද ආරක්ෂාවත් සලකා බලනවා, මේ index එකේ rating කරනකොට. ඒ සම්බන්ධයෙන් වන මේ වාර්තාව මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ ගරු අගමැතිතුමියගේ දැනගැනීම සඳහා, විශ්වවිද්‍යාල නේවාසිකාගාර සම්බන්ධයෙන් විස්තර ඇතුළත් සටහනකුත් මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා. .

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයින් දැනට සති කිහිපයකට පෙර ලංකාවට පැමිණි බව. එම අවස්ථාවේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිකුත් කරන ලද මාධ්‍ය ප්‍රකාශයේ සඳහන් කර තිබෙනවා, "Preserving the integrity of the anti-corruption legislative framework is critical to enhance public trust" යනුවෙන්. ඉතින් මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් කනස්සල්ල ප්‍රකාශ කර තිබෙන බව සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.38]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන අද දවසේ, මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා "සිරිලිය" ගිණුම ගැන කථා කළා. හැබැයි, එතුමාට අද අමතක වෙලා තිබෙනවා, පැලවත්තේ ගිණුම ගැන. පැලවත්තේ ගිණුමේ තිබෙන්නේ මොන සල්ලිද කියන එක ගැන අමතක වෙලා තමයි එතුමා අද වෙනත් ගිණුම් ගැන කථා කළේ. මේ රටේ කර්මාන්තශාලා වහන්න කටයුතු කරලා, කප්පම් අරගෙන, බස්වලට නැඟලා කැට හොල්ලා කප්පම් අරගෙන, ඒ වාගේම වෘත්තීය සමිති සාමාජිකයින්ගේ මුදල් එකතු කරලා කප්පම් අරගෙන, ඒ වාගේම වෙනත් ක්‍රමවලින් කප්පම් අරගෙන තමයි පැලවත්තේ ගිණුම අද පෝෂණය වෙලා තිබෙන්නේ; තර වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි, පැලවත්තේ ගිණුම පිළිබඳව මුලින්ම මේ රටට කියන්න කියලා. "සිරිලිය" ගිණුම ගැන මම කථා කරන්නේ නැහැ, එය මේ මොහොතේ අධිකරණයේ තිබෙන කටයුත්තක් නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ පාර්ලිමේන්තුවේදී මේ පනත පිළිබඳව, අයිතිවාසිකම් පිළිබඳව කථා කළා. ඔබේ ආණ්ඩුව කොහොමත් දක්ෂයි, අනුන්ගේ දරුවන්ට උප්පැන්න සහතික දෙන්න. අඩුම ගණනේ ඒක කළේ කවුද, ඒක ගෙනාවේ කවුද, ඒකට මුල් වුණේ කවුද කියන කාරණයවත් කියලා, ඒ කණ්ඩායමට ඒ ගරුත්වයවත් දෙන්න සදාචාරවත් වෙන්න කියන කාරණය මා මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ. මොකද, ඒක අපේ ආණ්ඩුවලින් ගෙනාපු යෝජනාවක්. ඒ පිළිබඳවත් මේ මොහොතේ මතක් කරන්න ඕනෑ.

අපි දැක්කා, පසුගිය දවස්වල පාවෙන විදුලි බලාගාර විවෘත කරන්න ගිය ආකාරය. අපේ ආණ්ඩු හදපු දේවල්, පසුගිය ආණ්ඩු හදපු දේවල් විවෘත කරන්න ගියා. තමන් කළ දේවල් වාගේ ඒවා විවෘත කළා, ඒවා කළේ කවුද කියන කාරණයවත් සිහිපත් කළේ නැහැ.

මීට පෙර කථා කළ මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා දත් පිළිබඳව කිව්වා. මේ පනතට හයිය දත් දුන්නේ ඒගොල්ලන්ය කිව්වා. අපට කියන්න වෙලා තිබෙන්නේ, මේ පනතේ දත් ගැලෙව්වේ ඔබතුමන්ලාය කියලායි. අද බොරු දත් සවි කරලා මේ පනත ක්‍රියාත්මක කරන්න බැරි විධියට, ක්‍රියාත්මක කරන්න අමාරු විධියට, ක්‍රියාත්මක කිරීම අපැහැදිලි තත්ත්වයට පත් කරන්න කටයුතු කළේ ඔබයි කියන කාරණය මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ. ඒ වාගේම කිව්වා, මේ පනත ගෙනැල්ලා අධිකරණය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම, නීතිපති දෙපාර්තමේන්තුව ඔබතුමන්ලා කෙළින් කළාය කියලා. ඒ ආයතන කෙළින් කරපු විධිය මේ රටම දන්නවා. අපි දැක්කා, ඒ කෙළින් කරපු එක විධියක්.

ඕස්ට්‍රේලියාවේ ඉන්න වංචාකාරයෙක් වෙච්ච නිමල් පෙරේරා මහතාගේ කටඋත්තරයකට අනුව අද නාමල් රාජපක්ෂ මැතිතුමා දේශපාලන දඩයමකට ලක් කරලා තිබෙනවා. සල්ලි ගත්ත මිනිහා

[ගරු චානක මාදුගොඩ මහතා]

අද එළියේ. ප්‍රකාශ අරගෙන, සල්ලි ගත්ත මිනිහා එළියේ තියලා අද ඒ නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, අධිකරණය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව කෙලින් කළාය කියලා. ඒ නිසා ඒ ආයතන කෙලින් කළ විධියත් අද මේ රටම දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනඥයින්, රජයේ උසස් නිලධාරින් සල්ලි හම්බ කළේ කොහොමද කියලා, ඒ සල්ලි එකතු කළේ කොහොමද කියලා මේ රටේ මහජනතාවට බලාගන්න පුළුවන් වුණේ මේ පනතෙන් විතරයි කියලා අපි දන්නවා. හැබැයි, ආණ්ඩුව අද ගෙනෙන මේ සංශෝධන තුළින් ඒ අවස්ථාව ජනතාවට අහිමි කරලා තිබෙනවා. පසුගිය අවුරුදුවල වත්කම් සහ බැරකම් ප්‍රසිද්ධ කරපු නිසා මේ රටේ ජනතාව දැක්කා, නොයෙක් අයගේ වත්කම් පිළිබඳව. මම ඔබේ වත්කම් පිළිබඳව කථා කරන්නේ නැහැ. ඔබ කොහොමද විපක්ෂයේ හිටියේ, ඔබ කොහොමද අද ආණ්ඩු පක්ෂයේ ඉන්නේ, විපක්ෂයේ ඉන්නකොට ඔබේ ආදායම කොහොමද, අද ඔබේ ආදායම කොහොමද කියන කාරණය මම කියන්නේ නැහැ. මුහුණුපොතට ගියාම ඒක බලාගන්න පුළුවන්. එම නිසා මම ඒ කාරණයට වැඩි වෙලාවක් ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

මේ දූෂණ විරෝධී පනත මඟින් වත්කම් සහ බැරකම් බලන්න තිබුණු අයිතිය අද නැති කරලා තිබෙනවා. ඒ ගැන කථා කළොත් හිරේ දමන තැනට ක්‍රියා කරන්න මේ සංශෝධන පනත මඟින් අද කටයුතු කරනවා.

ඒ වාගේම මූලික මානව අයිතිවාසිකමක් විධියටත්, ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවලත් පැහැදිලිව කියලා තිබෙනවා, භාෂණයේ නිදහස ලැබෙන්නේ කොහොමද කියන කාරණය. හැබැයි අද මේ සංශෝධන මඟින් රටට දෙන පණිවුඩය වන්නේ, ඉතාම නරක ලෙස ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ හොරකම් දිහා බලාගෙන ඉන්න කියලා කියන එකයි. ඒ ගැන කථා කරන්න තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අද අහෝසි කරලා, කටවල් වහලා තිබෙනවා. මේ තරම් දරුණු ඒකාධිපති නීතියක් තිබුණේ ඉතාලියේ මුසෝලිනීගේ, ජර්මනියේ හිට්ලර්ගේ සහ උතුරු කොරියාවේ පමණයි.

ඒ විතරක් නොවෙයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයාට මෙමඟින් අසීමිත බලයක් නිර්මාණය වෙලා තිබෙනවා. වත්මන් පූර්වාදර්ශ එක්ක ගත්තාම ඒක ඉතාම භයානක තත්ත්වයක්. කපිල චන්ද්‍රසේන මහතාගේ සිදුවීමේදී අපි දැක්කා, මරණයට කලින් කපිල චන්ද්‍රසේන මැතිතුමා දිවුරුම් ප්‍රකාශයක් දීලා තිබුණු බව, නාමල් රාජපක්ෂ මැතිතුමාගේ නම කියන්න කියලා ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයා තර්ජනය කළා කියලා. ඒ වාගේම දැන් චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා අද මේ පාර්ලිමේන්තුවේදීත් අපට කිව්වා, එතුමාටත් එවැනි අවදානමක් සිදු වෙමින් තිබෙනවා කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතක තියාගන්න, ඔබ ආණ්ඩුවක් විධියට තමන්ගේ වංචා, දූෂණ වහගෙන තමයි අද කටයුතු කරන්නේ කියන එක. කන්ටේනර් 323 වංචාව, ගල් අඟුරු මහා වංචාව, ත්‍රිවිධ හමුදාවට වියළි ආහාර ද්‍රව්‍ය සැපයීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ වංචාව කියන ඒ සියල්ල ඔබ පසුපස එනවාය කියන කාරණයත් මතක තියාගෙන කටයුතු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂණ විරෝධී පනතේ 149වන වගන්තියට ගෙනෙන සංශෝධනය මඟින් අල්ලස සම්බන්ධයෙන් චෝදනාවට ලක්වන පුද්ගලයන් ඇප මත මුදාහැරීම සම්බන්ධව මහෙස්ත්‍රාත්වරයාට තිබෙන බලය අද අධිකරණයෙන් ඉවත් කරලා තිබෙනවා. ඒ වෙනුවට ඒ බලය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරෙනවා. ඔහු අධිකරණ නිලධාරියෙකු නොවෙයි. ඔහු නියෝජනය කරන්නේ විධායකය. එම නිසා ඔහුට ලැබෙන ඒ බලය නිසා කොතරම් දුරට මේ නීතිය අවභාවිත වේවිද කියන ප්‍රශ්නය තිබෙනවා.

මේ පාර්ලිමේන්තුවේ ඉන්න, මේ විපක්ෂයේ ඉන්න අපි හැමෝම වංචා, දූෂණවලට විරුද්ධ කණ්ඩායමක්. ඔබ හැමදාම විපක්ෂයට ඇඟිලි දිගු කරමින්, විපක්ෂයට චෝදනා කරමින් කටයුතු කරනවා. හැබැයි, ඔබට එල්ල වෙච්ච චෝදනාවලින් නිදොස් වෙන්න ආණ්ඩුවක් විධියට ඔබ කටයුතු කරලා නැහැ. එම නිසා පළමුවැනි වගකීම විය යුත්තේ ඔබට එල්ල වෙච්ච චෝදනාවලින් නිදොස් වීම මිස ඔබ චෝදනා එකින් එක කරපින්නාගෙන විපක්ෂයට චෝදනා කරමින් ඉන්න එක නොවෙයි. ඔබ මේ සියල්ල පිටුපස ඉඳගෙන දේශපාලන දඩයම් කරමින් ඉන්නේ. ඔබ දේශපාලන දඩයම කරන්නේ, මේ රටේ කවුද ඉදිරියට එන්නේ, කවුද ජනප්‍රිය වන්නේ, කවුද ඊළඟට බලය ලබාගන්නේ කියන කාරණා පිළිබඳව සොයා බලායි. එහෙම සොයා බලා ඔබ විවිධ චෝදනා එල්ල කරලා දේශපාලන වශයෙන් ඔවුන්ට තිබෙන ශක්තිය නැති කරන්න උත්සාහ ගනිමින් ඉන්නවා. එම නිසා අපි ආණ්ඩුවට මේ කාරණය කියන්න ඕනෑ. ඒ මොන දේශපාලන බලවේග ආවත්, විපක්ෂයක් විධියට අපි එකතු වෙලා කරන මේ දේශපාලන ගමන කාටවත් නවත්වන්න බැහැ කියන කාරණය සිහිපත් කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.47]

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන අද දිනයේ, ඒ පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද දින දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්න තිබෙනවා වුණත්, ඊයේ දිනයේ මම සභාවේ නොසිටි වෙලාවේ ජයවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා කියපු කාරණයක් පිළිබඳව මට කථා කරන්න සිද්ධ වනවා. එතුමා මම නොකියූ බොරු කථාවක් කියලා මේ ගරු සභාව නොමඟ යවලා තිබෙනවා. එය මා ඉතාම පිළිකුළෙන් යුතුව හෙළා දකිනවා. මේ විධියට තවදුරටත් බොරු කියලා ජනතාව රවටන්න අපිව පාවිච්චි කරන්න එපා කියන ඉල්ලීමත් මම කරනවා. එතුමා ඒ කියන ආකාරයට අප විසින් ගොවි ජනතාව එකතු කරගෙන එම විරෝධතාව කළේ මැයි මාසයේ. මැයි මාසය වනකොට පොහොර සහනාධාරයෙන් භාගයක්වත් හරියාකාරව ගෙවලා තිබුණේ නැහැ. ඒවා නොගෙවපු නිසා තමයි ගොවි ජනතාව ඒක රාශි කරගෙන අපට ඒ විරෝධතාව පවත්වන්න සිද්ධ වුණේ. ඒ වනකොට වැඩි කොටසකට පොහොර සහනාධාරය ලබා දීලා තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අන්න ඒකයි අපට ඒ විරෝධතාව පවත්වන්න සිද්ධ වුණේ. මෙවැනි බොරු ප්‍රකාශ කරමින් අපිව ඔබතුමන්ලාගේ බොරුවලට පාවිච්චි කරන්න එපා කියලා මම නැවත වාරයක් ඉල්ලා සිටිනවා.

අද ඔය_

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අත් දිග සුදු කමිසය ඇඳලා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කළාට, ඔය අප්පුහාමිලා තමයි එදා 1988-89 කාලයේ අපේ ගම්වල හිටපු තරුණ තරුණියන්, වැඩිහිටියන් වාගේම රජයේ දේපළ විනාශ කරන්න කටයුතු කළේ. ඒ,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා මම ඇඟිල්ල දිගු කරලා අද කියන්න කැමැතියි. මම දන්න නිසා තමයි මේ කරුණු කාරණා කියන්නේ. එදා ඔක්කම්පිටියේ වැදගත් විධියට ජීවත් වුණු සේකර අයියලා, ඔක්කම්පිටියේ හිටපු අරාවේ අප්පුහාමිලා මහ පාරේ මරා දාලා, ට්‍රාන්ස්ෆෝමර් ගිනි තියලා, බස් ටික ගිනි තියලා, තැපැල් කන්තෝරුවලටත් ගිනි තැබුවා. ඔක්කම්පිටියේ තිබුණු වී ගොවිපොළේ ගබඩාව ගිනි තියලා දැම්මා. ඒ මදිවාට බුත්තල නගරයේ තිබුණු වී ගබඩාව පසුගිය දවසක ඇඟලුම් කර්මාන්තශාලාවකට විකුණා දැම්මා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද වනකොට වී මිලදී ගන්න බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එකම වී ගබඩාවක්වත් නැහැ. අද බුත්තල නගරයේ රතු සහ සුදු වී කිලෝවක් රුපියල් 100කට, 105කට වැඩි මිලකට විකුණන්න බැහැ. අපි - අපේ ආණ්ඩු කාලයේ - ගොඩනහලා තිබුණු පැල්වත්ත, සෙවණගල සීනි කර්මාන්තශාලා අද වනකොට වසා දමන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

අද උජාරු දොඩවන ඔය නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, පුළුවන් නම් සෙවණගලට හරි පැල්වත්තට හරි ගිහිල්ලා ජනතාව එකතු කරලා, සාකච්ඡාවක් කරන්න කියලා. එහෙම ගියොත් බෙල්ල මල්ලේ දමාගෙන තමයි ඔය මැතිතුමාට එන්න සිද්ධ වෙන්නේ කියන එකත් මම මතක් කරනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා සභාවේ නැති වුණත් මන්ත්‍රීතුමා ඇඟිල්ල දිගු කරලා කියනවාය කිව්වා, එතුමා තමයි ට්‍රාන්ස්ෆෝමර් ගිනි තිබ්බේ, මිනී මැරුවේ කියලා. ඒක බරපතළ චෝදනාවක්. ඒ නිසා පදනම් විරහිතව පාර්ලිමේන්තු බලය පාවිච්චි කරලා එවැනි චෝදනා කරන එක වැරදියි. එතුමාට එහෙම සාක්ෂි තිබෙනවා නම් ඒ සාක්ෂි ඉදිරිපත් කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
උසාවියට යන්න කියන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
එහෙම නම් උසාවියට යන්න. එහෙම නැතිව පාර්ලිමේන්තු බලය පාවිච්චි කරලා, එතුමා මේ කථාව කියන ගමන් ජයවර්ධනලා තමයි ට්‍රාන්ස්ෆෝමර් ගිනි තිබ්බේ, මිනිස්සු මැරුවේ, ගිනි තිබ්බේ කිව්වාම ඒක බරපතළ චෝදනාවක්. එහෙම චෝදනාවක් කරන්න එතුමාට සාක්ෂි තිබෙන්න ඕනෑ. සාක්ෂි නැතිව එතුමා එවැනි චෝදනාවක් කරනවා නම් ඒක බරපතළ වැරැද්දක්. වහාම ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. *[බාධා කිරීම්]*

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් පොඩි අවස්ථාවක් ලබා දෙන්න, මගේ නම කියලා කථා කළ නිසා. *[බාධා කිරීම්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නම කිව්වේ නැහැ. *[බාධා කිරීම්]*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔය කාරණාව විවාදයක් කර ගන්න එපා. *[බාධා කිරීම්]* නම කිව්වාට ඒක විවාදයක් කර ගන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
මගේ නම කිව්වා නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තත්පර 30ක් දෙන්නම්.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා, එදා මගේ සහෝදරයාත්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වෙඩි තියලා කියන එක. මහ දවාලේ අමු අමුවේ වෙඩි තියලා දැම්මා, ඔක්කම්පිටිය නගරයේදී. මට ඕනෑ තැනක සාක්ෂි ඇතිව ඒ ගැන කියන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඇමතිතුමනි, මම හිතන්නේ ඔබතුමාත් ඒ කාලයේ,- *[බාධා කිරීම්]*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.52]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදේ ඉඳලා මෙතැන කෑ ගැහුවා, අපිට ආගමක් නැහැ, ජාතියක් නැහැ, අපි ආගමට ගරු කරන්නේ නැහැ, සිවුරට ගරු කරන්නේ නැහැ කියලා. මෑත භාගයේදී උතුරු පළාතේ හිටපු ඉතාම ශ්‍රේෂ්ඨ විනිශ්චයකාරතුමෙක් නඩු තීන්දුවක් ලබා දුන්නා, කෝවිල්වල

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

loudspeaker එක සද්දෙන් දාන්න අවශ්‍ය නැහැ, දෙවියන්ට කන් ඇහෙනවා, ආගමික නායකයන්ට කන් ඇහෙනවා, ඒ නිසා හයියෙන් loudspeaker දාන්න ඕනෑ නැහැ කියලා. විපක්ෂය හැසිරෙන විධිය දැක්කාම අපට කියන්න තිබෙන්නෙත් ඔයගොල්ලන්ගේ ඔය ස්පීකර් එක නතර කර ගන්න, ඕක අපිට අවශ්‍ය නැහැ කියන එකයි. මේ රටේ මිනිස්සුන්ට කන් ඇහෙනවා; මේ රටේ මිනිස්සුන්ට හිතන්න පුළුවන්; මේ රටේ මිනිස්සුන්ට ඇස් පෙනෙනවා; මිනිස්සු වෙච්ච දේවල් දැකලා තිබෙනවා; දැන් වෙන දේවල් මිනිස්සු දකිනවා; මිනිස්සුන්ට වෙච්ච දේවල් ඇහුණා; දැන් වෙන දේවල් ඇහෙනවා. ඒ නිසා අලුතෙන් කෑ ගහන්න අවශ්‍ය නැහැ. අමුතුවෙන් කෑ ගහන්න අවශ්‍යත් නැහැ. ඒ නිසා කියන්න තිබෙන්නේ මේකයි. විවිධ කාරණා මූලික කර ගනිමින් තමයි මේ කථා කරන්නේ.

අද දවසේ මාතෘකාව තමයි, දූෂණ විරෝධී පනතට අදාළ සංශෝධන ගෙන ඒම. නමුත්, උදෑසන ඉඳලා ගෝරනාඩුව තිබෙන්නේ වෙනත් කාරණා සම්බන්ධයෙන්. මන්ත්‍රීවරයෙකුට - මහජන නියෝජිතයෙකුට- කථා කරන්න දන්නේ නැහැ. විශේෂයෙන් රාජ්‍ය නිලධාරින්ට කථා කරන්න දන්නේ නැහැ. මෙතැන කෑ ගහපු සමහර මන්ත්‍රීවරු රාජ්‍ය නිලධාරින්ට සලකපු ආකාරය සම්බන්ධයෙන් පසුගිය දවස්වල ගරු අධිකරණය විසින් තීන්දු තීරණ ලබා දුන්නා. මේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කරන නිලධාරින්ට සලකපු ආකාරය, ඒගොල්ලන්ට පහර දීපු ආකාරය, ගස් බැඳපු විධිය සම්බන්ධයෙන් හොඳම තීන්දුව අධිකරණය ලබා දීලා තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් තීන්දු තීරණ ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න ඕනෑ මේකයි. පසුගිය කාලයේ ස්වර්ණ පුස්තක සම්මානයෙන් පිදුම් ලැබූ "කැමෙලියා" කියන පොතේ ලේඛිකාව තමයි, විරාජිනී තෙන්නකෝන් මහත්මිය. එතුමිය එම පොතේ 205වැනි පිටුවේ ලියා තිබෙනවා, "සෙමෙන් වැඩෙන්න. එකවර කඩා පතින්න" කියලා. සෙමෙන් වැඩෙමින්, සෙමෙන් ක්‍රියාත්මක වෙමින්, සෙමෙන් නීතිය ස්ථාපිත කරපු ජාතික ජන බලවේගය ආණ්ඩුව නීතිය හරියට ක්‍රියාත්මක කරද්දී, නීතිය අකුරට ඉෂ්ට කරද්දී එකවර කඩා පැනපු මේ නීතියේ ආධිපත්‍ය ආරක්ෂණය මහජනතාවට දැනෙද්දී විපක්ෂය කලබල වෙලා තිබෙනවා. විපක්ෂයේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වැඩි වෙලා තිබෙනවා. ඒකට අපි බය වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාල වකවානුවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තිබුණත් ඒක ක්‍රියාත්මක වන බවට පෙනෙන්නට පටන් ගත්තේ 2024 වර්ෂයේ අපි බලයට පත් වුණාට පසුවයි. නීතිය හරියට ක්‍රියාත්මක වන බව පෙනෙන්නට ලැබුණේ 2025 වර්ෂයෙන් පස්සේ. මේ ගත වෙච්ච කාලය තුළ සැකකරුවන් 332කට එරෙහිව නීති විරෝධී වත්කම් විමර්ශන ආරම්භ කරලා තිබෙනවා. 2024 වසරේ සැකකරුවන් 49දෙනෙකුට අයත් රුපියල් මිලියන 1,597ක නීති විරෝධී වත්කම්, දේපොළ අක්‍රිය කරලා තිබෙනවා. 2025 වසරේදී සැකකරුවන් 30දෙනෙකුට අයත් රුපියල් මිලියන 1,546ක නීති විරෝධී දේපළ තහනම් කරලා තිබෙනවා. 2026 මුල් මාස තුන තුළ රාජ සන්තක කිරීම් ගත්තොත්, පුද්ගලයන් 8දෙනෙකුට අයත් රුපියල් මිලියන 170ක නීති විරෝධී දේපොළ රජයට පවරා ගෙන තිබෙනවා. මේ, 2024න් පස්සේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අයථා මුදල් උපයා ගැනීම්, වත්කම් තහනම් කර ගැනීම් සම්බන්ධයෙන් වන දත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්න තිබුණු, විමර්ශන කාර්යාවලිය සාර්ථක කරන්න තිබුණු ආයතන හය වෙලා හිටියේ. ඒවායේ වැඩ කරපු නිලධාරින්ට තමන්ගේ රාජකාරිය ස්වාධීනව, හය නැතිව කරන්න තිබුණු පරිසරය අකුළලා තිබුණේ. අපි මේ නීති, අණපනත්, සංශෝධන ගෙනෙන්නේ අපිට මොනවා හෝ අවාසියක් තිබෙනවා නම්. නමුත් එහෙම එකක් ගෙනෙන්න අපට අවශ්‍ය නැහැ.

දැන් අපේ පැලවත්තේ ගිණුම ගැන කථා කළා නේ. පැලවත්තේ ගිණුම ගැන ඔබතුමන්ලාට මොනවා හෝ සැකයක් තිබෙනවා නම් ඒ ගැන පැමිණිලි කරන්න එළියේ ඕනෑ තරම් ආයතන තිබෙනවා. පැමිණිලි ඉදිරිපත් කරන්න තැන් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අධිකරණයට යන්න පුළුවන්. අපි සපථ කරලා පෙන්වලා තිබෙනවා, මේ 159දෙනාගෙන් කවුරු හරි කෙනෙක් අයථා ලෙස මුදල් උපයා තිබෙනවා නම් අපි මන්ත්‍රී ධුරය අත්හැරලා හෙට ගෙදර යන බව. එහෙම ඔප්පු කරන්න ඔයගොල්ලන්ගෙන් කාටවත් බැහැ. ඒ නිසායි හය නැතිව අපි ඒ අභියෝගය ලබා දෙන්නේ. එහෙම කරන කිසි කෙනෙක් මෙතැන වාඩි වෙලා නැහැ. පැලවත්තේ ගිණුම නොවෙයි, ඕනෑම ගිණුමක් ගැන ස්වාධීනව පරීක්ෂණ කරන්න ආයතන තිබෙනවා. ඒවාට අපි බලය දීලා තිබෙනවා. ගිහිල්ලා පැමිණිලි කරන්න, මෙතැන ඇවිල්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගාන්නේ නැතුව. ඔබතුමන්ලා ඔය කියන, ඔබතුමන්ලා පාරම් බාන කෙරුවාවල් අපට මතකයි. උදේ වරුවේ මන්ත්‍රීවරයෙක් කියනවා මම අහගෙන, ඉස්පිරිතාලවල බෙහෙත් නැහැ. ඔයගොල්ලන් මේ මොනවා ද කරමින් ඉන්නේ කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමාගේ කෙරුවාවල් ටිකක් මම කියන්නම්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීම සඳහා සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය කථා කරන්න.

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
පළමුවැනි එක, හිටපු සෞඛ්‍ය ඇමති කෙහෙළිය රඹුක්වැල්ලගේ සම්බන්ධීකරණ ලේකම් රුපියල් ලක්ෂ 80ක් රජයට පාඩු කිරීම. 2025.05.26 දින සිට 2025.06.03 දක්වා අත්අඩංගුවේ සිට දැනට ඔහු ඇප මත මුදා හැර තිබෙනවා. එහි නඩු

කටයුතු විභාග වෙමින් තිබෙනවා. ඊළඟට, කෙහෙළිය රඹුක්වැල්ල ඥාති සංග්‍රහයෙන් රජයට පාඩු කිරීමේ නඩුව. ඔහු 2025.07.02 සිට 2025.07.23 දක්වා අත්අඩංගුවේ සිට ඇප මත මුදා හැරලා, නඩුව විභාග වෙමින් තිබෙනවා. රමිත් රඹුක්වැල්ල රුපියල් ලක්ෂ අසූවක් රජයට පාඩු කිරීම. ඔහු 2025.05.21 සිට 2025.06.03 දක්වා අත්අඩංගුවේ සිට ඇප මත මුදා හැරලා, නඩුව විභාග වෙමින් තිබෙනවා. හිටපු අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් රුපියල් මිලියන 900ක් උපයාගත් ආකාරය හෙළි කිරීමට නොහැකි වීම. ඔවුන්ව අත්අඩංගුවට අරන් ඇප මත මුදා හැරලා නඩු විභාග වෙමින් තිබෙනවා. ඊළඟට, හිටපු පළාත් සභා මන්ත්‍රී සුලෝචන ගමගේට අදාළ රුපියල් ලක්ෂ 90ක අල්ලස් සිද්ධිය. 2024.12.28 සිට 2025.01.24 දක්වා ඔහු අත්අඩංගුවේ සිට ඇප මත මුදා හැරලා, නඩුව විභාග වෙමින් තිබෙනවා. ලිඳුල නගර සභාවේ හිටපු සභාපති ලිඳුල නගර සභාවට අයත් ගව මස් කඩ කාමරයක් බදු දීමට අදාළව ලන්සුව පිරිනැමීමේදී වැඩිම ඉල්ලුම්කරුට ලන්සුව ලබා නොදී අවම ලන්සුව ඉදිරිපත් කළ ඉල්ලුම්කරුට කඩ කාමරය ලබා දී රුපියල් 2,380,000ක මුදලක් අල්ලස් වශයෙන් ලබාගෙන රජයට පාඩු කිරීම සම්බන්ධයෙන් නඩුව විභාග වෙමින් තිබෙනවා.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරි විශ්‍රාමික ලුතිනල් කර්නල් නෙවිල් වන්නිආරච්චි සිය ආදායමට වඩා රුපියල් මිලියන 28ක වත්කම් නීති විරෝධීව උපයා ගැනීමක් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අත්අඩංගුවට ගෙන විමර්ශන ක්‍රියාත්මක වනවා. හිටපු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර පසුගිය රජය සමයේ ඊශ්‍රායලයට කෘෂි කාර්මික රැකියා සඳහා සේවකයන් යැවීමේදී අක්‍රමිකතාවක් සිදුව ඇති බව සඳහන් කරමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විමර්ශන කටයුතු ආරම්භ කරලා විමර්ශන සිදු කරමින් පවතිනවා. අකිල විරාජ් කාරියවසම් සිය පෞද්ගලික ඉන්ධන පිරවුම් හලේ සේවය සඳහා රාජ්‍ය සේවකයන් යොදා ගැනීම මඟින් දූෂණය නමැති වරද සිදු කිරීම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මඟින් අත්අඩංගුවට ගෙන විමර්ශනය කරමින් පවතිනවා. රවී කරුණානායක ජාතික ලොතරැයි මණ්ඩලයට අනුමත පටිපාටියෙන් පිට කොන්ත්‍රාත් පදනම මත පස්දෙනකු බඳවාගෙන ඔවුන් සිය පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර ගනිමින් දූෂණය නමැති වරද සිදු කිරීම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විමර්ශනය කරමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව පැයක් විතර මේ ලැයිස්තුව කියවන්න පුළුවන්. මෙතුමන්ලා හදපු රට, මේ. මෙතුමන්ලා හදපු රට! අපට කියනවා නේ, "ඔයගොල්ලෝ මෙහෙම කළා නම් හොඳයි. අපි හිතාගෙන හිටියේ මෙහෙම රටක් හදන්න" කියලා. ඔයගොල්ලෝ හිතාගෙන හිටපු රට හැදුවා නම්, අපේ දරුවෝ ඔක්කෝටම පාරවල් ගානේ හිඟා කන්න වනවා. අපට අනාගතයක් නැති වෙලා යනවා. අපට ඉතුරු වෙන්නේ, සිහින නැති රටක්. එම නිසා ඔයගොල්ලන් හිතපු රට හදපු නැති එක අපේ වාසනාවක්. අපේ පූර්ව වාසනාවක්. ඔයගොල්ලන් හිතපු රට කවදාකවත් මේ පොළොවේ හැදුණේ නැති එක අපේ වාසනාවක්. එම නිසා හොඳට මතක තබා ගන්න, මේ පනත්වලට සංශෝධන ගෙනැල්ලා අපට මොනවා හරි වාසිදායක දෙයක් කර ගන්න අපි කිසි කෙනෙකුට වුවමනාවක් නැති බව. අපි කිසි කෙනෙකුට එහෙම අවශ්‍යතාවකුත් නැහැ. අපි කිසි කෙනෙක් එහෙම වැරදි කරන්නෙත් නැහැ. ඒක හොඳට මතක තබා ගන්න. ඔයගොල්ලන්ගේ කෙඳිරිලි තව තවත් වැඩි වනවා මිසක්, ඔය කෙඳිරිලි නතර වෙන්නේ නැහැ. තව අවුරුදු තුනකින් පස්සේ සියලු කෙඳිරිලි නතර කරලා ජාතික ජන බලවේගය ආණ්ඩුව නීතිය ස්ථාපිත කර රට හදනවාය කියන කාරණය මතක් කරමින්, මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.02]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்டமூலம் தொடர்பாக நாங்கள் எல்லோரும் பேசிக்கொண்டு இருக்கின்றோம். உண்மையிலேயே, கடந்த கால அரசாங்கங்கள்மீது மக்களுக்கு ஏற்பட்ட நம்பிக்கையீனம் காரணமாகவே, இந்த அரசாங்கத்தின்மீது நம்பிக்கை வைத்து இந்த அதிகாரத்தை வழங்கியிருக்கின்றார்கள். அந்தக் காலகட்டங்களில் இருந்த அதிகாரிகள் மற்றும் அரசியல்வாதிகள் செய்த துஷ்பிரயோகங்கள் எல்லாவற்றையும் கருத்திற்கொண்டுதான் இந்த அதிகாரம் வழங்கப்பட்டிருக்கின்றது. இன்று விவாதிக்கப்படுகின்ற திருத்தச் சட்டமூலத்தின்மூலம், நீதித்துறைக்கு இருக்கின்ற அதிகாரங்கள் சில நேரடியாக அரச அதிகாரிகளுக்கு வழங்கப்படுகின்றன. இதன்மூலம் உங்களுடைய ஆட்சி அதிகாரங்களின்மீது இருக்கின்ற நம்பிக்கையை நீங்கள் அரச அதிகாரிகளுக்கு வழங்குகின்றீர்கள். இனி வரவிருப்பவர்கள், எதிர்காலத்தில் நீங்கள் எதிர்பார்க்கின்ற சிறந்த அதிகாரிகளாக இருப்பார்களா? என்ற சந்தேகம் இருக்கின்றது. எனவே, இதைப் பரிசீலிக்க வேண்டிய கட்டாயக் கடமை உங்களுக்கு இருக்கின்றது.

இந்த நாட்டில் கடந்த காலங்களிலே நடைபெற்ற ஊழல்கள், அதிகார துஷ்பிரயோகங்கள் என்பவற்றுக்கு எதிரான சட்ட நடவடிக்கைகள் முன்னெடுக்கப்பட்டுக் கொண்டிருப்பதை இன்று நாங்கள் பார்க்கின்றோம். இன ரீதியாக முஸ்லிம்களாக இருக்கின்ற, இஸ்லாமிய மார்க்கத்தை ஏற்றுக்கொண்ட நாங்கள், இந்த நாட்டில் 2009ஆம் ஆண்டுக்குப் பிறகு ஏற்பட்ட மாற்றம், இங்கு இருக்கின்ற சிறுபான்மைச் சமூகத்தை ஒட்டுமொத்தமாக அடக்குகின்ற ஒரு விடயமாகக் காணப்பட்டது. முஸ்லிம்களுக்கு எதிரான அடக்குமுறை என்பது, தம்புள்ளையில் ஆரம்பித்து Dharga Town, திகன, அம்பாறை ஆகிய இடங்களில் தொடர்ச்சியாக நடைபெற்றன. சஹ்ரானின் குண்டுவெடிப்புக்குப் பின்னரான நெருக்கடிகள், ஜனாஸாக்கள் எரிக்கப்பட்டமை, அல்-குர்ஆன் பிரதிகள் தடுத்துவைக்கப்பட்டமை போன்ற துயரங்கள் தொடர்ந்ததற்குப் பிறகுதான், முஸ்லிம் மக்கள் இந்த அரசாங்கத்திற்குத் தங்களது அங்கீகாரத்தை வழங்கினார்கள். இங்கு குறிப்பிடப்பட்ட அந்தக் காலகட்டங்களிலே இஸ்லாமிய மக்கள் பட்ட இன்னல்கள், துன்பங்கள், கஷ்டங்கள் ஏராளம். அவர்களுடைய பிரார்த்தனைகள்தான் இன்று இவர்களுக்கு இவ்வாறான தண்டனைகளை இந்த அரசாங்கம் வழங்கிக் கொண்டிருப்பதற்குக் காரணம் என்று நாங்கள் நம்புகின்றோம்.

அதேபோன்று, பல அரச நிறுவனங்களில் இன்றுவரை துஷ்பிரயோகங்கள் நடந்துகொண்டுதான் இருக்கின்றன; இல்லை என்று சொல்வதற்கில்லை. பல்கலைக்கழகங்களில் கல்வி கற்கின்ற மாணவிகளிடம் பாலியல் இலஞ்சம் கோருகின்ற விடயத்தைப் போலவே, ஏனைய அரச திணைக்களங்களிலும் இவ்வாறான செயற்பாடுகள்

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

நடந்துகொண்டுதான் இருக்கின்றன. பாதுகாப்புத் தரப்பிலே, குறிப்பாக பொலிஸ் அதிகாரிகளிடம் இன்று பல மாற்றங்களை நாங்கள் காண்கின்றோம். அவ்வாறே பல மாற்றங்கள் இந்த நாட்டில் நடந்துகொண்டு இருக்கின்றன. இவ்வாறான நிலைமைக்கு நாட்டைக் கொண்டுவருவதற்குச் சரியான ஒரு தீர்வை எடுத்தமைக்காக இந்த நாட்டு மக்களுக்கும், சிறந்த நடைமுறைகளைச் செயற்படுத்திக் கொண்டு வருகின்ற மைக்காக இந்த அரசாங்கத்திற்கும் இச்சந்தர்ப்பத்தில் நன்றி களைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். இன்னும் சில விடயங்களிலே மாற்றங்களைக் கொண்டுவரவேண்டிய தேவைப்பாடு இருக்கின்றது என்ற விடயத்தையும் முன்வைத்து, விடைபெறுகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩබ්ලිව්.එම්.එම්. අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.05]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දවසේ දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ විවාදයේදී මම බොහෝ කථා අහගෙන හිටියා. දූෂණය, එහෙමත් නැත්නම් වංචාව පිළිබඳව කථා කරද්දී, ආණ්ඩුවේ එක මන්ත්‍රීතුමෙක් සඳහන් කළා, හොරකම, වංචාව, දූෂණය පිළිබඳව. ඒ නිසා මට මගේ කථාව ආරම්භ කරන්න වෙන්නේ මේ ආකාරයටයි. 1994දී ජනතා පරමාධිපත්‍යය හොරකම් කරපු මනුස්සයා මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳන් හොරකම ගැන කථා කරනවා. ජනිත් විපුලගේගේ මන්ත්‍රී ධුරය හොරකම් කරලා, ලැයිස්තුවේ නැති කෙනෙකු හැටියට මන්ත්‍රී ධුරය ලබාගෙන ජනතා පරමාධිපත්‍යය හොරකම් කරපු මිනිස්සු තමන්ගේ ඉතිහාසය ආරම්භ කරන්නේම ප්‍රජාතන්ත්‍රවාදය හොරකම් කිරීමෙන්. එම නිසා හොරකම ගැන කථා කරන්න මීට වඩා සුදුසුකම් තිබෙන අය ඉන්නවාද කියලා අපි අහන්න ඕනෑ, ඔබෙන්. මොකද, ආරම්භය පවා හොරකම්.

ඊළඟට, ආණ්ඩුවේ තව මන්ත්‍රීවරයෙක් ඇහුවා, යහපාලන කාලයේ නඩු දැම්මාට දඬුවම් දුන්නාද කියලා. දඬුවම් දෙන්නේ උසාවියයි. යහපාලන කාලයේත්, මීට කලින් තිබුණු ආණ්ඩු කාලවලත් උසාවියේ තීරණ ජනාධිපතිවරයා කිව්වේ නැහැ. ජනාධිපතිගේ තීරණය 2025දී රූපවාහිනී වැඩසටහනකදී කියනවා අනුර, අරයා හිරේ, මෙයා හිරේ, බලාගන්නකෝ කියලා. චෝදනාව ලබපු මිනිහා කියනවා, "මම නිවැරදිකරුවෙක්" කියලා. නමුත්, ජනාධිපතිතුමා රූපවාහිනී වැඩසටහනට ඇවිල්ලා කියනවා, "හිරේ යනවා. බලා ගන්න" කියලා. එහෙම නඩු ඇහුවොත් අවුරුද්දෙන් දෙකෙන් හිරේ යවන්න පුළුවන්. ඒ නිසා තමයි නීතිය කෙලින් කරලා තිබෙන්නේ. අර කියපු විධියට තව අවුරුදු තුනකට පස්සේ බලා ගන්න පුළුවන්, නීතිය කෙලින් කරපු විධියේ ආනිශංස කොයි වාගේද කියලා. ඒ පිළිබඳව මා පළමුව සඳහන් කරනවා.

ඊළඟ කාරණාව මේකයි. මේ ආණ්ඩුව දිගින් දිගටම කියන දෙයක් තිබෙනවා. තමන් ඉන්නේ දූෂිතයන්ට දඬුවම් දෙන්නලු; හොරකම් කරපු ධනය ආපසු ගන්නලු. "අපි හොරකම් කරන්නේ නැහැ, දූෂණය කරන්නේ නැහැ" කියන එක තමයි මේ අයගේ සටන් පාඨය. අවුරුදු දෙකක් පුරාවට කියන්නේත් ඒක. "ගෙවුණු අවුරුදු 70 ඇතුළේ හොරකම් කළා, හොරකම් කළා, හොරකම් කළා!" කියනවා. මම මේ පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳන් අහන ප්‍රශ්නය තමයි, හොරකම නවත්වන්න ඇත්තටම වුවමනාවක් තිබෙනවා නම්, අවුරුදු 20ක, 25කවත් එක එක අවුරුද්ද තුළ එක එක ක්ෂේත්‍රවල වෙච්ච දූෂණ, වංචා පිළිබඳව වෝහාරික පරීක්ෂණයක් කරලා තිබෙනවාද කියලා. මුලින්ම කළ යුතු වැඩේ ඒකයි. ඒක නේ ඇත්ත කථාව. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිදු වුණු හොරකම්, සෞඛ්‍ය ඇමතිවරුන් හැටියට කරපු හොරකම්, බලශක්ති ක්ෂේත්‍රයේ කරපු හොරකම්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ කරපු හොරකම් ආදි වශයෙන් වෝහාරික විගණනයක් කරලා ඊට පස්සේ නොවෙයිද, හොරකම්වලින් ඇත්තටම වෙච්ච පාඩු ටික, වංචා ටික, වෙච්ච අවාසනාවන්ත තත්ත්වයන් පිළිබඳව සොයන්න ඕනෑ? කෝ, එහෙම දෙයක්? අඩුම තරමේ 2015 යහපාලන ආණ්ඩුව කාලයේ වාගේවත් කමිටු පත් කරලා, එක එක විධිවලට FCID වාගේ ආයතන හදලා, වෙන වෙනම පරීක්ෂණ ටිකවත් අද වනකල් ආරම්භ කරලා තිබෙනවාද? මම ඔබෙන් අහනවා, 2024දී වෙච්ච වංචාවලින් නාස්ති වෙච්ච මුදල් ප්‍රමාණය කීයද කියලා. කාටද ඒක කියන්න පුළුවන්? කෝ පරීක්ෂණ? 2021, 2022, 2023 වසරවල ඒවා කෝ? මේ රටේ මොළය තිබෙන මිනිසුන්ට තේරෙන්න ඕනෑ, ඇත්තට හොරකම් අල්ලනවා නම් ඉස්සර වෙලාම මේ කියපු වෝහාරික විගණනය කරන්න ඕනෑ කියලා. මේවා නාට්‍ය විධියට, එක එක පුද්ගලයා ඉලක්ක කරගෙන කරන දේශපාලන නාඩගම් විධියට තමයි දකින්න තිබෙන්නේ. නමුත්, වැදගත්ම දේ මොකක්ද? රටේ මිනිසුන්ට අවශ්‍ය වෙන්නේ, වෙච්ච හොරකම්වලින් රටේ ආර්ථිකයට වෙච්ච බලපෑම කොච්චරද කියලා දැන ගන්න එක; ඒක ප්‍රතිශතාත්මකව කීයද කියලා දැන ගන්න එක. ඒක තමයි විද්‍යාත්මක ක්‍රමය. අවුරුදු දෙකක් ගෙවුණු තැන ආණ්ඩුව ඒ වාගේ විගණන පරීක්ෂණයක් කරලා තිබෙනවාද?

ඊළඟ කාරණාව මේකයි. කලින් ආණ්ඩුවලින් වෙච්ච හොරකම් පිළිබඳව දිගින් දිගටම කිව්වාට, ඒ වෙච්ච වංචා පිළිබඳව කථා කළාට, පුද්ගලයන් කිහිප දෙනෙකු පිළිබඳව විතරයි කථා කරමින් තිබෙන්නේ. සමස්ත පද්ධතියම වංචාවෙන් පිරුණා නම්, කෝ මේ රටේ අමාත්‍යාංශ ලේකම්වරුන් පිළිබඳව කරන පරීක්ෂණ? මා නැවත නැවත කියනවා, හොරකම්, වංචා නතර කිරීමට සැබෑවටම වුවමනා නම්, මේ පද්ධතිය පුළුල් කරලා ඒක තමයි කළ යුතු වැඩේ කියලා. හැබැයි, අර විධියට කරනවා, මෙහෙම කරනවා, වංචාව දූෂණය නවත්වනවා කියලා ඔබ දිගින් දිගටම කියනවා. ලංකාවේ වැඩිම අපනයන ප්‍රමාණයක් මිල දී ගන්නා රට වන ඇමෙරිකාව විසින් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේක 2025දීත් ඉදිරිපත් කළා. 2026දීත් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ වාර්තාවේ ඉතා පැහැදිලිව කියනවා, නැවත වතාවක් දූෂණය ඉහළ ගිහින් තිබෙන බව.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, මේ කාරණයත්. මේ ආණ්ඩුව මේ රටේ ජනතාව මේ මොහොතේදී අලුත් අර්බුදයකට ගෙනිහින් දැම්මා. ඒ අර්බුදය තමයි, බුද්ධ ශාසනය හා සම්බන්ධ පද්ධතිය, එහෙමත් නැත්නම් වසර 2500ක බෞද්ධ සංස්කෘතියත් එක්ක තිබෙන ශක්තිය පරීක්ෂා කරන්න ආණ්ඩුව දේශපාලනිකව උත්සාහ කිරීම. ස්වාමීන් වහන්සේනමකගේ සිවුර ඉවත් කිරීම දේශපාලනිකයි. මේ හරහා උත්සාහ කරමින් ඉන්නේ කුමක්ද? දිගින් දිගටම කරගෙන ආපු දේශපාලන ව්‍යාපෘතියයි මේ කරගෙන යන්නේ. එක පැත්තකින්, ස්වාමීන් වහන්සේගේ සිවුර අයින් කරලා, බෞද්ධ ජනතාව කුපිත කරවා ඒ හරහා එන pressure එක අනෙක් ජාතීන් අතරට ගියාට පස්සේ මේ ප්‍රශ්නය යන්නේ දෙමළ ජාතිකයාට, මේ ප්‍රශ්නය යන්නේ මුස්ලිම් ජාතිකයාට, මේ ප්‍රශ්නය යන්නේ කතෝලික ආගම අදහන්නාට. එහෙම ගියාට පස්සේ ඒ තුළ එන අර්බුදය හමුවේ "අපි තමයි ආරක්ෂකයා" කියමින් මැදිහත් වීමේ දේශපාලන ක්‍රියාවලිය තමයි මේ කරමින් ඉන්නේ. ජාතික සමගිය වාගේ දේවල් ගොඩනගන්න

අනුර වාගේ පොඩි මිනිහෙකුට බැහැ කියලා මම දිගින් දිගටම කියමින් තිබෙනවා. මේ පොඩි මනුස්සයා කරන වැඩේ නිසා, මම මේ රටේ සමස්ත සිංහල බෞද්ධ ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. ඔබේ විරෝධය යන්න ඕනෑ ආණ්ඩුවට; ඔබේ විරෝධය යන්න ඕනෑ අනුරට. කරුණාකර ඔබේ විරෝධය මුස්ලිම් ජනතාවටවත්, දෙමළ ජනතාවටවත්, කතෝලික ආගම අදහන අයටවත්, වෙනත් කිසිම කෙනෙකුට යොමු කරන්න එපා. මොකද, මේ රට ඔය විධියේ අර්බුදවලින් විශාල විනාශයක් වෙච්ච රටක්. මේක අනුර සහ අනුරගේ කණ්ඩායම විසින් මේ රටට ඇති කරපු අර්බුදයක්. ස්වාමීන් වහන්සේනමකගේ ගෞරවය විනාශ කිරීම, එහෙමත් නැත්නම් සිවුරේ බලය අයින් කිරීම, ගමේ තිබෙන පන්සල සතු ශක්තිය අයින් කිරීම තමයි දේශපාලන ව්‍යාපෘතිය. තමන්ගේ ප්‍රධාන ඡන්ද මෙවලම, ප්‍රධාන ඡන්ද කුට්ටිය සුළු ජාතික ඡන්ද බවට පත් කර ගන්න දරන දේශපාලන ක්‍රියාවලියේ ආරම්භක අදියරයි මේ තිබෙන්නේ. ඒ නිසා කරුණාකර තමන්ගේ පටු දේශපාලන අරමුණු වෙනුවෙන් මේ රටේ බෞද්ධ ශාසනය සහ සිංහල ජනතාව කුපිත කරවා, නැති අර්බුද නිර්මාණය කරන්න එපා කියලා මම කියනවා. පොඩි වැඩ ටිකක් කරගෙන අවුරුදු දෙකක් ඉඳලා ඉතුරු ටිකත් කරගෙන යන්න ඉඩ දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

පොඩි පොඩි වැඩවලින් විනාශයක් කරමින්, සම්බුද්ධ ශාසනයේ ශක්තිය පරීක්ෂා කරන්න උත්සාහ කරන්න එපා කියලාත් ආණ්ඩුවට කියමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair and DEPUTY SPEAKER took the Chair.*

[பி.ப. 5.13]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள ஊழல் எதிர்ப்பு (திருத்தம்) சட்டமூலம் நாட்டுக்கு ஆரோக்கியமானது என்பதை நாங்கள் ஏற்றுக் கொள்கின்றோம். எமது நாடானது சுதந்திரம் அடைந்த காலத்தில், ஆசியாவிலே பொருளாதாரத்தில் யப்பானுக்கு அடுத்ததாக இரண்டாவது இடத்தில் இருந்தது. அப்படி யென்றால், 1948க்குப் பிற்பட்ட காலத்தில் ஆட்சி செய்தவர்கள் இந்த நாட்டை என்ன செய்திருக்கிறார்கள் என்பதைப் பார்க்க வேண்டும். இந்த நாட்டை ஆட்சி செய்தவர்கள் இரண்டு விடயங்களை மேற்கொண்டார்கள். ஒன்று, அடிப்படைவாதம். அதாவது, அரசியலில் வெற்றியைக் கைப்பற்றுவதற்காக அடிப்படைவாதத்தைக் கைக்கொள்ளல். இரண்டாவது, அரசியல் வெற்றியைப் பெற்றதன் பின்னர், தங்களுடைய பொருளாதார வெற்றியை வீட்டு ரீதியாகப் பெற்றுக் கொள்வதற்கு ஊழல், மோசடி, இலஞ்சம் ஆகியவற்றை மார்க்கமாகக் கடைப்பிடித்தல்.

நான் ஒரு புள்ளிவிபரத்தைப் பார்த்தேன். அதன் அடிப் படையில், ஒவ்வொரு குடிமகனும் 11 இலட்சம் ரூபாய் கடன்பட்ட நிலையில் உள்ளான். ஒவ்வொரு குடும்பமும் 44 இலட்சம் ரூபாய் கடன்பட்ட நிலையில் இருந்தது. கடந்த ஆட்சிக் காலத்தில் எமது நாட்டில் இருந்த வரி இறுப்பாளர்களின் எண்ணிக்கை 16 இலட்சமாகும். அதனை 4 இலட்சமாகக் குறைத்தபோது, எங்களுடைய நாட்டுக்கு 60,000 கோடி ரூபாய் இழப்பு ஏற்பட்டது. இதைவிட, பல்வேறுபட்ட ஊழல் மோசடிகள் நடைபெற்று இருக்கின்றன. சீனி இறக்குமதியில் செய்யப்பட்ட ஊழல் மோசடியால், 1,700 கோடி ரூபாய் இலங்கை அரசுக்கு நஷ்டம் ஏற்பட்டு இருக்கின்றது. அதேபோன்று, மருந்து இறக்குமதியில் செய்யப்பட்ட ஊழல் மோசடியால் கிட்டத்தட்ட 6,000 கோடி ரூபாய் நஷ்டம் ஏற்பட்டிருக்கின்றது. அதேபோன்று, உர இறக்குமதிக்குத் தடை விதித்ததனால் விவசாயிகள் கிட்டத்தட்ட 26,000 கோடி ரூபாய் நஷ்டம் அடைந்திருக் கிறார்கள். மேலும், ஒவ்வோர் இறக்குமதியின்போதும் commissions பெறுகின்ற முறை காணப்பட்டது. எக்ஸ்பிரஸ் பேர்ள் கப்பல் விபத்துக்கு உள்ளானபோது, அந்தப் பிரச்சினையைச் சமாளிப்பதற்கு கிட்டத்தட்ட 7,500 கோடி ரூபாய் கையூட்டு பெறப்பட்டதாகக் கூறப்படுகின்றது.

இந்த நாட்டை ஆட்சி செய்தவர்கள் அரசியல் வெற்றிக்கு அடிப்படைவாதத்தையும், பொருளாதார ரீதியாகத் தங்களுடைய குடும்பங்கள் வெற்றிபெற ஊழல், மோசடி, இலஞ்சம் என்பவற்றையும் கைக்கொண்டு இருக்கின்றார்கள். எனவே, எந்த அரசாங்கமாக இருந்தாலும், இந்த ஊழல், மோசடி, இலஞ்சத்தைத் தடுக்கவேண்டியதும், அதற்கெதிராகப் போராட வேண்டியதும் அவசியமாக இருக்கின்றது. ஏனென்றால், கடந்த காலத்தில் இந்த நாட்டில் ஒவ்வொரு குடிமகனும் 11 இலட்சம் ரூபாய் கடனாளியாக இருந்திருக் கின்றான். தற்போதைய புள்ளிவிபரம் எனக்குத் தெரியவில்லை. நான் சொல்வது, கடந்த காலத்தில் கிடைத்த புள்ளிவிபரத்தின் அடிப்படையில்தான். இப்படியான பல்வேறுபட்ட ஊழல், மோசடிகள் காரணமாகத்தான் எமது நாடு வெளிநாடுகளிடம் கையேந்தவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலையில் காணப்படுகின்றது.

எனவே, ஊழல் மற்றும் மோசடிகளில் ஈடுபட்டவர்கள், நாட்டைக் கொள்ளை அடித்தவர்கள் நிச்சயமாக சட்டத்தின் முன் நிறுத்தப்பட வேண்டும்; அவர்கள் விசாரிக்கப்பட வேண்டும். மக்களின் பணத்தைக் கொள்ளையடித்தவர்கள் என்ற அடிப்படையில், ஊழலுக்கு எதிராகச் செயற்பட வேண்டியது காலத்தின் கட்டாயமாக இருக்கின்றது. அதேவேளை, 'பொருளாதாரக் குற்றவாளிகள்' என்று உயர் நீதிமன்றத்தால் அளிக்கப்பட்ட தீர்ப்பொன்று இருக்கின்றது. அவர்கள் தங்களது வீட்டின் பொருளாதாரத்தில் குற்றம் செய்திருந்தால் பிரச்சினை இல்லை. நாட்டின் பொருளாதாரத்தில் குற்றம் செய்திருந்தால், நிச்சயமாக அவர்கள் தண்டிக்கப்பட வேண்டும். அவர்கள் செய்த குற்றத்தால் அவர்கள் பாதிக்கப்படவில்லை; மக்கள்தான் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். எமது நாட்டில் கைக்கொள்ளப்பட்ட அடிப்படைவாத அரசியலும், ஊழல் மோசடிமிக்க பொருளாதாரச் செயற்பாடும் எமது நாட்டை மிக மோசமாகப் பாதித்து இருக்கின்றது. அதன் பாதிப்பை

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

அனுபவித்துக்கொண்டு இருப்பவர்கள் சாதாரண மக்களாவர். அந்த மக்கள் இதனை விளங்கிக்கொள்ளாமல் இருப்பதற்காக, அடிப்படைவாதம், மதவாதம், இனவாதத்தைப் பேசி, ஓர் இரும்புத் திரையைப் போட்டு, அந்த மக்கள் அதைப் பற்றி சிந்திக்காத அறிவிலியர்களாக அல்லது சிந்தனை அற்றவர்களாக இருப்பதற்குரிய செயற்பாடு மேற்கொள்ளப்படுகின்றது.

கடந்த காலத்தில் நாங்கள் கற்றுக்கொண்ட பல பாடங்கள் இருக்கின்றன. எதிர்மறையான செயற்பாடுகள்மூலம் நாட்டின் ஜனநாயகம் வீழ்ச்சியடைந்து இருக்கின்றது; மனித உரிமை சார்ந்த விடயம் வீழ்ச்சியடைந்து இருக்கின்றது; நாட்டு மக்களுக்கு இடையேயான ஒற்றுமை வீழ்ச்சி அடைந்திருக்கின்றது. அதேபோன்று, பொருளாதாரமும் அதலபாதாளத்தில் வீழ்ந்திருக்கின்றது.

நிச்சயமாக ஊழலுக்கு எதிரான சட்டம் என்பது வரவேற்கத்தக்க ஒரு விடயமாகும். இருந்தாலும், அதில் பாதிப்புகளைத் தரக்கூடிய விடயங்கள் ஏதும் காணப்படுமாக இருந்தால், அவற்றை ஆழமாகச் சிந்தித்து அகற்ற வேண்டும். இப்படியான சட்டங்கள் கொண்டுவரப்படுகின்றபொழுது, ஊழல், மோசடி செய்கின்றவர்கள், அதன்மூலம் தமது குடும்பத்தின் பொருளாதாரத்தை உயர்த்திக்கொள்ள விரும்புகின்றவர்கள் தண்டிக்கப்படுவார்கள். இப்பொழுது பத்திரிகையில் அதிசயமான பல விடயங்கள் வெளிவந்துகொண்டு இருக்கின்றன. எனவே, நாங்கள் இதனைக் கட்சி ரீதியாகப் பார்க்காமல், நாட்டைக் களவெடுத்தவர்கள், கொள்ளை அடித்தவர்கள் அல்லது நாட்டின் பொருளாதாரத்தை எலும்புக் கூடாக மாற்றியவர்கள் என்ற அடிப்படையில் பார்க்கின்ற பொழுது, அந்த விடயங்களால் மக்கள் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள் என்பதை அறிய முடியும். குறிப்பாக, மக்கள் தங்களது தொழிலை இழந்திருக்கிறார்கள்; பல தொழிற்சாலைகள்கூட மூடப்பட்டுக் காணப்படுகின்றன. எனவே, நாங்கள் சொல்லக்கூடிய முக்கியமான விடயம் என்னவென்றால் ஊழல், மோசடி, இலஞ்சம், இனவாதம், அடிப்படைவாதம் என்பன ஒழிக்கப்பட வேண்டும் என்றுதான்.

அரசியலில் எதைச் செய்யாதுவிட்டாலும், அடிப்படைவாதத்தைப் பயன்படுத்தி ஆட்சியைக் கைப்பற்றுகின்ற நடைமுறை காணப்படுகின்றது. இப்படியான செயற்பாடுகளுக்குக்கூட, எதிரான சட்டங்கள் இருக்க வேண்டும். இல்லையென்றால், அவர்கள் நாட்டின் பொருளாதாரத்தை படுமோசமாக வீழ்த்தி, அதலபாதாளத்துக்குள் தள்ளிவிட்டு மக்களை ஏமாற்றுவதற்காக இனவாதத்தை, மதவாதத்தைத் தங்களுடைய பிரசார உத்தியாகப் பயன்படுத்துவார்கள். ஊழல், மோசடி, இலஞ்சம் போன்ற செயற்பாடுகளுக்கு எதிரான போக்கைத்தான் நாங்கள் கடைப்பிடிக்கின்றோம். எங்களைப் பொறுத்தமட்டில், சிங்களவர், தமிழர், முஸ்லிம்கள், பறங்கியர், மலாயர் என்ற வேறுபாடுகள் இல்லாமல் இப்படியான சட்டங்கள் நாட்டிலுள்ள சகல மக்களுக்கும் நேரிடையான நிலைமையை ஏற்படுத்த வேண்டும்.

ஊழல், மோசடி, இலஞ்சத்துக்கு எதிரான இந்தத் திருத்தச் சட்டமூலத்தை இனரீதியாகப் பார்க்காமல், பொதுவாக இந்த நாட்டின் பிரஜை என்ற அடிப்படையில் அதை நாங்கள் வரவேற்கின்றோம். அதில் ஏதாவது பாதிக்கக்கூடிய விடயங்கள் காணப்படுமாக இருந்தால், அவற்றைத் தவிர்த்து இந்தத் திருத்தச் சட்டமூலத்தை நிறைவேற்றுவது நல்லதென நான் கருதுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Wasantha Samarasinghe. You have 18 minutes.

[අ.භා. 5.20]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව විවාදය පැවැත්වෙන මේ වෙලාවේ එම විවාදයට එකතු වෙමින් අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. අපේ රටේ වංචාව, දූෂණය පිළිබඳ මාතෘකාව බරපතළ ලෙස සමාජයට සාකච්ඡාවට එන්නේ 2010න් පසුව. ඒ කියන්නේ, රාජපක්ෂ පාලනයේ දෙවැනි සමය ආරම්භ වුණාට පසුව. ඒකත් එක්කම අපේ රටේ සිද්ධ වෙච්ච මහා පරිමාණ වංචා, දූෂණවලට එරෙහිව දේශපාලන ව්‍යාපාරයක් ලෙස අපි විශාල ලෙස මැදිහත් වුණා. ජනතා විමුක්ති පෙරමුණ ලෙසත්, ජාතික ජන බලවේගය ලෙසත් අපි මේක අඛණ්ඩව කරපු අරගළයක්. ඒ අරගළයේ ප්‍රතිඵලයක් හැටියට තමයි මේ රටේ ජනතාව 2024 ජනාධිපතිවරණයේදී අනුර දිසානායක මැතිතුමා ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කරන්නේ; ඒ වාගේම 2024 නොවැම්බර් මාසයේ පැවති මහ මැතිවරණයේදී අපේ රටේ ජනතාව තුනෙන් දෙකක බලයක් සහිතව මේ ජනවරම අපට ලබා දුන්නේ. අපේ රටේ ජනතාව හොරකමට, වංචාවට, දූෂණයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න, හොරුන්ට දඬුවම් කරන්න, හොරා කාපු ඒවා අය කර ගන්න, ජනතාවට මේවා පවරන්න කියන ඒ මූලික ඉල්ලීම් ඉදිරිපත් කරමින් තමයි මේ ජනවරම අපට ලබා දුන්නේ. අද ඒ ජන වරම ක්‍රියාත්මක වෙනකොට සමහරුන්ට රිදිලා තිබෙන්නේ. ඒක කොච්චරද කියනවා නම්, පාර්ලිමේන්තුවේ බන්ධනාගාර බස් හෝල්ට් එකකුත් දැන් තිබෙනවා. ඇයි? බන්ධනාගාරයේ බස් එක ඇවිල්ලා නවත්තලා තියෙන්න ඕනෑ, පාර්ලිමේන්තු එන්න; සවස එක්කන් යන්න. දැන් එහෙම අය තමයි බන්ධනාගාරයේ ඉඳන් ඇවිල්ලා අපට වංචාව දූෂණය ගැන කියන්න එන්නේ. ඒ නිසා මේ කියන අය අතර විපක්ෂයේ සමහරු,- මට හිතෙන්නේ එක්කෝ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ටිකක්. එහෙම නැත්නම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මොකද, කට්ටියට වුවමනායි, අනුර පොඩි කරන්න. දැන් කියනවා "අනුර පොඩි මිනිහෙක්; පොඩි වැඩ කරගෙන ඉන්න; ලොකු වැඩ කරන්නේ නැහැ" කියලා. අනුර විතරක් නොවෙයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව අනුර කුමාර දිසානායක මැතිතුමාගේ නායකත්වයෙන් යුතුව මේ රටේ ලොකු වැඩ තවදුරටත් කරලා වංචාවට, දූෂණයට එරෙහිව යන අරගළය අපි අඛණ්ඩව ඉස්සරහට අරගෙන යනවා. ඒ නිසා ඒක නවත්වන්න ඔය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බැහැ. අනුර පොඩි කරන්න හදනවා.

ලෝකය පිළිගන්නවා; ලෝකයේ පැසසුම් තිබෙනවා; රාජ්‍ය නායකයෝ ඒ පිළිබඳව කථා කරනවා. ලංකාවේ බිහි වෙච්ච ජනාධිපතිවරු අතරින් අද බිහි වෙලා ඉන්න මේ ජනාධිපතිවරයා තමයි වංචාවට, දූෂණයට එරෙහිව වාගේම රට ගොඩනඟන වැඩ පිළිවෙළටත් ජාතික සමගිය ගොඩනඟමින් නිවැරදි නායකත්වය දෙන්නේ කියන එක කියනවා.

එහෙම කියනකොට දැන් විපක්ෂයට ටිකක් රිදිලායි ඉන්නේ. රිදිලා විතරක් නොවෙයි, ඒ අයට දැන් යන එනමං හොයාගන්න බැරිවයි ඉන්නේ. ඒ නිසා සමහරු බොරු කියන එක කලාව කරගෙන තිබෙනවා. බොරු කියන එක කලාවක් නම් ඒකේ පිකාසෝලා තමයි විපක්ෂයේ ඉන්න සමහර අය. සමහරු උත්සාහ කරනවා, බොරුවෙන්ම යන්න. අපේ අගමැතිතුමිය පිළිබඳව මහා බොරු ගොඩක් කියන්න උත්සාහ කළා. අගමැතිතුමිය බොරු ගොඩක් කිව්වාය කිව්වා. නැහැ. අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියේ තිබෙන නේවාසිකාගාර වාගේම නේවාසිකාගාර වැඩිවෙනකොට වැඩිවෙච්ච ශිෂ්‍යයන් ප්‍රමාණය බලන්න.

දැන් අපි 40,000කට ආසන්න සිසුන් ප්‍රමාණයක් බඳවා ගන්නවා. මේ අවුරුද්දේ සිසුන් 43,000ක් විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නවා. එහෙම බඳවා ගනිද්දී ඒ බඳවා ගනිපු කාලය අනුව විශ්වවිද්‍යාලවලට නේවාසිකාගාර හැදෙන්න ඕනෑ. ළමයින් හත් අටදෙනා ඉන්නවා, විශ්වවිද්‍යාල නේවාසිකාගාර කාමරවල. ඒ නිසා කාන්තා නේවාසිකාගාර ද, පිරිමි නේවාසිකාගාර ද අදාළ නැහැ, ඒවා හැදෙන්න ඕනෑ. ඉතිහාසය ඇතුළේ තිබිච්ච දේවල් අද සරදම් වෙලා ඇහෙනකොටම මේගොල්ලන්ට අමාරුයි. ඒ ගොල්ලන් එහෙම කළා නම් ජනතාව ඒගොල්ලන් එක්ක ඉන්න එපායැ. ඇයි ඉන්නේ නැත්තේ? ඒ නිසා අද ඒගොල්ලන් උත්සාහ කරනවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පිළිබඳව බොරු සමාජගත කරන්න. ඒ බොරු සමාජගත කරන්න උත්සාහ කරන අතරේ තමයි නොයෙක් දේවල් කියන්නේ.

මාදුගොඩ මන්ත්‍රීතුමාත් කිව්වා, ගල් අඟුරු වංචාව ගැන, කන්ටේනර් ගැන. ආහාර ටෙන්ඩරයක් ගැනත් කිව්වා. අපි අහනවා, ඒ සම්බන්ධයෙන් දමපු පැමිණිල්ලක් තිබෙනවාද කියලා. දමන්න එපායැ වංචාවක්, දූෂණයක් වෙලා තිබෙනවා නම් පැමිණිල්ලක්. නමුත්, පැමිණිල්ලක් දමන්න යන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ ඇවිල්ලා කියනවා, යනවා. ඒ, නිකම් අර පුරුද්දට වාගේ. කොටුව පැත්තට යනකොට "කොටුව, කොටුව" කියලා ඇහෙනවා නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. "ඔටුවො, ඔටුවො" කියලාත් ඇහෙනවා, සමහරුන්ට. අන්න ඒ වාගේ තමයි විපක්ෂයත්. දැන් මේවා පුරුද්දට කියන්න පටන්ගෙනයි තිබෙන්නේ. ඒ නිසා බොරු චෝදනා කරන්න ලැහැස්ති වෙන්න එපා; රටේ නීතිය තිබෙනවා, එය ක්‍රියාත්මක වෙනවා කියන කාරණය අපි කියන්න ඕනෑ.

මේ පනත සංශෝධනය කරන්න යනකොට ශ්‍රේෂ්ඨාධිකරණය සමහර ඒවා එපා කිව්වාම අන්න, ශ්‍රේෂ්ඨාධිකරණය හොඳයි. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙනකොට කිව්වා, ශ්‍රේෂ්ඨාධිකරණයත් දේශපාලනීකරණය කරනවාය කියලා. ඒ නිසා එකක් හරියට කියන්න. අද දූෂණ විරෝධී පනතට සංශෝධන ඉදිරිපත් කරන්නේ, ඒ පනත හදපු වෙලාවේ කරන්න බැරිවෙච්ච ඒවා කරන්න විතරක් නොවෙයි, ඒ පනත තවදුරටත් ශක්තිමත් කරලා වංචාව, දූෂණය නැති රටක් හදන්න, දූෂිතයන්ට දඬුවම් දෙන්න, හොරා කාපුවා නැවත අයකර ජනතාවට දෙන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ හදන්න. ඒ සඳහා විශේෂ කමිටුවකුත් පත්කරන්න ජනාධිපතිතුමා විසින් යෝජනා කර තිබෙනවා. ඒ නිසා මේ කටයුත්ත අපි අඛණ්ඩව ඉදිරියට අරගෙන යනවා. ඒ කටයුත්ත ඉදිරියට අරගෙන යනකොට මේ අය හැම තිස්සේම කියන්නේ එකම දේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. චෝදනාවක් තිබෙනවා නම් පැමිණිල්ලක් දමන්න එපායැ. ඒවා කරන්නේ නැහැ.

දැන් කියන්න ගත්තා, අපට නඩුවක් තිබෙනවා කියලා. චෝදනාවකට අදාළව ගල්කිස්ස උසාවියේ නඩුවක් තිබෙනවා කිව්වා. පැමිණිල්ල දමපු අය පැමිණිල්ල දමන්නේ 2024 ජනාධිපතිවරණයට කලින්. National Workers' Congress - NWC - කියන්නේ අපේ වෘත්තීය සමිතියක්. මම ඒකේ සභාපති. ඒ වෘත්තීය සමිතියට අදාළ දේපළක් අපි බදු දුන්නා කියලා ඒකට විරුද්ධව කට්ටියක් අල්ලාගෙන පැමිණිල්ලක් දමා තිබෙනවා. කවුද, මේගොල්ලන්ගේ නීතිඥයා? ඇපදෙන්න කියලා ඊයේ පෙරේදා විනිශ්චයකාරවරයෙකුට තර්ජනය කළ - දැන් උසාවියේ නඩුවක් තිබෙනවා, නීතියට බලපෑම් කරන්න කටයුතු කළා කියලා - ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න. එතුමාගේ statement එකේදී උසාවියට කියනවා, වසන්ත සමරසිංහ අත්අඩංගුවට ගන්න කියලා. චතුරිකා සිල්වා කියන විනිශ්චයකාරතුමිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, නැත්නම් Fraud Investigation Bureau එකට කියනවා, පරීක්ෂණයක් කරලා වැරදිකරුවන් ඉදිරිපත් කරන්න කියලා. හැබැයි, පොලිස් වංචා විමර්ශන කාර්යාංශය - Fraud Investigation Bureau එක - කියනවා, අපරාධකරුවෙක් නැහැ, සැකකරුවෙක් ඉදිරිපත් කරන්න බැහැ කියලා. මොකද, පැමිණිල්ල දාපු මිනිස්සුන්ටත් මේකේ අයිතිය තහවුරු කරන්න බැහැ. ඇයි බැරි? බොරු පැමිණිල්ලක් නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගොඩනැඟිල්ල අපි ඉස්සෙල්ලාම බදු දුන්නේ 2019දී. එතැන ඉඳන් අවුරුදු 3ක් ගියා. ඊට පස්සේ තව ගිවිසුමක් ගැහුවා. 2024දී තමයි මේගොල්ලන්ට හදිසියේ මතක් වෙලා බොරු චෝදනාවක් දමන්න උත්සාහ කළේ. ඒ විතරක් නොවෙයි, දැන් පරීක්ෂණ යනවා. ඒකේ විමර්ශන නිලධාරිවරයාට එවා තිබෙනවා. ඇත්ත අයිතිකරුවන් කවුද කියලා කියන එක විතරයි දැන් තිබෙන්නේ. ඒ ඇත්ත අයිතිකරුවන් වන අපි සතුව අදාළ ලිපිලේඛන තිබෙනවා. එය, 1958දී හදපු වෘත්තීය සමිතියක්. මම ඒකේ සභාපතිවරයා වුණේ 2015දී. ඒ නිසා මේ වෘත්තීය සමිතියට අදාළව නීත්‍යනුකූල ලිපි ලේඛන, original ඔප්පු ටික අපි පොලීසියට භාර දීලා කිව්වා, "මෙන්න original ඔප්පු. හොරු ටිකක් මේ දේපළ හොරකම් කරන්න උත්සාහ කරනවා" කියලා. මේකට කම්කරු දෙපාර්තමේන්තුව භාරව කටයුතු කළ හිටපු කම්කරු ඇමතිවරයෙක් සම්බන්ධයි. ඒ තමයි, ජෝන් සෙනෙවිරත්න. ඔහුගේ සම්බන්ධීකරණ ලේකම් වශයෙන් කොඩිකාර කියලා නීතිඥ මහත්මයෙක් හිටියා. වෘත්තීය සමිතියක් හොරට ලියාපදිංචි කරවලා ඒකට අයිති සීදුවේ තිබුණු දේපළක් එයා හදපු වෘත්තීය සමිතියකට අරගෙන විකුණා ගත්තා. දැන් ඒ සම්බන්ධ නඩුවත් ඇහෙනවා. හැබැයි, ගල්කිස්සේ නඩුවක් ගැන හැම තිස්සේම බොරු කියනවා. අඩුම ගණනේ උසාවිය අත්අඩංගුවට ගන්න තියා සැකකරුවෙක් ලෙසවත් මා නම් කරලා නැහැ. පැමිණිල්ලේ අපිව නම් කරලා තිබෙනවා. ඊට පසුව ඒගොල්ලන්ගේ නීතිඥයා නම් කරනවා. හැබැයි, මේ පරීක්ෂණය කරන පොලීසිය උසාවියට ගිහින් කියනවා, පරීක්ෂණ කරගෙන යද්දී මේකට සැකකාරයෙක් ඉදිරිපත් කරන්න බැහැ, මොකද මේ අයටත් එහෙම අයිතිවාසිකමක් නැහැ, මේක ඔප්පු කරන්න බැහැ කියලා. එහෙම එකකට හැම තිස්සේම පාර්ලිමේන්තුවේ කිය කියා ඉන්නවා, අපි සැක පිට ඉන්නවා කියලා. බන්ධනාගාරයේ ඉන්න අයත්, සැක පිට ඉන්න ගොඩක් අයත් ඇප අරගෙන තමයි මේ ඇවිත් තිබෙන්නේ.

දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේ සමහර අය උත්සාහ කරනවා, මේක සිංහල ජාතියට, බෞද්ධ ආගමට විරුද්ධ කථාවක් බවට පත් කරන්න, එහෙම කරලා ජාතිවාදය අවුස්සන්න. උතුරේ මන්ත්‍රීතුමෙකුත් කිව්වා, මේ හදන්නේ වෙන ගමනක් යන්න කියලා. නැහැ, රටේ නීතිය අපි හරියට ක්‍රියාත්මක කරනවා. නීතිය ක්‍රියාත්මක කරගෙන යද්දී යම් කෙනෙකු අපහසුතාවකට පත් වන්න පුළුවන්.

[ගරු වසන්ත සමරසිංහ මහතා ]

වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දුන්නාට පස්සේ ඒ වත්කම් සහ බැරකම් ප්‍රකාශවල පිටපත් ඕනෑම කෙනෙකුට ගන්න තිබෙන අයිතිය අපි මේ සංශෝධනයෙන් නවත්වා නැහැ. මේ කියන්නේ පට්ටපල් බොරු. මේ ඕනෑම කෙනෙකුට, ඕනෑම කෙනෙකුගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශවල පිටපත් ගන්න පුළුවන්. හැබැයි එකක් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ අප විසින්ම හදලා දීපුවා. මේවා වෙන කවුරුවත් හදපුවා නොවෙයි. මේවා අපි ඇමතිවරුන් වෙන්න කලින් තිබ්ච්ච ඒවා. මේවා අපි ඇමතිවරුන් වුණාට පස්සේ හදපුවා නොවෙයි. ඒ නිසා අප සතුව මොනවා හරි දේපළක් තිබෙනවා නම්, ඒ දේපළේ නියමිත වෙළෙඳ පොළ වටිනාකම දාලා තිබෙනවා. හැබැයි අපි දන්නවා, සමහර අය එහෙම නොවෙයි දැම්මේ කියලා. ගොඩක් අය තෑගි හම්බ වෙච්ච ඒවා කියලා දාලා තිබෙන්නේ. ඒ නිසා ඒවා හම්බ වෙච්ච මිනිස්සුත් දැන් ඇවිත් එය ඔප්පු කරන්න ඕනෑ. එක්කෙනෙක් සාක්ෂි දීලා කිව්වා, එය නඩුවක් කියලා. නැහැ, සාක්ෂි දීලා තිබෙන මනුස්සයා සාක්ෂි දීලා තිබෙනවා නම්, ඒ සාක්ෂි අනුව තමයි උසාවිය පරීක්ෂණ පවත්වන්නේ.

පවුල් පිටින් එකට හොරා කාලා, පවුල් පිටින්ම හොරු වෙලා තිබෙන නඩු ඇහෙනකොට පවුලේම මිනිස්සුන්ට හිරේ යන්න වෙනවා තමයි. පවුලේම මිනිස්සු එකට හොරා කෑවේ නැත්නම් බේරිලා ඉන්න තිබුණා. පවුලම - අම්මලා, තාත්තලා, පුතාලා, නෑනලා, මස්සිනාලා, බාප්පලා, පුංචි අම්මලා - එකට එකතු වෙලා හොරා කාලා තිබෙන්නේ. හොරා කාපු මිනිස්සුන්ගේ නඩු ඇහෙනවා, නීතිය ක්‍රියාත්මක වනවා.

ඒ නීතිය ක්‍රියාත්මක වෙද්දී සමාව ගත්ත එක මහත්මයෙක් මෙතැන ඉඳලා ගියා. 2012දී විතර අයථා වත්කම් රැස්කර ගැනීම පිළිබඳව පරීක්ෂණයට එන්න කිව්වාම අමාත්‍යාංශයක ඉඳන් කිව්වා, නයෙක් කෑවා කියලා. අද ඒ කෙනාත් ඇවිල්ලා කියනවා, දේශපාලන පළිගැනීම් කරන්න එපා කියලා. අමාත්‍යාංශයේ ඉඳන් නයෙක් කෑවා කියලා පහුවදා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයා - හිටපු කොමසාරිස්වරයා - විනිශ්චයකාරවරයකු කරලා ත්‍රිකුණාමලයට මාරු කරලා යැව්වා. කවුද? රාජපක්ෂලාගේ ආණ්ඩුව; ඒගොල්ලන්ගේ ආණ්ඩුව. එහෙම නැතිව වෙන කවුරුවත් නොවෙයි.

අද සමගි ජන බලවේගය කියන්න උත්සාහ කරනවා, වංචා, දූෂණ නවත්වන්න ඒගොල්ලන් මාර වැඩක් කළා කියලා. 2015දී දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය පිහිටුවලා ඒ කමිටු ලේකම් කාර්යාලයට නිලධාරින් ටික බඳවා ගන්න ගියාට පස්සේ වින්ද දුක අපි දැක්කා. ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගිහිල්ලායි ඒකට පැමිණිලි භාර දුන්නේ. දවස ගාණේ එන්න එන්නම කරන පැමිණිලි ප්‍රමාණය වැඩි වුණා. මම ගිහිල්ලා භාර දීලා තිබෙනවා, පැමිණිලි 100කට වඩා දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයට. පැමිණිලි වැඩි වෙද්දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයායි, රනිල් වික්‍රමසිංහ අගමැතිවරයායි, සජිත් ප්‍රේමදාස නියෝජ්‍ය නායකයයි එකතු වෙලා මොකද කළේ? ඒගොල්ලන් එකතු වෙලා කමිටු ලේකම් කාර්යාලය පවත්වා ගෙන යන එක නැවැත්වූවා. අවුරුදු දෙකකින් පස්සේ ප්‍රතිපාදන දුන්නේ නැහැ, වහලා දැම්මා. අන්න එහෙමයි ඒගොල්ලන් දූෂණය නවත්වන්න හැදුවේ. ඒගොල්ලන් දූෂණය නවත්වන්න හැදුවේ ඒ කමිටුව ශක්තිමත් කරලා, ඉදිරිපත් වූ පැමිණිලි සම්බන්ධ නඩු අහලා නොවෙයි.

ඒ අස්සේ ලොකුම චෝදනාව ආවා. ඒ තමයි, මහ බැංකු බැඳුම්කර වංචාව. මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ වෙච්ච පුද්ගලයෝ මේක නවත්වන්න footnotes දැම්මා, COPE එකේ වාර්තාවට. ඔබටත් මතක ඇති, ඒක සමාජයේ ප්‍රසිද්ධයි. හිටපු මහ බැංකු අධිපති ලෝකයේ වැඩිම කාලයක් තිස්සේ පවත්වන wedding එකට ගිහිල්ලා තිබෙන්නේ. එදා රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, "මම තමයි එයාට යන්න කිව්වේ. Wedding එකකටයි ගියේ" කියලා. 2015 පෙබරවාරි මාසයේ තමයි වංචාව වුණේ. 2015දී මේ පුද්ගලයා wedding එකකට ගියා. අත්අඩංගුවට ගැනීම නවත්වා ගන්න තමයි යැව්වේ. අද වෙනකම් ආවේ නැහැ. දැන් අවුරුදු 11ක් වනවා, තවම මඟුල් කනවා, අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවේ. එහෙමයි මේගොල්ලන් වැඩ කළේ.

දැන් සජබයේ කවුරු හරි කථා කළාද, මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ අර්ජුන මහේන්ද්‍රන් රට ගිහිල්ලා ඉන්නවා කියලා? අද කියන්න හදනවා, මේ නඩු ඉවර කරලා නැහැ කියලා. තවම ඒ නඩුව අවසන් වෙලා නැහැ. මහ බැංකු බැඳුම්කර වංචාව විතරක් නොවෙයි, SLIIT එක සම්බන්ධ සිද්ධියත් වුණේ මෙතුමන්ලාගේ කාලයේ; 2015 මැයි මාසයේ. ආණ්ඩුව ඇවිල්ලා මාස හතරයි. එවකට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ තිබුණු මාලබේ SLIIT එකේ ගිණුමේ රුපියල් මිලියන 1,100ක් තියෙද්දි, ඒ රුපියල් මිලියන 1,100න් මිලියන 400ක් මහපොළට දීලා මේ අය වෙනත් පිරිසකට SLIIT එක ලියලා දුන්නා. ඒක කළේත් මේගොල්ලන්. අදාළ නැති ඇමතිවරුන් ශ්‍රී පවන් අග්‍ර විනිශ්චයකාරතුමාගේ chamber එකට ගිහිල්ලා, ඒ chamber එකේ ඉඳන් හොර ගිවිසුමක් ගැහුවාට පස්සේ, අග්‍ර විනිශ්චයකාරතුමා මහපොළ භාරකාර මණ්ඩලය - Board of Trustees - නැවත කැඳෙව්වේ නැහැ. ඒ, ඇයි? එතුමා කිව්වා, වංචාවක් කළා, මට බොරුවක් කළා, මම දන්නේ නැති ගිවිසුමකට අත්සන් කළා කියලා. අවසානයේ එතුමා Board of Trustees කැඳවන්නේ නැති වුණාම, අවුරුදු තුනක් ගිහිල්ලා මේ අය පනත සංශෝධනය කරලා හිටපු විනිශ්චයකාරතුමෙකු හෝ Auditor-General කෙනෙකු මේ අරමුදලේ සභාපති ධුරයට පත් කරන්න යෝජනා කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් තිබුණු විධියට අග්‍ර විනිශ්චයකාරතුමා තමයි මේ අරමුදලේ සභාපති. එතකොට අග්‍ර විනිශ්චයකාරතුමා ඒක ප්‍රතික්ෂේප කළාට පස්සේ මොකද කළේ? මෙතුමන්ලාගේ ආණ්ඩුව එකතු වෙලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විශ්‍රාම ගිය විනිශ්චයකාරවරයෙකු හෝ විශ්‍රාම ගිය Auditor-General කෙනෙකු සභාපති හැටියට පත් කරන්න පුළුවන් කියලා පනත සංශෝධනය කළා. අපි දැන් ඒ පරීක්ෂණයට අදාළ තොරතුරු හොයාගෙන ගිහිල්ලා තිබෙන්නේ. දැන් ඒ පරීක්ෂණ කටයුතු අවසන් කරමින් තිබෙන්නේ. ඒ නිසා මේ භාරකාර අරමුදල ශක්තිමත් කරන්න, වැඩිපුර ශිෂ්‍යාධාර දෙන්න, තාක්ෂණය සහිත අධ්‍යාපන අවස්ථා වැඩි කිරීමට අවශ්‍ය පහසුකම් හදන්න තමයි SLIIT එක හැදුවේ. 2015දී ඒක කොල්ලකනකොටත් මේ අයගේ ආණ්ඩුව තිබුණේ. ඒ ගැන මොනවා හරි කථා කළාද? නැහැ.

මේ ආණ්ඩුව විසින් ඉතිහාසයේ වෙච්ච සියලු හොරකම්, වංචා, දූෂණ පිළිබඳව පරීක්ෂණ පවත්වනවා. මම දැක්කා, පාර්ලිමේන්තුවට ගෙන්වා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු කණ්ඩායමෙන් ප්‍රශ්න කළ බව, මේ ආණ්ඩුවේ පැමිණිලි විභාග නොකරන්නේ ඇයි කියලා. පැමිණිලි දාලා තිබෙනවා, ඒවා විභාග කරනවා, හැබැයි ඒ විභාග කරන සමහර පැමිණිලි 2012, 2014, 2015 ඉඳන් තිබෙන පැමිණිලි කියලා ඒ නිලධාරින් කිව්වා. ඒ කාලයේ මේගොල්ලන් තමයි හිටියේ. හොරා කෑවේ මේගොල්ලන්. ඒ කාලයේ දාපු පැමිණිලි විභාග කළේ නැහැ. ඒ නිසා ඒ කල් ගිය

පැමිණිලි දැන් විභාග කරනවා. ඒ කල් ගිය පැමිණිලි දැන් විභාග කරද්දී පවුලේ ඉන්න ඔක්කෝම වැඩේට සම්බන්ධයි නම් අහුවෙනවා. එතකොට, "sorry" කිව්වාට වැඩක් නැහැ; දුක් වුණාට වැඩක් නැහැ. හොරකමට සම්බන්ධ වෙලා, වංචාවට සම්බන්ධ වෙලා කොළේ වහගෙන හිටියා. කොළේ වහගෙන ඉඳලා අවසානයේ මේගොල්ලන් මොකක්ද කළේ? කොළේ වහගෙන ඉඳලා දැන් කියනවා, දේශපාලන පළිගැනීම් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලන පළිගැනීමක් නම්, මේ අයගේ නීතිඥ මහත්වරුන් උසාවියට යනවා. මේ අයගේ නීතිඥ මහත්වරුන් උසාවියට ගිහිල්ලා කියනවා, මෙන්න මේ කාරණා අනුව මේක දේශපාලන පළිගැනීමක් කියලා. දැන් මේගොල්ලන් ගිහිල්ලා එහෙම කරුණු කියනවාද? මේගොල්ලන්ට ගිහිල්ලා එහෙම කරුණු කියන්න පුළුවන්ද? එහෙම කරුණු කියන්න බැහැ. මොකද, එයාර් බස් ගනුදෙනුවේ වංචාවට අදාළව මුදල් ආ ගිය හැටි ඇති තරම් මෙතැනදි කථා කළා. හිටපු විධායක නිලධාරි කපිල චන්ද්‍රසේන ඔහුගේ නෝනාගේ සිංගප්පූරුවේ තිබුණු ගිණුමට තමයි සල්ලි දැම්මේ. එයාර් බස් සමාගම මේකට වගකියන්න ඕනෑ. ඔවුන් අනුන්ගේ ගිණුමකට සල්ලි දැම්මා. දැන් අන්න ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සමාගම එයාර් බස් සමාගමත් එක්ක negotiations කරගෙන යනවා, කොහොමද මේ ආරවුල බේරන්නේ කියලා. මොකද, ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් සමාගමට විශාල ලෙස අලාභ කිරීමේ සිද්ධියක් මේක. ඒකෙන් ඩොලර් මිලියන 20කට ආසන්න කප්පම් මුදල් ගත්තා. කොටස් තමයි මෙහාට ආවේ.

තව නඩුවක් තිබුණා. British Virgin Islandsවල තිබුණු සමාගමක තමයි සල්ලි දාලා තිබුණේ, හොංකොං ඩොලර් මිලියන 22ක්. ඒකට පරීක්ෂණයට ගියා, හිටපු FCID එකේ ලොක්කා රවී විද්‍යාලංකාර. ඒ පරීක්ෂණය අවසන් කරලා ඇවිල්ලා පරීක්ෂණයෙන් හොයා ගත් තොරතුරු ආණ්ඩුවට කිව්වා. ආණ්ඩුවට කිව්වාට පස්සේ පරීක්ෂණත් නැහැ, සල්ලි තිබුණු ගිණුම් ටිකත් නැහැ, වැඩේ කොහොමද අවසාන වෙලා තිබෙන්නේ කියලාත් නැහැ. ඒ නඩුවත් තවම අහනවා. ඒ පරීක්ෂණත් තවම යනවා.

ඊළඟ කථාව තමයි, ක්‍රිෂ් නඩුව. ක්‍රිෂ් සමාගමට කොළඹ heart එක වාගේ තිබෙන තැන, පරණ බිල්ඩින් එකත් එක්ක හෝටලය හදන්න ඉඩම දුන්නා. අන්න ඒකෙන් තමයි රුපියල් මිලියන 70ක් ඉඩම ලබා දීම වෙනුවෙන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අල්ලස් දීලා තිබෙන්නේ. ඒ නඩුවත් අහනවා. ඒ නඩුව අහනකොට ඒ නඩුවත් යට ගැස්සුවා. ඒ නඩුවත් අහන්න දෙන්නේ නැතුව යට ගැස්සුවා. ඒ නිසා දැන් ඒ නඩු අහන්න වෙලා තිබෙනවා. අහන්න තිබුණු නඩුව යට ගස්වන්න මැදිහත් වුණේ කවුද? මේ අයත් එක්කම එකට හිටපු රවී විද්‍යාලංකාර, හිටපු Senior DIG. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ටික දවසක් ගිහිල්ලා බලනකොට ක්‍රිෂ් සමාගමේ ලංකාවේ අධ්‍යක්ෂ හැටියට පත් වනවා, FCID එකේ හිටපු ලොක්කා රවී විද්‍යාලංකාර. වංචාව සහ මේ සම්බන්ධකම්වල ස්වභාවය තමයි ඒ. අද ඔහුටත් චෝදනා ගොනු කරලා විමර්ශනය සඳහා කැඳවා තිබෙනවා. ඒ නිසා කිසිවක් අත්හරින්නේ නැතුව මේ පරීක්ෂණ එකින් එක, එකින් එක ඉස්සරහට යනවා. එහෙම වෙද්දී මේගොල්ලන් උත්සාහ කරනවා, ඒවා දේශපාලන පළිගැනීම් ලෙස සඳහන් කරන්න. අපි එසේ දේශපාලන පළිගැනීම් කරන දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. පරණ ඉතිහාස කථා ඔක්කෝම කියලා මේගොල්ලන් උත්සාහ කරනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුව කළු කරන්න.

අපි කියන්න ඕනෑ, මේ රටේ මිනිස්සු අපට මේ ජන වරම දුන්නේ විශ්වාසයක් සහිතව බව. ඒ, මේ රට පීඩාවට පත් කරලා, ආර්ථිකමය වශයෙන් බංකොලොත් කරලා, තෙල් ටිකක් ගෙනෙන්න බැරිව, වාහනයක් ආනයනය කරන්න බැරිව, මේ රටේ මිනිස්සුන්ට භාණ්ඩයක් මිලදී ගන්න බැරිව, ආර්ථිකය කඩා වට්ටලා හිර කරලා තිබුණු නිසායි. එසේ කඩා වැටුණු ආර්ථිකයක් තමයි අපට භාර දුන්නේ. ආර්ථිකය කඩා වැට්ටුවේ කොහොමද? හොරකම් කරලා, වංචා කරලා. මහ බැංකුව විතරක් නොවෙයි, සංස්කෘතික අරමුදලේ මුදලුත් එක්ක හොරා කෑවා. ඒවාත් එක්ක හොරා කෑවා. දැන්වීම් දමනවා කියලා හොරා කෑවා. Foreign Employment Bureau එකේ සල්ලි රුපියල් මිලියන 570ක් දුන්නා, රට වටේ විදේශ නියෝජිත ආයතනවලට ප්‍රදර්ශන පවත්වන්න. වැඩිපුර සල්ලි දීලා තිබෙන්නේ මොනවාටද? Huts ගහන්න. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 400කට වැඩිය දීලා තිබෙනවා. මේවා ගැන විමර්ශන කරනකොට, හිටපු ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන්, පෞද්ගලික ලේකම්වරුන්, ඒ අයගේ හිටපු සම්බන්ධීකරණ ලේකම්වරුන් පෙළට ඇතුළට යනවා. එතකොට, සමහරු බන්ධනාගාරයට එහෙන්ම යනවා, තවත් සමහරු මේ පාර්ලිමේන්තු බන්ධනාගාර හෝල්ට් එකේ අපට හම්බ වෙනවා. අපි දූෂණ විරෝධී පනත සංශෝධනය කරන්නේ තවදුරටත් මේ රටේ වංචාව සහ දූෂණය සිදු වන එක නවත්වන්නයි; බොරු චෝදනා සහ අපහාස කිරීම් නවත්වන්නයි; ශක්තිමත්ව මේ රට ගොඩනඟන වැඩ පිළිවෙළේදී වංචාව සහ දූෂණය නැතුව ඉස්සරහට යන්නයි.

2025 අය වැයේදී අපි කියපු පරිදි රටේ ආදායම බදු ගහන්නේ නැතුව සියයට 68කින් වැඩි වුණා. මේ අවුරුද්දේත් මුල් කාර්තු දෙකේ මේ රටේ ආදායම සියයට 25කට වඩා වැඩි වෙලා තිබෙනවා. ඇයි ඒ? දැන් හැමෝම බදු ගෙවන්න පටන් ගෙන තිබෙන්නේ. පසුගිය කාලයේ වී මෝල් හිමියන් අපිත් එක්ක සාකච්ඡාවක් කළා, වී මිලදී ගැනීම සම්බන්ධව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම සාකච්ඡාව අතරතුර ඒ අය අපූරු කථාවක් කිව්වා. අපේ ජනාධිපතිතුමාටමයි ඒක කිව්වේ. "ජනාධිපතිතුමනි, අපි දැන් හරියට බදු ගෙවනවා. අපි ගණන් හදලා හරියට බදු ගෙවන නිසා දැන් බදු ගෙවන ප්‍රශ්නයත් අපට තිබෙන නිසා අපට ටිකක් අමාරුයි" කියලා තමයි ඒ අය කිව්වේ. දැන් හැමෝම පිළිවෙළට එනවා. ඒ නිසා නීතිය ශක්තිමත් වෙනකොට, නීතිය හැමෝටම සාධාරණයි කියලා කියනකොට, නීතියෙන් පනින්න බැහැ කියලා දැනෙනකොට, ජනාධිපතිවරුන්ට කියලා, ඇමතිවරුන්ට කියලා සහන ගන්න බැහැ කියලා දැනෙනකොට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කියලා ෆයිල් හංගා ගන්න බැහැ කියලා දැනෙනකොට, අන්න රට ඉස්සරහට යනවා, ශක්තිමත් වෙනවා, මිනිස්සුන්ට අවශ්‍ය සුබසාධන පහසුකම් වැඩි වෙනවා. ඒ නිසා වංචාව සහ දූෂණය නවත්වා ජනතාවට සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් හදන වැඩ පිළිවෙළට, මේ රට තවදුරටත් ඉදිරියට ගෙනියන්න ඕනෑ කරන වැඩ පිළිවෙළට ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව නායකත්වය දෙනවා. හොරකම, වංචාව සහ දූෂණය zero කරලා මේ රට ගොඩනඟන වැඩ පිළිවෙළ අපි අඛණ්ඩව ඉදිරියට ගෙන යන්න කටයුතු කරනවා කියන පණිවුඩය ලබා දෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Harini Amarasuriya.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 5 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 5ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 5 ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தின் 80ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 6.- *(Amendment of section 80 of the principal enactment)*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Chairman, on behalf of the Hon. President, I move,

"In page 4, leave out all words in line 24 and insert:

'(cc) proprietors, editors and members of the editorial staff' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 6, as amended, ordered to stand part of the Bill.*

## 7 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 7.- (முதன்மைச் சட்டவாக்கத்தின் 81ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 7.- *(Amendment of section 81 of the principal enactment)*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, on behalf of the President, I move,

"In page 5, leave out all words in lines 6 to 14 (both inclusive)".

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***7 වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.***

*7ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 7, ordered to be left out of the Bill.*

***8 සිට 10 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*8ஆம் வாசகத்திலிருந்து 10ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 8 to 10 ordered to stand part of the Bill.*

## 11 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 11.- (முதன்மைச் சட்டவாக்கத்தின் 88ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 11.- *(Amendment of section 88 of the principal enactment)*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, on behalf of the President, I move,

(1) "In page 6, leave out all words in lines 11 to 14 (both inclusive) and insert:

'in subsection (1) thereof, by the repeal of paragraph (c) and the substitution therefore of the following paragraph:-' ";

(2) "In page 6, leave out all words in line 22 and insert:
'declaration;' ";

(3) "In page 6, leave out all words in lines 23 to 28 (both inclusive)"; and

(4) "In page 7, leave out all words in lines 1 to 26 (both inclusive)".

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 11, as amended, ordered to stand part of the Bill.*

***12 සිට 16 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*12ஆம் வாசகத்திலிருந்து 16ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 12 to 16 ordered to stand part of the Bill.*

## 17 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 149 වන වගන්තිය සංශෝධනය කිරීම)
## வாசகம் 17.- (முதன்மைச் சட்டவாக்கத்தின் 149ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 17.- *(Amendment of section 149 of the principal enactment)*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, on behalf of the President, I move,

(1) "In page 10, leave out all words in lines 23 to 30 (both inclusive)"; and

(2) "In page 11, leave out all words in lines 1 to 11 (both inclusive)".

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***17 වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.***

*17ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 17, ordered to be left out of the Bill.*

***18 සිට 20 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*18ஆம் வாசகத்திலிருந்து 20ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 18 to 20 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I move,

"That the Bill, as amended, be now read the Third time".

I also request to give permission to correct the language and typographical errors, grammatical errors, numerical errors and consequential Amendments to the Bill.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
Hon. Deputy Speaker, I move,

"That Parliament do now adjourn".

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Adjournment Questions.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් මා මෙම ප්‍රශ්නය අහනවා.

ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රජාවගේ ජීවනෝපාය මෙන්ම, රටේ ආහාර සුරක්ෂිතතාව, පෝෂණ අවශ්‍යතා සහ දේශීය ආර්ථිකය සඳහාද අතිශය වැදගත් වන ධීවර කර්මාන්තය මේ වනවිට බරපතළ අර්බුද රැසකට මුහුණ දී ඇත. ඒ අනුව, මම පහත ප්‍රශ්න සඳහා පිළිතුරු බලාපොරොත්තු වෙමි.

[ගරු දිලිප් වෙදආරච්චි මහතා ]

01. ශ්‍රී ලංකාව තුළ ඇති ධීවර වරායන් සංඛ්‍යාව සහ මේ වනවිට සක්‍රිය මට්ටමේ ඇති වරායන් සංඛ්‍යාව කොපමණද? දැනට ධීවර ක්ෂේත්‍රයේ නිරත ලියාපදිංචි එක්දින, බහුදින හා සුළුපන්න ධීවර යාත්‍රා සංඛ්‍යාව කොපමණද?

02. රජය විසින් යම් සහනාධාරයක් ලබා දුන්නද, මුහුදු යාත්‍රා සඳහා අවශ්‍ය ඩීසල් සහ භූමිතෙල් මිල ඉහළ යෑම හේතුවෙන් ධීවර ප්‍රජාව පත්ව ඇති අපහසුතාවට රජය ලබා දෙන සාධනීය පිළිතුර කවරේද?

03. විදේශීය ධීවර යාත්‍රා ශ්‍රී ලංකා මුහුදු සීමාව ආශ්‍රිතව සිදු කරන නීති විරෝධී ධීවර කටයුතු හේතුවෙන් දේශීය ධීවර කර්මාන්තයට එල්ල වී ඇති බලපෑම අවම කිරීමට ගෙන ඇති තිරසර විසඳුම් කවරේද?

04. ධීවර යාත්‍රා, එන්ජින්, දැල් සහ අනෙකුත් ධීවර ආම්පන්නවල මිල සහ අලුත්වැඩියාවන් සඳහා වන අධික පිරිවැය පාලනය කිරීම සඳහා අමාත්‍යාංශය සතු වැඩ පිළිවෙළ කවරේද?

05. පාරිභෝගිකයන්ගේ පෝෂණ අවශ්‍යතා වෙනුවෙන් සාධාරණ මිලකට මසුන් මිලදී ගැනීමට ධීවර සංස්ථාව සතු ක්‍රියාමාර්ග ප්‍රමාණවත්ද? නොඑසේ නම්, ඒ සඳහා ඇති වැඩ පිළිවෙළ කවරේද?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

01. ධීවර වරායන් සංඛ්‍යාව 26ක් වන අතර, සක්‍රිය මට්ටමේ ඇති වරායන් සංඛ්‍යාව 25කි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එක් එක් ධීවර යාත්‍රා සංඛ්‍යා පිළිබඳ විස්තර වෙනම අහලා තිබෙනවා. අපේ රටේ සම්පූර්ණ බෝට්ටු ප්‍රමාණය 49,271ක් වෙනවා. ඒ තමයි, one-day බෝට්ටු ඇතුළු සියලුම බෝට්ටුවල එකතුව.

දේශීය ධීවර කර්මාන්තය භාවිත කරන යාත්‍රා අතුරින් යාත්‍රා කිහිපයක් හැර ඉතිරි යාත්‍රා සියල්ල ෆයිබර්ග්ලාස්වලින් නිෂ්පාදනය කර ඇති අඩි 60ට අඩු යාත්‍රා වන අතර, එම යාත්‍රාවලින්ද විශාල ප්‍රමාණයක් පැරණි යාත්‍රා වේ. පැරණි යාත්‍රා තමයි වැඩිපුර තිබෙන්නේ. ඒවා ෆයිබර්ග්ලාස්වලින් තමයි හදලා තිබෙන්නේ.

සංඛ්‍යාලේඛන සහ දත්ත අනුව ලියාපදිංචි බහුදින ධීවර යාත්‍රා 4,869ක්ද, ඇතුළත එන්ජිම සහිත එක්දින - one-day - ධීවර යාත්‍රා 880ක්ද, පිටත එන්ජිම සහිත ෆයිබර්ග්ලාස් යාත්‍රා 24,823ක්ද, යාන්ත්‍රික සාම්ප්‍රදායික යාත්‍රා 2,709ක්ද, යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික යාත්‍රා 15,037ක්ද තිබෙනවා. ඒ වාගේම යාන්ත්‍රික නොවන මාදැල් යාත්‍රා 953ක් තිබෙනවා.

02. විශේෂයෙන්ම ඔබතුමන්ලා සියලුදෙනාම දන්නවා, අපි බලයට පැමිණි විගස ධීවර කර්මාන්තයේ නියැළෙන ධීවරයින් සඳහා ඉන්ධන සහනාධාර ලබා දුන් බව. ඒ කාලයේ තිබුණු ආර්ථික අර්බුදයත් එක්ක මේ සියලු බෝට්ටු සහ සියලු යාත්‍රා වෙරළේ ගැට ගහලයි තිබුණේ. පළමු වතාවට අපි ඒගොල්ලන්ට ඉන්ධන සහනාධාරයක් සහ අනෙකුත් සියලුම සහනාධාර ලබා දෙමින්, නැවත වතාවක් ධීවරයින් තුළ විශ්වාසය ගොඩනඟලා, ඔවුන්ට ධීවර කර්මාන්තයේ නියැළෙන්න පුළුවන් ආකාරයේ වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ කටයුත්ත සාර්ථක වුණා. ඊට අතිරේකව අවස්ථා දෙකකදී ධීවරයින් සඳහාම ඉන්ධන සහනාධාර ක්‍රම අපි සලසා දුන්නා. 2024 ඔක්තෝබර් මාසයේ සිට 2025 මාර්තු මාසය දක්වා කාලය තුළ ඩීසල් සහ භූමිතෙල් භාවිත කරන යාත්‍රා සඳහා සහනාධාර ලබා දුන් අතර, එම සහනාධාර සඳහා අපේ ආණ්ඩුව රුපියල් මිලියන 1,926ක් වැය කර තිබෙනවා. ඊට අමතරව මෙම වසරේ - 2026 - අප්‍රේල් සිට ජූලි දක්වා මාස තුනක කාලයක් ඉන්ධන සහනාධාරයක් ලබා දුන්නා. මෙම සහනාධාරය සඳහා රජය මේ වන විට වැය කර ඇති මුදල රුපියල් මිලියන 2,999ක් වන අතර, එය ඉතිහාසයේ ධීවරයින් වෙනුවෙන් ඉන්ධන සහනාධාරයක් ලෙස ලබා දෙන ලද විශාලතම මුදල වනවා. ඊට අතිරේකව ධීවරයින්ට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා සාධාරණ මුදලක් ලබාදීම කෙරෙහිත් අවධානය යොමු කර ඇති අතර, ධීවර සංස්ථාව මේ සඳහා මේ වන විට සක්‍රිය දායකත්වයක් ලබා දීම සිදු කරයි. අන්න ඒක හරහා අපි මේ ධීවර කර්මාන්තය නැවත ගොඩ නැඟීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා.

03. ඉන්දියානු ධීවරයන්ගේ පැමිණීම පිළිබඳව ගත්තාට පස්සේ අපි හැමදාම කියනවා වාගේම ඔබතුමාත් දන්නා පරිදි ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේත් දිගින් දිගටම මේක බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබුණා. මේ ප්‍රශ්නයේදී අපේ රජයට දැන් සතුටු වෙන්න පුළුවන් දවසක් උදා වේවි. මේ සම්බන්ධයෙන් අපි දිගටම අරගළ කළා. අරගළයේ ප්‍රතිඵලයක් හැටියට මම විශ්වාස කරනවා, අපට යහපත් ප්‍රතිචාරයක් ලැබෙයි කියලා. ඊයේ පෙරේදා ඉන්දියාවේ තමිල්නාඩුවේ තිබෙන පක්ෂ දෙකක් තමන්ට ඉන්දියාවේ සිට කච්චතිව්වලට පැමිණිලා මාළු අල්ලා ගැනීම සඳහා අවසර ලබා දෙන්න, ඒ සඳහා ඒ අයට අයිතිය ලබා දෙන්න කියලා ඉල්ලලා ඉන්දියාවේ අධිකරණයක නඩුවක් පවරා තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නඩුවේදී ඉන්දියාවේ උසාවිය පැහැදිලිව කියා තිබෙනවා, "නැහැ, කච්චතිව් දූපත කියන්නේ ලංකාවට අයිති එකක්" කියලා. එපමණක් නොවෙයි, ලංකාවේ ධීවරයින් ගත්තත්, ලංකාවේ ධීවර කර්මාන්තයේ යෙදෙන මුහුදු සීමාව ගත්තත්, වෙරළබඩ ප්‍රදේශය ගත්තත්, ඉන්දියාවේ තමිල්නාඩුවට වඩා ඉතාම පිරිසිදුව තබාගෙන ඉන්නවා කියලා සඳහන් කර තිබෙනවා. මම මේ කියන්නේ ඉන්දියාවේ එම අධිකරණය සඳහන් කර තිබෙන දේ. අනෙක් පැත්තෙන්, ඉන්දියාවේ තමිල්නාඩු මුහුදු සීමාව ගත්තාම අපිරිසිදුභාවයෙන් පිරිලා තිබෙනවා කියාත් සඳහන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පිරිසිදුවට තිබෙන, පිරිසිදුවට ක්‍රියාත්මක වන, සියල්ලන්ටම සාධාරණය ඉටු කරන ආණ්ඩුවක් ලංකාවේ තිබෙනවා කියලාත් සඳහන් කර තිබෙනවා. එම නිසා ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරලා අපට වාසිදායක තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. ඒ හරහා ඉන්දියාවේ තමිල්නාඩුවට අපි නැවත වාරයක් බලපෑම් කරලා, ඒ අය සමඟ සාකච්ඡා මාර්ගයෙන් හෝ රාජ්‍ය තාන්ත්‍රික මාර්ගයෙන් හෝ මේ ප්‍රශ්නයට නැවත වාරයක් නීත්‍යනුකූලව උත්තර ලබා ගැනීම සඳහා අපේ පැත්තෙන් සියලුම කටයුතු කරන බවට මම මේ පාර්ලිමේන්තුවට සහතික වෙනවා. ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග අපි තෝරාගෙන තිබෙනවා.

04. ධීවර යාත්‍රා, එන්ජින්, දැල් සහ අනෙකුත් ධීවර ආම්පන්නවල මිල සහ අලුත්වැඩියාවන් සඳහා යන පිරිවැය ඉහළ යාම වළක්වන්න බැහැ. කෙටි කාලයක් තුළ රුපියල විශාල ලෙස අවප්‍රමාණය වීම තමයි මේකට මූලික හේතුව හැටියට තිබුණේ. ඒකට හේතුව තමයි, පසුගිය කාලයේ පැවති ආණ්ඩු මේවා පිළිබඳව සොයා බලා ඒ කටයුතු හොඳින් කළමනාකරණය කර නොතිබීම. එවැනි කළමනාකරණයක් තිබුණේ නැති නිසාම තමයි අපේ රට ආර්ථික වශයෙන් කඩා වැටුණේ. ඒ කඩා වැටීමත් එක්ක

තමයි මේ තත්ත්වයට පත් වුණේ. ඒ කඩා වැටුණු තත්ත්වයට පත් වෙච්ච අපේ රට දැන් මුදා ගෙන තිබෙනවා. ඒ නිසා අපට ඉදිරියේදී මීට වඩා සහනදායී ලෙස ධීවරයන්ට සලකන්න පුළුවන්, ඒ අයගේ අයිතිවාසිකම් ලබා දෙන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම "දිට්වා" ව්‍යසනයෙන් හානියට පත් වෙච්ච බෝට්ටු, දැල් ආම්පන්න ඇතුළු සියල්ලම අපි ලබා දුන්නා. ඒ සියල්ල ලබාදීමේ වගකීම ආණ්ඩුව බාර ගත්තා.

05\. අපි මීට අවුරුදු 2කට කලින් බලය ගන්න කොට ධීවර සංස්ථාවේ රුපියල් මිලියන 1,800ක විතර පාඩුවක් තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ රුපියල් මිලියන 1,800න් රුපියල් මිලියන 900ක්ම තිබුණේ, එහි වැඩ කරපු සේවකයන්ට නොගෙවා තිබුණු EPF, ETF මුදල්. ඒ EPF, ETF ගෙවීමට අවශ්‍ය වන මුදල ආණ්ඩුව සහනාධාරයක් හැටියට අපට ලබා දුන්නා. ඒ නිසා අපි ඒ බරෙන් නිදහස් වෙලා සහනාධාරයක් හැටියට ලැබුණු මුදල් ඒ මිනිසුන්ට ලබා දුන්නා. පාඩුව වශයෙන් පෙන්වන අනෙක් රුපියල් මිලියන 900 ඒ කාලයේ පිට මාළු කඩවලින් මාළු ණයට ගැනීම නිසා ඒ අයට ගෙවිය යුතුව තිබුණු මුදල් ප්‍රමාණයයි. මේ කටයුතු සිදුවීම නිසා මෙතෙක් කාලයක් පාඩු ලබමින් තිබුණු එම ආයතනය දැන් ලාභ ලබමින් ඉස්සරහට යමින් තිබෙනවා. නමුත් අපි අර කියපු රුපියල් මිලියන 900 ණය තවමත් ගෙවමින් යන නිසා අපට විශාල වෙනසක් කරන්න බැරි වෙලා තිබෙනවා. මේ සැරේත් අපි ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කර තිබෙනවා, ඒකටත් සහනාධාරයක් දෙන්න කියලා. අපි විශ්වාස කරනවා, ඉදිරියේදී ඒ සඳහාත් සහනයක් ලැබෙයි කියලා.

අපි ඊළඟ අවුරුද්දේදී මාළු මිල අඩු කිරීම සඳහා - අඩු මිලට මාළු ලබා දීම සඳහා - රට පුරා මාළු stalls 1,000ක් හදන්න කටයුතු සූදානම් කර තිබෙනවා. එහි මූලික වටයේදී වෙළෙඳ කුටි 100ක් ලබා දෙන්න අපි කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ හරහා ඉදිරියේදී මාළු මිල අඩු කරන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතෙක් කාලයක් තිබුණු තත්ත්වය දැන් වෙනස් වෙලා තිබෙනවා. පාඩු ලැබූ ඒ ආයතන සියල්ල යම්තාක් දුරට යථා තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි, මේ ඇත්ත තොරතුරු පිළිබඳව අපි ධීවර ජනතාව දැනුවත් කරලා තිබෙනවා. ඉදිරියේදී ධීවර ජනතාව එක්ක එකතු වෙලා, ධීවර සංස්ථාව පිළිබඳව තිබුණු විශ්වාසය නැවත ගොඩනැඟීම සඳහා වැඩ පිළිවෙළක් අපි සකස් කර තිබෙනවා. එමඟින් සාධාරණ මිලකට මාළු ලබා දෙන්නත්, ඒ හරහා ජනතාවගේ විශේෂයෙන්ම ප්‍රෝටීන් ඌනතාව අවසන් කරන්නත් පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)a
Hon. Dilip Wedaarachchi, there is no provision for a Supplementary Question or for a clarification on an Adjournment Question.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ඕනෑ ගරු ඇමතිතුමාට යම් අදහසක් ඉදිරිපත් කරන්න විතරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will give you 30 seconds, Hon. Member.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු ඇමතිතුමනි, කිරින්ද ධීවර වරාය අද වැලිවලින් ගොඩ වෙලායි තිබෙන්නේ. එම වැලි ඉවත් කරන්න - වරාය හාරන්න - ගිය නැවත් දැන් හිර වෙලායි තිබෙන්නේ. එහි පොඩි බෝට්ටු දෙසියහැත්තෑ ගණනක් තිබෙනවා. ඒවා එළියට දාන්න තැනක් නැහැ. වැලි හාරන්න ගිය නැව විතරක් වැලි ටික ඉවත් කරලා එළියට ගැනීමේ වැඩ කටයුතු දැන් ආරම්භ කර තිබෙනවා. මට ගරු නිහාල් ගලප්පත්ති මැතිතුමා ඒ සම්බන්ධයෙන් කිව්වා. අර බෝට්ටු ටික එළියේ දාන්න තැනක් නැහැ. ඒ සඳහා තිබුණු තොටුපොළ තමයි ඔරුවැල්ලේ තොටුපොළ. එය නාවික හමුදාව අත්පත් කරගෙන තිබෙනවා. වරායේ ඒ නැංගුරම් පොළ බෝට්ටු නතර කරන තැනක්, ගරු ඇමතිතුමනි. ඒක බෝට්ටු දුවන වරායක්. ඒ බෝට්ටු දෙසියහැත්තෑ ගණන දාන්න තැනක් දැන් නැති නිසා නාවික හමුදාවත් එක්ක කථා කරලා, එහි ඒ බෝට්ටු ටික දාන්න අවස්ථාව ලබා දෙන්න, ගරු ඇමතිතුමනි. ඒ වාගේම ඒ වැලි ටික ඉවත් කරලා එම නැව විතරක් එළියට අරගෙන යන්න එපා කියන්න. හාරන වැලි ටික ඉවත් කරලා වරාය යථා තත්ත්වයට පත් කරලා දෙන්න කියා ඒ ධීවර ජනතාව ඉල්ලීමක් කරනවා. ඔබතුමා මැදිහත් වෙලා ඒ කටයුත්ත කරන්න. මොකද, ඒක අපේ ධීවර ජනතාවට ලොකු ප්‍රශ්නයක්, ගරු ඇමතිතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you may provide a brief answer.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මතු කරන කාරණය, තර්කය ඇත්ත. එවැනි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. එතුමා කියන්නේ, ඒ බෝට්ටු ටික දාන තැන ලබා දීම සම්බන්ධව නාවික හමුදාව සමඟ කථා කරලා ධීවරයන්ට පක්ෂපාතී ලෙස අපේ පැත්තෙන් ක්‍රියාත්මක වෙන්න කියන එකයි. අපි ඒ සඳහා දැනටමත් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාත්, ඒ ගැන දන්නවා. ඒ සම්බන්ධයෙන් විධිමත් ලෙස ක්‍රියා කිරීම සඳහා කටයුතු කරනවා කියන පොරොන්දුව අපි ඒ ධීවර ජනතාවට ලබා දෙනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.00ට, 2026 ඔක්තෝබර් 09වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.00க்கு, பாராளுமன்றம் 2026 ஒக்ரோபர் 09, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.00 p.m. until 9.30 a.m. on Friday, 09th October, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

## 'දිට්වා' සුළි කුණාටුවෙන් හානියට පත් රජයේ පාසල්: ප්‍රතිසංස්කරණය/ නැවත ගොඩනැඟීම
## 'தித்வா' சூறாவளியால் சேதமடைந்த அரசாங்கப் பாடசாலைகள்: புனரமைப்பும் மீள்கட்டுமானமும்
## GOVERNMENT SCHOOLS DAMAGED BY CYCLONE "DITWAH": RESTORATION/ RECONSTRUCTION

2166/2026

**1. ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) "දිට්වා" සුළි කුණාටුවෙන් හානියට පත් රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වලට සිදු වූ හානියේ ස්වභාවය සහ ඇස්තමේන්තුගත හානිය;

(iii) එම පාසල්වල හානි යථා තත්වයට පත් කිරීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට රජය, අමාත්‍යාංශය, පළාත් සභා, විදේශ ආධාර වැඩසටහන් සහ අනෙකුත් ආයතන මඟින් ලබා දී ඇති මූල්‍ය ප්‍රතිපාදන;

(iv) එම මූල්‍ය ප්‍රතිපාදන මඟින් සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන ලද පාසල් සංඛ්‍යාව;

(v) මේ වන විට සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා හෝ ප්‍රතිසංස්කරණය කර නොමැති පාසල් සංඛ්‍යාව;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) අලුත්වැඩියා හෝ ප්‍රතිසංස්කරණය කර නොමැති පාසල් යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය මුළු මුදල කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 'தித்வா' சூறாவளியால் சேதமடைந்த அரசாங்கப் பாடசாலைகளின் எண்ணிக்கை;

(ii) மேற்படி பாடசாலைகளுக்கு ஏற்பட்ட சேதத்தின் தன்மை மற்றும் மதிப்பிடப்பட்ட சேதம்;

(iii) மேற்படி பாடசாலைகளின் சேதங்களைச் சீர்செய்வதற்கும் புனரமைப்புப் பணிகளை மேற்கொள்வதற்கும் இன்றளவில் அரசாங்கம், அமைச்சு, மாகாண சபைகள், வெளிநாட்டு உதவித் திட்டங்கள் மற்றும் ஏனைய நிறுவனங் களால் வழங்கப்பட்டுள்ள நிதி ஒதுக்கீடுகள்;

(iv) மேற்படி நிதி ஒதுக்கீடுகளின்மூலம் முழுமை யாகப் புனரமைக்கப்பட்ட பாடசாலைகளின் எண்ணிக்கை;

(v) இன்றளவில் முழுமையாகத் திருத்தப்படாத அல்லது புனரமைக்கப்படாத பாடசாலைகளின் எண்ணிக்கை;

மாவட்ட வாரியாக வெவ்வேறாக யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) திருத்தப்படாத அல்லது புனரமைக்கப்படாத பாடசாலைகளைச் சீர்செய்வதற்குத் தேவையான மொத்தத்தொகை எவ்வளவு என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House, separately by each district the -

(i) number of government schools damaged by Cyclone "Ditwah";

(ii) nature of the damage caused to those schools and the estimated value of such damage;

(iii) financial provisions made thus far by the Government, the Ministry, the provincial councils, foreign aid programmes and other institutions for damage restoration and the implementation of reconstruction activities in those schools;

(iv) number of schools that have been fully reconstructed through the utilization of those financial provisions; and

(v) number of schools in which repair or reconstruction activities have not yet been fully completed?

(b) Will she also inform this House the total amount of money required to restore the schools that have not yet been repaired or reconstructed?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

(අ) (i) 'දිට්වා' සුළි කුණාටුවෙන් හානියට පත් රජයේ පාසල් සංඛ්‍යාව 2,141කි.

හානියට පත් පාසල් දිස්ත්‍රික්ක වශයෙන් ඇමුණුම 01 හා ඇමුණුම 02හි (i) තීරුවෙහි දක්වා ඇත. ඇමුණුම් පහත පරිදි වේ.

ඇමුණුම 01:

## දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත්වූ පළාත් පාසල් පිළිබඳ විස්තර

| | පළාත | දිස්ත්‍රික්කය | හානි වූ පාසල් සංඛ්‍යාව | හානියේ ඇස්තමේන්තුගත ප්‍රමාණය රු.මි | ලබා දී ඇති මූල්‍ය ප්‍රතිපාදන රු.මි. | දැනට ප්‍රතිසංස්කරණය කර ඇති පාසල් සංඛ්‍යාව | තවදුරටත් ප්‍රතිසංස්කරනය කළ යුතු පාසල් සංඛ්‍යාව | තවදුරටත් අවශ්‍ය ප්‍රතිපාදන |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රශ්න අංකය | | (i) | (ii) | (iii) | (iv) | (v) | (ආ) |
| 1 | බස්නාහිර | කොළඹ | 84 | 143.22 | 59.61 | 75 | 9 | 21.50 |
| | | ගම්පහ | 79 | 81.85 | 58.30 | 70 | 9 | 8.50 |
| | | කළුතර | 43 | 48.62 | 34.61 | 39 | 4 | - |
| | **එකතුව** | | **206** | **273.69** | **152.53** | **184** | **22** | **30.00** |
| 2 | දකුණ | ගාල්ල | 26 | 88.15 | 87.72 | 18 | 8 | ප්‍රතිපාදන ලැබී ඇත |
| | | මාතර | 3 | 52.58 | 52.58 | 1 | 2 | |
| | | හම්බන්තොට | 2 | 18.23 | 18.23 | 1 | 1 | |
| | **එකතුව** | | **31** | **158.96** | **158.53** | **20** | **11** | - |
| 3 | මධ්‍යම | මහනුවර | 218 | 2,576.77 | 2,656.41 | 5 | 218 | ප්‍රතිපාදන ලැබී ඇත |
| | | නුවරඑළිය | 197 | 1,425.28 | 1,491.78 | | 192 | |
| | | මාතලේ | 61 | 537.62 | 574.12 | | 61 | |
| | **එකතුව** | | **476** | **4,539.67** | **4,566.01** | **5** | **471** | - |
| 4 | උතුර | යාපනය | 281 | 196.22 | 142.93 | 149 | 132 | දිස්ත්‍රික්ක වශයෙන් විස්තර ලබා දී නොමැත. |
| | | කිලිනොච්චිය | | | | | | |
| | | මන්නාරම | | | | | | |
| | | මුලතිව් | | | | | | |
| | | වව්නියාව | | | | | | |
| | **එකතුව** | | **281** | **196.22** | **142.93** | **149** | **132** | **53.29** |
| 5 | වයඹ | කුරුණෑගල | 107 | 274.04 | 82.69 | 84 | 23 | |
| | | පුත්තලම | 72 | | 86.75 | 56 | 16 | |
| | **එකතුව** | | **179** | **274.04** | **169.44** | **140** | **39** | **104.60** |
| 6 | උතුරුමැද | අනුරාධපුර | 88 | 97.23 | 90.01 | 35 | 53 | |
| | | පොළොන්නරුව | 89 | 37.89 | 37.89 | 28 | 61 | |
| | **එකතුව** | | **177** | **135.12** | **127.90** | **63** | **114** | **7.22** |
| 7 | නැගෙනහිර | ත්‍රිකුණාමලය | 146 | 96.97 | 96.94 | 146 | 0 | |
| | | අම්පාර | 87 | 88.39 | 86.97 | 87 | 0 | |
| | | මඩකලපුව | 113 | 68.50 | 67.14 | 113 | 0 | |
| | **එකතුව** | | **346** | **253.86** | **251.05** | **346** | **0** | **2.81** |
| 8 | ඌව | බදුල්ල | 173 | 3,893.91 | 1,712.50 | 0 | 173 | 2,181.41 |
| | | මොණරාගල | 7 | | | 0 | 7 | |
| | **එකතුව** | | **180** | **3,893.91** | **1,712.50** | **0** | **180** | **2,181.41** |
| 9 | සබරගමුව | රත්නපුරය | 54 | 308.83 | 231.04 | 31 | 23 | පාසල් 10ක් සඳහා ඇස්තමේන්තු කැඳවා ඇත |
| | | කෑගල්ල | 56 | | | 20 | 36 | |
| | **එකතුව** | | **110** | **308.83** | **231.04** | **51** | **59** | **77.79** |
| | එකතුව | | **1986** | **10,034.29** | **7,511.92** | **958** | **1028** | **2,457.12** |

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

ඇමුණුම **02:**

## දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත්වූ ජාතික පාසල් පිළිබඳ විස්තර

| පළාත | දිස්ත්‍රික්කය | හානි වූ පාසල් සංඛ්‍යාව | හානියේ ඇස්තමේන්තුගත ප්‍රමාණය රු.මි | ලබා දී ඇති මූල්‍ය ප්‍රතිපාදන රු.මි. | දැනට ප්‍රතිසංස්කරණය කර ඇති පාසල් සංඛ්‍යාව | තවදුරටත් ප්‍රතිසංස්කරනය කළ යුතු පාසල් සංඛ්‍යාව | වෙනත් විස්තර |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රශ්න අංකය | | (i) | (ii) | (iii) | (iv) | (v) | (ආ) |
| බස්නාහිර | කොළඹ | 8 | 49.08 | 48.76 | 0 | 8 | කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් 03ක් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කර දී ඇත. |
| | ගම්පහ | 1 | - | - | 0 | 1 | |
| | කළුතර | 0 | - | - | 0 | | |
| **එකතුව** | | **9** | **49.08** | **48.76** | **0** | **9** | **0.32** |
| දකුණ | ගාල්ල | 6 | 3.67 | 3.13 | 0 | 6 | ගාල්ල දිස්ත්‍රික්කයේ ඇස්තමේන්තු ලැබී ඇති පාසලක් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කර දී ඇත |
| | මාතර | 3 | 100.06 | - | 0 | 3 | |
| | හම්බන්තොට | 0 | - | - | 0 | 0 | |
| **එකතුව** | | **9** | **103.73** | **3.13** | **0** | **9** | **100.60** |
| මධ්‍යම | මහනුවර | 32 | 1,377.13 | 242.64 | 0 | 32 | මහ නුවර දිස්ත්‍රික්කයේ පාසල් 05 සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පාසල් 03ක් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කර දී ඇත |
| | නුවරඑළිය | 5 | 52.00 | 59.74 | 0 | 5 | |
| | මාතලේ | 8 | 93.09 | - | 0 | 8 | |
| **එකතුව** | | **45** | **1,522.22** | **302.38** | **0** | **45** | **1,219.84** |
| උතුර | යාපනය | 0 | | | | | |
| | කිලිනොච්චිය | 0 | | | | | |
| | මන්නාරම | 0 | | | | | |
| | මුලතිව් | 0 | | | | | |
| | වව්නියාව | 0 | | | | | |
| **එකතුව** | | **0** | | | | | - |
| වයඹ | කුරුණෑගල | 10 | 79.50 | 22.40 | 0 | 10 | කුරුණෑගලදිස්ත්‍රික්කයේ පාසල් 04ක් සහ පුත්තලම පාසල් 01ක් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කර දී ඇත. |
| | පුත්තලම | 3 | 122.50 | 90.00 | 0 | 3 | |
| **එකතුව** | | **13** | **202.00** | **112.40** | **0** | **13** | **89.60** |
| උතුරුමැද | අනුරාධපුර | 5 | 54.19 | 6.00 | 0 | 5 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇස්තමේන්තු ලැබී ඇති පාසලක් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කර දී ඇත |
| | පොළොන්නරුව | 3 | 2.55 | - | 0 | 3 | |
| **එකතුව** | | **8** | **56.74** | **6.00** | **0** | **8** | **50.74** |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 6 | 55.83 | 20.53 | 0 | 6 | අම්පාර දිස්ත්‍රික්කයේ පාසල් 06ක් සහ ත්‍රිකුණාමලයේ පාසල් 05ක් සහ මඩකලපු දිස්ත්‍රික්කයේ පාසල් 02 සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කර දී ඇත |
| | අම්පාර | 13 | 32.40 | 15.06 | 0 | 13 | |
| | මඩකලපුව | 10 | 18.78 | 2.53 | 0 | 10 | |
| **එකතුව** | | **29** | **107.01** | **38.12** | **0** | **29** | **68.89** |
| ඌව | බදුල්ල | 15 | 659.00 | 46.20 | 0 | 15 | බදුල්ලේ පාසල් 03ක් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන්කර ඇත |
| | මොණරාගල | 2 | 33.50 | - | 0 | 2 | |
| **එකතුව** | | **17** | **692.50** | **46.20** | **0** | **17** | **646.30** |
| සබරගමුව | රත්නපුරය | 13 | 191.91 | 121.44 | 0 | 13 | රත්නපුර පාසල් 12කට හා කෑගල්ල පාසල් 11 සඳහා |
| | කෑගල්ල | 12 | 175.99 | 83.89 | 0 | 12 | |
| **එකතුව** | | **25** | **367.90** | **205.33** | **0** | **25** | **162.57** |
| **එකතුව** | | **155** | **3,101.18** | **762.32** | **0** | **155** | **2,338.86** |
| **ඇමුණුම 01 හා 02 හි එකතුව** | | **2141** | **13,135.47** | **8,274.24** | **958** | **1183** | **4,795.98** |

(ii) එම පාසල්වලට සිදු වූ ඇස්තමේන්තුගත හානිය රුපියල් මිලියන 13,135.47කි.

නායයාම් නිසා ගොඩනැඟිලි සම්පූර්ණයෙන්ම හානියට පත්වීම, අර්ධ හානි සහ සුළු හානි සිදු වීම, භූමිය ගිලා බැසීම් සිදුවීම නිසා ගොඩනැඟිලිවල බිත්ති ඉරිතැලීම් ඇති වීම, ගස් කඩා වැටීම නිසා වහලවලට සිදුව ඇති හානි, සුළඟින් වහලවල ෂීට් ගැලවී යෑම, පැති බැමි, ආරක්ෂිත බැමි හා තාප්ප නායයාම්වලින් විනාශ වීම.

(iii) • "Rebuilding Sri Lanka" වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් කිරීම

• හානියට පත් වූ ජාතික පාසල් සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන සලසා දීම

• පළාත් සභා නිශ්චිත සංවර්ධන ප්‍රදාන

• UNICEF ආධාර

යන ආයතන හා ව්‍යාපෘති මඟින් ලබා දී ඇති මුළු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 8,274.24ක් වන අතර එය දිස්ත්‍රික් වශයෙන් ඇමුණුම 01හි හා ඇමුණුම 02හි (iii) තීරුවෙහි දක්වා ඇත.

(iv) පාසල් 958කි.

දිස්ත්‍රික් වශයෙන් ඇමුණුම 01හි හා ඇමුණුම 02හි (iv) තීරුවෙහි දක්වා ඇත.

(v) පාසල් 1,183කි.

දිස්ත්‍රික් වශයෙන් ඇමුණුම 01හි හා ඇමුණුම 02හි (v) තීරුවෙහි දක්වා ඇත.

(ආ) රුපියල් මිලියන 4,795.98කි.

මෙම ප්‍රතිපාදන ඉදිරියේදී වෙන් කර දීමට නියමිතය.

(ඇ) අදාළ නොවේ.

(அ) (i) 'தித்வா' புயலால் சேதமடைந்த அரச பாடசாலைகளின் எண்ணிக்கை 2,141 ஆகும்.

பாதிக்கப்பட்ட பாடசாலை மாவட்டங்கள் வாரியாக **இணைப்பு 01*** மற்றும் **இணைப்பு 02***இன் நிரல் (i)இல் சுட்டிக்காட்டப்பட்டுள்ளன. (சிங்கள இணைப்பு 01 மற்றும் இணைப்பு 02ஐப் பார்க்கவும். )

(ii) அந்தப் பாடசாலைகளுக்கு ஏற்பட்ட சேதத்தின் மதிப்பிடப்பட்ட மதிப்பு 13,135.47 மில்லியன் ரூபாய் ஆகும்.

மண்சரிவுகளால் கட்டிடங்களுக்கு முழுமையான சேதம், பகுதி சேதம் மற்றும் சிறு சேதம் ஏற்படுதல். நிலம் தாழ்வதால் கட்டிடங்களின் சுவர்களில் விரிசல்கள் ஏற்படுதல், மரங்கள் விழுவதால் கூரைகளுக்குச் சேதம் ஏற்படுதல். காற்று காரணமாக கூரைத் தகடுகள் பெயர்ந்து விழுதல், மண்சரிவுகளால் பக்கச் சுவர்கள், பாதுகாப்புச் சுவர்கள் மற்றும் சுவர்கள் அழிதல்.

(iii) • "Rebuilding Sri Lanka" நிகழ்ச்சித்திட்டத்தின்கீழ் நிதி ஒதுக்கீடு.

• கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சால் சேதமடைந்த தேசியப் பாடசாலைகளுக்கு நிதி ஒதுக்கீடு செய்தல்.

• மாகாண சபை குறிப்பிட்ட அபிவிருத்திக் கொடைகள்.

• UNICEF உதவி.

நிறுவனங்கள் மற்றும் நிகழ்ச்சித்திட்டங்களால் வழங்கப்பட்ட மொத்த நிதி ஒதுக்கீடு 8,274.24 மில்லியன் ரூபாய் ஆகும். இது மாவட்ட வாரியாக **இணைப்பு 01** மற்றும் **இணைப்பு 02**இன் நிரல் (iii)இல் சுட்டிக் காட்டப்பட்டுள்ளது.

(iv) 958 பாடசாலைகள்.

**இணைப்பு 01** மற்றும் **இணைப்பு 02**இன் நிரல் (iv) இல் மாவட்ட வாரியாகச் சுட்டிக் காட்டப்பட்டுள்ளது.

(v) 1,183 பாடசாலைகள்.

மாவட்ட வாரியாக, **இணைப்பு 01** மற்றும் **இணைப்பு 02**இன் நிரல் (v) இல் சுட்டிக் காட்டப்பட்டுள்ளது.

(ஆ) 4,795.98 மில்லியன் ரூபாய்.

இந்த ஒதுக்கீடுகள் எதிர்காலத்தில் செய்யப்பவுள்ளன.

(இ) பொருந்தாது.

(a) (i) The number of Government schools damaged by Cyclone "Ditwah" is 2,141. The damaged schools, categorized by district, are shown in column (i) of Annex 01* and Annex 02*. (Please refer Annex 01 and Annex 02 in Sinhala.)

(ii) The total estimated damage to those schools is Rs. 13,135.47 million.

Buildings were completely destroyed, partially damaged or sustained minor damage due to landslides. Cracks developed in the walls of buildings due to ground subsidence. Roofs were damaged by falling trees, and roofing sheets were blown away by strong winds. Side retaining walls, protective barriers and boundary walls were also destroyed by landslides.

(iii) • Funds allocated under the "Rebuilding Sri Lanka" programme;

• Funds provided for damaged National Schools by the Ministry of Education, Higher Education and Vocational Education;

• Provincial Council Specific Development Grants; and

• UNICEF aid.

A total of Rs. 8,274.24 million has been granted by those institutions and projects. The details are provided by district in columns (iii) of Annexes 01 and 02.

(iv) Nine hundred and fifty eight schools. They are indicated by district in column (iv) of Annexes 01 and 02.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

(v) One thousand one hundred and eighty three schools. They are indicated by district in column (v) of Annexes 01 and 02.

(b) Rs. 4,795.98 million. These allocations are scheduled to be released in the future.

(c) Not applicable.

## 2021 වසරේ සිට ඩෙංගු රෝගීන් සහ මරණ: විස්තර
### 2021 முதல் டெங்கு நோயாளிகள் மற்றும் உயிரிழந்தவர்கள்: விபரம்
### DENGUE PATIENTS AND VICTIMS FROM 2021: DETAILS

2344/2026

**2.** ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2021 වර්ෂයේ සිට 2026 වර්ෂයේ මේ දක්වා වූ කාල සීමාව තුළ ලියාපදිංචි කරන ලද ඩෙංගු රෝගීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය සහ වර්ෂය අනුව;

(ii) එම කාල සීමාව තුළ ඩෙංගු රෝගයෙන් මියගිය සංඛ්‍යාව, දිස්ත්‍රික්කය සහ වර්ෂය අනුව;

(iii) 2026 වර්ෂයේ මේ දක්වා ලියාපදිංචි කරන ලද ඩෙංගු රෝගීන් සංඛ්‍යාව සහ මියගිය සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය, මාසය, වයස් කාණ්ඩය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වන විට ඩෙංගු රෝගීන් වැඩි වශයෙන් වාර්තා වන දිස්ත්‍රික්ක සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස කවරේද;

(ii) 2025 සහ 2026 යන වර්ෂවලදී ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ පළාත් පාලන ආයතන මට්ටමින් රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග සඳහා එක් එක් වර්ෂයේ වෙන් කළ සහ වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2021ஆம் ஆண்டு முதல் 2026ஆம் ஆண்டின் இதுவரையான காலப்பகுதியில் பதிவுசெய்யப் பட்ட டெங்கு நோயாளர்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டம் மற்றும் வருடாந்த அடிப்படையிலும்;

(ii) மேற்படி காலப்பகுதியில் டெங்கு நோயால் உயிரிழந்தவர்களின் எண்ணிக்கை மாவட்டம் மற்றும் வருடாந்த அடிப்படையிலும்;

(iii) 2026 ஆம் ஆண்டில் இதுவரை பதிவுசெய்யப் பட்ட டெங்கு நோயாளர்களின் எண்ணிக்கை மற்றும் உயிரிழந்தவர்களின் எண்ணிக்கை, ஒவ்வொரு மாவட்டம், மாதாந்த, வயதுப் பிரிவு மற்றும் பாலினத்தின் அடிப்படையிலும்;

வெவ்வேறாக யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தற்போது டெங்கு நோயாளர்கள் அதிகளவில் பதிவாகும் மாவட்டங்கள் மற்றும் சுகாதார வைத்திய அதிகாரி பிரிவுகள் யாவை என்பதையும்;

(ii) 2025 மற்றும் 2026 ஆகிய ஆண்டுகளில் டெங்கு நோயைக் கட்டுப்படுத்துவதற்காகத் தேசிய, மாகாண, மாவட்ட மற்றும் உள்ளூராட்சி நிறுவன மட்டங்களில் அரசாங்கத்தினால் மேற் கொள்ளப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி நடவடிக்கைகளுக்காக ஒவ்வொரு வருடமும் ஒதுக்கப்பட்ட மற்றும் செலவிடப்பட்ட நிதித் தொகைகள் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House, separately, the number of -

(i) dengue patients registered in each district during each year from 2021 to date;

(ii) deaths attributed to dengue in each district during the aforesaid period in each year; and

(iii) dengue patients registered and deaths reported to date, disaggregated by district, month, age group and gender?

(b) Will he also inform this House the -

(i) Districts and Medical Officer of Health (MOH) Divisions in which the highest numbers of dengue patients are currently being reported;

(ii) measures that have been taken by the Government at the national, provincial, district and local government levels to curb the spread of dengue during 2025 and 2026; and

(iii) amount of money allocated and expended in each year for the implementation of the aforesaid measures, separately?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) **ඇමුණුම 01*** මඟින් ඉදිරිපත් කර ඇත. (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම 01 බලන්න.)

(ii) **ඇමුණුම 02*** මඟින් ඉදිරිපත් කර ඇත. (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම 02 බලන්න.)

(iii) **ඇමුණුම 03*** මඟින් ඉදිරිපත් කර ඇත. (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම 03 බලන්න.)

(ආ) (i) **ඇමුණුම 04*** මඟින් ඉදිරිපත් කර ඇත. (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම 04 බලන්න.)

(ii)
- ඩෙංගු රෝගීන්ගේ සහ මදුරු ගහනයේ වැඩිවීම හා අඩුවීමේ ප්‍රවණතා පිළිබඳව කාලානුරූපීව නිරීක්ෂණය කිරීම.
- ඩෙංගු රෝගීන් පිළිබඳ විමර්ශනය, මදුරුවන් බෝ වන ස්ථාන විනාශ කිරීම හා ජනතාව දැනුවත් කිරීම.
- පළාත් සහ ජාතික මට්ටමින් ඩෙංගු රෝග තත්ත්වය සමාලෝචනය කර ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ඩෙංගු රෝගය වැළැක්වීම හා පාලනයට අදාළ ක්ෂේත්‍ර සඳහා ජාතික මට්ටමේ මාර්ගෝපදේශ ලබාදීම.
- ඩෙංගු රෝගය වැළැක්වීම හා පාලනයට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සියලුම මට්ටම්වල කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ඉහළ අවදානම් සහිත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසවල විශේෂ මදුරු මර්දන වැඩසටහන් (SMCC) පැවැත්වීම.
- රෝගීභාවය සහ මරණ අවම කිරීමට රෝහල් කාර්ය මණ්ඩලය සඳහා සායනික පුහුණුව ලබා දීම, අවශ්‍ය උපකරණ සැපයීම සහ ප්‍රතිකාර මාර්ගෝපදේශ ලබා දීම.
- සියලුම ඩෙංගු මරණ විශේෂඥ මණ්ඩලයක් මඟින් සමාලෝචනය කර, පවතින අඩුපාඩු හඳුනාගෙන නිවැරැදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- වාහක මදුරු පාලනය.
- ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් අංශ අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම.
- සමාලෝචන හා උපදේශන රැස්වීම් පැවැත්වීම.
- අවදානම් සන්නිවේදනය හා මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

(iii) ජාතික ඩෙංගු මර්දන ඒකකය (NDCU) ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගය වැළැක්වීම හා පාලනය සඳහා ජාතික කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කරන බැවින්, ජාතික මට්ටමේ ඩෙංගු මර්දන කටයුතු සඳහා වෙන් කරන මූල්‍ය සම්පත් කළමනාකරණය හා සම්බන්ධීකරණය කිරීමේ ප්‍රධාන වගකීම NDCU වෙත පැවරී ඇත.

**2025 අරමුදල් වෙන් කිරීම:** ඩෙංගු මර්දන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 84.6ක් වෙන් කළ අතර, එයින් රුපියල් මිලියන 74.5ක් පමණ වැය කර ඇත.

**2026 අරමුදල් වෙන් කිරීම:** ඩෙංගු මර්දන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 125ක් වෙන් කර ඇත.

**අරමුදල් භාවිත වන ප්‍රධාන ක්ෂේත්‍ර**

මදුරු සමීක්ෂණ උපකරණ, දුම් ගැසීමේ යන්ත්‍ර සහ කෘමිනාශක ඇතුළු අත්‍යවශ්‍ය සැපයුම් ප්‍රසම්පාදනය.

සායනික, නිරීක්ෂණ සහ පාලන කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන්.

ක්ෂේත්‍ර අධීක්ෂණය සහ අධි-අවදානම්/පැතිරීම් කාල සීමාවල විශේෂ මදුරු මර්දන වැඩසටහන්.

**අතිරේක වියදම්:**

**පළාත් හා දිස්ත්‍රික් මට්ටමින්:** පළාත්/දිස්ත්‍රික් සෞඛ්‍ය බලධාරීන් ඔවුන්ගේ අය වැය මඟින් දුම් ගැසීම් ඇතුළු පාලන කටයුතු සඳහා වෙනම වියදම් දරයි.

**පුනරාවර්තන වියදම්:** කාර්ය මණ්ඩල වැටුප්, වාහන, ඉන්ධන, නඩත්තු සහ මෙහෙයුම් සඳහා වෙනම පුනරාවර්තන වියදම් පවතී.

(ඇ) පැන නොනඟී.

(அ) (i) இணைப்பு 01 மூலம் சமர்ப்பிக்கப்பட்டுள்ளது. (ஆங்கில மொழியிலுள்ள இணைப்பு 01*ஐப் பார்க்கவும்.)

(ii) இணைப்பு 02 மூலம் சமர்ப்பிக்கப்பட்டுள்ளது. (ஆங்கில மொழியிலுள்ள இணைப்பு 02*ஐப் பார்க்கவும்.)

(iii) இணைப்பு 03 மூலம் சமர்ப்பிக்கப்பட்டுள்ளது. (ஆங்கில மொழியிலுள்ள இணைப்பு 03*ஐப் பார்க்கவும்.)

(ஆ) (i) இணைப்பு 04இல் தரப்பட்டுள்ளது. (ஆங்கில மொழியிலுள்ள இணைப்பு 04*ஐப் பார்க்கவும்.)

(ii)
- டெங்கு நோயாளிகள் மற்றும் கொசுக்களின் எண்ணிக்கை அதிகரிப்பு மற்றும் குறைவுப் போக்குகளைக் காலமுறைப்படி கண்காணித்தல்.
- டெங்கு நோயாளர்களைப் பற்றிய புலனாய்வு, கொசுக்கள் பெருகும் இடங்களை அழித்தல் மற்றும் பொது மக்களுக்கு விழிப்புணர்வு ஏற்படுத்துதல்.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

- மாகாண மற்றும் தேசிய மட்டத்தில் டெங்கு நோயின் நிலைமையை மீளாய்வு செய்து, அதற்கேற்ப தேவையான நடவடிக்கைகளை எடுத்தல்.
- டெங்கு நோயைத் தடுத்தல் மற்றும் கட்டுப் படுத்துதல் தொடர்பான துறைகளுக்கு தேசிய மட்டத்திலான வழிகாட்டு தல்களை வழங்குதல்.
- டெங்கு நோயைத் தடுத்தல் மற்று கட்டுப் படுத்துதல் தொடர்பான செயற்பாடுகள் குறித்து அனைத்து மட்டங்களிலுமுள்ள ஊழியர்களுக்கும் பயிற்சிகளை நடத்துதல்.
- அதிக ஆபத்துள்ள சுகாதார அதிகாரி (MOH) பிரிவுகளில் சிறப்பு கொசு ஒழிப்புத் திட்டங்களை (SMCC) நடத்துதல்.
- நோய்வாய்ப்படுதல் மற்றும் மரணங்களைக் குறைப்பதற்காக வைத்தியசாலை ஊழியர் களுக்கு மருத்துவப் பயிற்சிகளை வழங்குதல். தேவையான உபகரணங் களை விநியோகித்தல் மற்றும் சிகிச்சை வழிகாட்டுதல்களை வழங்குதல்.
- அனைத்து டெங்கு மரணங்களையும் நிபுணர் குழுவொன்றின்மூலம் மீளாய்வு செய்து, நிலவும் குறைபாடுகளை அடையாளங் கண்டு, அவற்றை நிவர்த்தி செய்வதற் கான நடவடிக்கைகளை எடுத்தல்.
- நோய்க்காவி கொசுக்களைக் கட்டுப்படுத் துதல்.
- தேசிய, மாகாண, மாவட்ட மற்றும் பிரதேச மட்டங்களில் துறைகளுக்கு இடையிலான ஒத்துழைப்பை மேம்படுத்துதலும் வலுப் படுத்துதலும்.
- மீளாய்வு மற்றும் ஆலோசனைக் கூட்டங்களை நடத்துதல்.
- ஆபத்துத் தகவல் தொடர்பு மற்றும் பொது விழிப்புணர்வுத் திட்டங்களை நடைமுறைப் படுத்துதல்.

(iii) தேசிய டெங்கு கட்டுப்பாட்டுப் பிரிவு (NDCU) இலங்கையில் டெங்கு நோயைத் தடுப்பதற்கும் கட்டுப்படுத்துவதற்குமான தேசிய மைய நிறுவன மாகச் செயல்படுவதால், தேசிய மட்டத்திலான டெங்கு கட்டுப்பாட்டு நடவடிக்கைகளுக்காக ஒதுக்கப்படும் நிதி வளங்களை நிருவகிப்பதற்கும் ஒருங்கிணைப்பதற்குமான முதன்மைப் பொறுப்பு NDCUஇடம் ஒப்படைக் கப்பட்டுள்ளது.

2025 நிதி ஒதுக்கீடு: டெங்கு கட்டுப்பாட்டு நடவடிக்கைளுக்காக 84.6 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டதுடன், அதில் சுமார் 74.5 மில்லியன் ரூபாய் செலவிடப்பட்டுள்ளது.

2026 நிதி ஒதுக்கீடு: டெங்கு கட்டுப்பாட்டு நடவடிக்கைகளுக்காக 125 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது.

**நிதிகள் பயன்படுத்தப்படும் பிரதான துறைகள்**

கொசு ஆய்வுக் கருவிகள், புகைப்பிடிக்கும் இயந்திரங்கள் (fogging machine) மற்றும் பூச்சிக் கொல்லிகள் உள்ளிட்ட அத்தியாவசியப் பொருட் களின் கொள்முதல்.

மருத்துவ, கண்காணிப்பு மற்றும் கட்டுப்பாட்டுப் பணியாளர்களுக்கான பயிற்சித் திட்டங்கள்.

புலக் கண்காணிப்பு (field supervision) மற்றும் அதிக அபாயம்/நோய் பரவல் காலங்களில் சிறப்பு கொசு ஒழிப்புத் திட்டங்கள்.

**மேலதிக செலவுகள்**

**மாகாண மற்றும் மாவட்ட மட்டத்தில்:** மாகாண/மாவட்ட சுகாதார அதிகாரிகள் தங்களது வரவு செலவுத் திட்டத்தின்மூலம் புகையூட்டுதல் (fogging) உட்பட கட்டுப்பாட்டு நடவடிக்கை களுக்காக தனியாகச் செலவழிக்கின்றனர்.

**மீண்டெழும் செலவுகள்:** ஊழியர்களின் சம்பளம், வாகனங்கள், எரிபொருள், பராமரிப்பு மற்றும் செயற்பாடுகளுக்காக தனியான மீண்டெழும் செலவுகள் உள்ளன.

(இ) பொருந்தவில்லை.

(a) (i) The number of registered dengue patients, by district, is given in Annex 01*.

(ii) The number of deaths attributed to dengue during the said period, by district, is given in Annex 02*.

(iii) The numbers of dengue patients registered and deaths reported to date, disaggregated by district, month, age group and gender are given in Annex 03*.

(b) (i) Districts and Medical Officer of Health (MOH) Divisions in which the highest numbers of dengue patients are currently being reported are given in Annex 04*.

(ii)
- Periodically monitoring trends in dengue patients and mosquito density.
- Investigation of dengue patients, destruction of mosquito breeding places and educating the public.
- Reviewing the dengue disease situation at provincial and national levels and taking necessary actions accordingly.
- Providing national-level guidelines for the prevention and control of the dengue disease.
- Conducting training programmes for staff at all levels regarding activities related to dengue prevention and control.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

- Conducting Special Mosquito Control Campaigns (SMCCs) in high-risk Medical Officer of Health (MOH) Divisions.
- Providing clinical training to hospital staff to reduce morbidity and mortality, supplying necessary equipment and issuing treatment guidelines.
- Reviewing all dengue deaths by a specialist panel and taking necessary steps to identify and correct existing shortcomings.
- Vector mosquito control.
- Promoting and strengthening inter-sectoral cooperation at national, provincial, district and local government levels.
- Conducting review and advisory meetings.
- Implementing risk communication and public awareness programmes.

(iii) Since the National Dengue Control Unit (NDCU) functions as the national centre for the prevention and control of dengue disease in Sri Lanka, the primary responsibility of managing and coordinating financial resources allocated for national-level dengue control activities is entrusted to the NDCU.

- **2025 fund allocation:** Rs. 84.6 million was allocated for dengue control activities, out of which approximately Rs. 74.5 million has been spent.
- **2026 fund allocation:** Rs. 125 million has been allocated for dengue control activities.

**Main Areas of Fund Utilization:**

- Procurement of essential supplies, including mosquito surveillance equipment, fogging machines, and insecticides.
- Training programmes for clinical, surveillance and control staff.
- Field supervision and special mosquito control campaigns during high-risk/outbreak periods.

**Additional Expenses:**

- **At provincial and district levels:** Provincial/district health authorities incur separate expenses from their own budgets for control activities including fogging.
- **Recurrent Expenditure:** There are separate recurrent expenses for staff salaries, vehicles, fuel, maintenance and operations.

(c) Does not arise.

## මන්නාරම, මුලතිව් සහ වවුනියාව දිස්ත්‍රික්කවල ආයුර්වේද සහ ප්‍රාදේශීය මූලික රෝහල්: පහසුකම් සහ පුරප්පාඩු

## மன்னார், முல்லைத்தீவு மற்றும் வவுனியா மாவட்டங்களிலுள்ள ஆயுர்வேத மற்றும் பிரதேச ஆதார வைத்தியசாலைகள்: வசதிகள் மற்றும் வெற்றிடங்கள்

## AYURVEDIC AND REGIONAL BASE HOSPITALS IN MANNAR, MULLAITIVU AND VAVUNIYA DISTRICTS: FACILITIES AND VACANCIES

2355/2026

**3.** ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මන්නාරම, මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල පිහිටි ප්‍රාදේශීය මූලික රෝහල්වල අනුමත කාර්ය මණ්ඩලය, මේ වනවිට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු ඇති තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම රෝහල් අතරින් ගිලන්රථ පහසුකම් නොමැති හෝ ප්‍රමාණවත් ගිලන්රථ පහසුකම් නොමැති රෝහල් කවරේද;

(iii) එම රෝහල් සඳහා ගිලන්රථ ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ) (i)හි සඳහන් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන සිද්ධ වෛද්‍ය රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල සංඛ්‍යාව රෝහල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහල් අතරින් නේවාසික පහසුකම් සහිත රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් පුරවා තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) මන්නාරම සිලාවතුර රෝහල සහ ඉරණඉලුප්පෙයිකුලම් ප්‍රාථමික සෞඛ්‍ය රෝහල උත්ශ්‍රේණිගත කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, උත්ශ්‍රේණිගත කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එම රෝහල් උත්ශ්‍රේණිගත කිරීමට අපේක්ෂිත කාලරාමුව කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා ]

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மன்னார், முல்லைத்தீவு மற்றும் வவுனியா ஆகிய மாவட்டங்களில் அமைந்துள்ள பிரதேச ஆதார வைத்தியசாலைகளில் அங்கீகரிக்கப்பட்ட ஆளணியினர், தற்போது சேவையில் ஈடுபட்டுள்ள ஆளணியினர் மற்றும் வெற்றிடங்கள் நிலவும் பதவிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி வைத்தியசாலைகளில் நோயாளர் காவு வண்டி வசதிகள் இல்லாத அல்லது போதுமானளவு நோயாளர் காவு வண்டி வசதிகள் இல்லாத வைத்தியசாலைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி வைத்தியசாலைகளுக்கு நோயாளர் காவு வண்டிகளை வழங்குவதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேலே (அ)(i)இல் குறிப்பிடப்பட்டுள்ள மாவட்டங்களில் இயங்கி வருகின்ற சித்த வைத்திய சாலைகளில் சேவையாற்றுகின்ற வைத்தியர்கள், சமுதாய மருத்துவ அலுவலர்கள் மற்றும் ஏனைய ஆளணியினரின் எண்ணிக்கை வைத்தியசாலை வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி வைத்தியசாலைகளில் வதிவிட வசதி களுடன்கூடிய வைத்தியசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அவற்றின் அங்கீகரிக்கப்பட்ட ஆளணி முழுமை யாக நிரப்பப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மன்னார் சிலாவத்துறை வைத்தியசாலையையும் இரணை இலுப்பைக்குளம் ஆரம்ப சுகாதார வைத்தியசாலையையும் தரமுயர்த்துவதற்காக முன்வைக்கப்பட்டுள்ள கோரிக்கைகள் தொடர்பில் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அவற்றைத் தரமுயர்த்துவதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி வைத்தியசாலைகளைத் தரமுயர்த்து வதற்கு எதிர்பார்க்கப்படும் காலகட்டம் யாது என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) separately, the approved staff, the staff currently serving and the number of posts vacant in the Regional Base Hospitals located in the Mannar, Mullaitivu and Vavuniya Districts;

(ii) out of the aforesaid hospitals, the hospitals which do not have ambulance facilities or lack adequate ambulance facilities; and

(iii) the steps that have been taken to provide ambulances to the aforesaid hospitals?

(b) Will he also inform this House -

(i) separately, the number of doctors, Community Health Medical Officers and other staff serving in each Siddha medical hospital functioning in the districts mentioned in (a) (i) above;

(ii) out of the aforesaid hospitals, the number of hospitals with in-patient facilities; and

(iii) whether the approved cadre in the aforesaid hospitals has been completely filled?

(c) Will he further inform this House -

(i) whether he is aware of the requests that have been made to upgrade the Mannar Silavathurai Hospital and the Iranailuppaikulam Primary Health Care Hospital;

(ii) if so, the steps that have been taken for upgrading; and

(iii) the expected timeframe for upgrading the aforesaid hospitals?

(d) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) ඇමුණුම **a(i)*** මඟින් දක්වා ඇත. (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම a(i) බලන්න.)

(ii) ඇමුණුම **a(ii)***සහ **(iii)*** මඟින් දක්වා ඇත. (ඉංග්‍රීසි භාෂාවෙන් ඇති ඇමුණුම a(ii) සහ (iii) බලන්න.)

(iii) පහත ප්‍රාදේශීය රෝහල් සඳහා ගිලන් රථ ප්‍රමාණවත් නොමැති අතර පහත රෝහල් ගිලන් රථ ලබා ගැනීම සඳහා ඉල්ලීම් යොමු කර ඇත.

වංගාලයි රෝහල, නානාවන් රෝහල, විඩත්තල්තිව් රෝහල, සිලාවතුරෙයි රෝහල, අලම්බිල් රෝහල, නෙඩුංගර්නි රෝහල

(ආ) (i) සිද්ධ වෛද්‍ය රෝහල් ලෙස වෙන් කළ ආයුර්වේද රෝහල් නොමැත. ආයුර්වේද වෛද්‍යවරුන්, ආයුර්වේද, සිද්ධ සහ යුනානි කාණ්ඩ 03න්ම බඳවා ගනු ලබන අතර, පොදුවේ ආයුර්වේද

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වෛද්‍යවරුන් ලෙස සලකනු ලබයි. ඉහත දිස්ත්‍රික්ක තුළ පවත්නා ආයුර්වේද රෝහල් හා ආයුර්වේද ඩිස්පෙන්සරි තුළ වැඩි වශයෙන් සිද්ධ වෛද්‍යවරුන් සේවයේ යොදවා ඇත.

(ii) දිස්ත්‍රික් ආයුර්වේද රෝහල - මන්නාරම

ආයුර්වේද මූලික රෝහල - වවුනියාව

දිස්ත්‍රික් ආයුර්වේද රෝහල - මුලතිව්

(iii) අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් පුරවා නොමැති අතර, රෝහල් කටයුතු හා රෝගී සත්කාර සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් තරම් කාර්ය මණ්ඩලයක් සේවයේ නිරතව සිටී. (**ඇමුණුම a (iv)*** මඟින් උතුරු පළාත තුළ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අනුමත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු දක්වා ඇත.)

(ඇ) (i) ඔව්.

(ii) සිලාවතුර රෝහල B ශ්‍රේණියේ සිට C ශ්‍රේණිය දක්වා උත්ශ්‍රේණිගත කිරීම උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් නිර්දේශ කර ඇති අතර, එම ඉල්ලීම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ලැබී ඇත.

ඉරණඉලුප්පෙයිකුලම් ප්‍රාථමික සෞඛ්‍ය රෝහල උත්ශ්‍රේණිගත කිරීම සම්බන්ධයෙන් මේ දක්වා ඉල්ලීම් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර නොමැත.

(iii) සිලාවතුර රෝහල උත්ශ්‍රේණිගත කිරීම සම්බන්ධව ඉල්ලීම පිළිබඳව අධ්‍යයනය කරමින් පවතින බැවින් නිශ්චිත කාල රාමුවක් දැක්විය නොහැක.

(ඈ) පැන නොනඟී.

(அ) (i) இணைப்பு a(i)இல் காட்டப்பட்டுள்ளது. (ஆங்கில மொழியிலுள்ள இணைப்பு a(i)*ஐப் பார்க்கவும்.)

(ii) இணைப்பு a(ii) மற்றும் a(iii)இல் காட்டப் பட்டுள்ளது. (ஆங்கில மொழியிலுள்ள இணைப்பு a(ii)* மற்றும் a(iii))*ஐப் பார்க்கவும்.)

(iii) கீழ்காணும் பிரதேச வைத்தியசாலைகளுக்கு அவசர ’அம்பியுலன்ஸ்’ வண்டிகள் போதுமான தாக இல்லை என்பதோடு, ’அம்பியுலன்ஸ்’ வண்டிகளைப் பெற்றுக்கொள்வதற்கான கோரிக்கைகளும் அனுப்பப்பட்டுள்ளன.

வங்காலை வைத்தியசாலை, நானாட்டான் வைத்தியசாலை, விடத்தல்தீவு வைத்தியசாலை, சிலாவத்துறை வைத்தியசாலை, அளம்பில் வைத்தியசாலை, நெடுங்கேணி வைத்தியசாலை.

(ஆ) (i) சித்த மருத்துவ மருத்துவமனைகளாக தனியாகப் பிரிக்கப்பட்ட ஆயுர்வேத மருத்துவமனைகள் எதுவும் இல்லை. ஆயுர்வேதம், சித்தா மற்றும் யுனானி ஆகிய மூன்று பிரிவுகளிலிருந்தும் ஆயுர்வேத மருத்துவர்கள் ஆட்சேர்ப்புச் செய்யப் படுவதுடன், அவர்கள் பொதுவாக ஆயுர்வேத மருத்துவர்களாகவே கருதப்படுகிறார்கள். மேற்கூறிய மாவட்டங்களிலுள்ள ஆயுர்வேத மருத்துவமனைகள் மற்றும் ஆயுர்வேத மருந்தகங் களில் (Dispensaries) அதிகளவில் சித்த மருத்து வர்களே சேவையில் ஈடுபடுத்தப்பட்டுள்ளனர்.

(ii) மாவட்ட ஆயுர்வேத வைத்தியசாலை - மன்னார்

ஆயுர்வேத ஆதார வைத்தியசாலை - வவுனியா

மாவட்ட ஆயுர்வேத வைத்தியசாலை - முல்லைத்தீவு

(iii) அங்கீகரிக்கப்பட்ட ஊழியர் அணி முழுமையாக நிரப்பப்படாதபோதிலும், மருத்துவமனை நடவடிக்கைகள் மற்றும் நோயாளி பராமரிப்பு சேவைகளைத் தடையின்றி முன்னெடுத்துச் செல்வதற்குப் போதுமான ஊழியர்கள் சேவவை யில் ஈடுபட்டுள்ளனர். (இணைப்பு a (iv)*மூலம் வடக்கு மாகாணத்தில் ஆயுர்வேத மருத்துவர் களின் அங்கீகரிக்கப்பட்ட ஊழியர் அணியும் வெற்றிடங்களும் காட்டப்பட்டுள்ளன.) .

(இ) (i) ஆம்.

(ii) சிலாவத்துறை மருத்துவமனையை ‘B’ பிரிவி லிருந்து ‘C’ பிரிவுக்குத் தரமுயர்த்துவது தொடர்பில், வட மாகாண சுகாதார சேவைகள் பணிப்பாளரினால் பரிந்துரைக்கப்பட்டுள்ள கோரிக்கை, சுகாதாரம் மற்றும் ஊடக அமைச்சுக்குக் கிடைத்துள்ளது.

இரனைஇலுப்பைக்குளம் ஆரம்ப சுகாதார மருத்துவமனையை தரமுயர்த்துவது தொடர்பாக இதுவரை சுகாதார மற்றும் ஊடக அமைச்சுக்கு எந்தவொரு கோரிக்கையும் சமர்ப்பிக்கப் படவில்லை.

(iii) சிலாவத்துறை வைத்தியசாலையை தரமுயர்த் துவது தொடர்பான கோரிக்கை குறித்து ஆராயப்பட்டு வருவதால், இதற்கான குறிப் பிட்ட காலவரையறையைக் கூற முடியாது.

(ஈ) பொருந்தவில்லை.

(a) (i) The approved staff, the staff currently serving and the number of posts vacant in the Regional Base Hospitals located in the Mannar, Mullaitivu, and Vavuniya Districts are given in Annex a(i) *.

(ii) The hospitals which do not have ambulance facilities or lack adequate ambulance facilities are given in Annexes a(ii)* and a (iii)*.

(iii) Ambulance facilities are inadequate for the following Divisional Hospitals, and requests have been forwarded by these hospitals to obtain ambulances:

Vankalai Hospital, Nanaddan Hospital, Vidattaltivu Hospital, Silavatturai Hospital, Alambil Hospital, and Nedunkerny Hospital.

---

* *පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

* *පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(b) (i) There are no separate Ayurvedic hospitals designated specifically as Siddha hospitals. Ayurvedic doctors are recruited from all three categories - Ayurveda, Siddha, and Unani - and are generally treated as Ayurvedic doctors. In the Ayurvedic hospitals and Ayurvedic dispensaries within the aforementioned districts, Siddha doctors are predominantly deployed.

(ii) District Ayurvedic Hospital - Mannar

Ayurvedic Base Hospital - Vavuniya

District Ayurvedic Hospital - Mullaitivu

(iii) The approved cadres have not been fully filled. However, sufficient staff is currently deployed to maintain hospital operations and patient care services without interruption. Annex a(iv)* indicates the approved cadres and vacancies for Ayurvedic doctors in the Northern Province.

(c) (i) Yes.

(ii) The Northern Province Director of Health Services has recommended upgrading Silavatturai Hospital from Grade B to Grade C, and that request had been received by the Ministry of Health and Mass Media.

Regarding the upgrading of Iranai-Iluppaikulam Primary Health Care Hospital, no request has been forwarded to the Ministry of Health and Mass Media to date.

(iii) Since the request regarding the upgrading of Silavatturai Hospital is currently under evaluation, a specific timeline cannot be provided at this time.

(d) Does not arise.

---

* පුස්තකාලයේ තබා ඇත.

* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.

* *Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.